# පාර්ලිමේන්තු

## සාර සංහිතා

# පාර්ලිමේන්තු

## සාර සංහිතා

සංස්කරණය සහ ප්‍රකාශනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

# පාර්ලිමේන්තු සාර සංහිතා

**උපදේශකත්වය**

| | |
|---|---|
| ධම්මික දසනායක මයා | (පාර්ලිමේන්තුවේ මහ ලේකම්) |
| නීල් ඉද්දවල මයා | (නියෝජ්‍ය මහ ලේකම් හා කාර්ය මණ්ඩල ප්‍රධානි) |
| කුෂාණි රෝහණදීර මිය | (සහකාර මහ ලේකම්/පරිපාලන සේවා) |
| ටිකිරි කේ. ජයතිලක මයා | (සහකාර මහ ලේකම්/ව්‍යවස්ථාදායක සේවා) |

**සංකල්පය සහ අධීක්ෂණය**

| | |
|---|---|
| ශාන් විජේතුංග මයා | (අධ්‍යක්ෂ/සන්නිවේදන) |

**මග පෙන්වීම සහ අධීක්ෂණ සහාය**

| | |
|---|---|
| නිම්මි හාතියල්දෙණිය මිය | (කළමනාකරු/මාධ්‍ය) |
| බුද්ධිනි රාමනායක මෙය | (කළමනාකරු/මහජන සේවා) |

**සංස්කරණ උපදේශකත්වය**

ආචාර්ය ධර්මකීර්ති ශ්‍රී රංජන් මයා,
අංශ ප්‍රධාන (වැ.බ), ජනමාධ්‍ය අධ්‍යයනාංශය,
ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය.

**සංස්කරණය**

ඒ. ඩී. එදිරිවීර ගුණසේකර මයා (මාධ්‍ය නිලධාරි)

**සංස්කරණ සහාය**

| | |
|---|---|
| සෞම්‍ය ඒකනායක මයා | (මාධ්‍ය නිලධාරි) |
| ඉෂාරා වික්‍රමසිංහ මෙය | (මහජන සේවා නිලධාරි) |
| මහේෂ්වරන් පිරසාද් මයා | (මාධ්‍ය නිලධාරි) |
| නිපුනි බලගමගේ මෙය | (මහජන සේවා නිලධාරි) |
| මාධවී පෙරේරා මිය | (මාධ්‍ය නිලධාරි) |
| රිශ්මියා නූටාන් මිය | (මහජන සේවා නිලධාරි) |
| ආසිරි හපුගොඩ මයා | (මාධ්‍ය නිලධාරි) |
| පාල්සාමි රුදකුමාර් මයා | (මහජන සේවා නිලධාරි) |
| මොහොමඩ් නුෂ්කි මයා | (මාධ්‍ය නිලධාරි) |
| යශ්රි මොහොමඩ් මයා | (මහජන සේවා නිලධාරි) |
| නුවන් දුමින්ද මයා | (මාධ්‍ය නිලධාරි) |
| දුමින්ද වික්‍රමසිංහ මයා | (මහජන සේවා නිලධාරි) |
| සපුමල් ද සිල්වා මයා | (මාධ්‍ය සම්බන්ධීකාරක) |
| පී. ජේ. රොඩ්‍රිගෝ මයා | (මහජන සේවා සම්බන්ධීකාරක) |
| එස්. ජෙයප්‍රකාශ් මයා | (මහජන සේවා සම්බන්ධීකාරක) |
| ප්‍රභාත් ප්‍රේමරත්න මයා | (පුහුණු විද්‍යාර්ථී) |

## පාර්ලිමේන්තු සාර සංහිතා

ISBN 978-955-8412-14-5

**ප්‍රථම මුද්‍රණය 2020**

**සෝදුපත් බැලීම**
ටී. ආර්. එම්. අනෝරත්න මයා (නියෝජ්‍ය හැන්සාඩ් සංස්කාරක)

**කවරයේ ඡායාරූපය**
සභා ගර්භයේ ප්‍රධාන ද්වාරය (පිටුව 53)

**ඡායාරූප**
නුවන් දුමින්ද (මාධ්‍ය නිලධාරී)

**පිටු සැකසුම සහ මුද්‍රණය**
Design Waves (Pvt) Ltd.
011 2 150 100

**සංස්කරණය සහ ප්‍රකාශනය**
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

011 2  777287 / 011 2 2777328, sriparliament@gmail.com

# පටුන


පූර්විකාව | පිටු අංක

01 ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තු රීති, විනය සහ එහි ක්‍රියා පටිපාටිය පිළිබඳ විමර්ශනයක් — 01
ධම්මික දසනායක

02 ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තු ක්‍රමය සහ එහි සම්ප්‍රදාය — 09
නීල් ඉද්දවල

03 පාර්ලිමේන්තු ස්ථාවර නියෝග සහ මන්ත්‍රීවරයන් සඳහා වූ චර්යාධර්ම සංග්‍රහය පිළිබඳ විමසුමක් — 15
කුෂාණි රෝහණදීර

04 නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය සහ පාර්ලිමේන්තු කමිටු ක්‍රමය පිළිබඳ විමංසනයක් — 19
ටිකිරි කේ. ජයතිලක

05 පාර්ලිමේන්තු රැස්වීම් දිනයක දී මන්ත්‍රීවරයෙකුට සක්‍රීය දායකත්වය ලබාදිය හැකි ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය පිළිබඳ විග්‍රහයක් — 23
එච්. ඊ. ජනකාන්ත සිල්වා

06 නව පාර්ලිමේන්තුවක ආරම්භක දිනය සහ එහි ක්‍රියාපටිපාටිය — 27
නිම්මි හාතියල්දෙනිය

07 තිරසර සංවර්ධන අරමුණු පාර්ලිමේන්තු කටයුතු සමඟ සම්බන්ධ කිරීම — 31
ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන

08 ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහ ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විග්‍රහයක් — 37
එච්. ඩී. එදිරිවීර ගුණසේකර

09 පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පතක් සම්මත කිරීම සහ එහි ක්‍රමවේදය — 43
එච්. ඩී. එදිරිවීර ගුණසේකර

10 පාර්ලිමේන්තු හැන්සාඩ් වාර්තාව ගැන හැඳින්වීමක් සහ හැන්සාඩ් වාර්තාවේ පළමුවන වෙළුම — 45
ගුණවතී පිටවල

11 ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තුවේ සෙංකෝලයෙහි බලාධිකාරය සහ එහි ප්‍රෞඪත්වය — 49
සෞම්‍ය ඒකනායක

## පටුන


පිටු අංක

12 **ශ්‍රී ලාංකේය කාන්තා දේශපාලනය සහ එහි ස්වරූප** 51
බුද්ධිනී රාමනායක

13 **ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තුවේ සභා ගර්භයෙහි ප්‍රධාන ද්වාරය** 53
සෞම්‍ය ඒකනායක

14 **ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තුවේ සභා ගර්භය සහ එහි සීමාව** 55
නිම්මි හාතියල්දෙනිය

15 **ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තුවෙහි මාධ්‍ය මධ්‍යස්ථානය සහ එහි කටයුතු** 57
මහේෂ්වරන් පිරසාද්

16 **නිදහස් ශ්‍රී ලංකේය පාර්ලිමේන්තු ක්‍රමයේ විකාශනය; විස්තරාත්මක විමංසනයක්** 59
නිපුනි බලගමගේ

17 **පාර්ලිමේන්තු ස්ථාවර නියෝග සරලව** 67

# පූර්විකාව

රාජ්‍ය යාන්ත්‍රණය වඩාත් ක්‍රමවත්ව පවත්වා ගනිමින් විධිමත් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට රට යොමු කිරීමේ වගකීම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සතුවේ. ඒ සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සියල්ලෝම කැප වී සිටිති. එහිදී නීති සම්පාදන කාර්යය පාර්ලිමේන්තුවට පැවරෙන භාරධූර වගකීමකි. ශ්‍රී ලාංකිකයෝ වන සියල්ලෝම පාර්ලිමේන්තුවේ එකී කාර්යය දෙස අවධානය යොමුකර සිටිති. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් ජනතාව අපේක්ෂා කරන කාර්යයන් නිසි පරිදි ඉටු කිරීම සඳහා අපි ඔවුන්ට සහාය වන්නෙමු. පාර්ලිමේන්තු මහලේකම්තුමාගේ කාර්ය මණ්ඩලය යටතේ ක්‍රියාත්මක සන්නිවේදන දෙපාර්තමේන්තුව ද එම කාර්යයේ දී ඉතා වටිනා මෙහෙවරක් ඉටුකරයි. “පාර්ලිමේන්තු සාර සංහිතා” නම් මෙම ග්‍රන්ථය ලියැවෙන්නේ එම මෙහෙවරෙහි එක් ආනුශාංගික කාරණයක් ලෙසිනි. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් අතට පත්වන මෙම ග්‍රන්ථය තුළ පාර්ලිමේන්තුව හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව තොරතුරු සම්පිණ්ඩනය කර ඇත.

පාර්ලිමේන්තු ක්‍රමය සහ සම්ප්‍රදායන්, නව පාර්ලිමේන්තුවක ආරම්භක දිනයේ ක්‍රියාපටිපාටිය, නියෝජිත ප්‍රජාත්‍රන්ත්‍රවාදය හා පාර්ලිමේන්තු කාරක සභා ක්‍රමය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයේ ව්‍යුහය, පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පතක් සම්මත කිරීමේ ක්‍රමවේදය, පාර්ලිමේන්තු හැන්සාඩ් වාර්තාව, පාර්ලිමේන්තුවේ බලාධිකාරයේ සහ ප්‍රෞඪත්වයේ සංකේතය වන සෙංකෝලය, පාර්ලිමේන්තු කාරක සභා, පාර්ලිමේන්තු මාධ්‍ය මධ්‍යස්ථානය, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග වැනි තේමා රැසක් යටතේ මෙම ග්‍රන්ථයට තොරතුරු ඇතුළත්ය. එය ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා මනා පිටිවහලක් බව අපි විශ්වාස කරන්නෙමු.

එමෙන්ම ගෝලීය යාන්ත්‍රණය තුළ පවතින ගැටලුකාරි ප්‍රපංචයන්ට පිළිතුරු සෙවීම සඳහා සියල්ලන්ම ඒකාබද්ධ යාන්ත්‍රණයක පිහිටා කටයුතු කිරීමේ කාලීන අවශ්‍යතාව ද වර්තමානයේ දී මතුව ඇත. ඒ සඳහා අපි සියල්ලෝම එක්විය යුත්තෙමු. සහස්‍ර සංවර්ධන ඉලක්ක ජය ගනිමින්, වඩා විනිදහාවයකින් යුතු ගෝලීය ප්‍රපංචයන් දේශීය වශයෙන් ජය ගැනීම සඳහා ද විශේෂ අවධානයක් යොමුකළ යුතු බව ද කිව යුතු මනා ය.

ශාන් විජේතුංග
අධ්‍යක්ෂ/සන්නිවේදන
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
shan_w@parliament.lk

# ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තු රීති, විනය සහ එහි ක්‍රියා පටිපාටිය පිළිබඳ විමර්ශනයක්

ධම්මික දසනායක
මහ ලේකම්
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
dhammika_d@parliament.lk



නීති සම්පාදනය කිරීමේ උත්තරීතර ආයතනය වන පාර්ලිමේන්තුවේ සියලු කටයුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ස්ථාවර නියෝග සහ සම්ප්‍රදාය අනුව සිදුවේ. ස්ථාවර නියෝග (3) අනුව මහ මැතිවරණයට පසු පාර්ලිමේන්තුව රැස්වන ප්‍රථම දිනයේදී එක් එක් මන්ත්‍රීවරයාට ආසන පහසුකම් වෙන්කර දෙනු ලබන තෙක් මන්ත්‍රීවරයන්ට සභාගර්භ සීමාව ඇතුළත ඇති කවර හෝ ආසනයක අසුන්ගත හැකිය. ආසන වෙන්කිරීම කථානායකවරයාගේ අභිමතය පරිදි සිදුවන අතර ඔහුගේ තීරණය අවසාන තීරණය වේ. කෙසේ වුවද ආසන පැනවීමේ දී අදාළ මන්ත්‍රීවරයන් සභාවේ දරන නිලතල, අමාත්‍ය ධුරයක් දැරීම, පක්ෂ නායකයන් වීම, ජ්‍යෙෂ්ඨත්වය සහ නම්වල අකාරාදි පිළිවෙළ යන කරුණු සම්ප්‍රදායට අනුව කථානායකවරයාගේ සැලකිල්ලට බඳුන් වේ.

පාර්ලිමේන්තුව රැස්වන්නේ මාසයක පළමු ඉරිදාට පසුව එළඹෙන සතියෙන් පළමු හා තුන්වන සති දෙකෙහි දී ය. එම සතිවල අගහරුවාදා, බදාදා, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා යන දිනවල පාර්ලිමේන්තුව රැස්වන අතර අඟහරුවාදා සහ බදාදා දිනවල ප. ව. 1.00 සිට ප. ව. 7.30 දක්වා ද බ්‍රහස්පතින්දා සහ සිකුරාදා දිනවල පෙ. ව. 10.30 සිට ප. ව. 7.30 දක්වා ද පාර්ලිමේන්තුව පැවැත් වේ.

නමුත් දෙසැම්බර් මස 31 වැනි දිනට පෙර දින විසි හයකට නොවැඩි දින ගණනක් විසර්ජන පනත් කෙටුම්පත සලකා බැලීම සඳහා වෙන් කරයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 73 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව සහ ස්ථාවර නියෝග 11 අනුව පාර්ලිමේන්තුවේ ගණපූරණය මූලාසනාරූඪ මන්ත්‍රීවරයා ද ඇතුළුව මන්ත්‍රීවරයන් විසි දෙනෙකුගෙන් සමන්විත වියයුතු වේ. කාරක සභාවල ගණපූර්ණය ස්ථාවර නියෝග මඟින් නියම කර ඇති අතර එසේ නොවන විට අදාළ කමිටුවට තීරණය කළ හැකි ය. යම් අවස්ථාවක දී ගණපූරණයක් නොපවතින බව කථානායකවරයාගේ හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයාගේ අවධානයට යොමුකරනු ලැබුවහොත් බෙදුම් සීනුව නාද කිරීමට කථානායකවරයා හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා අණකරනු ලැබිය යුතුය. එසේ බෙදුම් සීනුව නාද කිරීමෙන් මිනිත්තු පහක් ගතවීමෙන් අනතුරුව ගණපූරණයක් නොමැති නම් කථානායකවරයා හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල්තැබිය යුතු ය.

ස්ථාවර නියෝග 13 අනුව පාර්ලිමේන්තුවේ වැඩකටයුතු සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පවත්වාගෙන යා යුතු ය. මේ අනුව න්‍යාය පුස්තකය සහ න්‍යාය පත්‍රය මෙම භාෂා ත්‍රිත්වයෙන්ම පළකිරීම සිදුවන අතර කථා සහ  අනෙකුත් වැඩකටයුතු සමගාමීව අනෙකුත් භාෂා දෙකට පරිවර්තනය කළ යුතු ය. පවත්වනු ලබන කතා ඒවා පැවැත්වූ භාෂාවෙන්ම හැන්සාඩ් වාර්තාවේ පළ කරනු ලැබිය යුතු අතර කථිකයාගේ නම භාෂා ත්‍රිත්වයෙන්ම සඳහන් කළ යුතු ය. තවද හැන්සාඩ් වාර්තාවේ ඉදිරිපස කවරය ද භාෂා ත්‍රිත්වයෙන් මුද්‍රණය කිරීම ද සිදු වේ.

ස්ථාවර නියෝග සහ සම්ප්‍රදායන් අනුව පාර්ලිමේන්තු රැස්වීමක වැඩකටයුතු සිදුකරන ක්‍රමවේදයක් සහ පිළිවෙළක් තිබේ. ස්ථාවර නියෝග 22 හි පාර්ලිමේන්තුවේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ මෙම අනුපිළිවෙළ පැහැදිලිව  සඳහන් වේ.

(1) අභිනව මන්ත්‍රීවරයන්ගේ නිල ප්‍රතිඥාව හෝ දිවුරුම

(2) ජනාධිපතිවරයාගෙන් ලැබෙන සංදේශ

(3) කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන

(4) ලිපිලේඛනාදිය පිළිගැන්වීම

(5) කාරක සභා වාර්තා පිළිගැන්වීම

(6) මහජන පෙත්සම් පිළිගැන්වීම

(7) වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

(8) නොපැමිණීමේ අවසරය පිළිබඳ යෝජනා

(9) අමාත්‍යාංශ නිවේදන

(10) පෞද්ගලික පැහැදිලි කිරීම්

(11) වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්න

(12) ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී දැනුම්දීමක් අවශ්‍ය නොවන යෝජනා

(13) ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී දැනුම්දීමක් අවශ්‍ය යෝජනා

(14) ශෝක ප්‍රකාශ යෝජනා

(15) ප්‍රධාන වැඩකටයුතු

යන්න එම අනුපිළිවෙළය.

සාමාන්‍යයෙන් දවසේ වැඩපිළිවෙළ මෙසේ දැක්විය හැකි වුව ද සෑම දිනකම මෙහි සඳහන් සෑම කාරණයක්ම සලකා බැලීමට බඳුන් නොවේ. පාර්ලිමේන්තුවේ ප්‍රධාන වැඩකටයුතු, දිනට නියමිත කටයුතු සහ යෝජනා පිළිබඳ දැනුම්දීම්වලින් සමන්විත ය. පනත් කෙටුම්පත්, නියෝග, යෝජනා සම්මතයක් හෝ වෙනත් කාරණා දිනට නියමිත වැඩකටයුතු යටතට අයත් වේ. යම් මාසයක පළමු සිකුරාදා රැස්වීම හැර අනෙකුත් සෑම දිනකම ආණ්ඩුවේ කටයුතු සඳහා ප්‍රමුඛස්ථානය හිමි වේ.

පාර්ලිමේන්තුව කල් තැබීමක් යනුවෙන් අදහස් කෙරෙනුයේ දැනුම් දීමකින් පසුව ඉදිරිපත් කරන ලද යෝජනාවක් අනුව අන්කිසි නියමිත දිනකට පාර්ලිමේන්තුව කල් තබන ලෙස පාර්ලිමේන්තුව නියෝග කර ඇත්නම් මිස, පාර්ලිමේන්තුව සිරිත් පරිදි රැස්වන ඊළඟ දිනය තෙක් කල් තැබීමකි. දින නියමයක් නොමැති කල් තැබීමේ යෝජනාවක් පිළිගනු නොලැබිය යුතු ය. හතළිස් අට පැයකට වැඩි කාලයක් පවතින කල් තැබීමක් තුළ දී පාර්ලිමේන්තුව නැවත රැස්වීමට නියම කරන ලද දිනකට කලින් දිනකට පාර්ලිමේන්තුව කැඳවන ලෙස අග්‍රාමාත්‍යවරයා විසින් කථානායකවරයාගෙන් ඉල්ලුම් කරනු ලබයි නම්, එම ඉල්ලීමේ

දක්වා ඇති පරිදි පාර්ලිමේන්තුව කැඳවමින් කථානායකවරයා විසින් දැනුම්දීමක් කරනු ලැබිය යුතු ය. එවිට කථානායකවරයාගේ දැනුම්දීමෙහි නියම කරන ලද දින නියමිත වේලාවට පාර්ලිමේන්තුව රැස්වී එම දින සහ වේලාව වන තෙක් යථා පරිදි කල් තබන ලද්දාක් මෙන් පාර්ලිමේන්තුව ස්වකීය වැඩකටයුතුවල යෙදිය යුතුය. මෙවැනි දැනුම්දීමක් නිකුත් කරනු ලැබීමේ දී, පාර්ලිමේන්තුව කැඳවනු ලබන දිනය සහ වේලාව මන්ත්‍රීවරයන්ට දැන්වීමට ගත හැකි සෑම පියවරක් ම කථානායකවරයා විසින් ගනු ලැබිය යුතු ය.

එමෙන්ම පාර්ලිමේන්තුවට පෙත්සම් ඉදිරිපත් කිරීමට මහජනතාවට අවස්ථාව පවතී. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන සෑම පෙත්සමක් ම කථානායකවරයා ආමන්ත්‍රණය කරමින් ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය. සෑම මහජන පෙත්සමක්ම ඉදිරිපත් කල යුත්තේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු මාර්ගයෙනි. සෑම පෙත්සමක් ම ගෞරවාන්විත භාෂාවෙන් ඉදිරිපත් කළ යුතු ය. එහි අදාළ නොවන ප්‍රකාශ අන්තර්ගත නොවිය යුතු අතර ඉල්ලා සිටින සහනය ප්‍රකාශ කරන අභියාචනයකින් එය අවසන් විය යුත්තේය.

පාර්ලිමේන්තු අණ පනත් යටතේ ගෙන එනු ලබන යෝජනා සම්මතයන්, විධිවිධාන, නියම, නියෝග, පරිපූරක ඇස්තමේන්තු යනාදිය සභාගර්භයේ දී පිළිගැන්වීම නීතිමය අවශ්‍යතාවක් වන අතර, අදාළ විෂයභාර අමාත්‍යවරයා විසින් එය සිදු කරනු ලබයි. අමාත්‍යාංශ යටතට නොගැනෙන ලිපි ලේඛනාදිය පිළිගැන්වීම සිදු කරන්නේ ගරු කථානායකවරයා ය.

එමෙන්ම වාර්ෂික කාර්ය සාධන වාර්තා, ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව වැනි විවිධ අමාත්‍යාංශවල, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශන යනාදිය ද මෙහිදී පිළිගැන්වෙයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ.6 ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා සහ පරිපාලනය පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් වැනි ව්‍යවස්ථාපිත ආයතන යටතට ගැනෙන වාර්තා ද පාර්ලිමේන්තුවේ දී පිළිගැන්වීම සිදු වෙයි.

ප්‍රශ්න හෝ යෝජනා පිළිබඳ දැනුම් දිය යුත්තේ දැනුම් දෙනු ලබන මන්ත්‍රීවරයාගේ අත්සන දරන ලියවිල්ලක් මහලේකම්වරයා නමට ලිවීමෙනි. එවැනි දැනුම්දීම් පාර්ලිමේන්තුව රැස් වී සිටින කවර වේලාවක දී හෝ මහ ලේකම්වරයාට භාර දෙනු ලැබිය හැකි ය. එසේ නැතහොත්, කවර වේලාවක දී හෝ මහ ලේකම්වරයාගේ කාර්යාලයට යවනු ලැබිය හැකි ය, නැතහොත් බාරදෙනු ලැබිය හැකි ය. රීති විරෝධී යැයි කථානායකවරයා විසින් තීන්දු කරනු ලබන යම් ප්‍රශ්නයක් හැර මහ ලේකම්වරයාට දැනුම්දීම් ලැබී ඇති සියලු ප්‍රශ්න, දැනුම් දෙන ලද දින සිට සම්පූර්ණ දින හතක් ඉකුත් වීමට පෙර නොයෙදෙන දිනයක දී පිළිතුරු ලැබීම සඳහා පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුළත් කළ යුතු ය.

යම් කාරණයකට අදාළව ඡන්දය විමසීමේ දී "පක්ෂයි සහ විරුද්ධයි" යනුවෙන් කටහඬවල් අනුව ඡන්දය ලබාගෙන කථානායකවරයා විසින් ප්‍රතිඵලය ප්‍රකාශ කරනු ලැබිය හැකි ය. කථානායකවරයාගේ තීරණය සමඟ යම් මන්ත්‍රීවරයකු එකඟ නොවන්නේ නම්, කථානායකවරයා විසින් තීරණය කළ හැකි ස්ථාවර නියෝගවල සඳහන් ක්‍රමයකට ඡන්දයක් සඳහා බෙදීමක් ඉල්ලා සිටිය හැකි ය.

කථානායකවරයා විසින්, තීරණයට පක්ෂව හා විරුද්ධව ප්‍රකාශ කර ඇති ඡන්ද ගණන නිවේදනය කල යුතුය. ඡන්ද සංඛ්‍යා සමාන නම්, කථානායකවරයාට තීරක ඡන්දය ලබා දිය හැකි ය. කථානායකවරයා විසින්, ඉන්පසු ඡන්ද විමසීමෙහි ප්‍රතිඵලය ප්‍රකාශ කළ යුතු ය. ඡන්දය විමසීමක දී සටහන් කළ, සංඛ්‍යා හෝ නම් සම්බන්ධයෙන් නිවැරදි කළ නොහැකි පැටලිලි සහගත තත්ත්වයක් ඇතිවූ අවස්ථාවක දී කථානායකවරයා විසින් වහාම තවත් ඡන්ද විමසීමක් වෙත පාර්ලිමේන්තුව යොමු කළ යුතු ය.

යම් මන්ත්‍රීවරයකු විසින් සිය ඡන්දය වැරදි ලෙස භාවිතා කරන ලද බව හෝ යම් ඡන්දයක් වැරදි ලෙස ගණින් ගත් බව හෝ ප්‍රකාශ කරයි නම්, එම වරද නිවැරදි කරන ලෙස එම මන්ත්‍රීවරයා විසින් ඉල්ලා සිටිය හැකි ය. එසේ වුව ද, කථානායකවරයා විසින් ඡන්දය දීම සඳහා ඉඩ ලබා දෙනු ලැබූ කාලය අවසාන වූ බවට ප්‍රකාශ කරනු ලැබීමට පෙර එම මන්ත්‍රීවරයා විසින් එම ඉල්ලීම යොමු කළ යුතු ය.

විනය රීති පිළිපැදීම පිළිබඳ වගකීම පිළිවෙළින් පාර්ලිමේන්තුව තුළ දී නම් කථානායකවරයා විසින් ද, යම් කාරක සභාවක් තුළ දී නම් එහි සභාපතිවරයා විසින් ද දරනු ලබයි. රීති ප්‍රශ්නයක් පිළිබඳව කථානායකවරයා හෝ කාරක සභා සභාපතිවරයා හෝ විසින් දෙනු ලබන තීරණයකට විරුද්ධව අභියාචනයකට අවස්ථාව නැත.

විවාදයක් පවතින අතරතුර කථානායකවරයා හෝ සභාපතිවරයා හෝ යමක් පවසන කවර හෝ අවස්ථාවක දී, කථා කරමින් සිටින හෝ කථා කිරීමට අවස්ථාව ලබා දී ඇති හෝ යම් මන්ත්‍රීවරයකු විසින් අසුන් ගනු ලැබිය යුතු ය. කථානායකවරයා හෝ සභාපතිවරයා හෝ විසින් පවසන දෙය යම් බාධාවක් නොමැතිව ඇසෙන සේ පාර්ලිමේන්තුව හෝ කාරක සභාව නිශ්ශබ්ද විය යුතු ය.

රීති ප්‍රශ්නයක් නගා ඇති අවස්ථාවක දී, එම ප්‍රශ්නය නගන මන්ත්‍රීවරයා විසින් සිය අසුනේ නැවත අසුන් ගනු ලැබිය යුතුය. කථානායකවරයා හෝ සභාපතිවරයා හෝ ප්‍රශ්නය විසඳනු ලබන තෙක්, කථානායකවරයාගේ හෝ සභාපතිවරයාගේ හෝ අවසරය ඇතිව මිස වෙනත් යම් මන්ත්‍රීවරයකු නැඟී නොසිටිය යුතු ය. ප්‍රශ්නය නගන ලද වේලාවේ පාර්ලිමේන්තුව අමතමින් සිටි මන්ත්‍රීවරයාට මූලාසනයේ තීරණයට අනුකූලතාව දක්වමින්, ස්වකීය කථාව නැවතත් කරගෙන යාමට හිමිකම ඇත.

යම් මන්ත්‍රීවරයකු මූලාසනයේ අධිකාරිය නොතැකීම හෝ නිරන්තරයෙන් ම හිතාමතාම හෝ අන්‍යාකාරයෙන් පාර්ලිමේන්තුවේ වැඩකටයුතුවලට බාධා කිරීම මඟින් පාර්ලිමේන්තුවේ රීති අනිසි ලෙස භාවිත කිරීමේ වරද කරනු ලැබූ විගසම කථානායකවරයා විසින්, එම මන්ත්‍රීවරයා නම් කරනු ලැබූ කවර හෝ අවස්ථාවක දී "එම මන්ත්‍රීවරයාගේ පාර්ලිමේන්තු සේවය අත්හිටවනු ලැබිය යුත්තේ ය" යනුවෙන් කරන ලද යෝජනාවක් මත (කිසිම සංශෝධනයකට කල් තැබීමකට හෝ විවාදයකට ඉඩ ලබානොදී) කථානායකවරයා විසින් ප්‍රශ්නය වහාම විමසනු ලැබිය යුත්තේ ය.

එවැනි යම් යෝජනාවක් සම්මත වී මෙම ස්ථාවර නියෝගය යටතේ යම් මන්ත්‍රීවරයකුගේ පාර්ලිමේන්තු සේවය අත්හිටවනු ලැබ ඇත්නම්, එසේ එම මන්ත්‍රීවරයාගේ සේවය අත්හිටවීම පළමු අවස්ථාවේ දී සති දෙකකට ද, එම සභා වාරයේ ම දෙවැනි අවස්ථාවේ දී සති තුනකට ද, එම සභා වාරයේ ම තෙවැනි හෝ ඊට පසුව එළඹෙන කවර හෝ අවස්ථාවක දී සති හතරකට ද වශයෙන් විය යුතු ය.

එසේ වුව ද, පාර්ලිමේන්තු සේවය අත්හිටවනු ලැබ ඇත්තේ කවර මන්ත්‍රීවරයකුගේ ද, එම මන්ත්‍රීවරයාට එම අත්හිටවනු ලැබීම බලපැවැත්වෙන කාලසීමාව තුළ දී විසර්ජන පනත් කෙටුම්පතේ අවසන් ඡන්ද විමසීමේ දී පමණක් ඡන්දය භාවිත කරනු ලැබීමට කථානායකවරයා විසින් අවසර ලබා දිය හැකි ය.

සෙංකෝලය පාර්ලිමේන්තුවේ සභාගර්භය ඇතුළත තබා ඇති අවස්ථාවක දී, එය ස්පර්ශ කිරීම හෝ එසවීම හෝ මඟින් බරපතළ විනය විරෝධී ක්‍රියාවක් සිදු කරනු ලබන යම් මන්ත්‍රීවරයකු විසින් එම වරද සිදු කරනු ලබනුයේ පළමුවරට යන කාරණය නොසලකා එම මන්ත්‍රීවරයාගේ පාර්ලිමේන්තු සේවය සති හතරකට අත්හිටුවයි.

එමෙන්ම පැමිණ සිටින මන්ත්‍රීවරයන් කිහිප දෙනෙකු එක්ව මූලාසනයේ අධිකාරිය නොතකා ඇත්නම් මිස, එකම අවස්ථාවේ දී එක් මන්ත්‍රීවරයකුට වඩා වැඩි දෙනෙකු නම් කිරීම කරනු නොලැබිය යුතු යි. ස්ථාවර නියෝග යටතේ පාර්ලිමේන්තු සේවය අත්හිටවනු ලැබ ඇති යම් මන්ත්‍රීවරයෙකු හෝ එක්ව ක්‍රියා කළ මන්ත්‍රීවරයන් හෝ එසේ සේවය අත්හිටවනු ලැබ ඇති කාල සීමාව තුළ පාර්ලිමේන්තු පරිශ්‍රයෙන් ඉවත් වීම සඳහා කථානායකවරයා විසින් කරනු ලබන විධානය පිළිපැදීම ප්‍රතික්ෂේප කරනු ලබයි නම්, කථානායකවරයා විසින් සිය විධානය බලාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීමට නියෝග කරයි.

ඉහත පරිදි වරදක් පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක් තුළ දී කරනු ලැබුවහොත්, සභාපතිවරයා විසින් කාරක සභාවේ වැඩකටයුතු වහාම අත්හිටවනු ලැබ සිද්ධියට අදාළ කරුණු පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුතු ය. ඉන් අනතුරුව ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් මත, එම වරද පාර්ලිමේන්තුව තුළ දී කරන ලද්දක් මෙන් සලකා, සංශෝධනයක්, කල් තැබීමක් හෝ විවාදයක් නොමැතිව කථානායකවරයා විසින් එය  විමසනු ලබයි.

විවාදයක දී, තමා විසින් ම කරන ලද හෝ වෙනත් මන්ත්‍රීවරයන් විසින් හෝ කරන ලද තර්ක නිරන්තරයෙන් අදාළ නොවන හෝ වෙහෙසකර ලෙස නැවත නැවතත් ප්‍රකාශ කිරීමෙහි යෙදෙන මන්ත්‍රීවරයකුගේ හැසිරීම කෙරෙහි පාර්ලිමේන්තුවේ සැලකිල්ල යොමු කරවා, එම මන්ත්‍රීවරයාගේ කථාව අඛණ්ඩව කර ගෙන යෑම නවත්වන ලෙස සහ සජීවී විකාශය නවත්වන ලෙස නියෝග කිරීමේ බලය කථානායකවරයා සතු ය.

බරපතළ ලෙස විනය විරෝධීව හැසිරෙන මන්ත්‍රීවරයෙකුට එදින රැස්වීමේ ඉතිරි කොටස අවසන් වන තෙක් පාර්ලිමේන්තුවෙන් වහාම ඉවත් වන ලෙස කථානායකවරයා විසින් නියෝග කළ හැකි අතර, සිය නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට නියම කරයි. වේත්‍රධාරීවරයා විසින් එම නියෝගය ක්‍රියාවේ යෙදවීම සඳහා කටයුතු කළ යුතු ය.

යම් මන්ත්‍රීවරයකු පාර්ලිමේන්තු පරිශ්‍රයෙන් ඉවත් කර ඇති විටක දී, එසේ අත්හිටවන ලද කාල සීමාව තුළ, කාරක සභාවලට සහභාගී වීමට ද එම මන්ත්‍රීවරයන්ට තහනම් ය. පාර්ලිමේන්තුව තුළ පැන නඟින බරපතළ විනය විරෝධී තත්ත්වයක දී කථානායකවරයා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන්නේ නම්, ප්‍රශ්නය නොවිමසා සභාව කල් තබනු ලැබීමට හෝ කථානායකවරයා විසින් නිශ්චය කරනු ලබන කාල සීමාවකට රැස්වීම අත්හිටවනු ලැබීමට එතුමාට බලය තිබේ.

විවාදයක දී නොසැබි වූ නොහිසි වචන පාවිච්චි කර, එවැනි අනුචිත වචන පාවිච්චි කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව සෑහීමකට පත්වන ලෙස තම කනගාටුව ප්‍රකාශ කර නොමැති යම් මන්ත්‍රීවරයකු හෝ ස්ථාවර නියෝගවල නිශ්චිතව දක්වා නොමැති යම් රීතියක් කඩ කරන ලද යම් මන්ත්‍රීවරයකුට එරෙහිව පාර්ලිමේන්තුව විසින් සුදුසු යැයි සලකනු ලබන කවර හෝ ආකාරයකින් කටයුතු කරනු ලැබිය හැකි ය. යම් මන්ත්‍රීවරයකු විසින් දිගින් දිගටම අයෝග්‍ය ලෙස හැසිරෙන බව හෝ ස්ථාවර නියෝග උල්ලංඝනය කරමින් කටයුතු කරනු ලබන බව කථානායකවරයාගේ මතය වන්නේ නම්, පාර්ලිමේන්තුවේ කටයුතු පිළිබඳව සජීවී විකාශය වහාම අත්හිටවනු ලබන ලෙස නියෝග කිරීමට කථානායකවරයාට බලය තිබේ.

අනුචිත හෝ නුසුදුසු  වචන විවාදයක දී භාවිත කර ඇති විටක දී ,එම වචන හෝ ප්‍රකාශ හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙස හා එම වචන ප්‍රකාශ නොකරන ලද සේ සලකනු ලැබිය යුතු බවට නියෝග කිරීම කථානායකවරයාට සිය අභිමතානුසාරී බලය භාවිත කරමින් කරනු ලැබිය හැකිය. එමෙන්ම ජනාධිපතිවරයාගේ හෝ වැඩබලන ජනාධිපතිවරයාගේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ, විනිශ්චයකාරවරයන්ගේ හෝ යුක්තිය පසිඳලීමෙහි නියුක්ත අන් තැනැත්තන්ගේ පෞද්ගලික පැවැත්ම පූර්ණ යෝජනාවකින් හැර මතු කරනු නොලැබිය යුතු ය. යම් වැඩකටයුතුවල දී, අමාත්‍යවරයකු වෙත යොමු කරනු ලබන ප්‍රශ්නයක් හෝ වෙනත් යම් විෂයයක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් මත සිදු කරනු ලබන විවාදයක දී එවැනි යම් තැනැත්තකුගේ පැවැත්ම සම්බන්ධයෙන් සඳහන් කිරීම රීත්‍යනුකූල නොවේ.

කිසිම මන්ත්‍රීවරයකු විසින් සිය කථාවේ වරදවා තේරුම් ගෙන තිබෙන යම් වැදගත් කොටසක්, එම කොටසට වෙනත් අලුත් කාරණා ඇතුළත් නොකර එම කොටස පහදා දීමේ කාර්ය පිණිස; හෝ රීති ප්‍රශ්නයක් මත; හෝ විනා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති කිසිම කාරණයක් සම්බන්ධයෙන් එක් වරකට වඩා කථා කරනු නොලැබිය යුතු ය. යම් යෝජනාවක් හෝ සංශෝධනයක් ඉදිරිපත් කරනු ලබන මන්ත්‍රීවරයකුට එය සනාථ කරමින් කථා කළ හැකි ය. එසේ වුව ද, එම යෝජනාව හෝ සංශෝධනය නිසි ලෙස ස්ථිර කරනු ලබන තෙක් ඒ පිළිබඳ වැඩිදුර විවාදයකට ඉඩ නැත. ඒ සම්බන්ධයෙන් කිසිම ප්‍රශ්නයක් පාර්ලිමේන්තුවෙන් විමසිය නොහැක. කවර හෝ මන්ත්‍රීවරයකුට ස්වකීය ආසනයෙන් නැගී සිට මූලාසනයට හිස නැමීමෙන් විවාදයේ යම් පසු අවස්ථාවක දී තමාට කථා කිරීමට ඇති අයිතිවාසිකමට හානියක් නොමැතිව, යෝජනාවක් හෝ සංශෝධනයක් ස්ථිර කළ හැකි ය. යම් කාරණයක් සම්බන්ධයෙන්, "පක්ෂයි" සහ "විරුද්ධයි" යනුවෙන් හඬ නැගීමෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට අවස්ථාව හිමිවේ. විවාද කළ යුතු ප්‍රශ්නයක් සභාවට ඉදිරිපත් කර, විවාද කොට, අවසන් කරනු ලැබූ පසු, කථානායකවරයාගේ අවසරය නොමැතිව කවර හෝ මන්ත්‍රීවරයකුට එම සභා වාරයේදී ම එම ප්‍රශ්නය නැවත වරක් ඉදිරිපත් කළ නොහැකි ය.

සෑම මන්ත්‍රීවරයකු විසින්ම කථානායකවරයා අමතමින් සිය අදහස් ප්‍රකාශ කිරීම කළ යුතු ය. කථානායකවරයාගේ අවසරය ඇතිව ඔවුන් තමාට වෙන්කර තිබෙන ආසනයෙන් නැගී සිට කථා කළ යුතුය. මන්ත්‍රීවරයකුගේ කථාවකට බාධාකළ හැක්කේ රීති ප්‍රශ්නයක් මත හෝ කථා කරනු ලබන මන්ත්‍රීවරයා විසින් මැදිහත්වීමට අවසරය දෙනු ලැබුවහොත් පමණි. මන්ත්‍රීවරයකු විසින් සිය අදහස් ප්‍රකාශ කිරීම අවසන් කළ විට, එම මන්ත්‍රීවරයා විසින් සිය ආසනයෙහි නැවත අසුන් ගත යුතුය. මන්ත්‍රීවරයන් දෙදෙනකු එකවර නැගී සිටියහොත්, කථානායකවරයා විසින් තමාගේ ඇසට පළමුවෙන් හසුවන මන්ත්‍රීවරයාට පාර්ලිමේන්තුව ඇමතීමට අවස්ථාව ලබාදෙයි. සෑම මන්ත්‍රීවරයකු විසින්ම සිය අදහස් ප්‍රකාශ කිරීම සාකච්ඡාවට භාජනය වෙමින් පවතින විෂයයට සීමා කළ යුතුය. කිසිම මන්ත්‍රීවරයකු විසින් යම් යෝජනාවක දී හෝ විවාදයක දී අධිකරණයේ විනිශ්චයට භාජන වෙමින් පවතින හෝ අධිකරණයේ තීන්දුව දීමට නියමිතව තිබෙන යම් කාරණයක් පිළිබඳව සඳහන් කළ නොහැකි ය. එවැන්නක් සිදු කරන කවර හෝ මන්ත්‍රීවරයකුට සිය ආසනයෙහි අසුන් ගන්නා ලෙස නියෝග කිරීමට කථානායකවරයාට හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයාට බලය තිබේ. කථා කරමින් සිටින හෝ සභාවේ පැමිණ සිටින යම් මන්ත්‍රීවරයකු විසින්, අපහාසාත්මක හෝ අනිසි වචන පාවිච්චි කරනු ලැබුවහොත්, කථානායකවරයා විසින් ඒ මන්ත්‍රීවරයාට රීත්‍යනුකූල වන ලෙස නියෝග කරයි. එවිට එම සඳහන් කිරීම පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙස නියෝග කිරීමට කථානායකවරයාට බලය ඇත.

කිසිම මන්ත්‍රීවරයකු වෙනත් මන්ත්‍රීවරයකුට අයුතු චෝදනාවක් කිරීම හෝ වෙනත් මන්ත්‍රීවරයකුගේ පෞද්ගලික කටයුතු සම්බන්ධයෙන් සඳහන් කිරීම හෝ නොකළ යුතු ය. මන්ත්‍රීවරයකු විසින්, පාර්ලිමේන්තුව ඉදිරියේ ඇති විෂය කරුණට අදාළ වන ලෙස කථා කළ යුතු ය. පාර්ලිමේන්තුව ඉදිරියේ ප්‍රශ්නයක් ඉදිරිපත් කර නොතිබුණ ද, පාර්ලිමේන්තුවේ කැමැත්ත ඇතිව මන්ත්‍රීවරයකුට තමා සම්බන්ධව පෞද්ගලික ස්වභාවයේ කාරණා පැහැදිලි කළ හැකි ය. එහෙත් එවැනි කාරණා විවාදයකට භාජනය කළ නොහැකි ය. එමෙන්ම එම කථාව එම මන්ත්‍රීවරයාගේ පැවැත්ම නිදොස් කිරීමට පමණක් සීමා කරයි. පනත් කෙටුම්පතක්, නියෝග යක්, යෝජනා සම්මතයක් හෝ යෝජනාවක් ඉදිරිපත් කරනු ලබන මන්ත්‍රීවරයකුට විවාදය අවසානයේ දී පිළිතුරු දීම සඳහා අයිතිවාසිකමක් තිබේ. රීතිවලින් බැහැරවන කවර හෝ මන්ත්‍රීවරයකු වහාම සභාවේ රීතිවලට අනුකූල විය යුතු බවට කථානායකවරයා විසින් නියම කරයි.

ඡන්දය ප්‍රකාශ කරන අවස්ථාවේ දී හැර, මන්ත්‍රීවරයන් විසින් සභා ගර්භයට ඇතුළුවන සහ ඉන් පිටව යන අවස්ථාවේ දී, මූලාසනයට ගෞරව කළ යුතුය. රැස්වීම අවසානයේ දී, කථානායකවරයා හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා සභාගර්භයෙන් පිටව යාමට සූදානම් අවස්ථාවේ දී, මන්ත්‍රීවරයන් විසින් සිය ආසනවලින් නැගිට, කථානායකවරයා හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා සභා ගර්භයෙන් පිටත්ව යන තෙක් සිටිය යුතු ය. මෙම ස්ථාවර නියෝගයේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කථානායකවරයා විසින්

මන්ත්‍රීවරයන් අතර සාධාරණ සහ යුක්ති සහගත ආකාරයකට කාලය වෙන් කිරීම සඳහා පියවර ගනු ලැබිය යුතු ය. කථා කිරීම සඳහා කැඳවනු ලැබිය යුත්තේ කවරෙකු ද යන්න තීරණය කිරීමේ දී, ආණ්ඩු පාර්ශ්වයේ සහ විරුද්ධ පාර්ශ්වයේ සංවිධායකවරයන් විසින් එසේ කථා කිරීම සඳහා කථානායකවරයා විසින් කැඳවනු ලැබිය යුතු මන්ත්‍රීවරයන්ගේ ලැයිස්තුවක් ලබා දීම මඟින් කථානායකවරයාට සහාය වෙයි.

මූලාශ්‍ර

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය, (2015 ප්‍රතිශෝධිත මුද්‍රණය) "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව."කොළඹ, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, (2018). "ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග", කෝට්ටේ, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර.

# ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තු ක්‍රමය සහ සම්ප්‍රදාය

නීල් ඉද්දවල
නියෝජ්‍ය මහ ලේකම් හා කාර්ය මණ්ඩල ප්‍රධානි
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
neil_p@parliament.lk

## ඓතිහාසික පසුබිම

බ්‍රිතාන්‍ය ජාතිකයන් ශ්‍රී ලංකාවට පැමිණීමෙන් වසර 32 කට පසු සහ 1815 උඩරට ගිවිසුම අත්සන් කිරීමෙන් වසර 12 කට පසුව 1827 දී ඩබ්ලිව්. ජී. එම්. කෝල්බෲක් සහ චාල්ස් හේ කැමරන් යන අයගෙන් සැදුම් ලත් රාජකීය කොමිෂන් සභාවක් දිවයිනට පැමිණියේ ය. මෙම රාජකීය කොමිසම මගින් සභා දෙකක් පිහිටුවිය යුතු යැයි නිර්දේශ කළ අතර ඉන් එක් සභාවක් විධායක සභාව ලෙස ද අනෙක් සභාව ව්‍යවස්ථාදායක සභාව ලෙස ද හඳුන්වනු ලැබුවේ ය. ව්‍යවස්ථාදායක සභාවේ සභාපතිත්වය ආණ්ඩුකාරවරයාට හිමි වූ අතර සංයුතිය 15 ක් විය. ඊට නිල ලත් සාමාජිකයන් නව දෙනකු, ආණ්ඩුකාරවරයා විසින් නම් කරන ලද යුරෝපීය ජාතිකයන් තුන් දෙනකු, සිංහල, දෙමළ හා බර්ගර් ජාතිකයන් තුන් දෙනකු ඇතුළත් විය.

1921 දී ව්‍යවස්ථාදායක සභාවේ සංයුතිය එහි නිල ලත් සාමාජිකයන් 14 ක් සහ නිල නොලත් සාමාජිකයන් 23 දෙනකුගෙන් යුක්තව 37 දක්වා වැඩි කළේ ය. 1924 දී නැවත ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකත්වය (49) දක්වා වැඩි කළ අතර එහි දී නිල ලත් සාමාජිකයන් 12 දෙනකු හා නිල නොලත් සාමාජිකයන් 37 දෙනකුගෙන් සමන්විත විය. 1931 දී ඩොනමෝර් නිර්දේශයන් හඳුන්වා දීමත් සමඟ ලංකාවට සර්වජන ඡන්ද බලය හිමි විය. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායක සභාව රාජ්‍ය මන්ත්‍රණ සභාව ලෙස නම් කරන ලද අතර එය සාමාජිකයන් 61 දෙනකුගෙන් සමන්විත විය.

1944දී ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය සඳහා සෝල්බරි කොමිසම පත් කරන ලද අතර, එමගින් සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නම් වූ "වෙස්මිනිස්ටර්" ආකෘතියේ ප්‍රතිසංස්කරණ යෝජනාවලියක් 1946 දී හඳුන්වා දුන්නේ ය. එමගින් සෙනෙට් සභාව (උත්තරීතර මණ්ඩලය) සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය (පහළ මන්ත්‍රී මණ්ඩලය) හඳුන්වා දුන්නේය. සෙනෙට් මණ්ඩලය සාමාජිකයන් තිස් දෙනකුගෙන් ද නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සාමාජිකයන් එකසිය එක් දෙනකුගෙන් ද සමන්විත විය. මෙහිදී ආණ්ඩුකාරවරයා විසින් නම් කරන ලද අගමැති සහ ඇමති මණ්ඩලය පහළ මන්ත්‍රී මණ්ඩලයට වගකීමට යටත් විය. 1948 පෙබරවාරි මස 04 වන දින ලංකාවට නිදහස ලැබීමෙන් පසුව 1972 වන තුරු 1946දී හඳුන්වා දෙන ලද සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක විය.

1971 ඔක්තෝබර් මස 02 වන දින සෙනෙට් සභාව අහෝසි කරන ලද අතර 1972 මැයි මස 22 වන දින නව ජනරජ ව්‍යවස්ථාව හඳුන්වා දීම විශේෂත්වයකි. එතෙක් පැවැති අග්‍රාණ්ඩුකාරවරයා වෙනුවට ජනාධිපතිවරයා නාම මාත්‍ර රාජ්‍ය නායකයා වූ අතර, සැබෑ බලතල අගමැතිවරයා සතු විය. මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාව එක් සභාවකින් සමන්විත වූ අතර, තේරීපත් වන ජනතා නියෝජිතයන් එකසිය හැට අට දෙනකුගෙන් සභාව සංයුක්ත විය.

1978 සැප්තැම්බර් මස 07 වන දින දෙවන ජනරජ ව්‍යවස්ථාව වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කර ගන්නා ලදී. මෙහි සුවිශේෂී තත්ත්වය වන්නේ සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දීම හා විධායක ජනාධිපති ක්‍රමය තහවුරු කිරීමයි. මෙම ව්‍යවස්ථාදායකය ද එක් සභාවකින් සමන්විත වූ අතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව 225 දක්වා වැඩි විය. ඉන් 196 ක් සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ ද ඉතිරි 29 දෙනා එක් එක් දේශපාලන පක්ෂ මහ මැතිවරණයේ දී ලබා ගන්නා ඡන්ද ප්‍රතිශතය අනුව ද ජාතික ලැයිස්තුවෙන් පත් කරයි.

## අප රටේ ව්‍යවස්ථාදායකයේ විකාශය

1833 සිට 1931 දක්වා ව්‍යවස්ථාදායක සභාව

1931 සිට 1947 දක්වා රාජ්‍ය මන්ත්‍රණ සභාව

1947 සිට 1972 දක්වා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

1971 දී උත්තරීතර මණ්ඩලය අහෝසි කරන ලදී

1972 සිට 1978 දක්වා ජාතික රාජ්‍ය සභාව

1978 සිට මේ දක්වා පාර්ලිමේන්තුව

## පාර්ලිමේන්තු සම්ප්‍රදායන්

ශ්‍රී ලංකාව නිදහස් ස්වෛරී ස්වාධීන ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයකි. ජනරජයේ පරමාධිපත්‍යය ජනතාව කෙරෙහි පිහිටා ඇති අතර, ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ජනතාව විසින් තෝරාපත් කර ගනු ලබන මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුව විසින් සහ ජනමත විචාරණයකදී ජනතාව විසින් ක්‍රියාත්මක කළ යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පළමු වැනි පරිච්ඡේදයේ සඳහන් වේ. ජනරජය තුළ පවතින උත්තරීතරම ආයතනය හා මහජනතාවගේ පරමාධිපත්‍ය ක්‍රියාත්මක වන ස්ථානය පාර්ලිමේන්තුව වේ. පාර්ලිමේන්තුව සතු බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ලබා දී තිබේ. එමෙන්ම පාර්ලිමේන්තුවේ දෛනික කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ රීති මාලාවක් සාදා ගැනීමේ අනන්‍ය බලයක් පාර්ලිමේන්තුව සතු වේ. එම රීතීන් ස්ථාවර නියෝග ලෙස හඳුන්වයි. නමුත් එකී බලතල හා රීතීන්ට පරිබාහිරව පාර්ලිමේන්තු කටයුතු බොහොමයක් සම්ප්‍රදායන්, භාවිතයන් සහ පූර්වාදර්ශ අනුසාරයෙන් සකස් වී තිබේ. 1833 සිට බ්‍රිතාන්‍යයන් විසින් වරින්වර හඳුන්වා දී ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් මඟින් මේ දක්වා පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දක්වා බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ ආභාසයන් ලබා ඇති බව නොරහසකි. ඒ අනුව බ්‍රිතාන්‍යයේ මහජන මන්ත්‍රී මණ්ඩලයෙහි සම්ප්‍රදායන් ද අප පාර්ලිමේන්තුවේ පැවැත්ම සඳහා බොහෝ සෙයින් බලපෑම් ඇති කර තිබේ. ඒ යටතේ,

### 1. සෙංකෝලය

පාර්ලිමේන්තුවේ සහ කථානායකවරයාගේ අණසක / අධිකාරය සංකේතවත් කරයි. මෙය ද වෙස්මිනිස්ටර් ක්‍රමය යටතේ අපට ලැබුණු දායාදයකි. එසේම වර්තමානයේ පාවිච්චි කරන සෙංකෝලය 1949 දී බ්‍රිතාන්‍ය මහජන මන්ත්‍රී මණ්ඩලයෙන් ලැබුණු පරිත්‍යාගයකි. සාම්ප්‍රදායිකව සභා රැස්වීම පටන් ගන්නා අවස්ථාවේ වේත්‍රධාරී විසින් සෙංකෝලය සභා ගර්භයේ තැන්පත් කරන අතර, සභාවේ කටයුතු අවසන් වූ විට එය සභාවෙන් ඉවත් කරයි. සෙංකෝලය හා බැඳුණු පාර්ලිමේන්තු සම්ප්‍රදායන් බොහොමයක් ඇති අතර, පාර්ලිමේන්තු සැසියක් සෙංකෝලය රහිතව පැවැත්විය නොහැකි වීම, සෙංකෝලය රැගෙන එන විට සියලු මන්ත්‍රීවරුන් සිය අසුන්වලින් නැඟී සිටීම, සෙංකෝලය තැන්පත් කිරීමේ දිශාව, කමිටු අවස්ථාවලදී සෙංකෝලය පහළ ස්ථානයේ ස්ථානගත කිරීම ආදිය ඉන් ප්‍රධාන තැනක් ගනී. එසේ වුවත් සෙංකෝලය පිළිබඳව කිසිදු සඳහනක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ ස්ථාවර නියෝගවල සඳහන් නොවීම ද කැපී පෙනෙන කාරණයක් වේ.

## 2. මුලසුනට ගරු කිරීම

සෙංකෝලය රැගත් වේත්‍රධාරී පෙරටු කොට ගෙන කථානායකතුමා සහ ලේකම් මණ්ඩලය සභා ගර්භයට ප්‍රවිෂ්ට වන විට  සභාව තුළ සිටින සියලු මන්ත්‍රීවරුන් නැගිට කථානායකතුමා අසුන් ගන්නා තෙක් සහ සෙංකෝලය තැන්පත් කරන තෙක් නැගී සිටී. සභා ගර්භයට ඇතුළු වන සහ පිට වන අවස්ථාවල දී මුලසුනට නැමී ආචාර කිරීම ද  පිළිගත් සම්ප්‍රදායකි.

## 3. ඇඳුම

කථානායකතුමාට සහ සභා ගර්භය තුළ සිටින නිලධාරීන්ට නියමිත ඇඳුමක් වන අතර සභා ගර්භය තුළ දී එය ඇඳ සිටිය යුතුය. එසේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ද නියම කරන ලද ඇඳුමෙන් සැරසී සභාවට පැමිණීමට වගකීමක්  තිබේ.  යම් මන්ත්‍රීවරයකු නිසි ලෙස ඇඳ ගෙන නැත්නම් ඔහුව නම් කර සභාවෙන් ඉවත් කිරීමට මුලසුනට බලයක් තිබේ. එසේම පාර්ලිමේන්තුව නැරඹීමට ගැලරියට  පැමිණෙන අමුත්තන් ද නිසි පරිදි ඇඳ සිටිය යුතුය. කථානායකතුමාගේ ගැලරියට ඇතුළත් කිරීමට නම් අමුත්තන් සියලු දෙනා සම්පූර්ණ ඇඳුමින් සැරසී සිටිය යුතු ය.

## 4. සභා ගර්භය තුළ මන්ත්‍රීවරුන් හැඳින්වීම

සභා ගර්භය තුළ කටයුතු කරන අවස්ථාවලදී සහ විවාදයක් පවතින අවස්ථාවල දී අදාළ මන්ත්‍රීවරුන් හඳුන්වා දෙනු ලබන්නේ ඔවුන්ගේ ඡන්ද කොට්ඨාසයේ නාමයෙනි. ඒ "ගරු කැලණිය මන්ත්‍රීතුමා" වශයෙනි. නමුත් මෙම සම්ප්‍රදාය පාර්ලිමේන්තුව තුළින් සමානුපාතික ඡන්ද ක්‍රමය හඳුන්වා දීමත් සමගම වැළලී ගියේය. බ්‍රිතාන්‍ය, ඕස්ට්‍රේලියාව, කැනඩාව, දකුණු අප්‍රිකාව සහ ඉන්දියාව වැනි පාර්ලිමේන්තුවල තවදුරටත් මෙම සම්ප්‍රදාය පවතී. අගමැති, විපක්ෂ නායක, ඇමතිවරුන් සහ  සභාවේ නිලයක් උසුලන තැනැත්තන්, එම නිලය මඟින් ආමන්ත්‍රණය කිරීම පිළිගත් සම්ප්‍රදායකි.ඒ අනුව "ගරු අගමැතිතුමා", "ගරු විපක්ෂ නායකතුමා", "ගරු සභානායකතුමා", "ගරු මුදල් ඇමතිතුමා" ලෙස ආමන්ත්‍රණය කිරීම සිදු වේ.

## 5. මන්ත්‍රීවරුන්ට ආසන පැනවීම

හුදෙක් මන්ත්‍රීවරුන්ට සභා ගර්භය තුළ ආසන පැනවීම ගරු කථානායකතුමාගේ කාර්යයක් වන අතර, සම්ප්‍රදායක් වශයෙන් කථානායකතුමාගේ දකුණු පස ආසනවල  පාලක පක්ෂය ද, වම් පසට විපක්ෂය ද, අසුන් ගන්වයි.  අගමැති, විපක්ෂ නායක සහ පාර්ලිමේන්තුවේ නිලතල දරන මන්ත්‍රීවරුන්ට විශේෂිත අසුන් වෙන් කරන අතර, ඇමතිවරුන්ට සහ විපක්ෂයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ට සහ දේශපාලන පක්ෂ නායකයන්ට දෙපස ඉදිරි පෙළ අසුන් වෙන් කර තිබේ. සෙසු මන්ත්‍රීවරුන් සඳහා සම්ප්‍රදායක් ලෙස ආසන වෙන් කරනු ලබන්නේ ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය අනුව ය.

## 6. පක්ෂ මාරු කිරීම

මින් අදහස් කරන්නේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් විපක්ෂයට මාරු වීමත්, විපක්ෂයේ මන්ත්‍රීවරුන් ආණ්ඩු පක්ෂයට පිල් මාරු කිරීමත් ය. එබඳු අවස්ථාවක දී පිළිගත් සම්ප්‍රදාය වන්නේ  කථානායකතුමාගේ විශේෂ අවසරයක් ඇතිව තමන්ට දැනට වෙන් කර ඇති ආසනයේ සිට ප්‍රකාශයක් කර පාර්ලිමේන්තුවේ සභා ගර්භය හරහා පැත්ත මාරු කිරීමයි.

## 7. පාර්ලිමේන්තුවට නොගැළපෙන වචන

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් සභා ගර්භය තුළ විවාදයකට සහභාගි වෙද්දී හෝ යම් ප්‍රකාශයක් කරන විට ශිෂ්ට සම්පන්න භාෂාවකින් එය කළ යුතු වේ. පාර්ලිමේන්තුවට නොගැළපෙන වචනවලින් ආමන්ත්‍රණය කළහොත් පළමු අවස්ථාවේ දී එම වචනය ඉල්ලා අස් කර ගැනීමට එම මන්ත්‍රීවරයාට මූලාසනයෙන් නියම කරයි. එසේ කිරීමට මන්ත්‍රීවරයා ප්‍රතික්ෂේප කරන්නේ නම් ඔහු මූලාසනයේ අධිකාරිත්වයට / අණසකට යටත් නොවීම මත නම් කිරීමෙන් අනතුරුව සභා ගර්භයෙන් ඉවත් කළ හැකි අතර, සභාවට නොගැළපෙන වචන හෝ ප්‍රකාශය නිල වාර්තාවෙන් ඉවත් කිරීමට නියෝග කරයි.

## 8. රීති ප්‍රශ්න

සභා ගර්භය තුළ ඕනෑම අවස්ථාවක මන්ත්‍රීවරයකුට සභා රීතීන් කඩ වන්නේ යැයි විශ්වාස කරන විට රීති ප්‍රශ්නයක් මතු කිරීමට අවසරය තිබේ. රීති ප්‍රශ්නයක් මතු කළ විට ඒ සඳහා මූලාසනයෙන් නියෝගයක් ලබා දිය යුතු වේ. නමුත් රීති ප්‍රශ්නයක් විවාදයක් බවට පත් කර ගත නොහැකිය. එසේ වුවත් සම්ප්‍රදායක් ලෙස බෙදුම් සීනුව නාද වන විට, ඡන්දයක් විමසන අවස්ථාවේ දී ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවේ දී ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය එළි දක්වන විටදී හෝ මුදල් ඇමතිවරයා වාර්ෂික අයවැය ලේඛනය ඉදිරිපත් කරන විට සහ නවක මන්ත්‍රීවරයකු තම කුළුඳුල් කථාව පවත්වන විට බාධා කිරීමක් සිදු නොවේ.

## 9. වරප්‍රසාද

වෙස්ට්මිනිස්ටර් පාර්ලිමේන්තු සම්ප්‍රදායන් අනුව අප පාර්ලිමේන්තු ක්‍රමයේ ද හැඳින්විය හැකි වැදගත්ම සම්ප්‍රදාය වන්නේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාදයි. වරප්‍රසාද පිළිබඳ සියලු නියමයන් සම්ප්‍රදායයන් සහ භාවිතයන් මත ගොඩනැගී තිබේ. නමුත් වර්තමානයේ අප පාර්ලිමේන්තු ක්‍රමයේ වරප්‍රසාද පිළිබඳව 1953 අංක 21 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත ක්‍රියාත්මක වේ. මන්ත්‍රීවරුන්ට ඔවුන්ගේ කටයුතු සක්‍රීයව හා ආත්ම අභිමානයෙන් යුක්තව කිරීමටත් ස්වාධීනව හා අධිකාරීත්වයකින් යුක්තව කිරීමටත් වරප්‍රසාද ඉවහල් වේ. මන්ත්‍රීවරුන් ඔවුන්ගේ කටයුතු නොබියව කිසිදු අයුතු බලපෑමකට, තර්ජනයකට යටත් නොවී කිරීමට වරප්‍රසාද ඉවහල් වේ.

මන්ත්‍රීවරයෙකුට සතු පාර්ලිමේන්තු වරප්‍රසාද යටතේ භාෂණයේ නිදහස එනම් පාර්ලිමේන්තු විවාදවලදී නිදහසේ තම හෝ තමාගේ ඡන්දදායකයින්ගේ අදහස් ප්‍රකාශ කිරීමට අවකාශ ලැබේ.

මන්ත්‍රීවරයෙකු පාර්ලිමේන්තු විවාදයක දී හෝ පාර්ලිමේන්තු කටයුත්තක දී පළ කරන අදහස් හෝ ප්‍රකාශයක් හේතුකොට ගෙන එම මන්ත්‍රීවරයාට විරුද්ධව කිසිදු සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් ආරම්භ කළ නොහැකි වන්නේ ය.

එම මන්ත්‍රීවරයා වගකීමෙන් යුක්තව පාර්ලිමේන්තුවේ ප්‍රකාශයක් කළ විට එම කරුණු මන්ත්‍රීවරයා අනාවරණය කර ගත්තේ කෙසේද යන්න ඔහුගෙන් විමසා සිටිය නොහැකි වේ.

මන්ත්‍රීවරයකුට ලැබෙන මීළඟ වැදගත් වරප්‍රසාදය වන්නේ අත්අඩංගුවට ගැනීමෙන් වැළකී සිටීමයි. මින් අදහස් කරන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු පාර්ලිමේන්තු කටයුත්තකට සහභාගී වෙමින් සිටියදී හෝ පාර්ලිමේන්තු රැස්වීමකට එමින් සිටිය දී හෝ රැස්වීමක් අවසන් වී පෙරළා පැමිණෙන අතරතුර කාලයේ දී ඔහුව සිවිල් නඩු කටයුත්තක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීමෙන් වැළකී සිටීමට ඇති හැකියාවයි. එසේ වුවත් මන්ත්‍රීවරයෙකු අපරාධ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් සැකකරුවකු වන

අවස්ථාවකදී ඔහුව අත්අඩංගුවට ගැනීමෙන් වළක්වාලන වරප්‍රසාදයක් ඔවුනට හිමි නොවේ. එසේ වුවත් සම්ප්‍රදායක් ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු යම් අපරාධ කටයුත්තක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගැනීමට ප්‍රථමව කථානායකවරයා දැනුවත් කිරීම පිළිගත් සම්ප්‍රදාය වේ. යම් මන්ත්‍රීවරයෙකු අත්අඩංගුවට ගැනීමෙන් පසුව රිමාන්ඩ් බන්ධනාගාරගත කළේ නම් ඒ පිළිබඳව සභානායකවරයා විසින් සභාව දැනුවත් කිරීමේ සම්ප්‍රදායක් ඇත. මන්ත්‍රීවරයකු සැකකරුවකු ලෙස රිමාන්ඩ් බන්ධනාගාරයේ රඳවා ඇති අවස්ථාවක දී පාර්ලිමේන්තු සැසි වාරයක් හෝ පාර්ලිමේන්තු කමිටු සැසිවාරයක් පවතින්නේ නම් එයට සහභාගී වීමට ඉඩ ලබා දීම ද පිළිගත් සම්ප්‍රදාය වේ.

# පාර්ලිමේන්තු ස්ථාවර නියෝග හා මන්ත්‍රීවරයන් සඳහා වූ චර්යාධර්ම සංග්‍රහය පිළිබඳ විමසුමක්

කුෂාණි රෝහණදීර
සහකාර මහ ලේකම් (පරිපාලන)
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
kushani_r@parliament.lk

## පාර්ලිමේන්තු ස්ථාවර නියෝග

පාර්ලිමේන්තු ස්ථාවර නියෝග යනු පාර්ලිමේන්තුවේ කටයුතු විනයානුකූලව හා අර්ථවත් ආකාරයෙන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ ක්‍රියාමාර්ග නියම කරන්නා වූ රීති සමූහයකි. පාර්ලිමේන්තු ක්‍රියාපටිපාටිය පිළිබඳ තොරතුරු ලබා දෙන්නා වූ වැදගත්ම මූලාශ්‍රය වන ස්ථාවර නියෝගවලට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඇති රීතිවල තත්ත්වය හිමි වේ.

ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකය තුළ ක්‍රියාමාර්ග නියාමනය කිරීම සඳහා සකස් වූ ප්‍රථම රීති පද්ධතිය 1912 දී ව්‍යවස්ථාදායක සභාව සඳහා සකස් කර ඇති බවට සාක්ෂ්‍ය ඇත. එකී නියෝග සංග්‍රහය මුලුමනින්ම බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ ක්‍රියාදාමය අල ලා සකස් කරන ලද්දක් බව පෙනේ. 1947 දී සකස් කරන ලදද ස්ථාවර නියෝග ද එවකට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග මත පදනම් වී සකස් කොට ඇත.

1979 දී හඳුන්වා දී ඇති නව ස්ථාවර නියෝග 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවේ ආකෘතියට ගැළපෙන ආකාරයට වෙනස් කොට ඇතත් ඒවායේ අන්තර්ගත කරුණු එයට කලින් තිබූ ස්ථාවර නියෝගවලට බෙහෙවින් සමාන බව පෙනී යයි. කලින් කලට එනම් 1980, 1981, 1984, 1987 හා 1993 ආදී වශයෙන් සංශෝධිත මෙම ස්ථාවර නියෝග තුළට 1993 සිට ගත වූ වසර 25 ක කාලය තුළදී එක් වූ විවිධ පරිචයන්, ක්‍රියාපටිපාටි, නව කාරක සභා ආදිය ඇතුළත් කොට 2018 අප්‍රේල් මස 15 දින සිට ක්‍රියාත්මක වන නව ස්ථාවර නියෝග හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු සම්ප්‍රදායට එක් වූ නව තාක්ෂණය මුල්කොටගත් භාවිතාවන් ද, කාරක සභා පද්ධතියට අලුතින් හඳුන්වා දී ඇති ආංශික අධීක්ෂණ කාරක සභා, අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, සම්බන්ධීකරණ කාරක සභාව, පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව ආදී නව කාරක සභා ද, අග්‍රාමාත්‍යවරයාගෙන් අසන ප්‍රශ්න, විද්‍යුත් ක්‍රමයට ඡන්දය ගණන් ගැනීම, පාර්ලිමේන්තු හා කාරක සභාවල කටයුතු මාධ්‍යයට විවෘත කිරීම, සජීවී පාර්ලිමේන්තු විකාශය ආදී වශයෙන් සංශෝධන ගණනාවක් මෙම නව ස්ථාවර නියෝගවලට ඇතුළත් කොට ඇත.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් කටයුතු කිරීමේ දී සියලු ගරු මහජන නියෝජිතවරුන් ස්ථාවර නියෝග පිළිබඳ මනා දැනුමකින් යුක්ත වීම පාර්ලිමේන්තුව තුළ කාර්යක්ෂමව කටයුතු කිරීමේදී අත්‍යවශ්‍ය වන්නේ ය. මහ මැතිවරණයකින් පසුව මුල්වරට රැස්වන අභිනව පාර්ලිමේන්තුවේ පළමු රැස්වීම් වාරය තුළදී කථානායකවරයා, නියෝජ්‍ය කථානායකවරයා හා නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා ඡන්දයෙන් තෝරා ගන්නා ආකාරය ද, දිවුරුම / ප්‍රතිඥාව ගන්නා ආකාරය ද පාර්ලිමේන්තුවේ අසුන් පැනවීමේ සිට පාර්ලිමේන්තුවේ කටයුතු කරන දින හා කාල වේලාවන්, සභාව තුළ හා කාරක සභාවල කටයුතුවල නියැළීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග, විවාද රීති, පාර්ලිමේන්තුවේ යෝජනා, ප්‍රශ්න, පෙත්සම්, වරප්‍රසාද ප්‍රශ්න යොමු කළ යුතු ආකාරය, ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය, විසර්ජන පනත විවාදයට ගැනීම, අග්‍රාමාත්‍යවරයාගෙන් අසනු ලබන ප්‍රශ්න, ගණපූර්ණය, පාර්ලිමේන්තුවේ කටයුතු කිරීමේ අනුපිළිවෙළ යනාදිය සම්බන්ධයෙන් විස්තරාත්මකව සියලු රීති පෙළගස්වා තිබේ. එමෙන්ම, පාර්ලිමේන්තුවේ කටයුතු නියාමනය කිරීම සම්බන්ධයෙන් කථානායකවරයා සතු අධිකාරි බලතල හා අභිමතානුසාරී බලය පිළිබඳව සියලු විස්තර ස්ථාවර නියෝග 143 කින් සමන්විත නව ස්ථාවර නියෝගවල අඩංගු කොට ඇත. 1978

ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවේ 74 වන ව්‍යවස්ථාවට අනුව කථානායකවරයා, නියෝජ්‍ය කථානායකවරයා හා නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා ඡන්දයෙන් තෝරා පත් කිරීම හා ධුරයෙන් ඉවත්වීම පිළිබඳව ද, පාර්ලිමේන්තුවේ කටයුතු කිරීමේ පිළිවෙළ විධිමත් කිරීම සඳහා ද, රැස්වීම්වලදී විනය ආරක්ෂා කිරීම සඳහා ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියමකොට ඇත්තා වූ හෝ වෙනත් කාරණා සඳහා ද, පාර්ලිමේන්තුවට යෝජනා සම්මතයෙන් හෝ ස්ථාවර නියෝග මඟින් විධිවිධාන සැලසිය හැකි බව සඳහන් වේ. එමෙන්ම මෙලෙස යෝජනා සම්මතයකින් විධිවිධාන සලසන තුරු පවත්නා ස්ථාවර නියෝග එලෙසම ක්‍රියාත්මක විය යුතු බවට ද සඳහන් කොට ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (782) අනුව්‍යවස්ථාව යටතේ ස්ථාවර නියෝග එකක් හෝ වැඩි ගණනක් අත්හිටුවීමට ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව කිසියම් සුවිශේෂී නව කටයුත්තක් සලකා බැලීමට හෝ ඒ පිළිබඳව සුදුස්සක් කර අවසන් කිරීම සඳහා පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අත්හිටුවිය හැකි බව 135 වැනි ස්ථාවර නියෝගයෙන් කියැවේ.

කිසියම් පාර්ලිමේන්තු සැසි වාරයක් සඳහා පනවනු ලබන ස්ථාවර නියෝග, 'සැසිවාර නියෝගයක්' ලෙස සැලකිය යුතු අතර, එහි වලංගුභාවය ඒ අදාළ සැසිවාරයට පමණක් බල පවත්වනු ඇත.

පාර්ලිමේන්තුවේ වැඩකටයුතු හා රැස්වීම් පැවැත්වීම පිළිබඳ කරුණු සලකා බලා ස්ථාවර නියෝගවලට අවශ්‍ය යැයි සැලකෙන සංශෝධන හෝ එකතු කිරීම නිර්දේශ කිරීම හා පාර්ලිමේන්තුව විසින් තමන් වෙත පවරනු ලබන ස්ථාවර නියෝග පිළිබඳ සෑම කටයුත්තක්ම ගැන සලකා බලා ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කිරීම පිණිස ස්ථාවර නියෝග කාරක සභාව නමින් කාරක සභාවක් ක්‍රියාත්මක වන අතර, එහි සභාපතිත්වය කථානායකවරයා විසින් දරනු ලබයි. නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපති හා තේරීම් කාරක සභාව විසින් නම් කළ යුතු මන්ත්‍රීවරුන් 06 දෙනෙකුගෙ න් මෙම කාරක සභාව සමන්විත වේ. ස්ථාවර නියෝගවලට සංශෝධනයක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය මන්ත්‍රීවරයකුට ඒ සඳහා ඉඩ ප්‍රස්තාව 134 වැනි ස්ථවාර නියෝගයෙන් සලසා දී තිබේ. ඒ අනුව නිසි දැනුම් දීමකින් අනතුරුව, මෝසමක් මාර්ගයෙන් එවැනි සංශෝධනයක් සභාවට ඉදිරිපත් කරන පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ එම යෝජනාව වෙනත් මන්ත්‍රීවරයකු විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒ පිළිබඳව සලකා බලා වාර්තා කරනු පිණිස ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබේ. ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව ඒ පිළිබඳව සිය නිර්දේශ සහිත වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන තුරු ඒ පිළිබඳ වැඩිදුර කටයුතු කරනු නොලැබේ.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තමා නියෝජනය කරන මහජනතාව වෙනුවෙන් ඉටු කළ යුතු මෙහෙවර ඉටු කරමින් ඔවුන් නියෝජනය කිරීම සඳහා ද, ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියට සක්‍රීයව දායක වෙමින් ද, රජයේ මුදල් භාවිතය සම්බන්ධයෙන් අධීක්ෂණ කටයුතු කිරීමේදී ද ස්ථාවර නියෝග කටයුතු ගැන මනා අවබෝධයක් ලබා ගෙන තිබීම සෑම මන්ත්‍රීවරයකුටම සිය කටයුතුවල යෙදීමේ දී අත්‍යවශ්‍ය වේ. විශේෂයෙන්ම පාර්ලිමේන්තුවේ කටයුතු කරන දින වකවානු, වේලාවන්, දිනට නියමිත කටයුතු, ලිපි ලේඛන පිළිගැන්වීම්, යෝජනා හා ප්‍රශ්න ඉදිරිපත් කිරීමේ ක්‍රියාපටිපාටිය, පනත් කෙටුම්පතක් සම්මත වන්නා වූ ආකාරය, එක් එක් කාරක සභාව කටයුතු කරන ආකාරය මෙන්ම සභාව තුළ විවාදයේ යෙදෙන විට මෙන්ම විවාදයේ නොයෙදෙන විට පිළිපැදිය යුතු රීති, විසර්ජන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ආකාරය, සභාව තුළ ගෞරවාන්විතව හැසිරීම හා විනය රැකීම පිළිබඳව මන්ත්‍රීවරුන් විසින් අත්‍යවශයෙන්ම පිළිපැදිය යුතු සියලු රීතීන් අන්තර්ගත වන පාර්ලිමේන්තු ස්ථාවර නියෝග මහජන නියෝජිතයකු ලෙස කටයුතු කිරීමේ දී සෑම අවස්ථාවකදීම සිහි තබා ගැනීම සෑම මන්ත්‍රීවරයකුගේම වගකීමක් වන්නේ ය.

## පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් යනු මහජනතාව විසින් තෝරා පත්කර එවනු ලබන ඔවුන්ගේ නියෝජිතයන් වන අතර, පාර්ලිමේන්තුව තුළ කටයුතු කිරීමේ දී ඔවුන් විසින් සෑම විටම පාර්ලිමේන්තු සම්ප්‍රදායන්ට ගරු කරමින් ස්ථාවර නියෝග පිළිපදිමින් සභාව තුළ විනය ආරක්ෂා කර ගනිමින් ගෞරවාන්විතව කටයුතුවල නියැළීම අත්‍යවශ්‍ය වේ. කෙසේ වුවද දීර්ඝ කාලයක් තිස්සේ විවිධ ව්‍යවස්ථාදායකයන් විසින් සුරක්ෂා කර ගනිමින් ඉදිරියට රැගෙන ආ මෙකී ගුණාංගවල කිසියම් ආකාරයේ පිරිහීමක් කාලයත් සමඟම නිරීක්ෂණය වූ අතර, මෙම තත්ත්වය පොදු මහජනතාව අතර පාර්ලිමේන්තුව පිළිබඳව නොපහන් හැඟීමක් දනවන්නට මුල් විය. එමෙන්ම සමාජය තුළ ඒ පිළිබඳව කතිකාවතක් නිර්මාණය වන්නට ද මෙම පිරිහීම දායක විය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අරබයා ආචාර ධර්ම සංග්‍රහයක් සම්මත කරගත යුතුය යන්න 70 දශකයටත් පෙර සිට මාධ්‍ය මඟින් නිරන්තරයෙන් ඉස්මතු කරන ලද මාතෘකාවක් විය.

මෙකී අවශ්‍යතාව මැනවින් අවබෝධ කර ගනිමින් 1978 ජාතික රාජ්‍ය සභාවට ඇමැතිවරුන්, නියෝජ්‍ය ඇමතිවරුන් හා ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් සඳහා චර්යාධර්ම සංග්‍රහයක් ඉදිරිපත් කර ඇත. 1990 දී එවකට ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතාගේ උපදේශකත්වය මත අමාත්‍යවරුන් හා උසස් තනතුරු දරන්නන් විසින් අනුගමනය කළ යුතු ආචාරධර්ම පද්ධතියක් අමාත්‍ය මණ්ඩලයේ අධිකාරය යටතේ ප්‍රකාශයට පත් කරන ලදී. එතැන් සිට 2018 දක්වා මන්ත්‍රීවරුන් සඳහා චර්යා ධර්ම සංග්‍රහයක් නිකුත් කර නොමැති අතර, 2016 වර්ෂයේ නව ස්ථාවර නියෝග සකස් කිරීමට සමගාමීව මන්ත්‍රීවරුන් සඳහා වන චර්යාධර්ම සංග්‍රහයක් සකස් කොට 2018.03.07 දින පාර්ලිමේන්තුවේ දී අනුමත කරන ලදුව 2018.04.15 දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි සම්මත කරන ලදී.

විස්තරාත්මක කොටස් 13කින් සමන්විත මෙම චර්යාධර්ම සංග්‍රහය තුළ එහි අරමුණ, විෂය පථය, මන්ත්‍රීවරයන්ගේ කාර්යභාර්ය, චර්යා මූලධර්ම හා චර්යා රීති, මූල්‍යමය බැඳියාවන් පිළිබඳ ලේඛනය, පොදු දේපළ භාවිත කිරීම හා පෙළඹවීම්, පැමිණීම, හැසිරීම හා ආචාරශීලීත්වය මෙන්ම චර්යාධර්ම සංග්‍රහය පිළිපැදීම, පැමිණිලි විමර්ශන හා බලාත්මක කිරීම, පරීක්ෂණ සඳහා කාර්ය පටිපාටිය හා දඬුවම්, වාර්තා පිළිගැන්වීම හා සලකා බැලීම මෙන්ම චර්යා ධර්ම සංග්‍රහය සැකසීම හා යථාවත් කළ යුතු ආකාරය පිළිබඳව විස්තරාත්මකව විග්‍රහ කර ඇත.

මෙම චර්යා ධර්ම සංග්‍රහය සකස් කිරීමේදී ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් තුළ ක්‍රියාත්මක වන හොඳම පරිචයන්, පොදු රාජ්‍ය මණ්ඩලයීය රටවලට අයත් පාර්ලිමේන්තු තුළ ක්‍රියාත්මක වන ක්‍රියාපටිපාටීන් ආදිය විශේෂයෙන් සලකා බලා දීර්ඝ වශයෙන් පර්යේෂණ කිරීමෙන් පසුව ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව විසින් සිය නිර්දේශ සහිතව පාර්ලිමේන්තුවට ඉදිරිපත්කොට සම්මත කර ගන්නා ලදී.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් කටයුතු කිරීමේ දී පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් සහ පොදුවේ මහජනයා සම්බන්ධයෙන් සිය වගකීම් ඉටු කරනු පිණිස සිය බලතල ක්‍රියාත්මක කිරීම, කාර්යය කිරීම සහ කර්තව්‍යය ඉටු කිරීම සඳහා ඔවුනට සහාය වීම මෙකී චර්යා ධර්ම සංග්‍රහයේ අරමුණ වන්නේය.

මූලාසනය හොබවන මන්ත්‍රීවරයන්, අග්‍රාමාත්‍යවරයා, සභානායකවරයා, විපක්ෂ නායකවරයා, ආණ්ඩුවේ හා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරුන් ඇතුළු එක් එක් මන්ත්‍රීවරයාට ඔවුන්ගේ පොදු ජීවිතවල සියලු අංග කෙරෙහි චර්යාධර්ම සංග්‍රහය අදාළ වන අතර මෙයින් ඔවුන්ගේ පෞද්ගලික ජීවිත නියාමනය කිරීමක් කිසිවිටෙක සිදු නොවේ.

සෑම මන්ත්‍රීවරයෙකුටම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිපැදීමට හා ආරක්ෂා කිරීමටත්, රාජ්‍යයේ ඒකීයභාවය හා භෞමික අඛණ්ඩතාව සුරැකීමටත් වගකීමක් ඇති අතර, සෑම මන්ත්‍රීවරයෙකුම මූලික අයිතිවාසිකම්වලට අදාළ නීතිය පිළිපැදිය යුතු අතර, සෑම අවස්ථාවකදීම සිය ඡන්දදායකයන් සම්බන්ධයෙන් සිය බලතල ක්‍රියාත්මක කිරීමේ දී වෙනස් ආකාරයට

කටයුතු නොකළ යුතු ය. සිය බලතල ක්‍රියාත්මක කිරීමේ දී පොදුවේ ජාතියේ යහපත හා විශේෂයෙන්ම සිය ඡන්ද දායකයන්ගේ යහපත පිණිස ක්‍රියා කළ යුතුය. මන්ත්‍රීවරුන් සෑම අවස්ථාවක දීම ඔවුන් වෙත තබා ඇති මහජන විශ්වාසයට අනුව ක්‍රියා කළ යුතු අතර සෑමවිටම පොදු සම්පත් භාවිතයේ දී අවංකභාවයෙන් ක්‍රියා කළ යුතු වන්නේ ය.

සෑම මන්ත්‍රීවරයකුම තීරණ ගන්නා විට, සෑම අවස්ථාවක දීම මහජන බැඳියාවන් සැලකිල්ලට ගත යුතු අතර, ඔවුනට ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට, මිතුරන්ට හෝ ඔවුන් වෙනුවෙන් වෙනත් යම් තැනැත්තන්ට යම් මූල්‍යමය හෝ ද්‍රව්‍යමය ප්‍රතිලාභ හෝ පෞද්ගලික ලාභ අපේක්ෂා නොකළ යුතුය.

මන්ත්‍රීවරුන් විසින් මහජනතාව සම්බන්ධයෙන් ගනු ලබන තීරණ සහ ඔවුන් වෙනුවෙන් කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් හැකිතාක් දුරට මහජනතාවට විවෘත විය යුතු අතර එම තීරණ සඳහා හේතු දැක්විය යුතු ය.

සෑම මන්ත්‍රීවරයකුම සිය සාමාජික මන්ත්‍රීවරයන් සහ පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය ද මහජනතාව ද සම්බන්ධයෙන් ගෞරවාන්විතව, ආචාරශීලීව සහ පාර්ලිමේන්තුවේ ගරුත්වයට හානි නොවන ආකාරයෙන් කටයුතු කරන්නේයැයි අපේක්ෂා කෙරේ.

චර්යා ධර්ම සංග්‍රහයේ විධිවිධාන කඩ කිරීමක් හෝ මන්ත්‍රීවරයකු විසින් කරන ලදැයි කියනු ලබන සදාචාර විරෝධී හැසිරීමක් සම්බන්ධයෙන් ආචාර ධර්ම හා වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යම් මන්ත්‍රීවරයෙකු හෝ තැනැත්තකු විසින් යම් පැමිණිල්ලක් කළ හැකි අතර කථානායකවරයා විසින් එබඳු යෝජනාවක් පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද යෝජනා සම්මතයක් මත විභාගකොට වාර්තා කිරීම සඳහා ආචාර ධර්ම හා වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

මූලික පරීක්ෂණයකින් පසු බැලූ බැල්මට වරදක් සිදුකොට ඇති බවට පෙනෙන සාධක ඇති බව කාරක සභාව විසින් සලකනු ලබන්නේ නම් එම කාරණය විභාගකොට සුදුසු නිර්දේශ සහිතව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

# නියෝජිත ප්‍රජාත්‍රන්ත්‍රවාදය සහ පාර්ලිමේන්තු කමිටු ක්‍රමය පිළිබඳ විමංසනයක්

ටිකිරි කේ. ජයතිලක
සහකාර  මහ ලේකම් (ව්‍යවස්ථාදායක සේවා)
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
tikiri_j@parliament.lk

## නියෝජිත ප්‍රජාත්‍රන්ත්‍රවාදය

කිසියම් රාජ්‍යයක ජනතාව ඔවුන්ගේ පරමාධිපත්‍ය බලය නීත්‍යානුකූල ලෙස තෝරා පත්කර ගන්නා නියෝජිතයන් මඟින් සිදු කරන ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය නියෝජිත ප්‍රජාත්‍රන්ත්‍රවාදය යි. නියෝජිත ප්‍රජාත්‍රන්ත්‍රවාදී ක්‍රමය විවිධ රටවල, විවිධ අයුරින් ක්‍රියාත්මක වේ. දැනට ලොව දිගු කාලයක් මුළුල්ලේ සාර්ථකම හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මකවන  පාලන ක්‍රමය මෙය වේ. නියෝජිත ප්‍රජාත්‍රන්ත්‍රවාදය සමාජ සම්මුතිවාදය යන සංකල්පය මත පදනම්ව ක්‍රියාත්මක වේ. මෙහිදී පාලකයා හා පාලිතයා අතර යම් එකඟතාවක් මෙන්ම සාමාජීය ගිවිසුමක් ඇති බවට බොහෝ විද්වතුන් අතර පිළිගැනීමක් පවති.

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක නියෝජිත ප්‍රජාත්‍රන්ත්‍රවාදයට දීර්ඝ ඉතිහාසයක් පවතී. යටත් විජිතයක්ව පැවැති රට නිදහස ලැබීමෙන් පසු යටත් විජිත යුගයේ සිදුවූ දේශපාලනික, ආර්ථික, සමාජීය හා සංස්කෘතික වෙනස්කම් හේතුවෙන් ජන සමාජ ව්‍යුහයේ සිදුවූ ප්‍රබල වෙනස්කම් හේතුවෙන් පැනනැගුණු විවිධ අභියෝග හා අර්බුද හමුවේ ඒවා විසඳීමට අවශ්‍ය කරනු ලබන නීතිමය පසුබිම හා ප්‍රතිපත්ති සකස් කිරීමට නියෝජිත ප්‍රජාත්‍රන්ත්‍රවාදයට හැකියාව පැවතිණ. මෙම කාරණය නියෝජිත ප්‍රජාත්‍රන්ත්‍රවාදය මෙරටට හඳුන්වා දීමෙන් අනතුරුව පනවන ලද පාර්ලිමේන්තු පනත් කෙරෙහි අවධානය යොමු කිරීමෙන් පෙනී යයි. ඒ තුළින් රටේ විප්ලවීය වෙනස්කම් සිදු කළ අතර රට හා රටේ ජනතාව සමාජීය වශයෙන් හා අධ්‍යාපනික වශයෙන් ඉතා ඉහළ තලයකට රැගෙන යාමට අවශ්‍ය පදනම සැකසිණි. පසුකාලීනව මෙරට සමාජය තුළ පැන නැගුණු, කැරලි කෝලාහල, දීර්ඝ කාලීන සිවිල් යුද්ධ හා ස්වාභාවික ආපදා යන අභියෝගවලට රාජ්‍යයක් ලෙස ශක්තිමත්ව මුහුණදීමට හා විසඳුම් ලබා දීමට එම ක්‍රමය තුළින් අවකාශ හිමි විය.

උදාහරණයක් ලෙස 16 වෙනි සියවසේ දී යටත්විජිත පාලනය යටතේ දේශීය අධ්‍යාපන පද්ධතිය යටපත් කරමින් පෘතුගීසීන්, ලන්දේසීන් සහ ඉංග්‍රීසීන් විසින් ඔවුන්ගේ අධ්‍යාපන ක්‍රමවේදයන් ඇතුළත් කරන ලදී. 1931 වන විට ශ්‍රී ලංකාවේ අකුරු හැකියාව (සාක්ෂරතාව) 47.9%ක් විය. විශේෂයෙන්ම 1943-1944 අතර කාලය තුළ  පිටිසර ගම්මානවල ඡන්ද කොට්ඨාසයකට එක බැගින් මධ්‍ය මහා විද්‍යාල 50 ක් පිහිටුවීමේ වැඩසටහන ක්‍රියාත්මක විය. 1940 අප්‍රේල් මස අධ්‍යාපන ඇමති සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතාගේ සභාපතිත්වයෙන් අධ්‍යාපනයේ සියලුම ක්ෂේත්‍ර පිළිබඳ හදාරා නිර්දේශ ඉදිරිපත් කරනු පිණිස විශේෂ කමිටුවක් පත් කරන ලද අතර, බාලාංශයේ සිට විශ්වවිද්‍යාලය දක්වා වූ සෑම මට්ටමකම අධ්‍යාපනය නොමිලේ ලබා දිය යුතු බව එම කමිටුවේ තීරණයක් විය.

ඒ අනුව ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපනය ඇති කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබීම ද සිදුවූ අතර එය 1945 වසරේ සිට එය ක්‍රියාත්මක විය. එමෙන්ම ශ්‍රී ලංකාවේ වර්තමාන සාක්ෂරතාව 91.2% ක් දක්වා වර්ධනය වීම සාධනීය ලක්ෂණයකි.

එමෙන්ම යටත්විජිත පාලනය යටතේ පැවැති ගැටලු රැසක් නිරාකරණය කරමින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවීම සඳහා ද පුද්ගලයන් විසින් අයිතිව තබා ගත හැකි කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණය පිළිබඳ උපරිමයක් නියම කිරීම සඳහා ද ඒ උපරිමයට වැඩියෙන් ඇති ඉඩම්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම් සභාව වෙත සතු කිරීම හෝ කිසියම් ව්‍යවස්ථාපිත බද්දක් පිට, කලින් අයිතිකරුවන් වෙත පැවරීම සඳහා ද

1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත පිහිටුවිය. මෙයද නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය මඟින් ගොඩනැගුණු සාධනීය ලක්ෂණයකි.

නියෝජිත ප්‍රජාත්‍රන්ත්‍රවාදයේ ඇති සුවිශේෂී ලක්ෂණය වන්නේ, එය ප්‍රශස්ත මට්ටමින් ක්‍රියාත්මක බොහෝ රටවල් සංවර්ධිත හෝ සංවර්ධිත ඉලක්ක කරා සාර්ථකව ගමන් කරන රටවල් වීමයි. එමෙන්ම එම රටවල ජනතාවගේ සතුටින් ජීවත්වීමේ අගය ඉතා ඉහළ මට්ටමකි. දුර්භික්ෂ අඩුය. අභ්‍යන්තර කැරලි කෝලහල ද අවම ය.

වර්තමාන ශ්‍රී ලංකාවේ නියෝජිත ප්‍රජාත්‍රන්ත්‍රවාදය ක්‍රියාත්මක වන ආකාරය දෙස බැලූ විට අප වටහා ගත යුතු සුවිශේෂී ලක්ෂණය වන්නේ විධායකයේ ප්‍රධානියා වන ජනාධිපතිවරයා රටේ සමස්ත ඡන්දායකයන්ගේ ඍජු ඡන්දයෙන් තෝරා පත්කර ගැනීම ය. පාර්ලිමේන්තුව, මහා මැතිවරණයෙන් තෝරා පත් කර ගන්නා ජනතා නියෝජිතයන්ගෙන් සමන්විත වන අතර, අග්‍රාමාත්‍යවරයා හා අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් අතරින් තෝරා පත්කර ගනී.

## පාර්ලිමේන්තු කාරක සභා ක්‍රමය

මෙම ලිපියෙහි අවධානය යොමු කරනු ලබන පාර්ලිමේන්තු කාරක සභා ක්‍රමය සම්බන්ධව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ කිසිවක් සඳහන් නොවුණද 741 ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුවට ලැබී ඇති ස්ථාවර නියෝග පැනවීමේ බලතල තුළින් කාරක සභා පිහිටුවීමට අදාළව ස්ථාවර නියෝග සකසා ඇත. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සතුව ඉතාම සංකීර්ණ සහ කාර්යක්ෂම කාරක සභා ක්‍රමයක් වර්තමානය වන විට පවතින අතර, එය සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම කාරක සභා ප්‍රධාන වශයෙන් කොටස් 06 කි.

01. පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාව (ස්ථාවර නියෝග 93-99)

02. විශේෂ කාරක සභා (ස්ථාවර නියෝග 100-110)

03. ආංශික අධීක්ෂණ කාරක සභා (ස්ථාවර නියෝග 111)

04. අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා (ස්ථාවර නියෝග 112)

05. ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව (ස්ථාවර නියෝග 113)

06. විශේෂ කාර්යයන් සඳහා කාරක සභා (ස්ථාවර නියෝග 114)

මෙම කාණ්ඩය යටතට තේරීම් කාරක සභාව ඇතුළු කාරක සභා 13ක් ඇතුළත් වේ.

එමෙන්ම, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සතුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ස්ථාවර නියෝග ප්‍රකාරව ලැබී ඇති බලතල හා වගකීම් ප්‍රධාන වශයෙන් කොටස් 04 කි.

01. නියෝජනය (62 ව්‍යවස්ථාව)

02. ව්‍යවස්ථාදායක බලය (75 ව්‍යවස්ථාව)

03. රාජ්‍ය මූල්‍ය පාලනය (148 ව්‍යවස්ථාව)

04. අධීක්ෂණය (ස්ථාවර නියෝග අනුව)

නියෝජිත ප්‍රජාත්‍රන්ත්‍රවාදයට අනුව පාර්ලිමේන්තුවේ වැඩිම ආසන සංඛ්‍යාවක් හිමි පක්ෂයට ආණ්ඩු බලය හිමිවන අතර, රාජ්‍ය පාලනයේ වගකීම පැවරෙනුයේ ආණ්ඩුව මත ය. මෙහිදී ආණ්ඩුවේ කටයුතුවලට පාර්ලිමේන්තු ක්‍රියාවලිය තුළ ප්‍රධාන ස්ථානයක් හිමි වේ. නීති සම්පාදන ක්‍රියාවලියේ වැඩි බරක් ආණ්ඩුව

දරයි. පාර්ලිමේන්තු කාරක සභා ඇති කිරීමේ මූලික පරමාර්ථය වන්නේ,පාර්ලිමේන්තුවට ඉදිරිපත් වන පනත් කෙටුම්පත්, රෙගුලාසි, උසස් නිලතල සඳහා වන පත්කිරීම්, පාර්ලිමේන්තුව පරිපාලනය, මහජන ප්‍රශ්න යන සියලු කාරණා පාර්ලිමේන්තු සභා ගර්භයේ දී සාකච්ඡා කිරීමට අවකාශයක් හා කාල වේලාවක් නොමැතිවීම ය. ඒ අනුව පාර්ලිමේන්තුව වෙනුවෙන් යම් කරුණක් දීර්ඝ වශයෙන් හා ගැඹුරින් සාකච්ඡා කර, යම් නිර්දේශයන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පාර්ලිමේන්තු කාරක සභා මඟින් සිදු වේ.

කාරක සභා සංස්ථාපනයේ දී පාර්ලිමේන්තුව තුළ නියෝජනය අනුව දේශපාලන පක්ෂවල සංයුතිය සැලකිල්ලට ගන්නා අතර, හැකි සෑම අවස්ථාවකදීම සෑම පක්ෂයකම මන්ත්‍රීවරයන්ට කාරක සභාවල සාමාජිකත්වය ලබාදීමට ක්‍රියා කරයි. පාර්ලිමේන්තු සභා ගර්භයේ දී මෙන් නොව කාරක සභාවක් ඉදිරියේ දී පවතින යම් කාරණයක් සම්බන්ධයෙන් ඉතා දීර්ඝව හා ගැඹුරින් සාකච්ඡා කිරීමේ අවස්ථාව මන්ත්‍රීවරයන්ට ලැබෙන අතර, පාර්ලිමේන්තු රැස්වීම් පවතින දිනවල දී මෙන්ම එසේ නොපවතින දිනවල දී ද, පාර්ලිමේන්තුව පිටත දී ද, කාලය පිළිබඳ සීමාවලට යටත් නොවී රැස්වීමේ හැකියාව පවතී.

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කාරක සභාවල කාර්යයන් සාම්ප්‍රදායික පාර්ලිමේන්තු කාරක සභා සිදුකරන කාර්යයන් වන,

01. ව්‍යවස්ථාදායක කටයුතු

02. අධීක්ෂණය

03. විමර්ශනය

04. උසස් නිලතල පිළිබඳ නිර්දේශ නිකුත් කිරීම,

යන කාර්යන්ගෙන් ඔබ්බට ගොස් ක්‍රියාත්මක වේ. එනම් ජන ජීවිතයට බලපාන ප්‍රශ්නවලට විසඳුම් අමාත්‍යවරුන් මඟින් ලබා දීම, මහජනතාවගේ මානව හිමිකම් උල්ලංඝනයට අදාළ නිර්දේශ ලබාදීම වැනි කාර්යන් පාර්ලිමේන්තු කාරක සභා මඟින් ඉටු කිරීම විශේෂත්වයකි.

නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ සාම්ප්‍රදායික මතය වූයේ විපක්ෂයට හෝ මහජනතාවට ආණ්ඩුවේ නීති හා ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට සහභාගීවීමට හැකියාවක් නොමැති බව ය.

මෙම තත්ත්වය යටතේ මහජන නියෝජිතයන්ගේ ක්‍රියා කලාපය සම්බන්ධව මහජනතාව තුළ කලකිරීමත්, ඉච්ඡාභංගත්වයත්, ලොවපුරා පාර්ලිමේන්තු ක්‍රමය තුළ හටගත් අතර එය සමනය කිරීම සඳහා විවිධ අවස්ථාවල දී, විවිධාකාරයෙන් පාර්ලිමේන්තු ක්‍රියාවලියට මහජනතාවට සම්බන්ධ වීමට අවකාශ ලබාදුන් අතර ඊට භාවිත කළ සාර්ථකම ක්‍රමය වන්නේ පාර්ලිමේන්තු කාරක සභා ක්‍රම යයි.

මන්දයත්, නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී  ක්‍රමය තුළ මහජනතාවට හෝ නිලධාරින්ට එක එල්ලේ පාර්ලිමේන්තු සභා ගර්භයේ සිදුවන කටයුතුවලට සහභාගීවීමට අවකාශ නොමැත. එසේ වුවද කාරක සභා ක්‍රමයේ දී නිලධාරින්ට පමණක් නොව මහජනතාවට පාර්ලිමේන්තු ක්‍රමය හා සම්බන්ධ විය හැකි ය. කාරක සභා ක්‍රමය ක්‍රියාත්මක වීමේ දී එහි මන්ත්‍රීවරයන් අසුන් ගැනීම, කාරණා සාකච්ඡා කිරීම, විමර්ශනය කිරීම අවසානයේ ඒ සම්බන්ධව වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම යන සියලු පියවර තුළ ඔවුන් පක්ෂ දේශපාලනයෙන් තොරව, නිර්දේශපාලනිකව ක්‍රියා කරයි. එහිදී අවසානයේ කමිටුව එළඹෙන බොහෝ තීරණ හෝ නිර්දේශ ඒකමතිකව අවසන් කිරීමට හැකි සෑම උත්සාහයක්ම ගැනීම එහි ඇති විශේෂ ලක්ෂණයකි.

නීති සම්පාදනය, අධීක්ෂණය සහ මූල්‍ය පාලනය යන කටයුතුවල දී ආණ්ඩුවේ කටයුතු සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් ප්‍රශ්න කිරීමට, සාකච්ඡා කිරීමට, සහ අදහස් ඉදිරිපත් කිරීමට කාරක සභා ක්‍රමයේ දී මන්ත්‍රීවරයන්ට අවකාශ ලැබේ. බහු වාර්ගික, බහු ආගමික සහ බහු සංස්කෘතික පදනමක් සහිත ලංකාව වැනි රටක මහජනතාවගේ විවිධ වූ අපේක්ෂාවන් නියෝජනය කිරීමට, කරුණු ඉදිරිපත් කිරීමට, මන්ත්‍රීවරුන් හට මේ තුළින් අවකාශ හිමිවේ. නීති සම්පාදන ක්‍රියාවලියේ දී, එනම් වර්තමානයේ පවත්නා නීතිවල අඩුපාඩුකම් සම්බන්ධයෙන් සොයා බලා නව නීති සම්පාදනයට යෝජනා ඉදිරිපත් කිරීම සඳහා මෙමඟින් අවකාශ ලැබේ.

නීති සම්පාදන ක්‍රියාවලියට අතීතයේ දී මන්ත්‍රීවරයන් හා නිලධාරීන් පමණක් සහභාගී වූ අතර, වර්තමානය වන විට නීති සම්පාදනය ඉතා සංකීර්ණ ක්‍රියාවලියක් බවට පරිවර්තනය වී ඇති බැවින් ඊට අදාළ සියලුම පාර්ශවයන්, විශේෂඥයන්, බලපෑම් කණ්ඩායම් හා සිවිල් සමාජ නියෝජිතයන් ආදී විවිධ පාර්ශව කමිටුව ඉදිරියට කැඳවයි. ඒ තුළින් පාර්ලිමේන්තු ක්‍රමයක තිබිය යුතු ප්‍රධාන මූලික සිද්ධාන්තයන් 03ක් වන විවිධත්වය ආරක්ෂා කිරීම, සමාන බව හා සැවොම අන්තර්ගත කිරීම යන කරුණු මනාවට ක්‍රියාත්මක වේ.

මෙහි වැදගත්ම කාරණය වන්නේ විධායකය විසින් ගෙන එනු ලබන නීති සම්බන්ධයෙන් විරුද්ධ පක්ෂවල හා පසුපෙළ මන්ත්‍රීන් හට අවබෝධයක් ලබා ගැනීමට හා කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථා ලබා ගැනීමට හැකි අතර, පනත ගෙන ඒමට අදාළ ප්‍රතිපත්ති හා ඒවා නිසි පරිදි ක්‍රියාත්මක වී ඇති ද යන්න හා ඊට අදාළ මහජන ගැටලු සම්බන්ධව කරුණු ඉදිරිපත් කිරීමට හා සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා ගත හැකි ය.

එමෙන්ම පාර්ලිමේන්තු ක්‍රමයට හෝ දේශපාලනයට හෝ එක එල්ලේ සම්බන්ධ වීමට මැළිකමක් දක්වන උගතුන් හා වෘත්තිකයන් හා අනෙකුත් සමාජ ක්‍රියාකාරීන් මෙම ක්‍රමය තුළින් පාර්ලිමේන්තු ක්‍රමයට සම්බන්ධ කරගැනීමට අවකාශ සැලසේ. එමෙන්ම මහජන නියෝජිතයන්ට පමණක් නොව ප්‍රතිපත්ති සම්පාදකයන්ට යම් යම් ගැටලු සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට අවශ්‍ය කරනු ලබන කරුණු හා දත්ත ලබා ගැනීමට අවශ්‍ය ඉඩකඩ මෙම ක්‍රමය තුළින් සැක සේ.

නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය දිගු කාලීනව හා සාර්ථකව ක්‍රියාත්මක වන රටවල් වන මහා බ්‍රිතාන්‍යය, කැනඩාව, ඇමරිකාව ආදී රටවල ඉතා කාර්යක්ෂම හා සාර්ථක පාර්ලිමේන්තු කාරක සභා ක්‍රමයක් දැකිය හැකිය. ඒ තුළින් ආර්ථික සංවර්ධනය, මානව සංවර්ධනය, විද්‍යා හා තාක්ෂණික දියුණුව ලබා ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම ආදී කටයුතු රාශියක් සිදුවන අතර, වේගයෙන් වෙනස්වීම්වලට ආර්ථික, සමාජීය, දේශපාලනික හා පාරිසරික අභියෝගවලට මුහුණ දීමටත්, ඒවාට සාර්ථකව විසඳුම් ලබා ගැනීමටත් කාරකසභා ක්‍රමය දක්වන දායකත්වය හේතුවෙන් සමස්ත පාර්ලිමේන්තු ක්‍රමය පිළිබඳ මහජන විශ්වාසය තහවුරු වී ඇත.

# පාර්ලිමේන්තු රැස්වීම් දිනයක දී මන්ත්‍රීවරයෙකුට සක්‍රීය දායකත්වය ලබාදිය හැකි ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය පිළිබඳ විග්‍රහයක්

එච්. ඊ. ජනකාන්ත සිල්වා
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන), සභාලේඛන කාර්යාංශය,
ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව.
janakantha_s@parliament.lk

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4(අ) සහ 62 ව්‍යවස්ථාවල සඳහන් විධිවිධාන ප්‍රකාරව

- ජනතාවගේ පරමාධිපත්‍යය ක්‍රියාත්මක වීම ද, භුක්ති විඳීම ද, ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ජනතාව විසින් තෝරාපත් කර ගනු ලබන මන්ත්‍රීවරයන් දෙසිය විසිපස් දෙනෙකුගෙන් සමන්විත පාර්ලිමේන්තුව විසින් සිදුවන බව ව්‍යවස්ථානුකූලව ඉතාමත් පැහැදිලි ය.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75 ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන ප්‍රකාරව

- නීති පැනවීමේ බලය ව්‍යවස්ථාදායකය නැතහොත් පාර්ලිමේන්තුව සතු වන බැවින් ඊට අනුකූලව, රටට අවශ්‍ය නීති සම්පාදනය කිරීම සඳහා සෘජුවම නිරත වීමටත්;

## පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 22 සහ 50 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව

- රාජ්‍ය මූල්‍ය වැය කරනු ලබන විශේෂ ආයතනවල, විවිධ අමාත්‍යාංශවල,
- දෙපාර්තමේන්තුවල කාර්යසාධන වාර්තා,
- පාර්ලිමේන්තුවේ පනත්වලින් ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනවල වාර්ෂික වාර්තා,
- විවිධ පනත් යටතේ විෂය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලබන අතුරු ව්‍යවස්ථා,
- විවිධ පනත් කෙටුම්පත්

  රජය විසින් පාර්ලිමේන්තුවට විවිධ ලිපිලේඛනාදිය පිළිගැන්වීම යටතේ ඒවා ඉදිරිපත් කර ඒවා සියල්ල **පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 1114 විධිවිධාන ප්‍රකාරව** අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවලට යොමු කරනු ලැබ පරීක්ෂණය කිරීමේ දී ඒවා සම්බන්ධයෙන් එකී කාරක සභා රැස්වීම්වල දී සක්‍රිය හා සාධනීය දායකත්වයක් ලබා දීමටත්;
- අතුරු ව්‍යවස්ථා, පනත් කෙටුම්පත් යනාදිය පාර්ලිමේන්තුවේදී විවාද කරන අවස්ථාවේදී ද විවිධ කාරක සභා රැස්වීම්වලදී යෝග්‍ය පරිදි පරීක්ෂණය, විමර්ශනය හා අධීක්ෂණය කරනු ලැබූ කාරණා සම්බන්ධයෙන් සභාගර්භයේ දී සක්‍රිය සහ සාධනීය ලෙස විවාදවලට සහභාගි වීමටත්;

## පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 30 හි විධිවිධාන ප්‍රකාරව

- යම් රාජ්‍ය ආයතනයකින් හෝ යම් රාජ්‍ය නිලධාරියෙකු විසින් සිවිල් සමාජයේ කිසියම් හෝ පුරවැසියෙකුට කිසියම් හෝ අසාධාරණයක් සිදුවී තිබේ නම්, ඒ වෙනුවෙන් මහජන පෙත්සමක් ජනතා නියෝජිතයෙකු ලෙස කථානායකවරයා අමතා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විසින් පාර්ලිමේන්තුවට පිළිගන්වනු ලැබීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග (122) හි විධිවිධාන ප්‍රකාරව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ දී ඒ සම්බන්ධ විධිමත් පරීක්ෂණයකින් පසු එසේ අගතියට භාජනය වූ පාර්ශ්වයට සාධාරණත්වයක් ඉටු කරදීමටත්;

## පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 31 සිට 37 හි විධිවිධාන ප්‍රකාරව

- පොදු කටයුතු පිළිබඳ අග්‍රාමාත්‍යවරයාගෙන් හෝ ජනාධිපතිවරයා විසින් පවරා දෙන ලද යම් විෂයයන් කාර්යභාරයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශයීය වගකීමක් ඇති අමාත්‍යවරයෙකුගෙන් විදේශ සබඳතා ද ඇතුළුව සමස්ත රාජ්‍ය යාන්ත්‍රණය තුළින් හෝ නිලබලවාදය නිසා හෝ වින්දිතයෙකු බවට පත්වන සිවිල් සමාජයේ තනි පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට හෝ අදාළ වන යම් නිශ්චිත කාරණයක් සම්බන්ධයෙන් තොරතුරු ලබාගැනීමට හෝ කිසියම් ක්‍රියා මාර්ගයක් ගැනීම සම්බන්ධයෙන් රජයට බල කර සිටීමට හෝ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නයක් පාර්ලිමේන්තුවේදී අසනු ලැබීමටත්;
- අග්‍රාමාත්‍යවරයා හෝ අදාළ විෂය භාර අමාත්‍යවරයා හෝ විසින් එවැනි පාර්ලිමේන්තු ප්‍රශ්නයක් සම්බන්ධයෙන් සභාගර්භයේ දී පිළිතුරක් ලබාදුන් අවස්ථාවකදී එකී පිළිතුර පැහැදිලි කර ගැනීමට ප්‍රශ්නය අසන ලද මන්ත්‍රීවරයාට හෝ වෙනත් ඕනෑම මන්ත්‍රීවරයෙකුට අතුරු ප්‍රශ්න දෙකක් අසනු ලැබීමටත්;

## පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග (38) හි විධිවිධාන ප්‍රකාරව

- ජාතික වැදගත්කමකින් යුතු කාරණා ද ඇතුළුව ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට අදාළ කාරණාවලට සීමා වී සෑම මාසයකම පළමුවැනි රැස්වීම් සතියේ බදාදා වාචික පිළිතුරු අපේක්ෂා කරන පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා වෙන්කර තිබෙන කාලයෙන් මිනිත්තු තිහක කාලයක් පසුපෙළ ආණ්ඩු පාර්ශ්වයේ සහ විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයන්ට වෙන් වශයෙන් දෙක බැගින් ප්‍රශ්න හතරක් අග්‍රාමාත්‍යවරයාගෙන් අසනු ලැබීමටත්;
- අග්‍රාමාත්‍යවරයා විසින් යම් ප්‍රශ්නයකට පිළිතුරු ලබාදීමෙන් අනතුරුව ප්‍රශ්නය අසන ලද මන්ත්‍රීවරයා විසින් අතුරු ප්‍රශ්න දෙකක් අසනු ලැබිය හැකි අතරම ප්‍රශ්නය අසනු ලබන මන්ත්‍රීවරයාගේ අවසරය ඇතිව, වෙනත් ඕනෑම මන්ත්‍රීවරයෙකුට එම අතුරු ප්‍රශ්නවලින් එකක් හෝ ඊට වැඩි ගණනක් අසනු ලැබීමටත්;

## පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 24 හි විධිවිධාන ප්‍රකාරව

- පාර්ලිමේන්තු රැස්වීම් පවත්වනු ලබන සෑම මාසයකම පළමුවැනි සිකුරාදා පෞද්ගලික මන්ත්‍රී යෝජනා තුළින් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා රජයට සාධනීය කාරණා ඉදිරිපත් කර ඒවා විවාද කර ඒ සඳහා සක්‍රිය හා සාධනීය දායකත්වයක් ලබාදීමටත්;

## පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 20 හි විධිවිධාන ප්‍රකාරව

- හදිසි පොදු වැදගත්කමකින් යුතු කාරණා සම්බන්ධයෙන් පාර්ලිමේන්තු රැස්වීම් පවත්වනු ලබන සෑම දිනයකදීම පැයක කාලයක් සඳහා සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කිරීම තුළින් ජනතාවට වගවීමටත්;

## පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112 හි විධිවිධාන ප්‍රකාරව

- අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා රැස්වීම්වල දී අදාළ මැතිවරණ කොට්ඨාස බල ප්‍රදේශය තුළ රජය විසින් සපුරාලීමට අපේක්ෂා කරනු ලබන සංවර්ධන කටයුතු පිළිබඳ සොයා බැලීම හෝ ඉටු කරන ලද සංවර්ධන කටයුතු පිළිබඳ පසු විපරම් කටයුතු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කිරීමට හෝ අදාළ අමාත්‍යාංශයීය උපදේශක කරක සභා රැස්වීමට පැමිණ සහභාගි වීම තුළින් ඒවා විමසා බැලීමටත්;

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන ප්‍රකාරව

- රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු බැවින් විවිධ රාජ්‍ය මූල්‍ය වැය කරනු ලබන විශේෂ ආයතනවලට, අමාත්‍යාංශවලට, දෙපාර්තමේන්තුවලට, පළාත් සභා හා පළාත් පාලන ආයතනවලට විවිධ වැය ශීර්ෂ යටතේ මුදල් වෙන් කරමින් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 75 හි විධිවිධාන ප්‍රකාරව විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දී සම්මත කිරීමෙන් රාජ්‍ය මූල්‍ය පාලනයේ දී සක්‍රීය හා සාධනීය දායකත්වයක් ලබාදීමටත්;

## පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 හි විධිවිධාන ප්‍රකාරව

- මහජන වියදම් සඳහා පාර්ලිමේන්තුව විසින් ප්‍රදානය කරනු ලබන මුදල් විසර්ජනය කිරීම පෙන්නුම් කරන ගිණුම් ද, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු ලැබිය හැකි පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන වෙනත් යම් ගිණුම් ද, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කරනු ලැබීම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කර්තව්‍යය බැවින් ඊට නිරන්තරයෙන් සක්‍රිය දායකත්වය ලබාදීමටත්;

## පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120 හි විධිවිධාන ප්‍රකාරව

- රාජ්‍ය සංස්ථා සහ මුළුමනින්ම හෝ කොටසක් ආණ්ඩුව විසින් අරමුදල් සපයනු ලබන ආයතනවල ගිණුම් සහ යම් ලිඛිත නීතියක් මගින් ආණ්ඩුවට පවරා ගන්නා ලද යම් ව්‍යාපාරයක් හෝ වෙනත් පැවරීමක් සම්බන්ධව පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන ගිණුම්, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කරනු ලැබීම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කර්තව්‍ය බැවින් ඊට නිරන්තරයෙන් සක්‍රිය දායකත්වය ලබාදීමටත්;

## පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 121 හි විධිවිධාන ප්‍රකාරව

- ආදායම් එකතු කිරීම, ඒකාබද්ධ අරමුදලින් කරනු ලබන ගෙවීම්, නීතිය මගින් යම් විශේෂ කාර්ය සඳහා මහජන අරමුදල් භාවිත කිරීම, රජයේ අරමුදල් යෙදවීම, පවත්නා වර්ෂය සඳහා විසර්ජන පනතේ අඩංගු විසර්ජනවල ආර්ථික අවපාත, විසර්ජන මාරු කිරීම සහ අනපේක්ෂිත ශේෂය, පවත්නා වර්ෂය සඳහා විසර්ජන පනත කියාත්මක කිරීම, රාජ්‍ය ණය හා ණය සේවා සහ 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත් යටතේ වාර්තා සහ ප්‍රකාශන පරීක්ෂා කරනු ලැබීම පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 121 හි විධිවිධාන ප්‍රකාරව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ කර්තව්‍යය බැවින් ඊට නිරන්තරයෙන් සක්‍රිය දායකත්වය ලබාදීමටත්;

## පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 13 (අ) සහ 10(3) හි විධිවිධාන ප්‍රකාරව

- පිළිවෙළින් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය, න්‍යාය පුස්තකය යනාදී ව්‍යවස්ථාදායක ලිපිලේඛන යථා පරිදි පරිශීලනය කිරීමෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස ඉටුවිය යුතු ව්‍යවස්ථාදායක කටයුතු විධිමත් ලෙස ඉටු කිරීමටත්;

  රජය විසින් වෙන් කරනු ලැබ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට ලබාදෙන විමධ්‍යගත අරමුදල් උපයෝගි කරගෙන මන්ත්‍රීවරයාගේ මැතිවරණ බල ප්‍රදේශය තුළ විවිධ **සංවර්ධන ක්‍රියාදාමයන්ට සෘජුවම දායකත්වය ලබාදීම** මඟින් රටේ සංවර්ධන ක්‍රියාවලියට ද සම්බන්ධවීමටත්;

  **පාර්ලිමේන්තුවේ පර්යේෂණ අංශය, පුස්තකාලය වැනි තොරතුරු මූලාශ්‍රය** උපයෝගි කරගෙන පාර්ලිමේන්තුවේ විවාදවලට සක්‍රිය හා සාධනීය ලෙස නිරන්තරයෙන් සහභාගිවීමටත්;

  **පාර්ලිමේන්තුවේ නිල වෙබ් අඩවිය පරිශීලනය කිරීම තුළින්** ව්‍යවස්ථාදායකයේදී සිදු කරන ලද වැඩ කටයුතු පිළිබඳ සමාලෝචනයක යෙදීමට හැකියාව තිබෙන අතර ව්‍යවස්ථාදායකයේ ඉදිරි රැස්වීම් දිනවල දී සාකච්ඡාවට ගැනීමට නියමිත වැඩකටයුතු පිළිබඳ කල් තබා සූදානම්වීමටත්, යෝග්‍ය පරිදි විවාදවලට සක්‍රිය හා සාධනීය සහභාගිත්වයක් ලබාදීමටත්;

**සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුටම හැකියාව පවතින බව ඉතා පැහැදිලිව ප්‍රත්‍යක්ෂ වේ.**

ඉහත සඳහන් කාරණා සියල්ලම ගැඹුරින් අධ්‍යයනය කර බැලීමේදී පාර්ලිමේන්තු රැස්වීම් දිනයකදී සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුටම,

- ජනතා නියෝජිතයෙක් (People's Representative)
- නීති සම්පාදකයෙක් (Legislator)
- විමර්ශකයෙක් (Scrutizer)
- අධීක්ෂකයෙක් (Oversight Function)
- රාජ්‍ය මූල්‍ය පාලකයෙක් (Controller over Public Finance)
- ප්‍රතිපත්ති සම්පාදකයෙක් (Policy Maker)
- සංවර්ධන ප්‍රවර්ධකයෙක් (Development Promoter)
- ජනතා දුක්ගැනවිලි විසඳන්නෙක් (Public Ombudsman)
- ව්‍යවස්ථාදායක පාඨකයෙක් (Legislative Reader)
- ව්‍යවස්ථාදායක පර්යේෂකයෙක් (Legislative Researcher)

වශයෙන් නවවැනි පාර්ලිමේන්තුවේ සභා ගර්භය තුළ සහ කාරක සභා ක්‍රමය තුළ සක්‍රිය හා සාධනීය දායකත්වය ජනතාව වෙනුවෙන් ලබාදීමට හැකිවෙතැයි යන්න සැමගේ අපේක්ෂාවයි.

# නව පාර්ලිමේන්තුවක ආරම්භක දිනය සහ එහි ක්‍රියාපටිපාටිය

නිම්මි හාතියල්දෙනිය
මාධ්‍ය කළමනාකරු - සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
nimmiehathiyaldeniya@gmail.com



නව වන පාර්ලිමේන්තුව සඳහා මන්ත්‍රීවරුන් තෝරා පත්කර ගැනීම වෙනුවෙන් පැවැත්වුණු මහ මැතිවරණය පසුගිය අගෝස්තු 05 වැනිදාට යෙදී තිබිණ. එහිදී මහජන ඡන්දයෙන් තේරී පත්වන මන්ත්‍රීවරු 196 දෙනෙක් සහ ජාතික ලැයිස්තුවෙන් පත්වන මන්ත්‍රීවරු 29 දෙනෙක් ද ඇතුළුව පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරු සංඛ්‍යාව 225 ක් බවට පත්වෙති. මෙසේ තේරීපත්වන මන්ත්‍රීවරයන් සහභාගි වන නව වැනි පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරය ජනාධිපතිවරයා විසින් තීරණය කරනු ලබන දිනයක දී ආරම්භ වේ. පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරයේ පළමු දිනය ඉතා වැදගත් වන්නේ එදින සිදුකිරීමට නියමිත විශේෂ කටයුතු රැසක් පවතින බැවිනි.

පළමු දිනයේ සභා ගර්භයේ කටයුතු වල ප්‍රධාන වගකීම් පැවරෙනුයේ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙතය. පළමු දිනයේදී මන්ත්‍රීවරයන් සඳහා අසුන් පැනවීමේ පිළිවෙළක් නොමැති අතර තමන්ට රිසි අසුනක අසුන් ගැනීමේ අවස්ථාව මන්ත්‍රීවරයන්ට හිමිවේ. සෙංකෝලය සභා ගර්භයේ තැන්පත් කිරීමෙන් පසු, පාර්ලිමේන්තුව රැස් වන දිනය හා වෙලාව නියම කරමින් ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද නිවේදනය මහ ලේකම්වරයා විසින් දිනයේ පළමු කාර්යය ලෙස සභාවට ඉදිරිපත් කරනු ලබයි. අනතුරුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 64(1) වගන්තිය ප්‍රකාරව අනුපිළිවෙළින් කථානායකවරයා ඡන්දයෙන් පත්කර ගැනීම, කථානායක නිල ප්‍රතිඥාව හෝ දිවුරුම ලබා දීම, මන්ත්‍රීවරයන් විසින් නිල ප්‍රතිඥාව හෝ දිවුරුම ලබා දීම, නියෝජ්‍ය කථානායක සහ කාරකසභා සභාපති ඡන්දයෙන් තෝරා පත් කර ගැනීම සිදුකරනු ලැබේ.

## කථානායකවරයා පත් කිරීම

පාර්ලිමේන්තුවේ කථානායකවරයා ලෙස ඕනෑම මන්ත්‍රීවරයෙක් පත් කළ හැකිය. නමුත් කිසියම් මන්ත්‍රීවරයෙකුගේ නාම යෝජනාවක් ඉදිරිපත් කිරීමට පෙර කථානායකවරයා ලෙස පත්වීමට අදාළ මන්ත්‍රීවරයාගේ කැමැත්ත විමසිය යුතු වේ. කථානායකවරයා පත්කිරීම මන්ත්‍රී යෝජනා ස්ථිරත්වයෙන් සිදු විය යුතු අතර ඒ පිළිබඳ විවාද පැවැත්වීමට අවකාශ නොලැබේ.

මෙහිදී මුලින්ම කථානායකවරයා පත් කර ගත යුතු බව මහ ලේකම්වරයා විසින් සභාවට දැනුම් දෙනු ලබයි. එවිට යම් මන්ත්‍රීවරයෙක් අසුනින් නැගී සිටියහොත් මහ ලේකම්වරයා විසින් එම මන්ත්‍රීවරයා දෙසට සියත දිගුකොට අදාළ යෝජනාවට සභාවේ අවධානය යොමු කරවයි. එසේ එක් නමක් යෝජනා වූ පසු වෙනත් නාම යෝජනා තිබේද යන්න මහ ලේකම්වරයා විසින් අනිවාර්යයෙන්ම සභාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී විරෝධතාවක් හෝ වෙනත් යෝජනාවක් නොමැති නම් එම මන්ත්‍රීවරයා කථානායක ලෙස තෝරාපත් කර ගැනේ. මෙහිදී අදාළ මන්ත්‍රීවරයාගේ නම යෝජනා ස්ථිර කරනු ලැබූ මන්ත්‍රීවරයන් දෙදෙනා විසින් එම මන්ත්‍රීවරයාව දෙඅතින් අල්වාගෙන කථානායක අසුන වෙත කැඳවාගෙන යෑම ඓතිහාසික සම්ප්‍රදාය වේ. මෙසේ දෙඅතින් අල්වාගෙන යෑමේ සම්ප්‍රදාය බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමයෙන් ආභාසය ලද්දකි. අතීතයේදී බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමය තුළ කථානායක තනතුර එතරම් සිත් ගන්නා සුලු තනතුරක් නොවීම නිසා මන්ත්‍රීවරයාගේ අකැමැත්තෙන් කථානායක අසුන වෙත කැඳවාගෙන යන ආකාරයක් මෙමඟින් නිරූපණය කෙරේ. අනතුරුව කථානායකවරයා විසින් සිය නිල ප්‍රතිඥාව හෝ දිවුරුම දීම සිදුකරන අතර එම දිවුරුම හෝ ප්‍රතිඥාව ලබා ගනු ලබන්නේ මහලේකම්වරයා විසිනි. එසේ පත්වන කථානායකවරයා සිය ආසනයේ අසුන් ගැනීමට පෙර තමාව තෝරා පත් කර ගැනීම පිළිබඳ කෙටි ස්තුතියක් සභාව වෙත සිදු කිරීම සම්ප්‍රදායකි. නව කථානායකවරයාගේ තේරී පත්වීම පිළිබඳ ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ශුභාශිංසන පිරිනැමෙන අතර, අනතුරුව කථානායකවරයා විසින් සිය දීර්ඝ ස්තුති කථාව සිදුකරනු ලැබේ. සභාවේ මන්ත්‍රීවරයන් මන්ත්‍රීවරයෙකු ලෙස සිය ප්‍රතිඥාව හෝ දිවුරුම කථානායකවරයා වෙත ලබාදෙන්නේ ඉන් අනතුරුවයි.

කථානායක ධූරය සඳහා මන්ත්‍රීවරයන් දෙදෙනෙකුගේ නම් යෝජනා වී ඇති විටකදී රහස් ඡන්දයක් පැවැත් වේ. මෙලෙස රහස් ඡන්ද පවත්වන අවස්ථා 04ක් පාර්ලිමේන්තු ක්‍රමය තුළ පවතී. ඒවා නම් කථානායක පත්කිරීම, නියෝජ්‍ය කථානායක පත්කිරීම, නියෝජ්‍ය කාරකසභා සභාපති තෝරා පත්කර ගැනීම හෝ පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයෙකු තෝරා පත් කර ගන්නා අවස්ථාය.

එම ඡන්ද විමසීමේදී බෙදුම් සීනු විනාඩි 05 ක් නාද කිරීමෙන් අනතුරුව මහ ලේකම්වරයා විසින් සෑම මන්ත්‍රීවරයෙකුටම ඡන්ද පත්‍රිකාව බැගින් ලබා දෙන අතර, මන්ත්‍රීවරයන් ඒ මත ඡන්දය ලබාදෙන අපේක්ෂකයාගේ නම සහ සිය අත්සන යෙදිය යුතු වේ. අනතුරුව එම ඡන්ද පත්‍රිකාව කිසිවෙකුට නොපෙනෙන සේ නවා ඡන්ද පෙට්ටියට ඇතුළත් කළ යුතු වේ. ඡන්දයක් පැවැත්වීමේ ආකාරය තීරණය කිරීමේ බලය සහ ඡන්ද ගණන් කිරීමේ රාජකාරිය සම්පූර්ණයෙන් හිමි වන්නේ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙතයි. ඡන්දය ගණනය කරනු ලබන්නේ මහ ලේකම්වරයාගේ මේසය (Table of parliament) මතදී ය. මෙසේ ගණනය කිරීමෙන් අනතුරුව ඡන්ද ප්‍රතිඵලය සභාව වෙත ප්‍රකාශයට පත් කරනු ලැබේ. යම් අවස්ථාවකදී ඡන්ද පත්‍රිකාවක මන්ත්‍රීවරයාගේ අත්සන යොදා නොමැති විටක දී එම ඡන්දය අවලංගු ඡන්දයක් ලෙස පිළිගැනේ.

කථානායක ධූරය සඳහා මන්ත්‍රීවරයන් දෙදෙනෙකුට වැඩි ගණනකගේ නම් යෝජනා වී ඇති විටක දී පළමු ඡන්ද විමසීමේ දී එක් අපේක්ෂකයෙකුටවත් අනෙක් අපේක්ෂකයන් සියල්ලන්ටම ලැබී තිබෙන මුළු ඡන්ද ගණනට වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලැබී නොමැතිනම්, අඩුවෙන්ම ඡන්දය ලබාගත් මන්ත්‍රීවරයා තරගයෙන් ඉවත් කොට ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් නැවත ඡන්ද විමසීම ඉදිරියට කරගෙන යා යුතු ය. එලෙස ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් පවත්වන සෑම ඡන්ද විමසීම් වාරයකදීම අඩුම ඡන්ද ගණන ලබා ගන්නා අපේක්ෂකයා බැහැර කරමින් එක් අපේක්ෂකයෙකු, ඉතිරි වී ඇති අනෙක් අපේක්ෂකයන් ලබා ඇති

මුළු ඡන්ද ගණනට වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබා ගන්නා තෙක් ඡන්ද පත්‍රිකා මාර්ගයෙන් ඡන්ද විමසීම පවත්වාගෙන යා යුතු ය.

යම් අවස්ථාවක දී මන්ත්‍රීවරයන් තිදෙනෙක් හෝ ඊට වැඩි ගණනක් ඡන්දයට පෙනී සිටින විට සහ මන්ත්‍රීවරුන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් සමාන ඡන්ද ලබා ඇති විට කුසපත් ඇදීම මගින් එක සමාන ඡන්ද ගණනක් ලබා ඇති මන්ත්‍රීවරයන් අතරින් එක් අයෙක් ඉවත් කිරීමේ බලය මහ ලේකම්වරයාට හිමි වේ. අනතුරුව වැඩි ඡන්ද හිමි අපේක්ෂකයා සහ ඉතිරිවූ අනෙක් අපේක්ෂකයන් අතර නැවත ඡන්දයක් පවත්වා කථානායකවරයා තෝරා පත් කර ගැනේ.

මන්ත්‍රීවරයන් දෙදෙනෙකු අතර ඡන්දය පැවැත්වෙන අවස්ථාවකදී අපේක්ෂකයන් දෙදෙනාම සමාන ඡන්ද ලබා ඇති විටකදී නැවත ඡන්දය පවත්වයි. නමුත් එම අවස්ථාවේදීත් අපේක්ෂකයන් දෙදෙනා විසින් සමාන ඡන්ද ලබා ඇති විටකදී කුසපත් ඇදීම මඟින් කථානායකවරයෙක් තෝරා ගැනීමේ බලය මහ ලේකම්වරයාට හිමි වේ. මෙහිදී කුසපත් ඇදීමේ ක්‍රමවේදය තීරණය කිරීමේ බලය සම්පූර්ණයෙන් මහ ලේකම්වරයාට හිමි වේ.

ඡන්දයක් පැවැත්වීමෙන් අනතුරුව අදාළ ඡන්ද පත්‍රිකා මුද්‍රා තබා එක් ලිත් මාසයක කාල සීමාවක් මහ ලේකම්වරයාගේ භාරයේ තැබිය යුතු අතර, පසුව පාර්ලිමේන්තුවෙන් ලැබෙන නියෝගයක් අනුව ඒවා විනාශ කර, ඒ බව නැවත පාර්ලිමේන්තුවට දැනුම්දිය යුතු ය.

පාර්ලිමේන්තුවට තේරී පත්වන සියලු මන්ත්‍රීවරයන් පළමු දිනයේදී අත්සන් තැබීමේ ලේඛනයේ අත්සන් තැබීම සිදුකළ යුතු ය. මෙහිදී කථානායකවරයා පළමුවෙන් අත්සන් තබන අතර අනතුරුව සම්ප්‍රදායක් ලෙස අගමැතිවරයා අත්සන් කිරීමෙන් පසු මන්ත්‍රීවරු සිය අත්සන් යොදති. මෙම අත්සන් ලේඛනය සම්ප්‍රදායානුකූලව ඉතා ආරක්ෂිත ලේඛනයක් ලෙස පවත්වාගෙන යයි.

නියෝජ්‍ය කථානායකවරයා සහ නියෝජ්‍ය කාරකසභා සභාපතිවරයා තෝරා පත් කර ගැනීමේ අවස්ථාව වන විට කථානායකවරයා තේරී පත්ව ආසනයේ රැඳී සිටින බැවින් සියලු දැනුම්දීම් සහ ඡන්ද මෙහෙයවීම් සිදු කරනු ලබන්නේ කථානායකවරයා විසිනි. නියෝජ්‍ය කථානායකවරයා සහ කාරකසභා සභාපතිවරයා සඳහා නාම යෝජනා වීමෙන් අනතුරුව කථානායකවරයා විසින් වෙනත් යෝජනා තිබේදැයි සභාවෙන් විමසනු ලබයි. එසේ නොමැති විටකදී අදාළ යෝජිත මන්ත්‍රීවරයන් තනතුරු සඳහා තේරී පත්වේ. යම් අවස්ථාවකදී ඡන්ද විමසීමක් සිදුකරන්නේ නම් කථානායක තෝරා පත්කරගත් ක්‍රියා පිළිවෙතම අනුග මනය කෙරේ.

ඉහත කටයුතු සිදු කිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තුව කල් තබනු ලැබේ. මෙහිදී කල් තබන දිනය වන්නේ බොහෝ විට ඊළඟට එළඹෙන පාර්ලිමේන්තු දිනය යි.

සටහන පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහලේකම් සහ කාර්ය මණ්ඩල ප්‍රධානී නීල් ඉද්දවල මහතා සමග සිදුකළ සාකච්ඡාවක් ඇසුරිනි.

# තිරසර සංවර්ධන අරමුණු පාර්ලිමේන්තු කටයුතු සමඟ සම්බන්ධ කිරීම

ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන

ශ්‍රී ලංකාව ඇතුළු එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍ය විසින් (2015) වසරේ දී, (2030) වසර වන විට සම්පූර්ණ කිරීම ඉලක්ක කරගත් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය වන තිරසර සංවර්ධන අරමුණු හෙවත් (SDGs) පිළිගන්නා ලදී. එය වනාහි 2030 වසර වන විට දිළිඳුභාවය අවසන් කිරීමට, පෘථිවිය සුරක්ෂිත කිරීමට සහ සමස්ත ලෝකයේ ම වැසියන්ට සාමය හා සෞභාග්‍යය භුක්ති විඳීමට සැලැස්වීම සඳහා ලෝකයට ම කරන ලද ආරාධනයකි.[1]

> "අපගේ වගකීම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ වගවීම තහවුරු කිරීමේදී නීති බලාත්මක කිරීමෙන් සහ අයවැය සම්පාදනය කිරීමෙන් ජාතික පාර්ලිමේන්තු විසින් ඉටුකරන අත්‍යවශ්‍ය භූමිකාව අපි අගය කරන්නෙමු. "
>
> තිරසර සංවර්ධනය සඳහා 2030 න්‍යාය පත්‍රය පිළිබඳ ප්‍රකාශය

තිරසර සංවර්ධන අරමුණු (17) එකිනෙක සමඟ සම්බන්ධ ය. එයින් අදහස් වන්නේ, එක් අරමුණක ක්‍රියාමාර්ග වෙනත් අරමුණුවල ප්‍රතිඵලවලට බලපාන බව යි. එම සංවර්ධනය මගින් සමාජ, ආර්ථික සහ පාරිසරික තිරසරභාවය සමතුලනය කළ යුතු ය.

තිරසර සංවර්ධනය යථාර්ථයක් බවට පත්කිරීමේදී පාර්ලිමේන්තුවලට වටිනා භූමිකාවක් තිබේ. 2030 න්‍යාය පත්‍රය විසින් "නීති සම්පාදනය සහ අයවැය සැලසුම් කිරීමේදී සහ තිරසර සංවර්ධන අරමුණු කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීමේදී පාර්ලිමේන්තුවල වගකීම් සහගත භූමිකාව" අගය කරනු ලැබේ.

තිරසර සංවර්ධන අරමුණු සඳහා වන නීතිමය රාමුව නිර්මාණය කිරීම සඳහා පාර්ලිමේන්තු විසින් නීති සම්පාදනය කර සම්මත කළ යුතු ය. තිරසර සංවර්ධන අරමුණු සමඟ සම්බන්ධ විවිධ සංවර්ධන ක්ෂේත්‍රවලට මුදල් වෙන් කරන අයවැය යෝජනා විවාද කර පාර්ලිමේන්තුවේදී සම්මත කළ යුතු ය. තිරසර සංවර්ධන අරමුණු ජාතික හා ප්‍රාදේශීය තත්වයන්ට ගැළපෙන පරිදි ක්‍රියාත්මක වන්නේ ද යන්න නිරීක්ෂණය කිරීම ද පාර්ලිමේන්තුවට සිදු කළ හැකි ය. එසේම, තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේදී තම මැතිවරණ කොට්ඨාසවල ජනතා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීමට ද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හැකිය.

2030 වසර වන විට සම්පූර්ණ කිරීම ඉලක්ක කරගත් න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමේදී පාර්ලිමේන්තුවලට, මන්ත්‍රීවරුන්ට සහ කාර්ය මණ්ඩලයට සහාය වීම පිණිස, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන පාර්ලිමේන්තු සංවර්ධනය සඳහා ක්‍රියා කරන තවත් වැදගත් පාර්ශ්වකරුවන් සමඟ එක්ව තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ ලේඛන ප්‍රසිද්ධ කර තිබේ. එමගින් අරමුණු ක්‍රියාත්මක කිරීමට දිරි දීම හා ඒවා ක්‍රියාත්මක වන ආකාරය නිරීක්ෂණය කිරීම සඳහා වන වර්තමාන සූදානම තක්සේරු කිරීමට හා එසේ කිරීම සඳහා අවශ්‍ය හැකියාවන් ගොඩනැගීමට ඔවුන්ට හැකි ය.[2]




16වන තිරසර සංවර්ධන අරමුණ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විශේෂයෙන් වැදගත් ය. එමගින් ඉලක්ක කරනු ලබන්නේ "සාමකාමී සහ අන්තර්ග්‍රාහී සමාජයන් ප්‍රවර්ධනය කිරීම, සැමට යුක්තිය වෙත ප්‍රවේශය සැපයීම සහ කාර්යක්ෂම, වගකීමක් සහිත සහ අන්තර්ග්‍රාහී ආයතන සෑම මට්ටමකදී ම බිහි කිරීමයි." පාර්ලිමේන්තුව ද කාර්යක්ෂම, සියල්ලන් ඇතුළත් කරගන්නා, වගවීම් සහිත ආයතනයක් බවට පත් කිරීමේ අවශ්‍යතාවක් ද තිබේ.

1 ශ්‍රී ලංකාව විසින් ඉන් අනතුරුව 2017 අංක 19 දරණ ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත ක්‍රියාත්මක කරන ලදී

2 සොයාගත හැකි ප්‍රධාන මූලාශ

- UNDP/GOPAC/IDB (2017) Parliament's Role in Implementing the Sustainable Development Goals: A Parliamentary Handbook. Available in English, Russian and Arabic here
- UNDP/ IPU (2016) Parliaments and the Sustainable Development Goals: A self-assessment toolkit. Available here

තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී රටක ඇපකැපවීම සිදුවන්නේ විධායකය වෙතිනි. ප්‍රගතිය හා සම්බන්ධ සියලු වාර්තා කිරීම් නිල වශයෙන් කරනු ලබන්නේ මෙම ශාඛාව විසිනි. කෙසේ වෙතත්, තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම ආරම්භයේ සිටම ක්‍රියාත්මක කිරීමේ සියලු පැතිකඩවලදී පාර්ලිමේන්තුවේ සක්‍රිය සහභාගිත්වය ඉතා වැදගත් ය. එමඟින් පාර්ලිමේන්තුවට හා එහි මන්ත්‍රීවරුන්ට තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධ හිමිකාරිත්වය පිළිබඳ හැඟීමක් වර්ධනය වේ. නීති සම්මත කරන විට හෝ අයවැය සංශෝධනය කිරීමට අවශ්‍ය වන විට, එහි පසුබිම පිළිබඳ පූර්ණ අවබෝධයකින් යුතුව විවාද කිරීමේ හැකියාව පාර්ලිමේන්තුවට තිබිය යුතු ය.

16වන අරමුණ යටතේ වන ඉලක්ක පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අදාළ ය. (16.6) සහ (16.7) මගින් ඔවුන්ගේ කාර්යන් සෘජුවම ආවරණය කරනු ලැබේ. 16.6 ඉලක්කය මගින් "ප්‍රතිචාරාත්මක, අන්තර්ග්‍රාහී, වගකීම් සහිත සහ විනිවිද පෙනෙන ආයතන සෑම මට්ටමක දී ම ගොඩනැගීම" ඉලක්ක කරනු ලැබේ. 16.7 ඉලක්කය මගින් "සෑම මට්ටමකදී ම, ප්‍රතිචාරාත්මක, අන්තර්ග්‍රාහී, සහභාගී සහ නියෝජනාත්මක තීරණ ගැනීම" අපේක්ෂා කරනු ලැබේ. උදාහරණයක් ලෙස, පාර්ලිමේන්තු කාරක සභා මහජනයාට විවෘත කිරීමෙන්, වැඩිපුර පාර්ලිමේන්තු තොරතුරු මුදාහැරීමෙන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ජනතාව වෙත සමීප වීම දිරිගැන්වීමෙන් සහ කාන්තාවන්ගේ, අවදානම් සහගත ප්‍රජාවන්ගේ හා කොන්කරන ලද කණ්ඩායම්වල තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා විශේෂිත උපායමාර්ග අනුගමනය කිරීමෙන් එසේ සිදු කළ හැකි ය.[3] මෙම ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් තම කාර්යයන් සහ ක්‍රම වැඩිදියුණු කරගැනීමේ විවිධ ආකාර සොයා බැලිය යුතු ය.

## ශ්‍රී ලංකාව තිරසර සංවර්ධන අරමුණු සමග සම්බන්ධ වන ආකාරය

තිරසර සංවර්ධන සභාව පිහිටුවීමට ඉවහල් වන 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත ක්‍රියාත්මක කිරීමට අමතරව ලොව පළමු වරට තිරසර සංවර්ධන අරමුණු සඳහා වන පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පිහිටු වූ පළමු පාර්ලිමේන්තු අතරට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ද ඇතුළත් වේ. වෙනත් කාර්යයන් අතර, තේරීම් කාරක සභාව විසින් 2017 වසරේ අයවැය මගින් තිරසර සංවර්ධන අරමුණු ආවරණය වන ආකාරය ද තක්සේරු කරන ලදී. මෙමගින්, මුදල් අමාත්‍යාංශය සමඟ කටයුතු කරමින්, අයවැය කෙතරම් දුරට තිරසර සංවර්ධන අරමුණු සමග අනුගත වේ ද යන්න තහවුරු කරන ලදී. මෙම අභ්‍යාසයෙහි එක් අරමුණක් වූයේ තිරසර සංවර්ධන අරමුණු සමඟ සම්බන්ධ අයවැය තක්සේරු කිරීමේ අවස්ථාව පාර්ලිමේන්තුවට ලබාදීමය.

1. **ජාතික ප්‍රමුඛතාවන් සැලසුම් කර, තිරසර සංවර්ධන අරමුණු යථාර්ථයක් බවට පත්කිරීමේ හැකියාව පාර්ලිමේන්තුවට තිබේ:** ජාතික හා ප්‍රාදේශීය මට්ටම්වලදී තිරසර සංවර්ධන අරමුණු පුරවැසියන් වෙත රැගෙන ඒමේදීත්, ජාතික ප්‍රමුඛතාවන් නිර්මාණය කිරීමට පාර්ශ්වකරුවන් සහභාගි කරගැනීමේදීත් පාර්ලිමේන්තුවට ඉතා හොඳ භූමිකාවක් ඉටු කළ හැකි ය. පාර්ලිමේන්තුවේ සන්නිවේදන සහ මහජන සම්බන්ධතා උපායමාර්ගය මගින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මහජනයා සමග වඩා කාර්යක්ෂම ලෙස සම්බන්ධ විය හැකි ආකාරය ඉදිරිපත් කරනු ලැබේ. කාරක සභා මහජනතාවට විවෘත කිරීම සහ එම කටයුතු විකාශය කිරීම මහජනයා සම්බන්ධ කරගැනීම වඩා හොඳින් කළ හැකි ආකාර වේ.

2. **තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීමේ ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීමට පාර්ලිමේන්තුවට හැකිය:** අධීක්ෂණ කාර්යන් හරහා පාර්ලිමේන්තු සහ මන්ත්‍රීවරුන් රජයේ තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කරන අත්‍යවශ්‍ය පිරිසක් බවට පත් වේ. රටේ අනාගතය වෙනුවෙන් ප්‍රමුඛතා සහ අරමුණු උදෙසා සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම සඳහා, අදාළ රජයේ ආයතනවලින් දත්ත හා සංඛ්‍යාලේඛන ලබාගැනීමේ වගකීම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තිබේ. විධායක ආයතන විසින් සම්පත් පරිහරණය කරන ආකාරය පිළිබඳ අධීක්ෂණය කිරීමේ වැදගත් මාධ්‍යයක් වීමේ හැකියාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තිබේ. තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක සහ දර්ශක සම්බන්ධයෙන්

3 (GOPAC/UNDP 2017 Parliamentary handbook on SDGs) Page 16

කාරක සභාවල හැකියාවන් ශක්තිමත් කළහොත්, විධායකයේ වැඩසටහන් සහ ව්‍යාපෘති ඇගයීම තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම මත පදනම්ව සිදු කළ හැකි ය. එමඟින් එහි තිබෙන පරතරයන් හඳුනාගත හැකි ය.

**3. තිරසර සංවර්ධන අරමුණු වෙනුවෙන් මුදල් වෙන් කිරීම තහවුරු කිරීමට පාර්ලිමේන්තුවලට හැකිය:** තිරසර සංවර්ධන අරමුණු වෙනුවෙන් ප්‍රමාණවත් තරම් අරමුදල් වෙන්කිරීම තහවුරු කිරීමේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සුවිශේෂ වගකීමක් තිබේ. කොවිඩ් - 19 අර්බුදය හමුවේ එහි විශේෂ වැදගත්කමක් තිබේ. එමඟින් තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධ අරමුදල් සැපයීමේ ගැටලු පෙන්නුම් කර තිබේ (එනම්, තිරසර සංවර්ධන අරමුණු වෙනුවෙන් සම්පත් ප්‍රමාණවත් ලෙස වෙන් කර නැති බවයි). දුර්ලභ දෙයක් වන සම්පත් ප්‍රශස්ථ ලෙස තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා යෙදවීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තු අධීක්ෂණය ඉතා වැදගත් ය.

**4. සක්‍රිය බහු පාර්ශ්වීය සහයෝගිතා සඳහා පාර්ලිමේන්තුවට උපකාර කළ හැකි ය:** 'සමස්ත සමාජයේ ම ප්‍රවේශයක්' සහ සක්‍රිය හවුල්කාරීත්වයක් තිබීම මෙම උන්නතිකාමී න්‍යාය පත්‍රය සාක්ෂාත් කරගැනීම සඳහා අත්‍යවශ්‍ය ය. තිරසර සංවර්ධන අරමුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම පිළිබඳ රජයට පමණක් සහතික විය නොහැකි ය. එහිදී සියලු හවුල්කරුවන් සහ පාර්ශ්වකරුවන් සමාන වගකීමකින් සහභාගි විය යුතු ය. මෙහිදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වැදගත් භූමිකාවක් ඉටු කළ හැකි ය. ඒ පාර්ශ්වකරුවන් අතර හවුල්කාරීත්වයන් නිර්මාණය කිරීමෙන්, සිවිල් සමාජ සංවිධාන, විද්වතුන්, ව්‍යාපාරික ප්‍රජාව, රජය, ජාත්‍යන්තර සංවර්ධන සංවිධාන, මාධ්‍ය සහ වෙනත් අය සම්බන්ධ කරගැනීමෙනි.

**5. වඩාත්ම අවදානමට ලක් වූ ජනගහනයන්ගේ අවශ්‍යතාවන් නීති සම්පාදනයේදී, අයවැය සැලසුම් කිරීමේදී සහ අධීක්ෂණයේදී නියෝජනය කිරීම පාර්ලිමේන්තු සහ මන්ත්‍රීවරුන් හට කළ හැකි ය:** කොවිඩ් - 19, ගංවතුර සහ නායයාම් වැනි ස්වාභාවික ආපදා ඇතුළු විවිධ කම්පනයන් හේතුවෙන් අවදානමට පත් කණ්ඩායම් වඩාත් දරිද්‍ර වීමේ අවදානමක් තිබේ. ශ්‍රී ලංකාව 2030 තිරසර සංවර්ධන අරමුණු න්‍යාය පත්‍රයේ කිසිවකු අතහැර නොදැමීමේ වගකීම සාර්ථක කරගැනීමට නම්, කාන්තාවන්, ළමයින්, තරුණයන් සහ ආබාධ සහිත ජනයා ඇතුළු අවදානමට පත් පුද්ගලයන් සම්බන්ධ කරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය. ඔවුන්ගේ සුවිශේෂ තත්ත්වයන් හා අවශ්‍යතා වෙනුවෙන් හැඩගස්වන ලද නීතිමය ප්‍රතිචාර තහවුරු කිරීම සඳහා මන්ත්‍රීවරුන්ට වැඩි හැකියාවක් තිබේ.

**6. පාර්ලිමේන්තු හා මන්ත්‍රීවරුන්ට කොවිඩ්19 වැනි වසංගතවලදී ප්‍රතිචාර හඳුන්වා දිය හැකි ය:** කොවිඩ්-19 ගෝලීය වසංගතය විසින් ලොව පුරා සුවිශේෂ තත්වයක් ඇති කර තිබේ. මෙම සන්දර්භය තුළ පාර්ලිමේන්තුවලට තම වගකීම් ඉටු කිරීමේදී සැලකිය යුතු අභියෝගයකට මුහුණ දීමට සිදු වී තිබේ. අර්බුදයේ බහුවිධ ස්වරූප සෞඛ්‍ය හදිසි අවස්ථාවෙන් ආරම්භ වී වඩා ගැඹුරු සමාජ සහ ආර්ථික ප්‍රතිඵල දක්වා විහිදෙයි. සෞඛ්‍යාරක්ෂාව, ආර්ථික සුරක්ෂිතභාවය සහ මානව හිමිකම් සහතික කිරීමේදී එමඟින් සැලකියයුතු අභියෝග ප්‍රමාණයක් නිර්මාණය කරයි. සම්ප්‍රදායික දත්ත මූලාශ්‍ර මත රඳාපවතිනු වෙනුවට භූමියෙන් තොරතුරු ලබාගැනීමේ නවෝත්පාදන ක්‍රම සොයාබැලීමට පාර්ලිමේන්තුවට සිදු විය හැකි ය. අර්බුදය හේතුවෙන් සම්ප්‍රදායික මූලාශ්‍ර ඉක්මනින් යල් පැන ගිය හැකි ය. නව ඩිජිටල් මාධ්‍ය වැඩිපුර භාවිත කරමින් සමාජයේ සිදු වන දෙය ග්‍රහණය කරගන්නා අතර එම දත්ත ඒකරාශී කර දළ ලෙස විග්‍රහ කරගැනීම හා බුද්ධිය මෙහෙයවා කටයුතු කිරීම කෙරෙහි වැඩි විශ්වාසයක් තැබීමට සිදු වන්නට පුළුවන. පාර්ලිමේන්තු ලේකම් කාර්යාලයට එයට සහාය ලබා දිය හැකි ය.

## සාක්ෂි මත පදනම් වන මෙවලම් තිරසර සංවර්ධන අරමුණු අධීක්ෂණය කිරීම සඳහා භාවිතා කිරීම

කලින් පැවති ආණ්ඩුව විසින් තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය හරහා තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ වගකීම සහිත ව්‍යවස්ථාපිත ආයතන 425ක් වෙත එහි වගකීම පවරන ලදී.[4]

රජය සහ මෙම රාජ්‍ය ආයතන 425 ත්, සියලු අමාත්‍යාංශත් තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වගවිය යුතු තත්වයට පත් කිරීමෙහිදී කාරක සභාවලට ඉතා වැදගත් භූමිකාවක් තිබේ. කාරක සභාවල කටයුතුවලට සක්‍රිය අන්දමින් සහභාගි වීමෙන් මන්ත්‍රීවරුන්ට තම ඡන්ද කොට්ඨාසවල, නගර හා ගම්වල ජනතාව එම අරමුණුවලින් සත්‍ය වශයෙන් ම වාසි ලබන බව පෙන්වා දීමට හා එසේ වීම තහවුරු කිරීමට හැකියාව ලැබේ.

## ඉදිරි පියවර විය හැකි දේ:

එක්සත් ජාතීන්ගේ 2030 වසර ඉලක්ක කරගත් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් නැවත පත් කිරීම:

2016 වසරේදී, එක්සත් ජාතීන්ගේ 2030 වසර ඉලක්ක කරගත් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් පත් කරගන්නා ලදී. එහි අරමුණ වූයේ සමාලෝචනය, උපදේශක සේවා සැපයීම, පාර්ලිමේන්තුව සහ අදාළ අමාත්‍යාංශ සමග ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය සහ තිරසර සංවර්ධන අරමුණු මැනැවින් ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ලබා දීම ආදී කටයුතු සඳහා පහසුකම් සැලසීමයි. එම තේරීම් කාරක සභාවේ සාමාජිකයෝ 15දෙනෙකු වූ හ.

"මෙම තේරීම් කාරක සභාවේ වගකීම වන්නේ පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමයි: අදාළ අමාත්‍යාංශවලින් උපදෙස් විමසමින් ජාතික ප්‍රතිපත්ති සම්පාදනය, ප්‍රමාණවත් පරිදි දේශීය සම්පත් වෙන් කිරීම, ජාත්‍යන්තර අරමුදල් මූලාශ්‍රය සොයාගැනීම, ක්‍රියාත්මක කිරීමේ රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම, ජාතික, පළාත් සහ ප්‍රාදේශීය මට්ටමේ ජාලගත වීම, රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්වයන් දිරිගැන්වීම, එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සහ සිවිල් සමාජ සංවිධානවලින් සහාය ලබාගැනීම, කලාපීය සහ ජාත්‍යන්තර මට්ටමේදී රටවල් අතර විශේෂඥභාවය සහ අත්දැකීම් බෙදාහදාග ැනීම, වෙනම දත්ත පදනමක් සකස් කිරීම හා කාලාවර්තීයව ප්‍රගති සමාලෝචනය කිරීම, සහ ඉහත දක්වන කාරණා සමඟ සම්බන්ධ සහ ඒවාට දායක වන සෙසු සියලු කරුණු පිළිබඳ සලකා බැලීම."[5]

## සියලු කාරක සභා තම මූලික කටයුතුවලදී තිරසර සංවර්ධන අරමුණු සමඟ තිබෙන සම්බන්ධය සඳහන් කිරීම

ශ්‍රී ලංකාවේ රාජ්‍ය දෙපාර්තමේන්තු අතර තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධ කටයුතු ස්ථාපිත වී තිබේ. සියලු කාරක සභා ද තම කාර්යන්හි දී තිරසර සංවර්ධන අරමුණු මනාව සම්බන්ධ කරගෙන තිබේ. සෑම කාරක සභාවකම කටයුතු ශක්තිමත් කිරීම සඳහා උපයෝගී කරගත හැකි මූලාශ්‍ර රැසක් ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව හා තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පිළිබඳ

4. P.25, Sri Lanka Voluntary National Review on the Status of Implementing the Sustainable Development Goals (2018) https://sustainabledevelopment.un.org/content/documents/19677FINAL_SriLankaVNR_Report_30Jun2018.pdf

5 P.43, Interim Report of the Select Committee of Parliament on the United Nations 2030 Agenda for Sustainable Development, Parliamentary Series No. 226 of 2017 of the Eighth Parliament of the Democratic Socialist Republic of Sri Lanka (First Session) Hon. Thilanga Sumathipala, MP, Chairman, Parliamentary Select Committee on 2030 Agenda for Sustainable Development

ශ්‍රී ලංකාවේ ජාතික ස්වේච්ඡා සමාලෝචනය (2018 ජූනි) ඇතුළු වාර්තාගත කිරීමේ යාන්ත්‍රණයන් විසින් සපයා තිබේ.

## අදාළ අමාත්‍යාංශ සහ ජාතික සංඛ්‍යාලේඛන කාර්යාලය වැනි වෙනත් ක්‍රියාත්මක කිරීමේ ආයතන සමග කටයුතු කිරීම

තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකාවේ කරන ලද කාර්යයන් පිළිබඳ දත්ත ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ ඇතුලත්ය. මෙම වෙබ් අඩවිය විසින් දර්ශක 46ක් සම්බන්ධ පදනම් දත්ත දැනටමත් ඇතුළත් කර තිබේ.[6] තවත් දර්ශක 195ක් සම්බන්ධයෙන් දත්ත ඉදිරිපත් කළ යුතුව තිබේ. සෑම කාරක සභාවක ම මූලික කාර්යයක් වන්නේ දර්ශක 241 ම ආවරණය කරනු ලබන බව තහවුරු කිරීම හා එම දත්ත ශ්‍රී ලංකාවට අදාළ කිරීමයි. අධීක්ෂණය සම්බන්ධයෙන් සැලකූ කල, සෙසු දර්ශක 195න් ඇතැම් ඒවා සඳහා දත්ත දැනටමත් ඒකරාශී කර තිබිය හැකි ය. එහෙත්, ඒවා ඒකාබද්ධ කර ඉදිරිපත් කර නැත.

2020-2030 කාලයේදී තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ හා මන්ත්‍රීවරුන්ගේ වගකීම හා සම්බන්ධ නව ක්‍රියාකාරී සැලැස්මක හිමිකාරිත්වය පිළිගැනීම

තිරසර සංවර්ධන අරමුණු සමග පාර්ලිමේන්තුව සම්බන්ධ කිරීමේදී පෙර පාර්ලිමේන්තුව, තේරීම් කාරක සභා සහ ලේකම් කාර්යාලය විසින් කැපීපෙනෙන, සවිස්තර කාර්යභාරයක් ඉටු කරන ලදී.

ඉන් ඉතා වැදගත් කරුණක් වන්නේ අටවන පාර්ලිමේන්තුව නියෝජනය කළ සර්ව පාක්ෂික මන්ත්‍රීවරුන් විසින් 2018 ඔක්තෝබර් මාසයේදී පවත්වන ලද වැඩමුළුවකදී ක්‍රියාකාරී සැළැස්මක් සැකසීමයි. එයට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි තාක්‍ෂණික සහාය ලැබිණි. එම ක්‍රියාකාරී සැළැස්ම නව පාර්ලිමේන්තුවේදී ද ක්‍රියාත්මක කළ හැකිය. එහි පහත දැක්වෙන ශීර්ෂ යටතේ පුළුල් ලෙස වර්ගීකරණය කළ හැකි, යෝජිත ක්‍රියාකාරකම් 27ක් තිබේ:

- පාර්ලිමේන්තු යාන්ත්‍රණය තුළ තිරසර සංවර්ධන අරමුණු කෙරෙහි අවධානය තහවුරු කිරීම
- පාර්ලිමේන්තුව තුළ තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ අවබෝධයක් ඇති කිරීම
- තිරසර සංවර්ධන අරමුණු ප්‍රාදේශීය මට්ටම වෙත රැගෙන යාම
- තිරසර සංවර්ධන අරමුණුවලට සහයෝගී නීති සම්මත කිරීම
- තිරසර සංවර්ධන අරමුණු වෙනුවෙන් අරමුදල් සම්පාදනය
- තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය
- මහජනතාව සම්බන්ධ කරගැනීම
- තිරසර සංවර්ධන අරමුණු මඟින් වඩාත් ම අවදානමට ලක්වන ප්‍රජාවන්ට සේවයක් සැලසෙන බව තහවුරු කිරීම
- පාර්ලිමේන්තු සම්බන්ධීකරණය

6 http://www.statistics.gov.lk/sdg/index.php/sdg/page/Tables

2018-2022 එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන රාමුව (UNSDF)[7] හරහා, ශ්‍රී ලංකාවේ වැඩසටහන් ක්‍රියාත්මක කරන එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන 13ක් විසින් 2030 වසර වන විට තිරසර සංවර්ධන අරමුණු න්‍යාය පත්‍රය සාර්ථක කරගැනීම සඳහා රජයේ ප්‍රයත්නයන්ට උපකාර කිරීම සඳහා අන්‍යෝන්‍ය ගිවිසුමක් අත්සන් කරන ලදී. උදාහරණයක් ලෙස, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) ආසියා පදනම හා වෙනත් ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන් එක්ව, අධිකරණ අමාත්‍යාංශය සමඟ කටයුතු කරමින් ළමා හිතවාදී අධිකරණ ගොඩනැගීමටත්, ප්‍රජා සමථ මණ්ඩල නිර්මාණයට හා ශක්තිමත් කිරීමටත්, සමාන යුක්තිය ප්‍රවර්ධනය කිරීමටත් කටයුතු කරන ලදී. රජයේ නිලධාරීන් සඳහන් කළ පරිදි, ඒවා තාක්ෂණික සහ මූල්‍ය පරතරයන් පියවීම සඳහා මහත් සේ ප්‍රයෝජනවත් විය.[8]

ඇතැම් අරමුණු සාක්ෂාත් කරගන්නා ආකාරය හඳුනාගැනීම සාපේක්ෂව දුෂ්කර ය. බොහෝ අංශවල අයවැය ප්‍රතිපාදන පිළිබඳ දත්ත සමුදායක් රජයේ වාර්තා යාන්ත්‍රණය තුළින් සොයාගත හැකි ය. එහෙත්, අදාළ අනු අංශවල සත්‍ය වියදම් පිළිබඳ දත්ත සොයාගැනීම දුෂ්කර ය. අධ්‍යාපනය හා සෞඛ්‍යය සම්බන්ධ වියදම් සොයාගැනීම ඉතා පහසු ය. එම අංශ දෙක රජයේ විශාලතම හා කැපීපෙනෙන ම වියදම් වේ. මේවා පාර්ලිමේන්තු කාරක සභාවල මූලික පර්යේෂණවලට වැදගත් ය. ඒ සම්බන්ධ වාර්තා කිරීම සහ තිරසර සංවර්ධන අරමුණු රාමුව භාවිත කිරීම මඟින් කාරක සභාවල බලපෑම විශාල වශයෙන් වර්ධනය කළ හැකි ය.

7 https://lk.one.un.org/our-work/unsdf/ Page 109

8 181 Tilakaratna et al. (2017). "National Level Implications of SDG Implementation: The Case of Sri Lanka." Occasional Paper Series 41, Southern Voice on Post-MDG International Development Goals

# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහ ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විග්‍රහයක්

එච්. ඩී. එදිරිවීර ගුණසේකර
මාධ්‍ය නිලධාරි - සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
edirigunas@gmail.com



ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව දෙපාර්තමේන්තු (09) කින් සමන්විතය. ඒවා පාර්ලිමේන්තු මහලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වේ.

- වේත්‍රධාරි දෙපාර්තමේන්තුව
- පරිපාලන දෙපාර්තමේන්තුව
- හැන්සාඩ් දෙපාර්තමේන්තුව
- ආහාරපාන හා ගෘහ පාලන දෙපාර්තමේන්තුව
- සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව
- මුදල් හා සැපයුම් දෙපාර්තමේන්තුව
- ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව
- තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව
- සන්නිවේදන දෙපාර්තමේන්තුව

## වේත්‍රධාරී දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ වැදගත්ම දෙපාර්තමේන්තුවලින් එකක් වන වේත්‍රධාරී දෙපාර්තමේන්තුව එහි ඇති දෙවැනි පැරණිතම දෙපාර්තමේන්තුවයි. වේත්‍රධාරීවරයා, නියෝජ්‍ය වේත්‍රධාරී, සහකාර වේත්‍රධාරී ප්‍රමුඛ 140 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් මෙම දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ. ගරු කථානායකතුමාට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, ඔවුන්ගේ කාර්ය මණ්ඩලයට, පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට සහ අනුබද්ධ කාර්ය මණ්ඩලයට හැකි ඉහළම ගුණාත්මක සේවාවක් කලට, වේලාවට කාර්යක්ෂම අන්දමින් සපයා දී, පාර්ලිමේන්තුවේ සඵලදායී ක්‍රියාකාරීත්වයට පහසුකම් සැපයීම වේත්‍රධාරී දෙපාර්තමේන්තුවේ මෙහෙවර වේ. එම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන්නේ වේත්‍රධාරීවරයාය. පාර්ලිමේන්තු සංකීර්ණය මුළුල්ලේම ආරක්ෂා සහිත වූත් සුරක්ෂිත වූත් පරිසරයක් පවත්වා ගෙන යාමද මෙම දෙපාර්තමේන්තුවෙන් සිදු කරයි. ඊට පාර්ලිමේන්තු පොලිස් කොට්ඨාසයේද සහාය ලබා ගැනේ. එහිදී ආරක්ෂක පරීක්ෂාව, ත්‍රිවිධ හමුදාව, පොලීසිය සහ බුද්ධි අංශ සමඟින් සම්බන්ධ වීම, විදේශීය ප්‍රභූවරුන්ද සම්බන්ධ වන වැදගත් අවස්ථා සැලසුම් කිරීම හා ආරක්ෂාවට ඇතිවන තර්ජන වැළැක්වීම සම්බන්ධයෙන් වහා ක්‍රියාත්මක වී සැලසුම් කිරීම යනාදිය ප්‍රමුඛ වේ. විශේෂයෙන් පාර්ලිමේන්තු නව සභාවාර උත්සවාකාරයෙන් විවෘත කිරීම, විදේශ රාජ්‍ය නායකයන් පාර්ලිමේන්තුව ඇමතීම වෙනුවෙන් පවත්වන උත්සව සංවිධානය කිරීම, රාජ්‍ය අවමංගල්‍ය උත්සවද ඇතුළුව පාර්ලිමේන්තුවේ හා කථානායකවරයාගේ උත්සව කටයුතු හා ක්‍රියාකාරකම් නිසි පරිදි සංවිධානය කිරීම මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරයි.

## පරිපාලන දෙපාර්තමේන්තුව

පරිපාලන දෙපාර්තමේන්තුව ද ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළ සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරයි. තරඟකාරී පරිසරයක් තුළ සිය රාජකාරී කටයුතු ප්‍රතිඵලදායක ලෙස ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයට හැකියාව ලබා දෙනු පිණිස ඔවුන්ගේ පුද්ගල සංවර්ධනය හා යහපැවැත්ම කෙරෙහි අවධානය යොමු කිරීම වෙනුවෙන් උපායමාර්ගික වශයෙන් දායක වීම පරිපාලන දෙපාර්තමේන්තුවෙහි මුඛ්‍ය කාර්යභාරය වේ. පරිපාලන දෙපාර්තමේන්තුව, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයෙහි ප්‍රගතිය, සංවර්ධනය හා යහපැවැත්ම වෙනුවෙන් ඉතා දැඩි සේ කැප වී සිටියි. විශේෂයෙන් මෙම කාර්යය උදෙසා වෙනසක් ඇති කිරීම වෙනුවෙන් නිරන්තරයෙන් ප්‍රයත්න දරන අතර මානව සම්පත් කළමනාකරණයෙහි නිවැරදි ප්‍රතිපත්ති, තීරණ හා ක්‍රියාමාර්ග මඟින් ආයතනය මෙහෙයවීම පිණිස, මානව සම්පත් ප්‍රතිපත්ති තීරණය කිරීමේ හා සැකසීමේ බලය පරිපාලන දෙපාර්තමේන්තුව වෙත පවරනු ලැබ ඇත. කාර්ය මණ්ඩලයේ නව තනතුරු ඇති කිරීම, කාර්ය මණ්ඩලය වෙනුවෙන් නීති රෙගුලාසි සෑදීම, බඳවා ගැනීම් හා වෙනත් කටයුතු කිරීම සඳහා 1956 අංක 09 දරන පාර්ලිමේන්තු කාර්‍ය මණ්ඩල පනතේ විධිවිධාන ප්‍රකාරව ස්ථාපිත ගරු කථානායකවරයා සභාපතිත්වය දරන පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල උපදේශන කාරක සභාව සඳහා යොමුකරන සියලු යෝජනා හා ලිපි ලේඛන සකස් කිරීම මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇති භාරධූර කාර්යයන් වේ. මෙම දෙපාර්තමේන්තුව ආයතන අංශය, මන්ත්‍රී සේවා කාර්යාංශය, ප්‍රවාහන කාර්යාංශය හා තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ ඒකකයකින්ද සමන්විත වේ.

## හැන්සාඩ් දෙපාර්තමේන්තුව

හැන්සාඩ් දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තුව තුළ ඉටු කරන මෙහෙය ප්‍රශංසනීය වේ. පාර්ලිමේන්තු සභා ගැබේ කථා අඩංගු "හැන්සාඩ් වාර්තාව" සකස් කිරීම සහ පාර්ලිමේන්තු කාරක සභා වාර්තා සටහන් සකස් කිරීම හැන්සාඩ් දෙපාර්තමේන්තුවේ වගකීම වේ. හැන්සාඩ් සංස්කාරක, නියෝජ්‍ය හැන්සාඩ් සංස්කාරකවරුන්, සහකාර හැන්සාඩ් සංස්කාරකවරුන්, ජ්‍යෙෂ්ඨ හැන්සාඩ් වාර්තාකරුවන් සහ හැන්සාඩ් වාර්තාකරුවන් යන නිලධාරීන්ගෙන් සමන්විත මෙම දෙපාර්තමේන්තුව, කාරක සභා වාර්තාකරුවන්ගේ ඒකකයකින්ද, සුචි සම්පාදන ඒකකයකින් ද, කථා පටිගත කිරීමේ ඒකකයකින් ද සමන්විත ය. හැන්සාඩ්

සංස්කාරක මඩුල්ල, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි අංශ සඳහා නියෝජ්‍ය හැන්සාඩ් සංස්කාරකවරු තිදෙනකුගෙන් ද, සිංහල සහ ඉංග්‍රීසි අංශ සඳහා සහකාර හැන්සාඩ් සංස්කාරකවරු පස් දෙනා බැගින් ද, දෙමළ අංශය සඳහා සහකාර හැන්සාඩ් සංස්කාරකවරයකුගෙන් ද සමන්විත වේ. හැන්සාඩ් වාර්තාකාර අංශය, ඉංග්‍රීසි සහ සිංහල අංශ සඳහා වාර්තාකරුවන් දහඅට දෙනා බැගින් ද, දෙමළ අංශය සඳහා වාර්තාකරුවන් පස් දෙනෙකුගෙන් ද සමන්විත වේ.

## ආහාරපාන හා ගෘහ පාලන දෙපාර්තමේන්තුව

1982 වර්ෂයේදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නව පාර්ලිමේන්තු සංකීර්ණයට ගෙන ඒමත් සමගම ආහාරපාන හා ගෘහ පාලන දෙපාර්තමේන්තුව, පාර්ලිමේන්තුවේ නවතම දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත විය. තරු පන්තියේ හෝටල් ක්ෂේත්‍රයේ අන්තර්ජාතික ප්‍රමුඛ පෙළේ හෝටලයක් වූ ලංකා ඔබරෝයි හෝටලයේ තාක්ෂණික හා වෘත්තීයමය ප්‍රවීණත්ව මෙහෙයුම් හා උපදේශකත්වය යටතේ එය සිදු විය. මෙම දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තුවේ ගරු මහලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයට අනුයුක්තව අද වන විට ක්‍රියාත්මකව වේ. මෙම අංශය ආහාර හා භෝජනාගාර ගෘහපාලන අධ්‍යක්ෂවරයාගේ සෘජු අධීක්ෂණයට ගැනෙන අතර, මුළුතැන්ගෙය, භෝජනාගාර, ගෘහපාලන හා ගිණුම් වශයෙන් ප්‍රධාන උප අංශ හතරක් යටතේ එය ක්‍රියාත්මක වෙයි. ප්‍රධාන වශයෙන් ආහාරපාන භෝජනාගාර සේවා අංශ 12කින් සමන්විත වන අතර,ඒවා ආපනශාලා, විධායක භෝජනාගාර, ආහාර හා සැපයුම් අංශය, ප්‍රභූ භෝජනාගාර වශයෙන් සංවිධිත වේ. ඉන් 5 ක් දිනපතාම ක්‍රියාත්මකතාවයේ පවතිමින් පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන දින හැරුණු කොට දිනකට පුද්ගලයින් 1000 - 1200 අතර ප්‍රමාණයකට පහසුකම් සපයයි. නිසි වෘත්තීය පරිඥානයෙන්, නිපුණතාවයෙන් මෙන්ම වසර ගණනාවක පළපුරුද්දෙන් යුත් මෙම දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය සංඛ්‍යාවෙන් 260 ක් පමණ වන අතර, එදිනෙදා ආහාර හා ගෘහ පාලන සේවා කටයුතු මැනවින් මෙහෙයවා ගැනීම උදෙසා වඩාත් ඵලදායී සේවාවක් ඉටු කරයි.

## සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව

වර්ෂ 1990 සිට පාර්ලිමේන්තුව තුළ ක්‍රියාත්මක සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව, පාර්ලිමේන්තු සංකීර්ණයෙහි, කථානායකතුමාගේ නිල නිවසෙහි, ජයවඩනගම නිවාස සංකීර්ණයෙහි පිහිටි කාර්ය මණ්ඩල නිල නිවාස, මාදිවෙල පිහිටි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා වන නිල නිවාස 120 සහ නුවරඑළියේ පිහිටි මන්ත්‍රීවරයන්ගේ නිවාඩු නිකේතනය වන සෙන්පති නිවසෙහි සිවිල් නඩත්තු කටයුතු සියල්ල ඉටුකරයි. විදුලි සෝපාන, ප්‍රධාන වායු සමීකරණ පද්ධතිය, සමීප රූප ආවේක්ෂණ කැමරා පද්ධතිය, පාර්ලිමේන්තු රැස්වීම් වල සජීවී රූපවාහිනි විකාශය, විද්‍යුත් ඡන්ද ගණන් ගැනීමේ පද්ධතිය, ප්‍රධාන රූපවාහිනී ඇන්ටනා පද්ධතිය, සභා ගර්භයේ ශබ්ද සම්ප්‍රේෂණ පද්ධතිය, ශීත කාමර ආදී සියලුම සේවා සහ උපකරණ මනාව ක්‍රියාත්මක වීම සහතික කිරීම සහ අනුබද්ධ දෙපාර්තමේන්තුවල නඩත්තු කටයුතු සම්බන්ධයෙන් වගකීම දැරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාර්ය වේ. මන්ත්‍රීවරයන්ගේ කථා ඇතුළත් ඩීවීඩී හා සීඩී පට නිකුත් කිරීම සිදු වන්නේ ද මෙම දෙපාර්තමේන්තුව මගිනි.

## මුදල් සහ සැපයුම් දෙපාර්තමේන්තුව

මුදල් සහ සැපයුම් දෙපාර්තමේන්තුව විසින් පාර්ලිමේන්තුවේ කළමනාකරණ කටයුතුවලදී ප්‍රධාන මෙහෙයක් ඉටු කරනු ලබයි. අධ්‍යක්ෂ (මුදල්) මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වේ. ගිණුම් නිලධාරි ලෙස අධ්‍යක්ෂ (මුදල්) විසින් මූල්‍ය කටයුතුවලට අදාළ කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාට සෘජුවම වාර්තා කිරීම සහ උපදෙස් දීම සිදු කරනු ලබයි. 'මුදල් හා ගිණුම්' සහ 'සැපයුම් හා සේවා' යන කාර්යාංශ දෙකෙහි සහකාර අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු ප්‍රධානත්වය දරන අතර 'ආහාරපාන ගිණුම් කාර්යාංශය' ගණකාධිකාරිවරයෙකු යටතේ ක්‍රියාත්මක වේ. ගිණුම් නිලධාරි වශයෙන් පැවරෙන සාමාන්‍ය වගකීම් ඉටු කිරීම සහ රජයේ මුදල් රෙගුලාසි, නීති, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටීන්ට අනුව මුදල් කළමනාකරණය කිරීම

තහවුරු කිරීම සඳහා මුදල් පාලක කාර්යයන් ඉටු කිරීම ද අධ්‍යක්ෂ (මුදල්) යටතේ ඇති ප්‍රධාන කාර්ය භාරයන් වේ.

## ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළ ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව සිදු කරන කාර්යභාරය ඉතා වැදගත් වේ. නීති සම්පාදනය, අධීක්ෂණය හා මහජන මුදල් යන ක්ෂේත්‍රවලට අදාළ වෘත්තීමය සේවාවන් මන්ත්‍රීවරයන් වෙත මෙම දෙපාර්තමේන්තුව මඟින් සපයයි. සභා ලේඛන කාර්යාංශය, පනත් කෙටුම්පත් කාර්යාංශය, කාරක සභා කාර්යාංශය, උපදේශක කාරක සභා කාර්යාංශය, රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභා සහ රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කාරක සභා කාර්යාංශය, කථා පරිවර්තක කාර්යාලය හා පුස්තකාලය යන අංශවලින් මෙම දෙපාර්තමේන්තුව සමන්විත වේ.

පාර්ලිමේන්තු රැස්වීම්වලට අදාළ ඉදිරියේදී සලකා බැලීමට අපේක්ෂිත යෝජනා සහ ප්‍රශ්න ඇතුළත් න්‍යාය පුස්තකය හා ඒ හා සම්බන්ධ පරිපූරක සකස් කර මුද්‍රණය කිරීම සභා ලේඛන කාර්යාංශය මගින් සිදු කරයි. ඊට අමතරව ඒ ඒ පාර්ලිමේන්තු දිනයේ පාර්ලිමේන්තු රැස්වීම් වෙනුවෙන් න්‍යාය පත්‍රය හා කාර්ය සටහන්ද සකස් කර මුද්‍රණය කරනු ලබන්නේ මෙම කාර්යාංශයෙන් වීම විශේෂත්වයකි.

පාර්ලිමේන්තුව වෙත පැවරී ඇති ප්‍රමුඛතම ව්‍යවස්ථාදායක කාර්යභාරය වන නීතී සම්පාදනයට අදාළ ක්‍රියාපටිපාටිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල විධිවිධානවලට අනුව ක්‍රියාත්මක කරවීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක පනත් කෙටුම්පත් කාර්යාංශයෙන් සිදු වේ.

පාර්ලිමේන්තුව තුළ කාරක සභා රැසක් ක්‍රියාත්මක අතර, පනත් කෙටුම්පත් සම්මත කිරීමේදී වැඩි කාර්යභාරයක් කාරක සභා මඟින් සිදු කරයි. එම කාරක සභා ක්‍රියාත්මක වන්නේද ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව යටතේ ය. පාර්ලිමේන්තු ස්ථාවර නියෝග ප්‍රකාරව මෙම කාරක සභා පිහිටුවා තිබේ. රජයේ සැලසුම් හා ක්‍රියාකාරිත්වය පිළිබඳව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් ගැඹුරින් අධ්‍යයනය කරනු ලබන්නේ මෙම කාරක සභා මඟින් වේ. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ප්‍රධාන වශයෙන් කාරක සභා කිහිපයක් ක්‍රියාත්මක වේ. විශේෂ කාරක සභා, ආංශික අධීක්ෂණ කාරක සභා, අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා හා විශේෂ කාර්‍යයන් සඳහා වන කාරක සභා ලෙස ඒවා නම් කර ඇත.

පාර්ලිමේන්තු රැස්වීම් දිනවල දී ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සභා ගර්භය තුළ සිංහල / ඉංග්‍රීසි, සිංහල / දෙමළ, දෙමළ / ඉංග්‍රීසි භාෂාවෙන් සමගාමී කථා පරිවර්තන සේවාවන් සැපයීම කථා පරිවර්තක කාර්යාලය මඟින් සිදුවේ. එමෙන්ම ආංශික අධීක්ෂණ කාරක සභා රැස්වීම්වල දී සහ කාරක සභා කාමරවල පවත්වන ලද වෙනත් රැස්වීම්වලදී ද අවශ්‍යතාව අනුව කථා පරිවර්තන සේවාවන් සැපයීම ද මෙම කාර්යාලයෙන් සිදු කරයි.

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පරිහරණය සඳහාම පමණක් වෙන් වූ අංගසම්පූර්ණ පුස්තකාලයක් පාර්ලිමේන්තුව සතුවේ. දේශපාලනය, ඉතිහාසය, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව වැනි විවිධ විෂයන් පිළිබඳව ලියැවුණු පොත් ඇතුළු ලිපි ලේඛන තිස් දහසක එකතුවක් පුස්තකාලය සතු වේ. පාර්ලිමේන්තු විවාද, හැන්සාඩ් වාර්තා, නීති ප්‍රඥප්ති, පනත් හා පනත් කෙටුම්පත්, රජයේ ගැසට් පත්‍ර, පාර්ලිමේන්තු ප්‍රකාශන, පරිපාලන වාර්තා, වාර්ෂික වාර්තා වැනි වටිනා ලිපි ලේඛන සහ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ දිවුරුම් / ප්‍රතිඥා වැනි ලිපි ලේඛන ද මෙහි සුරක්ෂිතව තැන්පත් කර තිබේ. පුස්තකාලය නවීන සන්නිවේදන උපකරණවලින් සමන්විත වන අතර ඊට අන්තර්ජාල පහසුකම්ද සපයා තිබේ. පාර්ලිමේන්තු පුස්තකාලය ක්‍රියාත්මක කරන ලේඛන සංරක්ෂණ ව්‍යාපෘතිය මඟින් ඉතා වටිනා ලේඛන මිලියන (3.3) ක් පමණ නවීන තාක්ෂණය යොදා සංරක්ෂණය කිරීමද විශේෂත්වයකි.

## තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවශ්‍යතා හසුරුවනු ලබන්නේ තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුව මගිනි. 2004 වර්ෂයේ අග භාගයේදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළ මෙවැනි දෙපාර්තමේන්තුවක් නිර්මාණය කිරීමේ අදහස ඇති වූයේ, ශ්‍රී ලංකා රජය විසින් පවත්වනු ලැබූ "ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය හා සංවර්ධනය උදෙසා පාර්ලිමේන්තුව නවීකරණය කිරීමේ" ව්‍යාපෘතියේ ප්‍රතිඵලයක් ලෙසය. ඒ අනුව, පාර්ලිමේන්තුවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කටයුතු කළමනාකරණය කිරීමේ වගකීම දෙපාර්තමේන්තුවට පවරනු ලැබූ අතර "ඉ-පාර්ලිමේන්තුව" නම් වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපායමාර්ගයක් ක්‍රියාවට නැංවීමේ කාර්යයෙහි මේ වන විට නියැළී සිටී. ගෙවුණු වසර කිහිපය තුළ "ඉ-පාර්ලිමේන්තුව" සැලකිය යුතු ප්‍රගතියක් ලබාගෙන තිබෙන අතර පාර්ලිමේන්තු නිල වෙබ් අඩවිය වසර ගණනාවක් මුළුල්ලේම හොඳම වෙබ් අඩවිය වශයෙන් සම්මානයට පාත්‍ර වී ඇත.

## සන්නිවේදන දෙපාර්තමේන්තුව

සන්නිවේදන දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තුවේ කටයුතු සමාජගත කිරීමේ අරමුණින් 2019 වර්ෂයේදී අභිනවයෙන් ස්ථාපිත කෙරුණකි. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මෙන්ම පුරවැසියන්, මාධ්‍ය, සිවිල් සමාජ සංවිධාන සහ ප්‍රජා කණ්ඩායම් අතර අන්තර් ක්‍රියාකාරිත්වයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සන්නිවේදන දෙපාර්තමේන්තුවේ මූලික කාර්යය වේ. මහජනතාව වෙත තොරතුරු ගෙන යන පාර්ශවකරුවන්හට අදාළ තොරතුරු ලබා ගත හැකි කාර්යක්ෂම මහජන කේන්ද්‍රීය පාර්ලිමේන්තුවක් දක්වා වත්මන් පාර්ලිමේන්තුව වර්ධනය කිරීම මෙම දෙපාර්තමේන්තුව පිහිටුවීමේ මූලික අරමුණ විය. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට අදාළව ජනමාධ්‍ය, ආගන්තුක සේවා, මහජන සම්බන්ධතා, වෙළඳ නාම අලෙවිකරණය, වෙළඳ ප්‍රචාරණය, ඩිජිටල් හෝ සමාජමාධ්‍ය තුළ තොරතුරු නිෂ්පාදනය මෙන්ම සන්නිවේදන විෂය ක්ෂේත්‍රයන්හි උපාය මාර්ගික අපේක්ෂාවන් ඉදිරිපත් කිරීමද සන්නිවේදන දෙපාර්තමේන්තුව මගින් සිදු කරන සුවිශේෂී කර්තව්‍යයන් වේ. මාධ්‍ය අංශයෙන් හා මහජන සබඳතා අංශයෙන් සන්නිවේදන දෙපාර්තමේන්තුව සමන්විතය. නවීකරණය කරන ලද මාධ්‍ය මධ්‍යස්ථානයක් ද සන්නිවේදන දෙපාර්තමේන්තුව සතු ය.

## අභ්‍යන්තර විගණන කාර්යාංශය

රාජ්‍ය චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර, රාජ්‍ය සම්පත් කාර්යක්ෂමව යොදා ගැනීම දිරිමත් කිරීම අරමුණු කරගනිමින් අභ්‍යන්තර විගණන කාර්යාංශයක් පාර්ලිමේන්තුව තුළ ක්‍රියාත්මක වේ. විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම ද මෙම කාර්යාංශයෙන් සිදු වේ.

## විදේශ සබඳතා සහ සන්ධාන කාර්යාංශය

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළ ක්‍රියාත්මක විදේශ සබඳතා සහ සන්ධාන කාර්යාංශය මගින් ජාත්‍යන්තර සමුළු, වැඩමුළු, සංචාර, රැස්වීම්, අධ්‍යයන චාරිකා යනාදියට අදාළ සියලු කටයුතු සංවිධානය කරයි. පාර්ලිමේන්තු මිත්‍ර සංගම්වලට අදාළ කටයුතු සංවිධානය කරන්නේ ද මෙම කාර්යාංශය මගිනි.

# පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පතක් සම්මත කිරීම සහ එහි ක්‍රමවේදය

එච්. ඩී. එදිරිවීර ගුණසේකර
මාධ්‍ය නිලධාරි - සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
edirigunas@gmail.com



ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75 වන ව්‍යවස්ථාව යටතේ නීති පැනවීමේ මූලික ව්‍යවස්ථාදායක බලය පාර්ලිමේන්තුවට ලැබී තිබේ. අතීතයට ද බල පැවැත්වෙන නීතී සෑදීමේ බලය ඇතුළු නීතී සම්පාදනය කිරීමේ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කවර වූ හෝ විධි විධානයක් අහෝසි කිරීමේ, සංශෝධනය කිරීමේ හෝ එකතු කිරීමේ බලයද ඊට අයත් වේ. සියලු ව්‍යවස්ථාදායක යෝජනා, කෙටුම්පත් ආකාරයෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. ආණ්ඩුවේ පනත් කෙටුම්පත්, පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ පනත් කෙටුම්පත් වැනි විවිධ වර්ගවල පනත් කෙටුම්පත් සම්මත කිරීමේ විවිධ ක්‍රියාපටිපාටි තිබේ .


අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙකු වන අමාත්‍යවරයෙකුට ආණ්ඩුවේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කළ හැකිය. අදාළ අමාත්‍යාංශ මඟින් සකසන මූලික පනත් කෙටුම්පත නිල කෙටුම්පතක් ලෙස සකසා ගැනීම සඳහා නීති කෙටුම්පත් සම්පාදකවරයාට යොමු කරයි. අනතුරුව පනත් කෙටුම්පතේ ව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂා කිරීම සඳහා එය නීතිපතිවරයාට ද යොමු කෙරේ. ඒ සඳහා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 77 වන ව්‍යවස්ථාව මඟින් බලය හිමි වේ.

අනතුරුව නීතිපතිවරයාගේ සහතිකය සමඟ පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරයි. පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ කිරීමට සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය අවශ්‍ය වේ. පනත් කෙටුම්පත එලෙස පාර්ලිමේන්තුවට පිළිගැන්වීම පළමුවර කියවීම ලෙස සැලකේ. ඉදිරිපත් කළ පනත් කෙටුම්පතක් දෙවන වර කියවීම ප්‍රධාන විවාදය වන අතර, එහිදී මන්ත්‍රීවරු එම විෂය පිළිබඳව අදහස් පළ කරති. එහි දී පනත් කෙටුම්පතේ මූලධර්ම හා විෂය පථය සම්බන්ධයෙන් පුළුල්ව කරුණු සාකච්ඡා කරයි. දෙවැනි වර කියවීමේ ඡන්ද විමසීමෙන් අනතුරුව පනත් කෙටුම්පතක් පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට යොමු කළ යුතු අතර, එය ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවකට හෝ විශේෂ කාරක සභාවකට ද යොමු කළ හැකිය.

කෙසේ වෙතත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව යම් පුරවැසියෙකු විසින්, පනත් කෙටුම්පතක් අධිකරණය තුළදී අභියෝගයට ලක්කර ඇති අවස්ථාක දී, අධිකරණයේ තීරණය දෙන තෙක් හෝ, ඒ යොමු කිරීමේ නැතහොත් පෙත්සමේ දින සිට සති 03 ක කාල සීමාවක් ඉකුත්වන තෙක් හෝ යන මෙයින් පළමුවෙන් එළඹෙන දිනය තෙක් ඒ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ දී කිසිදු පියවරක් නොගත යුතු ය. තුන්වන වර කියවීමේ දී කාරක සභා අවස්ථාවේ කරන ලද, යම් සංශෝධන ද සහිතව කෙටුම්පත සමස්තයක් වශයෙන් සම්මත කරයි. එලෙස සම්මත කරගත් පනත් කෙටුම්පතක් නීතියක් බවට පත්වීමට නම් කථානායකවරයාගේ සහතිකය එතුමාගේ අත්සන සහිතව සටහන් කළ යුතුය. ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 80 වන ව්‍යවස්ථාව මඟින් බලය හිමි වේ.

## පාර්ලිමේන්තු හැන්සාඩ් වාර්තාව ගැන හැඳින්වීමක් සහ හැන්සාඩ් වාර්තාවේ පළමුවන වෙළුම

ගුණවතී පිටවල
සහකාර හැන්සාඩ් සංස්කාරක - හැන්සාඩ් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
guna_p@parliament.lk



**පාර්ලිමේන්තු විවාද**
(හැන්සාඩ්)

**பாராளுமன்ற விவாதங்கள்**
(ஹன்சாட்)

**PARLIAMENTARY DEBATES**
(HANSARD)

පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට අදාළ දෛනික නිල වාර්තාව වන හැන්සාඩ් වාර්තාව "පාර්ලිමේන්තුවේ සත්‍ය කැඩපත" (True mirror of Parliament) සහ ඉතිහාසයේ ශ්‍රවණේන්ද්‍රිය (Auditory of history) යන විරුදාවලින්ගෙන් පිදුම් ලබන්නකි. එය සභාවේ ජීවයයි. ඉතා අවධානයෙන් පරිශීලනය කරන කෙනෙකුට සැබවින්ම එය බරසාර දැනුම් මල්ලකි.

17 වන ශතවර්ෂය තෙක් දිවෙන ඉතිහාසයකට උරුමකම් කියන හැන්සාඩ් වාර්තාව ලංකාවේ උපත ලබන්නේ 1870 වර්ෂයේ බ්‍රිතාන්‍ය කිරීටය යටතේ ව්‍යවස්ථාදායකය සහ විධායකය යන උභය මණ්ඩලවලින් මේ රට පාලනය කෙරුණු සමයේදී ය. අද්‍යතන ශ්‍රී ලංකාවේ හැන්සාඩ් වාර්තාවේ ගුණාත්මකභාවය ලොව අනෙකුත් සංවර්ධිත රටවල හැන්සාඩ් වාර්තාවල ගුණාත්මකභාවයට සමාන තත්ත්වයකම රඳවා පවත්වා ගැනීමට ද සමත්ව ඇති බව පෙනේ. 1883 වර්ෂයේ (Ceylon Hansard) වාර්තාවල සිට හැන්සාඩ් වාර්තා සුරක්ෂිතව පාර්ලිමේන්තු පුස්තකාලයේ තබා ඇත්තේ අවශ්‍ය පාර්ශ්වයනට පරිශීලනයට පහසුකම් ද සපයමිනි.

"හැන්සාඩ්" යන නාමය මෙම නිල වාර්තාවට ලැබී ඇත්තේ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ ලිපිලේඛන මුද්‍රණය කිරීමේ කටයුතු භාරව සිටි ලුක් හැන්සාඩ්, ඔහුගේ පුත්‍රයා වූ තෝමස් කර්සන් හැන්සාඩ් (Thomas Curson Hansard 1776-1833) සහ දරු මුනුපුරන්ගේ පෙළපත් නාමයෙනි.

මුල් කාලයේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණක්ම හැන්සාඩ් වාර්තාව පළ වූයේ එදා සභාවේ සිටි කථිකයන් තම අදහස් පළ කළේ ඉංග්‍රීසි භාෂාවෙන්ම පමණක් වූ හෙයිනි. නමුත් විසිවන ශතවර්ෂයේ මැද භාගයේ සිට සිංහල හා දෙමළ භාෂාවෙන් ද කථිකයන් අදහස් පළ කළ හෙයින් එලෙස කථා කරන භාෂාවෙන් ම එම කථා හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වීමට පටන් ගති.

### හැන්සාඩ් වාර්තාවේ වැදගත්කම

- ප්‍රජාතන්ත්‍රවාදය තුළ, ඔබ ඡන්දය දුන් සහ ඔබ නියෝජනය කරන පුද්ගලයින් පවසන දේ වෙත ප්‍රවේශ වීම වැදගත් අංගයකි. සභා රැස්වීම් පැවැති දිනවල සභාවේදී සිදු වුණු කරුණු එපරිද්දෙන්ම දැනගැනීමට හැකි ලෙසට කථිකයන්ගේ භාෂා ශෛලිය හා උච්චාරණය පවා ආරක්ෂා වන පරිදි වාර්තාව සකසමින් හැන්සාඩ් වාර්තාව ඉටු කරන්නේ එම වගකීමයි. ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සෑම කෙනෙකුටම ප්‍රවේශ විය හැකි සහ විනිවිද පෙනෙන බව එයින් සහතික කරයි.

- පාර්ලිමේන්තු විවාදවල ඓතිහාසික වාර්තා සම්බන්ධයෙන් කරුණු දැනගැනීමට,
- ඒ ඒ කාල වකවානුවලට අදාළ සමාජීය, දේශපාලනමය, ආගමික, සංස්කෘතිකමය සහ ආර්ථිකමය කරුණු සම්බන්ධයෙන් විස්තර ලබා ගැනීමට,
- මහජන පෙත්සම්, වාචික පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න සහ පිළිතුරු, ලිඛිත පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න සහ පිළිතුරු, අගමැතිතුමාගෙන් අසන ලද ප්‍රශ්න සහ පිළිතුරු, අමාත්‍යාංශ නිවේදන, පෞද්ගලික පැහැදිලි කිරීම්, වරප්‍රසාද ප්‍රශ්න, සභාව කල් තබන අවස්ථාවේ අසන ලද ප්‍රශ්න යනාදී සියල්ලෙන් අසන්නේ ඒ ඒ කාල වකවානුවලට අදාළ සමාජ ප්‍රශ්න වන බැවින් එම කාල සීමාවේ ලාංකික සමාජය ගැන දැනුමක් ලබා ගැනීමට මෙමඟින් හැකියාව ලැබෙනු ඇත.
- වෙනත් මන්ත්‍රීවරයෙකු සභාවේ කලින් සඳහන් කළ කරුණක් ගැන අවධානය යොමු කරවීමට,
- හැන්සාඩ් වාර්තාවේ දිනය සහ තීරු අංකය සඳහන් කරමින් අදාළ උපුටා දැක්වීම් කරයි. බොහෝ විට වාද විවාදවලදී මෙසේ ඉදිරිපත් කිරීම් කරනු දක්නට ලැබේ.
- ඒ ඒ පාර්ලිමේන්තුවලට අදාළ පාර්ලිමේන්තු නියෝජිතයන් පිළිබඳ විස්තර දැන ගැනීමට,
- එක් එක් පාර්ලිමේන්තුවට අදාළ අමාත්‍ය ධුර (Portfolio) දැනගැනීමට,
- සෑම කලාපයකම පළමුවන වෙළුමේ මෙම විස්තර ඇතුළත් වෙයි.
- එක් එක් පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ දේශපාලන මත පිළිබඳ කරුණු දැනගැනීමට,
- මන්ත්‍රීවරුන්ගේ කථා පරිශීලනයට,
- නීතිමය කරුණු සම්බන්ධයෙන් මූලික දත්ත මූලාශ්‍රයක් ලෙසට,
- අධිකරණයක නඩු කටයුත්තක් ඔප්පු කිරීමට යාමේදී, හැන්සාඩ් වාර්තාවකට යුක්තිය සහ සාධාරණය වෙනුවෙන් ඉටු කළ හැකි මහත් වූ කාර්ය භාරය Pepper v Hart (1993) AC 593 නඩුකරයෙන් පෙන්වා දී ඇත. ඒ අනුව ප්‍රාථමික නීති සම්පාදනය අපැහැදිලි නම් හෝ බහු අරුත් දෙන්නේ නම් එම නීති සම්පාදනය කිරීමේදී අමාත්‍යවරුන් හෝ වෙනත් පනත් කෙටුම්පතක් ප්‍රවර්ධනය කරන්නන් විසින් පාර්ලිමේන්තුවේ කරන ලද ප්‍රකාශ අධිකරණය විසින් යම් යම් තත්ත්වයන් යටතේ සැලකිල්ලට ගත හැකි ය. එහිදී පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේදී අමාත්‍යවරයාගේ අරමුණ කුමක්ද යන්න ගැන සලකා බලයි. ඒ අනුව 1993 වර්ෂයේ සිට නඩු ඔප්පු කිරීමේ සාධකයක් වශයෙන් ද හැන්සාඩ් වාර්තාව භාවිතයට ගැනෙන බව පෙනේ.
- ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂා වන සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් මෙන්ම සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි භාෂාවෙන්ද මන්ත්‍රීවරුන් කථා කරන බැවින් හා අදාළ වැදගත් ලේඛන එම භාෂාත්‍රයෙන්ම පළවන හෙයින් එම භාෂා ඉගෙනුම් මෙවලමක් ලෙසට,
- 20 වන සියවසේ මැද භාගයේදී පමණ වැඩි වශයෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සභාවේ වැඩ කටයුතු සිදුව ඇති හෙයින් එකල හැන්සාඩ් වාර්තාව එදා සිටි සමාජයේ බොහෝ දෙනෙකු ඉංග්‍රීසි භාෂාව ඉගෙනීම සඳහා භාවිත කොට ඇති බව පෙනේ.
- භාෂා පරිවර්තක සහ භාෂණ පරිවර්තක රැකියාවන්ට ළැදි පාර්ශ්වයනට තම හැකියා වර්ධනය කර ගැනීමට ඉගෙනුම් මෙවලමක් ලෙස,
- ලඝුලේඛකයන්ට, හැන්සාඩ් වාර්තාකරුවන්ට මෙන්ම එම රැකියා සම්බන්ධව නිපුණතාවක් ලබා ගැනීමට ළැදි පාර්ශ්වයනට ඉගෙනුම් මෙවලමක් ලෙස,

  (තම ලඝුලේඛන වේගය තීව්‍ර කර ගැනීමට මෙන්ම පාර්ලිමේන්තු භාෂාව ගැන දැනුමක් ලබා ගැනීමට).

හැන්සාඩ් වාර්තාවේ ඇත්තේ එදිනෙදා සිදු වූ කරුණු පදානුසාරයෙන් වූ වාර්තාකරණයකි. සභාවේ මන්ත්‍රීවරුන් කථා කරන භාෂාවෙන්ම, හැන්සාඩ් වාර්තාකරුවන් විසින් ලඝු හන ආශ්‍රයෙන් වාර්තා කරනු ලබන එම කථා ඒ ඒ භාෂාවෙන් පරිගණකගත කොට කථිකයාගේ කථා ශෛලිය හා උච්චාරණය ද හැකිතාක් දුරට ආරක්ෂා කරමින්, පාර්ලිමේන්තුවට නුසුදුසු වචන ස්ථාවර නියෝගවලට අනුව මූලාසනයේ අණ පරිදි ඉවත් කරමින්, සහකාර හැන්සාඩ් සංස්කාරකවරුන්, නියෝජ්‍ය හැන්සාඩ් සංස්කාරකවරුන්ගේ සහ හැන්සාඩ් සංස්කාරකගේ සංස්කරණයට ලක් වීමෙන් පසුව සභාව පැවැත් වූ එක් එක් දිනට අදාළව මුද්‍රණය වන හැන්සාඩ් වාර්තාව (https://www'parliament'lk/si/business-of-parliament/hansard) යටතේ කියවා බැලීමට හා බාගත කර ගැනීමට පහසුකම ද අද්‍යතනයේ සලසා ඇත.

## හැන්සාඩ් වාර්තාව පළමුවන වෙලුම

සාමාන්‍ය හැන්සාඩ් වාර්තාවකට වඩා හැන්සාඩ් වාර්තාවක පළමු කලාපයක් ද, ඊටත් වඩා පළමු වෙළුමක පළමු කලාපයක් ද වැඩි වටිනාකමක් දරන්නේ එහි අන්තර්ගතයේ පවත්නා තොරතුරුවල බරසාරත්වය නිසාවෙන් ම ය. ප්‍රජාතන්ත්‍රවාදයේ මුදුන් මල්කඩ ලෙසට හඳුන්වන පාර්ලිමේන්තුව, තාක්ෂණයේ දියුණුව හා සමාජයේ දියුණුව හමුවේ ඊට ගැළපෙන පරිදි යාවත්කාලීන වෙමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හා ස්ථාවර නියෝගවලට අනුකූලව එහි විෂය පථය (Scope) පුළුල් වෙමින් හැඩය, ස්වරූපය (Form) වෙනස් කර ගන්නා සෑම අවස්ථාවකදීම හැන්සාඩ් වාර්තාව ද ඊට ගැළපෙන ලෙස පළමුවන වෙළුමක් හා ඊට අදාළ පළමු කලාපයක් ප්‍රකාශයට පත් කරමින් ඒ ගැන සමාජය දැනුවත් කිරීමේ කාර්ය භාරය නොපිරිහෙළා ඉටු කර ඇති බව පසුගිය හැන්සාඩ් වාර්තා පරිශීලනය කිරීමේදී පෙනී යයි.

කෙනෙකුගේ රාජකාරියට අවශ්‍ය වන සෑම තොරතුරක්ම තම මතකයේ තබා ගත නොහැකි වන බැවින් තොරතුරු මතක තබා ගැනීම මෙන්ම ක්ෂණිකව තොරතුරුවලට ප්‍රවේශ වන මාර්ග පිළිබඳව දැනුවත්වීමද තම කාර්යක්ෂමතාව වර්ධනය කර ගැනීමට අවශ්‍ය සාධකයකි. එමෙන්ම යම් ක්ෂේත්‍රයක කටයුතු කිරීමේදී එහි ඉතිහාසය දැන සිටීමෙනුත් තම කාර්යය පහසු කරවයි. ඒ අනුව හැන්සාඩ් වාර්තා පිළියෙල වීමේ ස්වභාවය පිළිබඳව ඔබ දැනුවත්වීම එහි තොරතුරුවලට ප්‍රවේශවීම පහසු කරවන්නකි.

දැනට පවත්නා හැන්සාඩ් වාර්තාවලට අනුව පළමුවන වෙළුමක් 1924 වර්ෂයේ පළ කොට ඇත. පසුව 1933 වර්ෂයේ සිට 1947 වර්ෂය දක්වා වූ රාජ්‍ය සභා කාල පරිච්ඡේදවල (පළමුවන රාජ්‍ය සභාව 1931-1935, දෙවන රාජ්‍ය සභාව 1936-1947 සෑම වසරකම පළමුවන වෙළුමක් ප්‍රකාශයට පත් කොට ඇති බව පෙනේ. ඉන් පසු පාර්ලිමේන්තු - නියෝජිත මන්ත්‍රී මණ්ඩලය 1947 දී පිහිටුවීමේ අවස්ථාවේදීත්, 1972 දී ජාතික රාජ්‍ය සභාව පිහිටු වූ අවස්ථාවේදීත් සහ 1978 වසරේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව ආරම්භ කළ අවස්ථාවේදී ත් මෙලෙසින් හැන්සාඩ් වාර්තාවේ අලුත් වෙළුමක් ආරම්භ කොට ඇත. එසේ 1978 වසරේ ආරම්භ කළ පළමුවන වෙළුමට අදාළ 276 වන වෙළුම් කාණ්ඩයේ 6වන කලාපය 2020 පෙබරවාරි මස 06 වන දිනයේ දී එනම් අටවන පාර්ලිමේන්තුවේ අවසන් දිනයේ දී ප්‍රකාශයට පත් විය.

එසේ හැන්සාඩ් වාර්තාවක එක් එක් වෙළුම්වලට අදාළව ප්‍රකාශයට පත් වන පළමුවන කලාපයක අන්තර්ගතය වැදගත් ප්‍රධාන කරුණු රාශියකින් සමන්විත ය. එවකට පවතින පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය (ආසනය, ජාතික ලැයිස්තුවෙන් ද යන්න මෙන්ම සභිකයෙකු වෙනුවට ආදේශ කිරීමක් නම් ඒ ආදේශ කළ දිනය ද සඳහන් කරමින්) අමාත්‍ය මණ්ඩලය, කැබිනට් නොවන අමාත්‍යවරු, රාජ්‍ය අමාත්‍යවරු, නියෝජ්‍ය අමාත්‍යවරු ඇතුළත් ලේඛනය, සභාපති නාමාවලිය, පාර්ලිමේන්තු කාරක සභා, අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා, විශේෂ කාරක සභා සමන්විත වන සභික ලැයිස්තුව සහ ඒ ඒ අංශවලට අදාළ පාර්ලිමේන්තු නිලධාරීන්ගේ නාම ලේඛනයක් වශයෙන් කාලීනමය වටිනාකමක් ඇති තොරතුරු භාෂාත්‍රයෙන් මෙම විශේෂිත හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වී තිබෙන්නේ එදින පාර්ලිමේන්තු සභා ගර්භයේ සිදු වුණු දෑට අමතරව ය.

පළමුවන කලාපයක් ප්‍රකාශයට පත් කරන සෑම අවස්ථාවක දී ඊට අන්තර්ගත කරන පොදු විස්තරය යාවත්කාලීන කෙරෙන හෙයින් ඔබට යම් දිනක විශේෂ කාරක සභාවක සාමාජිකයන්ගේ හෝ අමාත්‍යවරයෙකුගේ ධුරයක් (Portfolio) වැනි තොරතුරක් සම්බන්ධයෙන් විස්තරයක් දැන ගැනීමට අවශ්‍ය වේ නම් බැලිය යුතු වන්නේ ප්‍රකාශයට පත් වූ නවීනතම පළමුවන කලාපය යි. අප රටට නිදහස ලැබීමට පෙර වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ පළමු පාර්ලිමේන්තු නියෝජිත මන්ත්‍රී මණ්ඩලය රැස්වී ඇත. ඒ 1947 ඔක්තෝබර් 14 වන අඟහරුවාදා පූර්ව භාග 10.00ට ය. එදිනට අදාළව පළමු වෙළුමක පළමු කලාපයක් ප්‍රකාශයට පත් කර ඇත.

එදින Clerk to the House of Represen tatives අද්‍යතන පාර්ලිමේන්තුවේ එම ධුරය පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධුරයයි.) ධුරය හෙබවූ රැල්ෆ් සෙන්ට් ලුවිස් පීරිස් දැරනියගල මහතා ආණ්ඩුකාරවරයා විසින් එවන ලද සභාව රැස්වීමේ නිවේදනය ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව සභාවේ මූලික කටයුත්ත වී ඇත්තේ කථානායකවරයෙකු තේරීම ය. තැපැල් සහ විදුලි සංදේශ අමාත්‍යවරයා වන සී. සිත්තම්පලම් මහතාගේ සහ එස්. යූ. එදිරිමානසිංහම් මහතාගේ (පදිරුප්පු) යෝජනා ස්ථිරත්වයෙන් ඇලෙක්සැන්ඩර් ෆ්‍රැන්සිස් මොලමුරේ (බලංගොඩ) මහතාගේ නමත්; විල්මට් ඒ. පෙරේරා මහතා (මතුගම) ඒ.එල්. තම්බයියා මහතා (කයිට්ස්) ගේ යෝජනා ස්ථිරත්වයෙන් හර්බට් ශ්‍රී නිශ්ශංක මහතාගේ නමත් ඒ සඳහා ඉදිරිපත් කර ඇත. ඡන්ද 58ක් මොලමුරේ මහතාට ද, එච්.ශ්‍රී නිශ්ශංක මහතාට ඡන්ද 41ක්ද, වැළැකී සිටි ඡන්ද 2ක්ද තිබී ඇති හෙයින් වැඩි ඡන්ද ලබා ගත් මොලමුරේ මහතා කථානායක ධුරයට පත්ව ඇත. 1931 ජූලි 07 සිට 1934 දෙසැම්බර් 10 දින දක්වා පළමුවන රාජ්‍ය සභාවේද කථානායක ධුරය උසුලන ලද මොලමුරේ මහතා 1947 ඔක්තෝබර් 14 දින සිට 1951 ජනවාරි 25 දින දක්වා මෙම පදවිය දරා ඇත.) සභාවේ වැඩ කටයුතු එදින අපරභාග 2.55ට අවසන් කොට ඇත. එදින සභාවේ සියලු වැඩ කටයුතු ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සිදුව ඇති බවද පෙනේ. ෆ්ලොරන්ස් සේනානායක මහත්මිය (කිරිඇල්ල), කුසුමසිරි ගුණවර්ධන මහත්මිය (අවිස්සාවේල්ල) සහ තමරා කුමාරි ඉලංගරත්න මහත්මිය (මහනුවර) යන මන්ත්‍රීවරියන්ගෙන් සැදුම්ලත් එම පාර්ලිමේන්තු නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ කාන්තා නියෝජනය සියයට 2.97ක් වී ඇත.

මූලාශ්‍රයඃ 1947 පාර්ලිමේන්තු - නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ හැන්සාඩ් වාර්තාවේ පළමුවන වෙළුම.

# ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තුවේ සෙංකෝලයෙහි
# බලාධිකාරය සහ එහි ප්‍රෞඪත්වය

සෞම්‍ය ඒකනායක
මාධ්‍ය නිලධාරි - සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
saumya_e@parliament.lk



සෙංකෝලය, පොදු රාජ්‍ය මණ්ඩලයීය බොහෝ රටවල පාර්ලිමේන්තුවේ බලය විදහා පාන්නාවූ ත්, පාර්ලිමේන්තුව තුළ කථානායකවරයාගේ බලය සංකේතවත් කරන්නාවූත් භෞතික සංකේත යි. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සම්ප්‍රදාය අනුව ද යම් පාර්ලිමේන්තු රැස්වීමක් වලංගු වීම සඳහා අදාළ අවස්ථාවේ දී සෙංකෝලය පාර්ලිමේන්තුවේ තිබීම අත්‍යවශ්‍ය වේ.

අතීතයේ බ්‍රිතාන්‍ය රජතුමා ඉදිරියෙන් පුද්ගලික ආරක්ෂකයෙකු රාජ යෂ්ටියක් ගෙන ගමන් කර තිබේ. බ්‍රිතාන්‍ය රජතුමා පාර්ලිමේන්තුවට පැමිණෙන විට ද රාජ යෂ්ටියක් රැගත් ආරක්ෂකයෙකු පෙරමුණ ගනු ලැබීය. පසු කලෙක රජු වෙනුවට පාර්ලිමේන්තු සභා වාර සඳහා රජුගේ නියෝජිතයෙකු මුලසුන ගත් අතර ඔහු කථානායක නමින් හැඳින්විණි. ගරු කථානායකතුමාට ගෞරවයක් වශයෙන් ද රජතුමාගේ බලය හැඳින්වීම පිණිස ද මේ අනුව එතෙක් රජතුමා ඉදිරියෙන් පුද්ගලික ආරක්ෂකයා වේත්‍රධාරී ලෙසත් රාජ යෂ්ටිය සෙංකෝලය ලෙසත් කථානායකතුමා වෙත භාර කෙරිණි. එහිදී සෙංකෝලය රජුගේ පරමාධිපත්‍ය බලයේ සංකේතය වශයෙන් පිළිගැනිණි.

ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත්විජිතයක් බවට පත් වී පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත වීමෙන් අනතුරුව එම සිරිත අද දක්වා ම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් ද ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව සෙංකෝලය උරහිසින් දරාගත් වේත්‍රධාරී පෙරටුකොටගත් කථානායකතුමා පාර්ලිමේන්තු ලේකම්වරුන් සමඟ පෙරහරින් සභා ගර්භයට පිවිස, සෙංකෝලය තැන්පත් කිරීම සඳහාම ඇති ආධාරකය මත වේත්‍රධාරී විසින් සෙංකෝලය තැන්පත් කිරීමෙන් පසු අසුන් ගැනීමත් සමඟ පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු ඇරඹේ.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සෙංකෝලය අතීත හෙළ සම්ප්‍රදාය සිහිගන්වන විශිෂ්ට කලාත්මක නිර්මාණයක් ලෙස ද හැඳින්විය හැකි ය. මෙය මහා බ්‍රිතාන්‍යයේ මහජන මන්ත්‍රී මණ්ඩලය විසින් 1949 දී ලංකාවේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙත ප්‍රදානය කරන ලද්දකි. ශ්‍රී ලාංකේය සංස්කෘතික අනන්‍යතාව සුරකිමින් හෙළ කලා සම්ප්‍රදායට අනුව රජයේ ලලිත කලායතනයේ ආචාර්යවරයකු වූ එස්. පී. චාර්ල්ස් මහතා මෙහි සැලැස්ම නිර්මාණය කිරීමෙන් අනතුරුව එදා බකිංහැම් මාළිගයට ස්වර්ණාභරණ නිර්මාණය කළ "ගරාඩ්" නම් එංගලන්ත සමාගමේ ඩැනියෙල් ස්පෙන්සර් නම් කාර්මිකයා විසින් "සෙංකෝලය" නිර්මාණය කර ඇත.

එසේ නිමවූ සෙංකෝලයේ බර රාත්තල් 28ක් හෙවත් කි. ග්‍රෑ. 12.5ක් වන අතර එය දිගින් අඟල් 48ක් වේ. සෙංකෝලය නිමැවුමෙහි සංකල්පීය අර්ථය පෙරදිග සෞන්දර්යයේ සංකේතය වන නෙළුම් මල මූලික කර ගත්තකි. රිදියෙන්, කැරට් 18 රනින් හා නීල මාණික්‍යයෙන් සරසා ඇති කළුවර දැවමය යෂ්ටිය අඟල් 28ක් දිග ය. එහි පහත කොටස රනින් හා රිදියෙන් නිම කළ පෙති දොළොසක යටිකුරු නෙළුම් මලකි. කළුවර ලී කොටස මුදුනතෙහි, පැති අටකින් යුත් රිදීමය කුලුනු හිසකින් සමන්විත ය.

ඊට ඉහළින් පෘථිවියේ දිශා සතර සංකේතවත් කරන, නෙළුම් මලේ හැඩය ගත් රිදියෙන් හා කැරට් 18 රනින් කළ පේකඩ සතරකි. ඊට සම්බන්ධ වන්නේ මනස්කාන්ත සිව්රැස් ඝනකයකි. එහි සතර පැති සදාතනිකත්වය සංකේත කරමින් හිරු, සඳු ද, ඉදිරි ගමන සංකේතවත් කරමින් චක්‍රය ද, සෞභාග්‍යය දැක්වෙන පුන් කලස ද දර්ශනීය ලෙස කැටයම් කර තිබේ.

ඊට ඉහළින් ඇති රන්මුවා පද්මය මුදුනේ සෙංකෝලයේ ප්‍රධාන අංගය වූ අඟල් 6ක විෂ්කම්භයෙන් යුතු රිදී ගෝලය පිහිටියේය. එම ගෝලය දෙපැත්තේ අසිපත රැගත් සිංහ රූප ද්විත්වයක් උත්තලව රනින් කැටයම් කොට ඇත. එම ගෝලයට ඉහළින් නීල මාණික්‍ය වළල්ලක් ද , පවිත්‍රත්වයේ සංකේතයක් ලෙසින් අටපට්ටම් පළිඟු අග්‍රයක් ද වේ.

හෙළ සම්ප්‍රදායට ආවේණික සියුම් කැටයමින් සමලංකෘතව, ලාලිත්‍යයෙන් යුතුව නිර්මිත ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සෙංකෝලය අතීත ශ්‍රී විභූතිය සිහිගන්වන මනෝරමණීය කලාත්මක නිමැවුමකි.

සෙංකෝලය පාර්ලිමේන්තුවේ සභාගර්භය තුළ තබා ඇති අවස්ථාවක දී එය ස්පර්ශ කිරීම හෝ එසවීම මඟින් බරපතළ විනය විරෝධී ක්‍රියාවක් සිදු කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට විරුද්ධව ස්ථාවර නියෝග 77 යටතේ ක්‍රියා කළ හැකිය.එවැනි අවස්ථාවක ස්ථාවර නියෝග (77(2)) යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ සේවය සති 04 කට අත්හිටුවීමට හැකිය.

# ශ්‍රී ලාංකේය කාන්තා දේශපාලනය සහ එහි ස්වරූප

බුද්ධිනි රාමනායක
මහජන සේවා කළමණාකරු - සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
buddhiniuoc@gmail.com



ස්ත්‍රී පුරුෂභාවය කිසියම් වෘත්තියක නියුක්ත වීමට හෝ එහි හිණි පෙත්තට නැගීමට බාධාවක් නොවෙතැයි සියලු ශිෂ්ට සම්පන්න සමාජයන් විශ්වාස කරතත්, ලොව පුරා වෙසෙන බහුතර කාන්තාවන් දේශපාලනයට පිවිසීමේදී මුහුණ දෙන්නේ ඊට වඩා වෙනස් එක සමාන කටුක අත්දැකීමකට ය. ශ්‍රී ලංකාවේ ද දේශපාලනයේ නිරත කාන්තාවෝ වැඩි දෙනා මේ දුෂ්කරතාව මැනවින් හඳුනන්නියෝ ය. එහෙයින්, වයස 21 කට නොවැඩි කාන්තාවන්ට ඡන්ද බලය හිමිවූ ප්‍රථම දකුණු ආසියාතික රට ලෙස 1931 දී නම් ලැබ, ලොව පළමු අගමැතිනිය බිහි කළ ද වර්තමාන දේශපාලනයෙහි කාන්තා නියෝජනය සම්බන්ධයෙන් නම් ශ්‍රී ලංකාව සිටින්නේ දකුණු ආසියාතික රටවල් රැසකට පසුගාමීව ය.

මෙය අප්‍රිකානු ආසියාතික - බොහෝදෙනා වහරන්නාක් මෙන් තෙවෙනි ලෝකයේ රටවලට පමණක් සීමා වූ තත්ත්වයක් නොවන බව ද සඳහන් කළ යුතුය. ලොව පවතින සියලු පාර්ලිමේන්තුවල මන්ත්‍රී සභිකයන්ගේ සංඛ්‍යාව 46,064ක් වන අතර ඉන් කාන්තා මන්ත්‍රීවරියන් සිටින්නේ 10,849කි. එනම්, ලොව බහුතර මහජනයා නියෝජනය කරනු ලබන්නේ 35,215ක් වන මන්ත්‍රීවරුන් විසිනි. එමඟින් ලෝකයේ බල සමතුලිතතාව ගිලිහී ඇතිවාක් මෙන්ම කාන්තා සමානාත්මතාවට ද හානි වෙයි.

එනමුත්, දේශපාලනයේ කාන්තා නියෝජනය ඉහළ ප්‍රතිශතයක් ගන්නා සමහර රටවල් සංවර්ධිත යුරෝපීය හෝ නෝර්ඩික් රටවල් බව ඇත්තකි. මෑත කාලීන කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ මේ රටවල් බොහොමයක නායිකාවන් කටයුතු කළ ආකාරය ප්‍රශංසාවට පාත්‍ර වූ බව ද අමතක කළ නොහේ. සංවර්ධනය වෙමින් පවතින රටවල් - උපසහරා අප්‍රිකානු රටවල ජාතික මට්ටමේ කාන්තා දේශපාලන නියෝජනය (30%) දක්වා ඉහළ අගයක් කරා ගෙන එන්නට ඔවුන් සමත්ව ඇත්තේ ඊට අදාළ වූ ව්‍යවස්ථාපිත මූලෝපායන්ගේ පිහිටෙනි.

උගන්ඩාවේ පාර්ලිමේන්තුවල සභිකයන්ගේ සංඛ්‍යාව 80ක් වන අතර ඉන් 64%ක ප්‍රතිශතයක් එසේත් නැතිනම් මන්ත්‍රීවරියන් 51 දෙනෙක් සභිකයන් ලෙස පත්ව සිටීම උදාහරණයක් ලෙස දැක්විය හැක.

උගන්ඩාව මේ තත්ත්වය උදා කරගෙන ඇත්තේ, ව්‍යවස්ථාපිත පංගු ක්‍රමය - අපට පුරුදු වචනයෙන් නම් කෝටාව උපයෝගි කරගෙන ය. එරටේ ජාතික, පළාත් හා ප්‍රාදේශීය දේශපාලනයෙහි 60%ක කෝටාවක් නැත්නම් පංගුවක් අනිවාර්යයෙන් කාන්තාවන්ට හිමි ය. මේ ක්‍රමය උපයුක්ත කරගනිමින් 90 දශකයේ අග භාගයේ සිට 2000 මුල දක්වා අප්‍රිකානු රටවල් ස්වකීය කාන්තාවන්ට දේශපාලනයේ සම අවස්ථා ලබා දීමට පුරෝගාමී වී තිබේ.

අපේ රටේ කාන්තාවන් දේශපාලනයට පිවිසීමේදී මුහුණ දෙන බාධා මොනවා ද යන්න, නිතර සමාජයෙන් නැගෙන ප්‍රශ්නයක් වන අතර සෑම දකුණු ආසියාතික රටක මෙන්ම ලංකාවේද කාන්තාවන් දේශපාලනයට යොමු වීමේ දී ඔවුන්ගේ පවුල් පසුබිම තීරණාත්මක සාධකයක් බව නිරීක්ෂිත ය. එවන් දේශපාලන පවුලකින් නොපැමිණෙන සාමාන්‍ය පවුලක කාන්තාවක සතු දේශපාලන අධිෂ්ඨානය කෙතරම් දැඩි වුව ද සමාජ බලපෑම්, මූල්‍ය ශක්තියෙහි හිඟය ආදි සාධක ඇගේ ගමන මන්දගාමී කරවයි.

මෙය ඇරඹුණේ 1910, 1920, 1924 දී ලංකා ව්‍යවස්ථාදායක සභාවට තේරී පත් වීමට කාන්තාවන් නුසුදුසු බවට වූ සඳහනෙකි. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) වගන්තියට අනුව නම් වර්ගය, ආගම, භාෂාව, කුලය, දේශපාලන මතවාදය, උපන් ස්ථානය මෙන්ම ස්ත්‍රී පුරුෂ භේදය මතද පුද්ගලයකු වෙනස් කොට හෝ විශේෂ කොට නොසැලකිය යුත්තේ ය. එම ව්‍යවස්ථාවෙහිම 26(7) අනුව කාන්තාවන්ට සම ඉඩ ප්‍රස්තා ලැබිය යුතු බව සඳහන් වේ. ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවේ මෙම ප්‍රතිපාදන කාන්තාවක දේශපාලනයට පිවිසීමේදී මුහුණ දෙන නීතිමය-ලිඛිත බාධා සුන් කර දමයි. එනමුත්, පසුගිය අටවැනි පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියන් සංඛ්‍යාව 12ක් විය. නමවෙනි පාර්ලිමේන්තුවේද එම සංඛ්‍යාව ඉහළ නොගියේය. ප්‍රතිශතයක් අනුව මෙය 6%කට අඩුය. එනිසාම, අන්තර් පාර්ලිමේන්තු සංසදයෙහි කාන්තා දේශපාලන නියෝජන ශ්‍රේණිගත කිරීම් අනුව අපට ලැබී ඇත්තේ රටවල් 138 කින් (128) වෙනි ස්ථානය ය. එය නිහඬව කියා පාන්නේ, කාන්තා ජනගහනය 51%ක් වන ශ්‍රී ලංකාවේ කාන්තා දේශපාලන නියෝජනය කිසිසේත්ම සතුටුදායක මට්ටමක නොපවතින බව ය.

බොහෝ දුරට අපට සමාන සමාජයීය, සංස්කෘතික සහ ආගමික ලක්ෂණ සහිත අසල්වැසි දකුණු ආසියාතික රටවල් සිය කාන්තා නියෝජනය වැඩි කරගැනීමට ව්‍යවස්ථා ප්‍රතිපාදනයක් ලෙස "පංගු ක්‍රමය" යහ පුරුද්දක් සේ සාර්ථකව යොදාගත් රටවල් බව කිව හැකි ය. යම් යම් සංස්කෘතික තහංචි වෙතැයි අප සලකන ඇතැම් රටවල ද දේශපාලනයේ කාන්තා නියෝජනය ඇත්තේ අපට වඩා තෙගුණයක්ටත් එහායිනි. එනමුත්, ඒවා එක රැයින් සැබෑ වූ සිහින නොවේ. උදාහරණයකට අසල්වැසි ඉන්දියාවේ මන්ත්‍රීවරුන් (2/3)ක් කාන්තාවන්ට වෙන් කර තැබීම සඳහා වූ පනත 1996 පටන් අද දක්වා ම සම්මත කර ගැනීමට ලැබී නැත. 2010 රාජ්‍ය සභාවෙහි කාන්තා නියෝජනය 33%ක් විය. 2/3ක් කාන්තාවන් පත් කෙරෙන කෝටාව රාජ්‍ය සභාවේදී සම්මත නොවුණ ද පිලාපර්ෂද් හා පංචායත් මට්ටමේ අනුමතව දැන් ක්‍රියාත්මකව පවතී.

මූලාශ්‍රය - පර්යේෂණ අංශය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභා ගර්භයෙහි ප්‍රධාන ද්වාරය

සෞම්‍ය ඒකනායක
මාධ්‍ය නිලධාරි - සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
saumya_e@parliament.lk


ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභා ගර්භයට පිවිසෙන ප්‍රධාන ද්වාරය ලාංකේය කලාකරුවාගේ ප්‍රතිභාව ලොවට විදහාපාන විශිෂ්ට නිමැවුමකි. ඩී. විමලසුරේන්ද්‍ර නම් ශිල්පියාගේ කැටයමින් අලංකෘත මෙම ද්වාරය දිගින් අඩි 12ක් සහ පළලින් අඩි 12ක් වන අතර තඹවලින් නිමවා රිදී තහඩුවකින් ආවරණය කර ඇත.

මෙම රිදී තහඩුව මත පුරාණ සෙල්ලිපි රටාව අනුව යමින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පූර්විකාව සිංහල, දමිළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් කැටයම් කොට ඇති අයුරු මනෝරමණීය වේ. මෙම ද්වාරයෙහි පිටත මායිම්, පුරාණ හෙළ කලාවට අනන්‍ය වූ දර්ශනීය නෙළුම් මල් රටා සහ නානාවිධ සැරසිලි මෝස්තර කැටයමින් සමලංකෘත ය. බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ඇති පුරාණ ශ්‍රී ලාංකික උඩු වියනක ඇති මල් මෝස්තරයක් ද මෙම ද්වාරයේ පිටුපස දක්නට ලැබේ. ද්වාරය ත්‍රිමාණ ස්වරූපයක් සහිතව නිර්මාණය කර ඇති අයුරු විස්මය දනවන සුලුය.

අතීත ශ්‍රී විභූතිය සිහිපත් කරමින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ප්‍රෞඪත්වයක් එක් කරන මේ ද්වාරය හෙළ කලාකරුවාගේ නෛපුණ්‍යය විශද කරන අනභිභවනීය නිමැවුමකි.

# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභා ගර්භය සහ එහි සීමාව

නිම්මි හාතියල්දෙනිය
මාධ්‍ය කළමනාකරු - සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
nimmiehathiyaldeniya@gmail.com



බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු සම්ප්‍රදායට අනුකූලව පිහිටුවා ඇති ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති සම්පාදනය කිරීමේ උත්තරීතර ආයතන යයි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභා ගර්භය ව්‍යවස්ථා සම්පාදන කාර්යය සිදුකරනු ලබන ස්ථාන යයි. එනිසා ම එය පාර්ලිමේන්තු ගොඩනැගිල්ල තුළ පිහිටි වඩාත් වැදගත් ස්ථානය වෙයි.

පාර්ලිමේන්තු සභා ගර්භයේ ප්‍රධාන ද්වාරයෙන්, සභා ගර්භයට පිවිසීමට ඇති පිය ගැට පෙළට ඔබ්බෙන් සභා ගර්භයේ මැද කොටස මත අතුරා ඇති ලෝහිත පැහැති විල්ලුද පලස මත, දිගු ඍජුකෝණාස්‍රාකාර නිකල් ලෝහයෙන් නිර්මිත තහඩුවක් වෙයි. මෙය පාර්ලිමේන්තු සභා ගර්භයේ සීමාව සලකුණු කරයි.

පාර්ලිමේන්තු සභා ගර්භයේ සීමාව දක්වන ඍජු සීමා දර්ශකයෙන් නිර්ණය කරනුයේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය, නීති සම්පාදනයේ උත්තරීතරභාවය සහ පාරදෘශ්‍යභාවය සුරක්ෂිත ස්ථානයේ ගෞරවනීයත්ව යයි.

මෙම සීමා දාරයේ මුහුණතෙහි, සාම්ප්‍රදායික එමෙන්ම සංකීර්ණ මෝස්තර කැටයම් කර තිබේ. මේවා මගින් නිර්භීතභාවය, සදාකාලිකත්වය සහ සෞභාග්‍යය, ඒකීයත්වය මෙන්ම පාර්ලිමේන්තු සභා ගර්භයේ ගෞරවනීය භාවය ද සංකේතවත් කරයි.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ සභා ගර්භ නිලධාරියකු හෝ නොවන කිසිම පුද්ගලයෙකුට මෙම සීමාවෙන් ඔබ්බට ගමන් කිරීමට අවසර නොලැබේ. මහා මැතිවරණයකින් පසුව පාර්ලිමේන්තුව රැස් වන ප්‍රථම දිනයේ දී සියලුම මන්ත්‍රීවරුන් සභා ගර්භයේ සීමාව තුළ අසුන් ගෙන සිටින අවස්ථාවේදී හැර, වෙනත් අවස්ථාවකදී දිවුරුම් දීමට නියමිත මන්ත්‍රීවරයකු එසේ දිවුරුම් දීමට පෙර සභා ගර්භයේ සීමාව මත රැඳී සිටිය යුතු ය.

එයට අමතරව කිසියම් කරුණක් උදෙසා පාර්ලිමේන්තුව හමුවට කැඳවනු ලැබූ පුද්ගලයකු හෝ කණ්ඩායමක් අදාළ කාර්යය වෙනුවෙන් සභා ගර්භය තුළට කැඳවන තුරු රැඳී සිටිය යුත්තේ සභාගර්භ සීමාව මත ය.

# ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තුවෙහි මාධ්‍ය මධ්‍යස්ථානය සහ එහි කටයුතු

මහේෂ්වරන් පිරසාද්
මාධ්‍ය නිලධාරි - සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
pirassath_m@parliament.lk



පාර්ලිමේන්තු වාර්තාකරණයේ නියැළෙන මාධ්‍යවේදින්ගේ කටයුතු වඩාත් විධිමත්ව සහ කාර්යක්ෂමව ඉටු කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මාධ්‍ය මධ්‍යස්ථානය ස්ථාපිත කොට ඇත. පාර්ලිමේන්තුවේ තෙවන මහලේ පිහිටා ඇති මෙය නවීන තාක්ෂණික පහසුකම්වලින් සමන්විත වන අතර මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය ආයතනවල මාධ්‍යවේදීන් 70 කට ආසන්න ප්‍රමාණයකට ආසන පහසුකම් සපයා තිබේ. මේ සෑම ආසනයකටම අන්තර්ජාල පහසුකම් සපයා තිබේ. පටිගත කිරීමේ මැදිරි, රූපවාහිනි යන්ත්‍ර, හඬ සහ රූප පටිගත කිරීමේ පහසුකම් ඇතුළු නවීන අංගෝපාංග රැසකින් පාර්ලිමේන්තු මාධ්‍ය මධ්‍යස්ථානය සමන්විත ය.

පාර්ලිමේන්තු රැස්වීම් මෙන්ම කෝප්, කෝපා ඇතුළු කමිටු රැස්වීම් ද මෙම මාධ්‍ය මධ්‍යස්ථානයේ ඇති පුළුල් රූපවාහිනි තිර මගින් සජීවීව නැරඹීමේ හැකියාව ඇති අතර, අවශ්‍ය නම් ඒවා පසුව බාගත (Downlaod) කරගැනීමේ පහසුකම් ද සලසා ඇත.

තව ද මෙම මාධ්‍ය මධ්‍යස්ථානයේ අතිනවීන පහසුකම්වලින් සමන්විත රූපවාහිනි මැදිරියක් වෙයි. එහි රූපවාහිනි සාකච්ඡා සහ වෙනත් නිෂ්පාදන කටයුතු සජීවිව හෝ පටිගත කිරීම් ලෙස සිදු කළ හැකි ය. මෙම සියලු කටයුතු පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයෙන් සිදු වන අතර ඕනෑම මාධ්‍යවේදියෙකුට හෝ මන්ත්‍රීවරයෙකුට සන්නිවේදන දෙපාර්තමේන්තුව මගින් මෙය වෙන් කරවාගත හැකි ය. මේ වන විටත් සන්නිවේදන දෙපාර්තමේන්තුව මෙම මැදිරිය භාවිත කරමින් වැඩසටහන් ගණනාවක් නිෂ්පාදනය කොට ඇත. පාර්ලිමේන්තුවේ කෝප්, කෝපා ඇතුළු කමිටු මාධ්‍යයට විවෘත වීමත් සමඟ මාධ්‍යවේදීන්ගේ සහභාගීත්වය වැඩි වශයෙන් සිදු වන අතර, එකී සියලු කටයුතු පහසු කර ගැනීමට පාර්ලිමේන්තු මාධ්‍ය මධ්‍යස්ථානයෙන් ලැබෙනුයේ මහඟු පිටිවහලකි.

# නිදහස් ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තු ක්‍රමයේ විකාශනය; විස්තරාත්මක විමංසනයක්

නිපුනි බලගමගේ
මහජන සේවා නිලධාරි - සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
nipuni_b@parliament.lk

## හැඳින්වීම

1948 වර්ෂයේ දී ශ්‍රී ලංකාවට නිදහස ලැබීම මෙරට ඉතිහාසයේ සුවිශේෂී සන්ධිස්ථානයකි. ඒ සමඟම පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක් ද ලැබුණු බැවින් නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය මඟින් දේශපාලන කටයුතුවලට සම්බන්ධ වීමේ අවස්ථාව ලාංකිකයන්ට හිමි විය. වර්ෂ 1947 දී සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හඳුන්වා දෙන ලද්දේ වඩා පුළුල් නියෝජනයක් ලබා දෙන ලෙස සුවිශේෂ කණ්ඩායම් විසින් කරන ලද උද්ඝෝෂණවල ප්‍රතිඵලයක් වශයෙනි. මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ලංකාවට පාර්ලිමේන්තු ක්‍රමය හඳුන්වා දෙනු ලැබිණ. එතැන් පටන් සෝල්බරි ආණ්ඩු ක්‍රමය යටතේ පාර්ලිමේන්තු හතක් ක්‍රියාත්මක විය. ජනරජයක් ලෙස 1972 මැයි 22 දින ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම සමඟ සත්වන පාර්ලිමේන්තුව වෙනුවට ජාතික රාජ්‍ය සභාව පිහිටවනු ලැබිණ. ජාතික රාජ්‍ය සභාව ලංකාවේ පරිපාලන ව්‍යුහයට සම්බන්ධ වූයේ අවුරුදු හයකට අඩු කාලයකට පමණි.

එයින් අනතුරුව 1978 සැප්තැම්බර් 7 වෙනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමත් සමඟ දෙවන ජාතික රාජ්‍ය සභාව වෙනුවට ප්‍රථම පාර්ලිමේන්තුව ස්ථාපිත කෙරිණ. එතැන් පටන් අද දක්වා පාර්ලිමේන්තු අටක් ක්‍රියාත්මකව ඇත. මෙසේ සාර සංක්ෂිප්තව සඳහන් කළ හැකි නිදහස් ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ක්‍රමයේ විකාශනය පිළිබඳ මෙම ලිපිය විස්තරාත්මක විමංසනයක් වන්නේ වර්තමාන පාඨකයාට ඇතැම්විට අමතක විය හැකි නමුත් උනන්දුව වැඩි වීමෙහි සමත් කරුණු රාශියක් සංගෘහිත හෙයිනි.

## ප්‍රථම පාර්ලිමේන්තුව

(1947 ඔක්තෝම්බර් 14 - 1952 අප්‍රේල් 8)

ශ්‍රී ලංකාවේ පළමු පාර්ලිමේන්තුව ලෙස හැඳින්වෙනුයේ, සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් හඳුන්වා දුන් බ්‍රිතාන්‍ය වෙස්ට්මින්ස්ටර් ආකෘතිය පරිදි සකස් කෙරුණු ව්‍යවස්ථාදායකය යි. එය නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හා සෙනෙට් සභාවෙන් සමන්විත විය. වෙස්ට්මින්ස්ටර් ආකෘතිය යනුවෙන් හැඳින්වෙන්නේ, එංගලන්තයේ වෙස්ට්මිනිස්ටර් චතුරස්‍රයේ පිහිටි එංගලන්ත පාර්ලිමේන්තුව කේන්ද්‍රය කරගත් ආණ්ඩු ක්‍රමය යි.

- අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන් වීම
- රාජ්‍ය නායකයා අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත ක්‍රියාත්මක වන නාමමාත්‍ර විධායකයක් වීම
- රාජ්‍ය සහ අධිකරණ නිලධාරීන්ගේ ස්වාධීනතාවය රැක ගැනීමට විශේෂ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සැලසීම
- නිදහස් හා සාධාරණ මැතිවරණ නිසි කල්හි පැවැත්වීම සහ ව්‍යවස්ථාදායකය මහජන නියෝජිතත්වය සාක්ෂාත් කිරීම
- ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණෙන් නීතියේ බලය පවත්වා ගැනීම

මහා මැතිවරණය දින 19ක් පුරා පැවැත්වීම විශේෂත්වයකි. මැතිවරණයෙන් අනතුරුව මුළු සභික සංඛ්‍යාව 101 ක් තෝරා පත් කර ගත් අතර, ඉන් 95 ක් මහජන ඡන්දයෙන්ද 06 දෙනෙක් අග්‍රාණ්ඩුකාරවරයා විසින්ද තෝරා පත්කර ගන්නා ලදී. ඡන්ද 58ක් ලබා ගනිමින් ගරු ශ්‍රීමත් ෆ්‍රැන්සිස් මොලමුරේ මහතා ප්‍රථම කථානායක ධූරයට පත්විය. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ප්‍රථම සභාපතිවරයා වූ මෙතුමා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ප්‍රථම කථානායකවරයා විය. ඔහුගේ ධූර කාලයෙන් අනතුරුව ගරු ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස් මහතා කථානායක ධූරයට පත්විය. ප්‍රථම පාර්ලිමේන්තුවේ ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාමාත්‍යවරයා වූයේ මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමාය.

## දෙවැනි පාර්ලිමේන්තුව

(1952 ජූනි 09 - 1956 පෙබරවාරි 18)

ප්‍රථම පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් අනතුරුව දෙවැනි පාර්ලිමේන්තුව සඳහා 1952 මැයි මස 24, 26, 28, 30 යන දින 04ක් පුරා මැතිවරණය පැවැත්විණ. ඉන් එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කළේය. දෙවන පාර්ලිමේන්තුවේ කථානායක පදවිය ගරු ශ්‍රීමත් ඇල්බට් එෆ්. පීරිස් මහතාට හිමි විය. ඉන් අනතුරුව නියෝජ්‍ය කථානායක පදවිය සඳහා ගරු එච්. එස්. ඉස්මයිල් මහතා පත් විය. මෙම කාල සීමාව තුළ දී සිදු වූ විශේෂ සිදුවීම් කිහිපයක් පහත පරිදි පෙළ ගස්වා ඇත.

- 1952 මහා මැතිවරණයට මුහුණදෙන දුන් සියලුම දේශපාලන පක්ෂවල භාෂා ප්‍රතිපත්තිය වූයේ සිංහල හා දෙමළ භාෂාව රාජ්‍ය භාෂා බවට පත්කිරීමයි.
- රාජ්‍ය භාෂා ප්‍රශ්නය දේශපාලන ප්‍රවාහයේ ප්‍රධාන අංගයක් බවට පත් විය.
- 1952 මහා මැතිවරණයෙන් තෝරා පත්කරගත් පාර්ලිමේන්තුවේ නියමිත කාලය අවසන් වීමට වසරකට පෙර, එනම් 1956 දී මහ මැතිවරණය පැවැත්විණි.

## තුන්වැනි පාර්ලිමේන්තුව

(1956 අප්‍රේල් 19 - 1959 මැයි 12)

සිංහල භාෂාව පමණක් රාජ්‍ය භාෂාව කළ යුතුය යන යෝජනාවක් 1956 පෙබරවාරි 18 වෙනිදා කැලණියේ පැවැති විශේෂ සම්මේලනයක දී එක්සත් ජාතික පක්ෂය ගෙන ආ අතර එම යෝජනාව සම්මත වූ දිනයේදී ම අගමැතිවරයාගේ උපදෙස් පරිදි අග්‍රාණ්ඩුකාරයා 2 වන පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට කටයුතු කළේය. පැවැති මැතිවරණයෙන් බණ්ඩාරනායක මහතාගේ මහජන එක්සත් පෙරමුණට දැවැන්ත ජයක් අත් විය. ගරු එච්. එස් ඉස්මයිල් මහතා තුන්වෙනි පාර්ලිමේන්තුවේ කතානායකවරයා විය. තුන්වැනි පාර්ලිමේන්තුවේ විශේෂ අවස්ථා රැසකි.

සර් ජෝන් කොතලාවල මහතාගේ කැබිනට් මණ්ඩලයේ සිටි ඇමතිවරු 14 දෙනාගෙන් 12 ක්ම මැතිවරණයට ඉදිරිපත් වූ අතර ඉන් දහ දෙනෙක්ම පරාජයට පත් වූහ. 1956 මහ මැතිවරණයෙන් පසුව එනම් තුන්වන පාර්ලිමේන්තු කාලය තුළ පවත්වා ඇත්තේ එක් අතුරු මැතිවරණයක් පමණි. එය වැලිමඩ ආසනය වෙනුවෙනි. 1959 සැප්තැම්බර් 25 දින බණ්ඩාරනායක අගමැතිතුමා රොස්මිඩ් පෙදෙසෙහි සිය නිවසේ දී ම ඝාතනයට ලක්වූ අතර, අගමැති පදවියට ඩබ්ලිව් දහනායක මහතා පත්ව 1960 මාර්තු 20 වැනිදා දක්වා හය මසක් එම පදවිය දැරීය. අභ්‍යන්තර මත ගැටුම් නිසා මහජන එක්සත් පෙරමුණ රජයට තම නිල කාලය වූ පස් අවුරුදු ධූර කාලය සම්පූර්ණ කිරීමට ඉඩක් නොලැබිණ. එනමුත් එම රජය විසින් ප්‍රධාන තීරණ රැසක් ගනු ලැබී ය.

- සිංහලය රාජ්‍ය භාෂාව බවට පත් කිරීම
- කොළඹ වරාය සහ බස් ව්‍යාපාරය ජනසතුකරණය
- සංස්කෘතික දෙපාර්තමේන්තුවක් ආරම්භ කිරීම
- සේවක අර්ථසාධක අරමුදල ආරම්භ කිරීම
- ත්‍රිකුණාමලයේ බ්‍රිතාන්‍ය යුද කඳවුරු නිදහස් කර ගැනීම
- විද්‍යාලංකාර- විද්‍යෝදය පිරිවෙන් විශ්වවිද්‍යාලකරණය

## සිව්වැනි පාර්ලිමේන්තුව

(1960 මාර්තු 30 - අප්‍රේල් 23)

"තිස් දවසේ පාර්ලිමේන්තුව" යනුවෙන් මැතිවරණ ඉතිහාසයේ ප්‍රකට සිවුවැනි පාර්ලිමේන්තුව ද සුවිශේෂී වේ. මැතිවරණය 1960 මාර්තු 19 වෙනිදා පැවැත්වූ අතර එය මහා මැතිවරණයක් එක් දිනක් තුළ පැවැත්වූ ප්‍රථම අවස්ථාව විය. එයින් එක්සත් ජාතික පක්ෂයට ආසන 50 ක් ද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ආසන 46 ක් ද ලැබිණ. ආණ්ඩු පක්ෂයෙන් ඉදිරිපත් කරන ලද හිටපු කථානායක ඇල්බට් එෆ්. පීරිස් මහතා පරදවා විපක්ෂයේ නියෝජිත ටී. බී සුබසිංහ මහතා කථානායක පදවියට පත් වූයේ වැඩි ඡන්ද 33 කිනි.

## පස්වැනි පාර්ලිමේන්තුව

(1960.08.05 - 1964.12.17)

1960 මාර්තු මහා මැතිවරණයෙන් තෝරා පත් කරගන්නා ලද පාර්ලිමේන්තුව පැවතියේ දින 30 ක් පමණි. ජූලි මහා මැතිවරණය අනතුරුව පැවැත්විණි. මැතිවරණයේ දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ නායකත්වයෙන් යුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආසන 75ක් දිනා ගත්තේ ය.එක්සත් ජාතික පක්ෂය ආසන 30 ක් දිනා ගනිමින් දෙවන ස්ථානයට පත් වූ අතර ෆෙඩරල් පක්ෂය ආසන 16ක් දිනා ගත්තේය.

සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය පදවියට පත්වූ සයවැන්නාවූවා ය. එතුමිය ලෝකයේ අග්‍රාමාත්‍ය පදවියට පත් වූ පළමු කාන්තාව විය. පස්වැනි පාර්ලිමේන්තුවේ කථානායක පදවියට ආර්. එස්. පැල්පොල මහතා පත් විය.

## සයවැනි පාර්ලිමේන්තුව

(1965 අප්‍රේල් 05 - 1970 මාර්තු 25)

මාර්තු 22 දින මැතිවරණය පැවැත්විණි. එක්සත් ජාතික පක්ෂය ආසන 66ක් දිනාගෙන තිබූ අතර ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආසන 41 ක් දිනාගෙන තිබුණි. සය වැනි පාර්ලිමේන්තුවේ කථානායක පදවියට පත්වූයේ සර්. ඇල්බට්. එෆ්. පීරිස් මහතා ය. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විපක්ෂ නායක පදවියට පත් වූ මුල්ම කාන්තාව ලෙස ඉතිහාසගත වීම විශේෂත්වයක් විය. පහත දැක්වෙන්නේ මෙම පාර්ලිමේන්තු කාල සීමාවේදී සිදු වූ විශේෂ සිදුවීම් කිහිපයකි.

- වයස අවුරුදු 18ට වැඩි තරුණ තරුණියන් මුල්වරට ඡන්දය භාවිත කළේ මෙම මැතිවරණයේදී ය.
- මහා මැතිවරණයට ඉදිරිපත් වූ හිටපු මන්ත්‍රීවරුන් 55 දෙනකු පරාජයට පත් විය.

- මාර්තු 27 වැනිදා ඩඩ්ලි සේනානායක මහතාගේ නායකත්වයෙන් ජාතික රජයක් පිහිටුවීම. එක්සත් ජාතික පක්ෂය හැරුණු විට ශ්‍රී ලංකා නිදහස් සමාජවාදී පක්ෂය, මහජන එක්සත් පෙරමුණ පෙඩරල් පක්ෂය හා ජාතික විමුක්ති පෙරමුණ එයට හවුල් විය.
- ඩඩ්ලි සේනානායක මහතා ඉරිදා නිවාඩුව අහෝසි කොට, ඒ වෙනුවට සතර පොහොය නිවාඩු බවට පත්කිරීම

## සත්වැනි පාර්ලිමේන්තුව

(1970 ජූනි 07 - 1972 මැයි 22)

සත්වැනි පාර්ලිමේන්තුවේ කථානායක පදවියට පත්වූයේ කෝට්ටේ මන්ත්‍රී ස්ටැන්ලි තිලකරත්න මහතාය. ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට අවශ්‍ය වන තුනෙන් දෙකක පාර්ලිමේන්තු බහුතරය ලබා ගැනීමට සමගි පෙරමුණ රජය සමත් විය. හත්වැනි පාර්ලිමේන්තු කාලය තුළ සිදු වූ විශේෂ වෙනස්කම් කිහිපයක් විය. එනම්,

- 1972 මැයි 22 දා ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය කිරීටයෙන් වෙන් වූ ස්වාධීන නිදහස් ස්වෛරී ජනරජයක් බවට පත් විය.
- සමගි පෙරමුණේ නායිකා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය 1970 මැයි 29 වැනිදා දෙවැනි වරටත් අග්‍රාමාත්‍ය පදවියට පත්වීම.
- සත්වැනි පාර්ලිමේන්තුවේ පළමු වැනි සැසිවාරය ජුනි 14 වෙනිදා විවෘත විය. එදින ජනතා විජයග්‍රාහී දිනය වශයෙන් නම්කොට රජයේ නිවාඩු දිනයක්ද කරනු ලැබී ය.
- ජනරජ ව්‍යවස්ථාව 1972 මැයි 21 වැනිදා සම්මත කොට ක්‍රියාත්මක කරනු ලැබී ය.
- ජනරජ ව්‍යවස්ථාව සම්මත වීමත් සමගම ලංකාව "ශ්‍රී ලංකාව" බවට පත්විය. වසර (139) ක් පුරා ව්‍යවස්ථාදායකය නියෝජනය කළ, පත් කළ, මන්ත්‍රීවරුන් පත් කිරීමද 1972 නව ව්‍යවස්ථාවෙන් අහෝසි කෙරිණ.
- සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව 1948 දී ස්ථාපනය කරන ලද, උත්තර මන්ත්‍රී මණ්ඩලය හෙවත් සෙනට් සභාව 1971 අංක 36 දරණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත මගින් අහෝසි කරනු ලැබුවේ 1971 ඔක්තෝබර් දෙවැනි දාය.
- 1970 දෙසැම්බර් 29 වැනිදා හමුවූ පාර්ලිමේන්තුවේ සියලුම පක්ෂ නායකවරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විශ්‍රාම වැටුපක් ලබාදීමට තීරණය කළහ.

## පළමු ජාතික රාජ්‍ය සභාව

(1972 මැයි 22 - 1977 මැයි 18)

1972) මැයි 22 දින ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාශයට පත් කිරීමත් සමගම පාර්ලිමේන්තුව වෙනුවට ජාතික රාජ්‍ය සභාව පිහිටුවීය. ජාතික රාජ්‍ය සභාවේද ද කථානායකවරයා වූයේ කෝට්ටේ මන්ත්‍රී ස්ටැන්ලි තිලකරත්න මහතා ය. මැයි 18 වැනිදා ජාතික රාජ්‍ය සභාව විසුරුවා හැරිණ. මහ මැතිවරණය 1977 ජූලි 21 වැනිදා පැවැත්විණි.

## දෙවන ජාතික රාජ්‍ය සභාව

(1977 අගෝස්තු 04 සිට 1978 සැප්තැම්බර් 07)

- 1977 අගෝස්තු 04 දින දෙවන ජාතික රාජ්‍ය සභාවේ කථානායකවරයා වශයෙන් කෝට්ටේ පාර්ලිමේන්තු මන්ත්‍රී ආනන්ද තිස්ස ද අල්විස් මහතා පත් විය. පහත දැක්වෙන්නේ දෙවන ජාතික රාජ්‍ය සභා කාලය තුළදී සිදු වූ විශේෂ කාරණා කිහිපයකි.
- 1972 මැයි 20 වෙනිදා සම්මත කරගන්නා ලද ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනුවට 1977 දී බලයට පත්, එක්සත් ජාතික පක්ෂ රජය විසින් සම්පාදනය කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1978 ජූලි 25 වැනිදා ජාතික රාජ්‍ය සභාවට ඉදිරිපත් කරනු ලැබී ය.
- අගෝස්තු 31 වෙනිදා ව්‍යවස්ථාවට අනුමැතිය දී අත්සන් තැබීම සිදු විය.
- 1978 සැප්තැම්බර් 7 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමත් සමඟ ජාතික රාජ්‍ය සභාව වෙනුවට "ප්‍රථම පාර්ලිමේන්තුව" පිහිටවනු ලැබිණ.
- 1978 ව්‍යවස්ථාපිත දෙවැනි ජනරජ ව්‍යවස්ථාව විධායක බලතලවලින් හෙබි ජනාධිපති ධූරයකින් ද පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයකින් ද සමන්විත විය. යළිත් ව්‍යවස්ථාදායකය පාර්ලිමේන්තුව ලෙස නම් කෙරිණ.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළමු පාර්ලිමේන්තුව

(1978 සැප්තැම්බර් 07 - 1988 දෙසැම්බර් 20)

පහත දැක්වෙන්නේ පළමු පාර්ලිමේන්තු කාල සීමාවේදී සිදු වූ විශේෂ සිද්ධීන් කිහිපයකි.

- 1978. 02. 04 වන දින සිට ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපතිවරයා ලෙස ජේ.ආර් ජයවර්ධන මහතා පත් වූයේය. ආර්. ප්‍රේමදාස මහතා අගමැති ධූරයට පත් විය.
- 1978 ඔක්තෝබර් පස් වැනි දා සිට දිවයිනම ආවරණය වන පරිදි දිස්ත්‍රික් අමාත්‍යවරුන් 24 දෙනෙක් ජනාධිපතිවරයා විසින් පත් කරන ලදී.
- කිසියම් මන්ත්‍රීවරයෙකු මිය ගියහොත්, ඉල්ලා අස් වුවහොත් හෝ පක්ෂයෙන් නෙරපා දැමූවහොත් වෙනදා පැවැත්වෙන අතුරු මැතිවරණ වෙනුවට එම පදවියට නව මන්ත්‍රීවරයෙක් නම් කර යැවීමේ කාර්යභාරය පැවරෙනුයේ පක්ෂ ලේකම්වරයා වෙත ය.
- ද්‍රවිඩ ඊලාම් විමුක්ති කොටි සංවිධානය සහ ඒ හා සමාන වෙනත් සංවිධාන තහනම් කෙරෙන ව්‍යවස්ථා කෙටුම්පත 1978 මැයි 25 වැනිදා සම්මත වූ පසු ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ පාර්ලිමේන්තුව වර්ජනය කිරීම ආරම්භ කළේ ය.
- 1980 සැප්තැම්බරයේ දී සම්මත වූ 1980 අංක 35 දරන සංවර්ධන සභා පනතින් පරිපාලන ව්‍යුහය තවත් පුළුල් කරනු පිණිස දිස්ත්‍රික්කයකට එක් සංවර්ධන සභාවක් පිහිටු වීය.
- 1980 ඔක්තෝබර් මස 16 වැනිදා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය ගේ සහ ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහතාගේ ප්‍රජා අයිතිය අහෝසි කර බණ්ඩාරනායක මැතිණිය පාර්ලිමේන්තුවෙන් නෙරපා දැමිණි.

- පාර්ලිමේන්තුව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නව අගනුවර නව පාර්ලිමේන්තු ගොඩනැගිල්ලට ගෙන එන ලදුයේ 1982 අප්‍රේල් 29 දිනය.
- 1982 නොවැම්බර් 4 පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හතර වෙනි සංශෝධනය වූ පාර්ලිමේන්තු නිල කාලය දීර්ඝ කිරීම 2/3 වැඩි ඡන්දයෙන් සම්මත වුවද කථානායකවරයාගේ සහතිකයේ දැන්වූයේ අදාළ කෙටුම්පත ජනමත විචාරණයකට ලක් කරන තුරු නීතියක් බවට පත් නොවිය යුතුය යන්න ය. එමගින් ශ්‍රී ලංකා ඉතිහාසයේ ප්‍රථම ජනමතවිචාරණයට මග පෑදිණි. යෝජනාවට පක්ෂව ලැබුණු ජන්ද සංඛ්‍යාව 3,141,223ක් වූ අතර විපක්ෂව ලැබූ ජන්ද සංඛ්‍යාව 2,605,983 කි.
- හයවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව, රට දෙකඩ කිරීමට විරුද්ධව දිව්රුම් දිය යුතු විය. එය ප්‍රතික්ෂේප කළ ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයන්ට ආසන අහිමි විය.
- 1987 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකතු කරන ලද දහතුන්වැනි සංශෝධනය මගින්, ශ්‍රී ලංකාවේ පළාත් සභා පලාත් සභා ස්ථාපනය කිරීම සඳහා වූ විධි විධාන එක් කරනු ලැබිණි.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දෙවැනි පාර්ලිමේන්තුව

(1989 මාර්තු 09 -1994 ජූනි 24)

- සමානුපාතික ඡන්ද ක්‍රමය අනුව ශ්‍රී ලංකාවේ ප්‍රථම මහ මැතිවරණය 1989 දී පැවැත්විණි. 1931 සර්වජන ඡන්ද බලය ලැබුණු දා සිට මෙරට ඡන්දදායකයා අනුගමනය කරන ලද කේවල ඡන්ද ක්‍රමය නිමා විය. නව පාර්ලිමේන්තුව 1989 මාර්තු 9 වන දින දිවුරුම් දුණි. කථානායක වශයෙන් එම්. එච්. මොහොමඩ් මහතා පත් විය. පහත දැක්වෙන්නේ මැතිවරණ කාලය තුළදී මෙන්ම පාර්ලිමේන්තු කාලසීමාව තුළ දී සිදු වූ විශේෂ සිදුවීම් කිහිපයකි.
- මැතිවරණ කොට්ඨාස වල ඡන්ද අනුපාතය අනුව ව්‍යවස්ථාවේ නියම කර ඇති මන්ත්‍රීන් 196 දෙනා තෝරා ගැනීමටත්, ජාතික ඡන්ද අනුපාතය අනුව එයට තවත් සියයට පහළොවක් එනම් මන්ත්‍රීධූර 29 ක් එකතු කිරීමටත් පියවර ගැනිණි.
- මනාප ක්‍රමය අනුව අපේක්ෂකයන් තුන්දෙනෙක් සඳහා මනාප පළ කිරීමට අවකාශය හිමි වීම
- අවුරුදු 5 මාස 3 දින 15 ක ධූර කාලයක් ඇවෑමෙන්, දෙවන පාර්ලිමේන්තුව 1994 ජූනි 24 වෙනිදා විසුරුවා හැරීය.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ තුන්වැනි පාර්ලිමේන්තුව

(1994 අගෝස්තු 25 - 2000 අගෝස්තු 18)

දෙවන පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් අනතුරුව තුන්වැනි පාර්ලිමේන්තුව සඳහා මහා මැතිවරණය අගෝස්තු 16 වැනි දා පැවැත්විණි. 1994 මහ මැතිවරණයෙන් පසුව අගෝස්තු 19 වැනි දා ශ්‍රී ලංකාවේ එකොළොස්වැනි අග්‍රාමාත්‍ය ධූරයට චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය පත් වූවාය. කථානායක පදවියට කේ. බී. රත්නායක මහතා පත් විය.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සිව්වැනි පාර්ලිමේන්තුව

(2000 දෙසැම්බර් 18 - 2001 ඔක්තෝබර් 10)

සිව්වැනි පාර්ලිමේන්තුව සඳහා අභිනව මන්ත්‍රීවරුන් තෝරා ගැනීමේ මැතිවරණය 2000 ඔක්තොම්බර් 10 දින පැවැත්විණි. මහා මැතිවරණයෙන් අනතුරුව අභිනව පාර්ලිමේන්තුවේ ප්‍රථම රැස්වීම 2000 ඔක්තොම්බර් 18 වන දින පැවැත් විණි. විපක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර බණ්ඩාරනායක මහතා කථානායක බවට නිතරගයෙන් තේරී පත් විය. මාස 11 දින 22 වැනි කෙටි කාලයක් පැවතියා වූ සිව්වන පාර්ලිමේන්තුවේ ධුර කාලය තළදී ආණ්ඩුව හා ජනතා විමුක්ති පෙරමුණ අතර, අවබෝධතා ගිවිසුමක් අත්සන් කෙරිණි. 20 දෙනෙකුගෙන් සමන්විත කැබිනට් මණ්ඩලයක් පත් කෙරිණි. 2001 ඔක්තෝබර් 10 වන දින පාර්ලිමේන්තුව විසුරුවා හැරිණ.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පස්වැනි පාර්ලිමේන්තුව

(2001 දෙසැම්බර් 19 - 2004 පෙබරවාරි 07 )

පස්වැනි පාර්ලිමේන්තුවේ අභිනව මන්ත්‍රීවරුන් තෝරා ගැනීමේ මහ මැතිවරණය 2001 දෙසැම්බර් 05 වැනිදා පැවැත් විණ. එක්සත් ජාතික පක්ෂය, එක්සත් ජාතික පෙරමුණ නමින් තරග කර වැඩි මන්ත්‍රී සංඛ්‍යාවක් ලබා ගත්තේ ය. 2001 දෙසැම්බර් 10 වැනි දින එක්සත් ජාතික පෙරමුණ වෙනත් සුළුතර පක්ෂවල සහයෝගයෙන් 25 දෙනෙකුගෙන් යුත් කැබිනට් මණ්ඩලයක් පිහිටුවිය. රනිල් වික්‍රමසිංහ මහතා අගමැති වශයෙන් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිනිය ඉදිරියේ දිවුරුම් දී වැඩ භාර ගත්තේ ය. කථානායක ධූරය සඳහා එම්. ජෝසප් මයිකල් පෙරේරා මහතා නිතරගයෙන් තේරී පත් විය. මෙම පාර්ලිමේන්තු කාල සීමාවේ දී සිදු වූ විශේෂිත සිද්ධීන් කිහිපයක් පහත පරිදි දැක්විය හැකිය.

- මැතිවරණ ඉතිහාසයේ පළමු වරට පාර්ලිමේන්තුවට තේරී පත්වූ බෞද්ධ භික්ෂූන් වහන්සේ වශයෙන් ගාල්ල දිස්ත්‍රික්කයෙන් පොදුජන එක්සත් පෙරමුණෙන් ඡන්ද 42120ක් ලබා ගනිමින් බද්දේගම සමිත හිමියෝ පාර්ලිමේන්තුවට තේරී පත් වූහ.
- ජනාධිපති කුමාරතුංග මැතිනිය විසින් පාර්ලිමේන්තුවේ සභාවාරය අවසන් කොට, හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කොට, වැදගත් අමාත්‍යාංශ තුනක (ආරක්ෂක, අභ්‍යන්තර කටයුතු සහ මාධ්‍ය) පාලන බලය සියතට ගැනීම.
- ජනාධිපති කුමාරතුංග මැතිනියගේ පක්ෂය මෙන්ම විපක්ෂ පොදු පෙරමුණෙහි ප්‍රධාන කොටසද වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුණ එක්ව 2004 ජනවාරි 20 දින දී එක්සත් ජනතා නිදහස් සන්ධානය (එ. ජ. නි. ස) නම්වූ නව දේශපාලන සන්ධානයක් පිහිටුවා ගැනීම.
- 2004 පෙබරවාරි 07 පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට කටයුතු කෙරිණ.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හය වැනි පාර්ලිමේන්තුව

(2004 අප්‍රේල් 22 - 2010 පෙබරවාරි 09)

අභිනව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීමේ මැතිවරණය 2004 අප්‍රේල් 02 දින පැවැත්විණි. මෙම මැතිවරණයෙන් එක්සත් ජනතා නිදහස් සන්ධානය ජය ගත්තේ ය. ඒ ආසන 225 අතුරින් ආසන 105 ක් දිනාගනිමින් පාර්ලිමේන්තුවේ විශාලතම කණ්ඩායම බවට පත්වීමෙනි. අන්දෝලනාත්මක ඡන්ද වට තුනකින් අනතුරුව, අභිනව පාර්ලිමේන්තුවේ කථානායකවරයා වූයේ විපක්ෂයේ අපේක්ෂක, වි. ජ. මු. ලොකුබණ්ඩාර මහතා ය. මෙම පාර්ලිමේන්තු කාල සීමාව තුළදී, 2004 අප්‍රේල් 6 දින, ජනාධිපති චන්ද්‍රිකා

කුමාරතුංග මහත්මිය විසින් නව අග්‍රාමාත්‍ය ලෙස එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මහින්ද රාජපක්ෂ මහතා පත් කරන ලදී. අවුරුදු 5 මාස 9 දින 17 ක පාර්ලිමේන්තු ධූර කාලයක් ඇවෑමෙන් අනතුරුව 6 වැනි පාර්ලිමේන්තුව 2010 පෙබරවාරි 09 දින විසුරුවා හැරිණ.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හත්වැනි පාර්ලිමේන්තුව

2010 අප්‍රේල් 22- 2015 ජූනි 26

මහා මැතිවරණය 2010 අප්‍රේල් 08 වැනි දින පැවැත්විණ. ඉන් එක්සත් ජනතා නිදහස් සන්ධානය ජයග්‍රහණය කළේ ය. අභිනව කථානායකවරයා ලෙස හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී චමල් රාජපක්ෂ මහතා නිතරගයෙන් තේරීපත් විය. මෙම මහා මැතිවරණයෙන් මන්ත්‍රීවරියෝ දසදෙනෙක් මැති සබයට පිවිසුණහ. 2015 වසරේ ජනවාරි 08 වැනි දින පැවැති ජනාධිපතිවරණයෙන් එවකට ජනාධිපතිව සිටි මහින්ද රාජපක්ෂ මහතා පරාජය කරමින් මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපතිධූරයට පත් විය. එම නව රජයේ අග්‍රාමාත්‍යවරයා ලෙස රනිල් වික්‍රමසිංහ මහතා පත් විය. එක්සත් ජාතික පක්ෂයේ හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ එකතුවෙන් ජාතික ආණ්ඩුවක් පිහිට වූ අතර, එය යහපාලන ආණ්ඩුව ලෙස හැඳින්විණි. මෙම පාර්ලිමේන්තු කාල සීමාව තුළ 19 වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුමත වීම විශේෂත්වයකි.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අටවැනි පාර්ලිමේන්තුව

(2015 සැප්තැම්බර් 01 - 2020 මාර්තු 02)

8 වැනි පාර්ලිමේන්තුව සඳහා මහා මැතිවරණය (2015.08.17) වැනි දින පැවැත්විණි. මෙම මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයට ජය හිමි විය. 08 වැනි පාර්ලිමේන්තුවේ විශේෂ අවස්ථා කිහිපයක් පහත පරිදි වේ.

- එක්සත් ජාතික පක්ෂය සහ එක්සත් ජනතා නිදහස් සන්ධානය එකතුව ජාතික ආණ්ඩුවක් ස්ථාපනය කිරීම විශේෂ වේ.
- අග්‍රාමාත්‍ය ධූරය සිව් වතාවකදී වෙනස් විය (රනිල් වික්‍රමසිංහ මහතා දෙවතාවක් ද, මහින්ද රාජපක්ෂ මහතා දෙවතාවක් ද වශයෙන් අග්‍රාමාත්‍ය ධූරයට පත් වූහ).
- පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශවයේ නායක ධූරය තිදෙනෙකු විසින් දරන ලදී.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් නොවන සාමාජිකයන් පත් කිරීම සිදු වීම ද විශේෂයකි.
- 2018 මාර්තු මස 07 වැනි දින පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහයක් ද පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.
- 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත සම්මත කිරීම.
- පාර්ලිමේන්තුවේ නව ස්ථාවර නියෝග මාලාව 2018 අප්‍රේල් 15 වැනි දින සිට ක්‍රියාත්මක කෙරිණි.
- 2018 ඔක්තෝබර් මස 26 වැනිදා සිට 2018 දෙසැම්බර් මස 16 වැනි දින දක්වා දින 52 ආණ්ඩුවක් අටවැනි පාර්ලිමේන්තුවෙහි පැවතිණි.
- එතෙක් පැවති උපදේශන කාරක සභා අත්හිටුවමින් 2015 දෙසැම්බර් මස 19 දින යෝජනා දෙකක් පාර්ලිමේන්තුවේ සම්මතකොට රජයේ මුදල් පිළිබඳ කාරක සභාව සහ ආංශික අධීක්ෂණ කාරක සභා 16ක් ස්ථාපිත කෙරුණි. අටවැනි පාර්ලිමේන්තුව අවුරුදු 4 මාස 6 දින 1 ක ධූර කාලයක් ඇවෑමෙන් 2020 මාර්තු මස 02 වැනි දින විසුරුවා හරින ලදී.

# පාර්ලිමේන්තු ස්ථාවර නියෝග සරලව

## මහා මැතිවරණයකට පසු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ පළමුවැනි රැස්වීමේ කාර්ය පටිපාටිය (ස්ථාවර නියෝග 1 සහ 2)

මහ මැතිවරණයකට පසු පාර්ලිමේන්තුව කැඳවන පළමුවැනි දිනයේදී රැස්වීම කැඳවූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයාගේ ප්‍රකාශනය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් කියවනු ලබයි. එම දිනයෙහි ඊට අනතුරුව සිදුවන කාර්යයන් පහත පරිදි වේ.

(අ) කථානායකවරයකු ඡන්දයෙන් තෝරා පත්කර ගැනීම;

(ආ) මහ ලේකම්වරයා විසින් ගනු ලබන පරිදි කථානායකවරයා විසින් පාර්ලිමේන්තුව ඉදිරියේ දී සිය නිල ප්‍රතිඥාව හෝ දිවුරුම දීම;

(ඇ) කථානායකවරයා ඉදිරියේ අන් සියලුම මන්ත්‍රීවරයන් නිල ප්‍රතිඥාව හෝ දිවුරුම් දීම;

(ඈ) නියෝජ්‍ය කථානායකවරයා සහ කාරක සභා සභාපතිවරයා ඡන්දයෙන් තෝරා පත්කර ගැනීම;

(ඉ) නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා ඡන්දයෙන් තෝරා පත්කර ගැනීම;

ඉහත කාර්යය අවසානයේ දී පාර්ලිමේන්තුව විසින් නියම කරන ලද දිනය සහ වේලාව වන තෙක් පාර්ලිමේන්තුව කල් තබනු ලබයි.

කථානායක ධුරයෙහි පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක දී, එම පුරප්පාඩුව ඇති වීමෙන් අනතුරුව පාර්ලිමේන්තුව විසින් එහි පළමුවැනි රැස්වීමේ දී කථානායකවරයා ඡන්දයෙන් තෝරා පත්කර ගනී.

## මන්ත්‍රීවරයන්ට ආසන පැනවීම (ස්ථාවර නියෝග 3)

මහා මැතිවරණයකට පසු පාර්ලිමේන්තුව රැස්වන ප්‍රථම දිනයේ සහ ඉන්පසුව එක් එක් මන්ත්‍රීවරයාට ආසනයක් බැගින් වෙන්කර දෙනු ලබන තෙක්, මන්ත්‍රීවරයන් විසින් සභා සීමාව ඇතුළත තිබෙන කවර හෝ ආසනයක අසුන් ගනු ලැබිය හැකි ය. කථානායකවරයාගේ අභිමතය පරිදි, කලින් කලට, මන්ත්‍රීවරයන් සඳහා ආසන වෙන් කරයි.

## කථානායකවරයකු ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලැබීම (ස්ථාවර නියෝග 4)

කථානායකවරයා වශයෙන් තෝරා පත්කර ගනු ලැබීමට මන්ත්‍රීවරයකුගේ නම යෝජනා කිරීමට කැමති යම් මන්ත්‍රීවරයකු, අදාළ මන්ත්‍රීවරයා කථානායකවරයා ලෙස සේවය කිරීමට කැමතිද යන්න එකී මන්ත්‍රීවරයාගෙන් කලින් විමසිය යුතුය. යම් මන්ත්‍රීවරයකු විසින්, මහ ලේකම්වරයා අමතමින්, එම අවස්ථාවේ දී පාර්ලිමේන්තුවේ සිටින වෙනත් යම් මන්ත්‍රීවරයකු පාර්ලිමේන්තුවේ කථානායක ධුරයට යෝජනා කරමින් එම මන්ත්‍රීවරයා කථානායකවරයා වශයෙන් මෙම පාර්ලිමේන්තුවේ මූලාසනාරූඪ විය යුතු බවට යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම යෝජනාව ස්ථිර කරනු ලැබිය යුතුය. එහෙත් ඒ පිළිබඳව විවාදයකට ඉඩ දෙනු නොලැබේ.

කථානායකවරයා වශයෙන් එසේ යෝජනා කරනු ලැබ ස්ථිර කරනු ලබනුයේ එක් මන්ත්‍රීවරයකු පමණක් නම්, එම මන්ත්‍රීවරයා කථානායකවරයා වශයෙන් තෝරා පත්කර ගනු ලැබූ බව මහ ලේකම්වරයා විසින් ප්‍රකාශ කරනු ලබයි. එක් මන්ත්‍රීවරයකුට වැඩි ගණනකගේ නම් කථානායක ධූරය සඳහා යෝජනා වී ඇත්නම්, පාර්ලිමේන්තුව විසින් බෙදුම් සීනු මිනිත්තු පහක් නාද කිරීමෙන් අනතුරුව රහස් ඡන්දයෙන් කථානායකවරයකු තෝරා පත්කර ගැනීමට කටයුතු කරයි.

## නිල ප්‍රතිඥාව හෝ දිවුරුම (ස්ථාවර නියෝග 5)

කථානායකවරයා විසින් නිල ප්‍රතිඥාව හෝ දිවුරුම ලබා දීමෙන් අනතුරුව පැමිණ සිටින මන්ත්‍රීවරයන් සියල්ලම ලවා ප්‍රතිඥා දීම හෝ දිවුරුම් දීම සහ අත්සන් තැබීම කරවීමට සලස්වනු ලැබිය යුතු ය. ප්‍රතිඥා දීම හෝ දිවුරුම් දීම මහ ලේකම්වරයා විසින් කරවනු ලැබිය යුතුය. කථානායකවරයා විසින් ආරම්භ කරනු ලබමින් සෑම මන්ත්‍රීවරයකු විසින් ම ප්‍රතිඥාව දීම හෝ දිවුරුම දීම සිදු කරනු ලැබූ වහාම මහ ලේකම්වරයා විසින් තත් කාර්යය සඳහා තබා ඇති මන්ත්‍රී නාමලේඛනයේ අත්සන් කරනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුව රැස්වන කවර හෝ දිනයක ඊට පෙර නිල ප්‍රතිඥාව හෝ දිවුරුම දීම සිදුකරනු නොලැබූ මන්ත්‍රීවරයකුට 22 වැනි ස්ථාවර නියෝගය යටතේ නියම කරනු ලබන වේලාවට පාර්ලිමේන්තු සභා මේසය වෙත පැමිණ ඒ සම්බන්ධයෙන් මහ ලේකම්වරයාට දැනුම් දෙනු ලැබිය හැකි අතර, එවිට, මහ ලේකම්වරයා විසින්, එම මන්ත්‍රීවරයා ලවා නිල ප්‍රතිඥාව හෝ දිවුරුම දීම කරවනු ලැබිය යුතු ය. ඉන් පසු එම මන්ත්‍රීවරයා විසින් මන්ත්‍රී නාමලේඛනයේ අත්සන් කරනු ලැබිය යුතු ය.

## නියෝජ්‍ය කථානායකවරයා සහ නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලැබීම (ස්ථාවර නියෝග 6)

අභිනවයෙන් තේරී පත්වූ පාර්ලිමේන්තුවක පළමුවැනි රැස්වීමේ දී හෝ ඉහත ධුරයන්හි පුරප්පාඩුවක් ඇතිවීමෙන් පසුව පැවැත්වෙන පළමුවැනි රැස්වීමේ දී එහි ප්‍රධාන කටයුතු ආරම්භයේ දීම, අවස්ථාවෝචිත පරිදි, නියෝජ්‍ය කථානායකවරයකු හෝ නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයකු ඡන්දයෙන් තෝරා පත්කර ගනියි.

නියෝජ්‍ය කථානායකවරයකු සහ නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයකු තෝරා පත්කර ගනු ලැබීමේ කාර්ය පටිපාටිය කථානායකවරයකු ඡන්දයෙන් තෝරා පත්කර ගැනීමේ දී අනුගමනය කරන කාර්ය පටිපාටියට හැකි තරම් සමාන විය යුතුය.

## ජනාධිපතිවරයකු තෝරා පත්කර ගනු ලැබීම (ස්ථාවර නියෝග 7)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 (1) (ආ) ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයකු තෝරා පත්කර ගනු ලැබීමේ අවස්ථාවක දී, ඡන්ද පත්‍රිකා භාවිතයෙන් රහස් ඡන්දයක් පැවැත්වීමට 1981 අංක 2 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ ක්‍රියා පටිපාටිය අනුගමනය කරයි.

## පාර්ලිමේන්තුවේ රැස්වීම් (ස්ථාවර නියෝග 8 සහ 9)

එක් එක් මාසයේ පළමුවැනි සහ තුන්වැනි සති දෙකේ දී පාර්ලිමේන්තුව රැස්වෙයි. එනම් යම් මාසයක පළමු ඉරිදාට පසුව එළඹෙන සතියේ අඟහරුවාදා, බදාදා, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා යන දින පළමු සතියේ රැස්වීම් පැවැත්වෙන දින වෙයි. පාර්ලිමේන්තුවේ රැස්වීම අඟහරුවාදා හා බදාදා දිනවල දී පස්වරු 1.00 ට ද, බ්‍රහස්පතින්දා හා සිකුරාදා දිනවල දී පෙරවරු 10.30 ට ද ආරම්භ කරයි.

## මහ ලේකම්වරයාගේ රාජකාරි (ස්ථාවර නියෝග 10)

පාර්ලිමේන්තුවේ සහ පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවල වැඩකටයුතු පිළිබඳ කාර්ය සටහන් මහ ලේකම්වරයා විසින් සකස් කරනු ලබයි. රැස්වීමට සහභාගි වන මන්ත්‍රීවරයන්ගේ නම් සහ පාර්ලිමේන්තුව විසින් ගන්නා ලද තීරණ සියල්ලම එම කාර්ය සටහන්වල සඳහන් කරයි.

පාර්ලිමේන්තුවේ දී හෝ පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක දී හෝ ඡන්දය ප්‍රකාශ කිරීමට බෙදීමේදී, ප්‍රශ්නයට පක්ෂව ඡන්දය දෙන මන්ත්‍රීවරයන්ගේ ත්, විරුද්ධව ඡන්දය දෙන මන්ත්‍රීවරයන්ගේත් සංඛ්‍යාවන් ද, බෙදීම සිදුවන්නේ 47(2)(ආ) සහ (ඇ) ස්ථාවර නියෝග යටතේ නම්, ඒ අනුව ඡන්දය දෙන මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාව සහ නම් ද, ඡන්දය දීමෙන් වැළකී සිටින මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාව සහ නම් ද, පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්වල අඩංගු කරනු ලැබිය යුත්තේ ය. මෙම කාර්ය සටහන් ස්ථිර කිරීම අවශ්‍ය නොවේ. එහෙත් එහි වැරදි තිබේ නම්, පාර්ලිමේන්තුවේ අවසරය මත ඒ සඳහා ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් මාර්ගයෙන් ඒවා නිදොස් කරනු ලැබිය හැකිය.

එමෙන්ම මතු කවර දිනකට හෝ නියම කරන ලද සියලු කටයුතු සහ නම් කරන ලද හෝ නම් නොකරන ලද, මතු දිනකට තබන ලද ප්‍රශ්න හෝ යෝජනා පිළිබඳ දැනුම්දීම් සඳහන් කරනු ලබන න්‍යාය පුස්තකයක් මහ ලේකම්වරයා විසින් එදිනෙදා සකස් කරනු ලැබ පාර්ලිමේන්තුවේ සභාමේසය මත හා පුස්තකාලයෙහි තබයි. කවර හෝ විශේෂ දිනක කටයුතු නියම කර තබනු ලැබිය හැකි අතර, එසේ කරනු ලැබූ බවට න්‍යාය පුස්තකයෙහි සටහනක් තැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්, වාර්තා සහ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන පනත් කෙටුම්පත් සහ අනෙකුත් ලේඛනවල සුරක්ෂිත භාරකාරත්වය සම්බන්ධයෙන් මහ ලේකම්වරයා වග කියයි. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන්ට සහ කථානායකවරයා අනුමත කරන ලද විධිවිධාන යටතේ වෙනත් තැනැත්තන්ට ද ඒවා පරීක්ෂා කිරීමට අවකාශ තිබේ. මහ ලේකම්වරයා කාරක සභාවලට පරිපාලනමය හා සම්පත් සහාය ලබා දීම සඳහා ද වගබලා ගනී.

## ගණපූරණය (ස්ථාවර නියෝග 11 සහ 12)

පාර්ලිමේන්තුවේ ගණපූරණය මූලාසනාරූඪ මන්ත්‍රීවරයා ද ඇතුළුව මන්ත්‍රීවරයන් 20 දෙනෙකුගෙන් සමන්විත ය. ඕනෑම අවස්ථාවක දී, සභාවේ ගණපූරණයක් නොපවතින බවට කථානායකවරයාගේ හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයාගේ අවධානය යොමු කරනු ලැබුවහොත් බෙදුම් සීනු නාද කිරීමට කථානායකවරයා හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් අණ කරනු ලබයි. බෙදුම් සීනු නාද කිරීම ආරම්භ කරනු ලැබ මිනිත්තු පහක් ගත වීමෙන් අනතුරුව ගණපූරණයක් නොමැති නම්, කථානායකවරයා හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් පාර්ලිමේන්තුව කල් තබනු ලැබිය යුතු ය.

## පාර්ලිමේන්තුවේ වැඩකටයුතු (ස්ථාවර නියෝග 13)

පාර්ලිමේන්තුවේ වැඩකටයුතු සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පවත්වාගෙන යාම අනිවාර්ය වේ. පාර්ලිමේන්තුවේ දී කරනු ලබන සෑම කථාවක් ම එය පවත්වනු ලබන භාෂාවෙන් හැන්සාඩ් වාර්තාවේ පළ කළ යුතුය. කථාව පවත්වනු ලබන භාෂාව තේරුම් ගත නොහැකි මන්ත්‍රීවරයන් සඳහා සුදුසු විධිවිධාන සැලසීම කථානායකවරයාගේ කාර්යයකි. එලෙස සැලසිය හැකි විධිවිධාන පහත පරිදි වේ.

- පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පළ කරනු ලැබීම;
- කථා සහ අනෙකුත් වැඩකටයුතු සමගාමීව අනෙකුත් භාෂා දෙකට පරිවර්තනය කරනු ලැබීම;
- හැන්සාඩ් වාර්තාවේ ඉදිරිපස කවරය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් මුද්‍රණය කරනු ලැබීම;
- කථිකයාගේ නම සිංහලෙන්, දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් සඳහන් කරනු ලැබිය යුතු අතර, පවත්වනු ලබන කථා ඒවා පවත්වන ලද භාෂාවෙන් ම හැන්සාඩ් වාර්තාවේ පළ කරනු ලැබීම.

## පාර්ලිමේන්තු විකාශය (ස්ථාවර නියෝග 14)

සභාවේ වැඩකටයුතු, පාර්ලිමේන්තුව විසින්, කලින් කලට, තීරණය කරන රීති හා කොන්දේසිවලට යටත්ව ගුවන් විදුලිය, රූපවාහිනිය හෝ වෙනත් යම් විද්‍යුත් මාර්ග භාවිතයෙන් විකාශය කිරීම සඳහා ඉඩ සලසා දී තිබේ. සභාවේ වැඩකටයුතු විකාශය කිරීමේ දී, පාර්ලිමේන්තුව විසින් යොදා ගනු ලබන සාධාරණත්වය පිළිබඳ ප්‍රමිති පවත්වා ගෙන යයි.

කාරක සභාවල වැඩකටයුතු ද, පාර්ලිමේන්තුව සහ අදාළ කාරක සභා විසින් කලින් කලට තීරණය කළ හැකි රීති හා කොන්දේසිවලට යටත්ව විකාශය සඳහා ද ඉඩ සලසයි.

පාර්ලිමේන්තුවේ හෝ කාරක සභාවල කටයුතු සජීවී ලෙස විකාශය කිරීම සඳහා ඉඩ සැලසීම, ඒ සඳහා සීමා පනවනු ලැබීම හෝ පාලනය කරනු ලැබීම හෝ පිළිබඳව තීරණය කිරීමේ අභිමතානුසාරී බලය අවස්ථාවෝචිත පරිදි කථානායකවරයාට හෝ කාරක සභාවක සභාපතිවරයාට හිමි වේ.

## කල් තැබීම (ස්ථාවර නියෝග 15 සහ 16)

පාර්ලිමේන්තුව කල් තැබීමක් යනුවෙන් අදහස් කරන්නේ, දැනුම් දීමකින් පසුව ඉදිරිපත් කරන ලද යෝජනාවක් අනුව පාර්ලිමේන්තුව රැස්වන ඊළඟ දිනය තෙක් කල් තැබීමකි. දින නියමයක් නොමැති කල් තැබීමේ යෝජනාවක් පිළිගනු නොලැබේ.

පැය හතළිස් අටකට වැඩි කාලයක් පවතින කල් තැබීමක් තුළ දී පාර්ලිමේන්තුව නැවත රැස්වීමට නියම කරන ලද දිනට කලින් දිනයක දී පාර්ලිමේන්තුව කැඳවන ලෙස කථානායකවරයාගෙන් ඉල්ලා සිටීමට  අග්‍රාමාත්‍යවරයාට හැකි ය. එම ඉල්ලීමේ දක්වා ඇති පරිදි පාර්ලිමේන්තුව කැඳවමින් කථානායකවරයා විසින් දැනුම් දීමක් කරනු ලැබිය යුතු ය. එවිට කථානායකවරයාගේ දැනුම් දීමෙහි නියම කරන ලද දින නියමිත වේලාවට පාර්ලිමේන්තුව රැස්වී එම දින සහ වේලාව වන තෙක් යථා පරිදි කල් තබන ලද්දක් මෙන් පාර්ලිමේන්තුව ස්වකීය වැඩකටයුතුවල යෙදිය යුතු ය. මෙවැනි දැනුම් දීමක් නිකුත් කිරීමේ දී පාර්ලිමේන්තුව කැඳවනු ලබන දිනය සහ වේලාව මන්ත්‍රීවරයන්ට දැන්වීමට ගත හැකි සෑම පියවරක් ම කථානායකවරයා විසින් ලැබිය යුතු ය.

## කල් තබන අවස්ථාවේ යෝජනා හෝ ප්‍රශ්න (ස්ථාවර නියෝග 20)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් සභාව කල් තබන අවස්ථාවේ දී යෝජනාවක් හෝ ප්‍රශ්න සලකා බැලීමට තීරණය කරනු ලැබ ඇති දිනයක දී, සභාවේ ප්‍රධාන කටයුතු සමාප්ත කිරීමෙන් අනතුරුව, පැය එකකට නොවැඩි කාලයක් මේ සඳහා වෙන් කරයි. එහිදී පහත සඳහන් රීතිවලට යටත් විය යුතුය.

- සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් හෝ සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න හදිසි පොදු වැදගත්කමකින් යුතු කාරණාවලට සීමා කිරීම.
- අදාළ යෝජනාව හෝ ප්‍රශ්න මඟින් යම් ස්ථාවර නියෝගයක් උල්ලංඝනය වන බව හෝ එම යෝජනාව හෝ ප්‍රශ්න අසනු ලැබීම අදාළ මන්ත්‍රීවරයාගේ අයිතිවාසිකම අනිසි ලෙස භාවිත කරනු ලැබීමක් බව කථානායකවරයාගේ මතය වන්නේ නම්, එම යෝජනාව හෝ ප්‍රශ්නය සඳහා ඉඩ නොදීමේ බලය කථානායකවරයා සතු වේ.
- විසර්ජන පනත් කෙටුම්පත පිළිබඳ විවාදය අතරතුර සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් හෝ සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න සඳහා වෙන් කරනු ලබන කාලය පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි අඩු කරනු ලැබිය හැකි ය.

- සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් හෝ සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්නවලට අදාළ කාර්ය පටිපාටිය පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් නිශ්චය කරනු ලැබීම.

## පාර්ලිමේන්තුවේ කටයුතු (ස්ථාවර නියෝග 22)

පාර්ලිමේන්තුවේ කටයුතු පහත අනුපිළිවෙළට පැවැත් වේ.

(1) අභිනව මන්ත්‍රීවරයන්ගේ නිල ප්‍රතිඥාව හෝ දිවුරුම

(2) ජනාධිපතිවරයාගෙන් ලැබෙන සංදේශ

(3) කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන

(4) ලිපිලේඛනාදිය පිළිගැන්වීම

(5) කාරක සභා වාර්තා පිළිගැන්වීම

(6) මහජන පෙත්සම් පිළිගැන්වීම

(7) වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

(8) නොපැමිණීමේ අවසරය පිළිබඳ යෝජන

(9) අමාත්‍යාංශ නිවේදන

(10) පෞද්ගලික පැහැදිලි කිරීම්

(11) වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්න

(12) ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී දැනුම්දීමක් අවශ්‍ය නොවන යෝජනා

(13) ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී දැනුම්දීමක් අවශ්‍ය යෝජනා

(14) ශෝක ප්‍රකාශ යෝජනා

(15) ප්‍රධාන වැඩකටයුතු

## ප්‍රධාන වැඩකටයුතු (ස්ථාවර නියෝග 23)

ප්‍රධාන වැඩකටයුතු, දිනට නියමිත කටයුතු හා යෝජනා පිළිබඳ දැනුම්දීම්වලින් සමන්විත වේ. යම් නියමිත දිනයක දී සැලකිල්ලට භාජනය කරන පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලද පනත් කෙටුම්පතක්, නියෝගයක්, යෝජනා සම්මතයක් හෝ වෙනත් යම් කාරණයක් යම් දිනයකට නියමිත වැඩකටයුතු වේ. එසේ නියම කරන ලද දිනය වෙනුවට ඊට කලින් වූ දිනයක් යොදා ගත නොහැකි ය. එක් එක් මාසයේ පළමුවැනි සිකුරාදා රැස්වීම හැර අනෙකුත් සෑම දිනයක ම ආණ්ඩුවේ කටයුතු සඳහා ප්‍රමුඛස්ථානය හිමි වේ.

අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් එක් එක් මාසයේ පළමුවැනි සිකුරාදා රැස්වීමේ ප්‍රධාන කටයුතු ආරම්භයේ දී "ආණ්ඩුවේ කටයුතු අද දින මුඛ්‍යස්ථානය ගත යුතු ය" නැතහොත් "ආණ්ඩුවේ කටයුතුවලින් නිශ්චිතව දක්වා ඇති යම් කටයුත්තක් අද දින මුඛ්‍යස්ථානය ගත යුතු ය" යනුවෙන් සංශෝධනයක් හෝ විවාදයක් නොමැතිව තීරණය කරනු ලැබිය යුතු යෝජනාවක් දැනුම් දීමක් නොමැතිව ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. එවැනි යෝජනාවක් සම්මත වුවහොත්, ආණ්ඩුවේ කටයුතු හෝ නිශ්චිතව දක්වා ඇති කටයුත්ත ඒ අනුව මුඛ්‍යස්ථානය ගනු ලැබිය යුත්තේ ය. ආණ්ඩුව විසින් සුදුසු යැයි සලකනු ලබන අනුපිළිවෙළට ආණ්ඩුවේ කටයුතු වැඩ සටහනට ඇතුළත් කරනු ලැබිය යුතු ය.

## පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ යෝජනා (ස්ථාවර නියෝග 24)

එක් එක් මාසයේ රැස්වීම පැවැත්වෙන පළමුවැනි සිකුරාදා පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ කටයුතු සඳහා මුඛ්‍යස්ථානය හිමි වේ. පාර්ලිමේන්තුව විසින් අන්‍යාකාරයෙන් නියෝග කරන්නේ නම් මිස එම තත්ත්වය වෙනස් නොවේ.

පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ යෝජනා සියල්ලම පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් තීරණය කරන ආකාරයට පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ පළ වන අනුපිළිවෙළට සාකච්ඡාවට ගැනීම සිදු වේ. පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ යෝජනා කාලානුක්‍රමික අනුපිළිවෙළට පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයේ ඇතුළත් කෙරේ. කවර හෝ අවස්ථාවක දී යම් මන්ත්‍රීවරයකු විසින් ඉදිරිපත් කරන ලද එවැනි යෝජනා දහයකට වඩා වැඩි සංඛ්‍යාවක් පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුළත් කරනු නොකළ යුතු ය.

"පෞද්ගලික මන්ත්‍රීවරයා" යන්නට කථානායක, නියෝජ්‍ය කථානායක, නියෝජ්‍ය කාරක සභා සභාපති, අග්‍රාමාත්‍ය, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍ය, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍ය, නියෝජ්‍ය අමාත්‍ය, පාර්ලිමේන්තුවේ සභානායක, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායක, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක සහ විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක යනාදී ධුර දරන මන්ත්‍රීවරයකු ඇතුළත් නොවේ.

## ලිපිලේඛනාදිය (ස්ථාවර නියෝග 26)

කථානායකවරයා, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකු විසින් පමණක් ලිපිලේඛනාදිය පිළිගන්වයි.

ව්‍යවස්ථානුකූල අවශ්‍යතාවයන් මත, රීති, රෙගුලාසි හා ව්‍යවස්ථා යටතේ සාදනු ලබන නියෝග මෙන්ම වාර්ෂික කාර්ය සාධන වාර්තා, ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව වැනි විවිධ අමාත්‍යාංශවල, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශන යනාදිය ද මේ යටතේ පිළිගැන්වෙයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ.(6) ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා සහ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් වැනි ව්‍යවස්ථාපිත ආයතන යටතට ගැනෙන වාර්තා ද පාර්ලිමේන්තුවේ දී පිළිගැන්වීම සිදු වෙයි.

ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන අදාළ ආයතනය මගින් පාර්ලිමේන්තුවේ සභානායක කාර්යාලය වෙත යොමු කරයි. අනතුරුව එම ලේඛන පාර්ලිමේන්තු මහ ලේකම්වරයා වෙත යොමු කෙරේ. පාර්ලිමේන්තුවේ දිනට නියමිත වැඩකටයුතු යටතේ මෙකී ලිපිලේඛන පිළිගැන්වීම සිදුවීම විශේෂත්වයකි. පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්වල ද ඒවා සඳහන් කරයි. යම්කිසි ලේඛනයක් පිළිගැන්වීමේ දී කෙටි හැඳින්වීමක් කළ හැකි නමුත් එසේ පිළිගන්වන අවස්ථාවේ දී ඒ පිළිබඳ විවාදයකට ඉඩ ලබා දෙනු නොලැබෙයි. එසේ පිළිගන්වනු ලබන සියලු ලිපිලේඛන සභා මේසය මත තැබීමෙන් අනතුරුව අදාළ කාරක සභාව වෙත යොමු කිරීම සිදු වෙයි.

## දැනුම්දීම් (ස්ථාවර නියෝග 27 සිට 29)

ප්‍රශ්න හෝ යෝජනා පිළිබඳ දැනුම් දිය යුත්තේ දැනුම් දෙනු ලබන මන්ත්‍රීවරයාගේ අත්සන දරන ලියවිල්ලක් මහ ලේකම්වරයා නමට ලිවීමෙනි. එවැනි දැනුම්දීම් පාර්ලිමේන්තුව රැස් වී සිටින කවර වේලාවක දී හෝ මහ ලේකම්වරයාට භාර දෙනු ලැබිය හැකි ය. එසේ නැතහොත්, කවර වේලාවක දී හෝ මහ ලේකම්වරයාගේ කාර්යාලයට යවනු ලැබිය හැකිය; නැතහොත් බාරදෙනු ලැබිය හැකි ය.

රීති විරෝධී යැයි කථානායකවරයා විසින් තීන්දු කරනු ලබන යම් ප්‍රශ්නයක් හැර මහ ලේකම්වරයාට දැනුම්දීම් ලැබී ඇති සියලු ප්‍රශ්න, දැනුම් දෙන ලද දින සිට සම්පූර්ණ දින හතක් ඉකුත් වීමට පෙර නොයෙදෙන දිනයක දී පිළිතුරු ලැබීම සඳහා පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයට ඇතුළත් කළ යුතුය.

එසේ වුව ද, ප්‍රශ්න අවසානයේ දී පොදු වැදගත්කමකින් යුතු කරුණක් සම්බන්ධයෙන් ප්‍රශ්නයක් අදාළ අමාත්‍යවරයාට විධිමත් ලෙස දැනුම්දීමකින් අනතුරුව පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශවයේ නායකවරයා හෝ පිළිගත් දේශපාලන පක්ෂයක නායකවරයකු විසින් අසනු ලැබිය හැකි ය.

අමාත්‍යාංශ නිවේදනයක් අග්‍රාමාත්‍යවරයා විසින් හෝ අදාළ විෂය පිළිබඳ අමාත්‍යාංශ වගකීම පැවරී ඇති අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් හෝ ඉදිරිපත් කළ යුතු ය. එසේ, නිවේදනයක් ඉදිරිපත් කරනු ලැබීමට අදහස් කරන අමාත්‍යවරයකු අදාළ නිවේදනයේ පිටපතක් කලින් කථානායකවරයා වෙත ලබා දී ඒ සඳහා පළමුව අනුමැතිය ගනු ලැබිය යුතු ය.

යම් මන්ත්‍රීවරයකු සභාවේ නොසිටි අවස්ථාවක සභාවේ වෙනත් මන්ත්‍රීවරයකු විසින් එම මන්ත්‍රීවරයාගේ පෞද්ගලික හැසිරීම සම්බන්ධයෙන් කරන ලද ප්‍රකාශයකට ප්‍රතිචාර වශයෙන් එම මන්ත්‍රීවරයාගේ පෞද්ගලික කල්ක්‍රියාව නිදොස් කර ගැනීමේ කාර්යය සඳහා පෞද්ගලික පැහැදිලි කිරීමක් කළ හැකි ය. එවැනි පැහැදිලි කිරීමක් කිරීමට අදහස් කරනු ලබන යම් මන්ත්‍රීවරයකු විසින්, කථානායකවරයාට එම පෞද්ගලික පැහැදිලි කිරීමේ පිටපතක් කලින් ලබා දී ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් දැනුම්දීමක් කර පළමුව ඒ සඳහා කථානායකවරයාගේ අනුමැතිය ගත යුතුය. එම පෞද්ගලික පැහැදිලි කිරීම එම මන්ත්‍රීවරයාගේ පෞද්ගලික කල්ක්‍රියාව නිදොස් කර ගැනීමේ කාර්යය සඳහා පමණක් සීමා විය යුතු ය.

ස්ථාවර නියෝගවල සඳහන් පරිදි පහත දැක්වෙන යෝජනා සම්බන්ධයෙන් හැර, ඉදිරිපත් කිරීමට අදහස් කරන කවර හෝ යෝජනාවක් සම්බන්ධයෙන් දැනුම්දීමක් කිරීම අනිවාර්ය වේ.

(අ). පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාව තුළදී කරන ලද යෝජනාවක්;
(ආ). පාර්ලිමේන්තුව හෝ කවර වූ හෝ විවාදයක් කල් තැබීම සඳහා කරනු ලබන යෝජනාවක්;
(ඇ). විශේෂ කාරක සභාවක වාර්තාවක් පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට යොමු කරනු ලැබීමට හෝ මුද්‍රණය කිරීමට කරනු ලබන යෝජනාවක්;
(ඈ). පිට අය ඉවත් කිරීමට කරනු ලබන යෝජනාවක්;
(ඉ). මන්ත්‍රීවරයකුගේ පාර්ලිමේන්තු සේවය තාවකාලිකව තහනම් කිරීමට කරනු ලබන යෝජනාවක්;
(ඊ). වරප්‍රසාද පිළිබඳ වූ කාරණයක් සම්බන්ධ යෝජනාවක්;
(උ). එදින පාර්ලිමේන්තුවේ කටයුතු පිළිබඳව ක්‍රියාකර අවසන් වූ වහාම කිසියම් අලුත් කාරණයකට අවතීර්ණ වීමට පෙර අවසන් වූ ඒ කටයුතුවලින් පැන නගින යෝජනාවක්.

එමෙන්ම පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට ඍජුවම සම්බන්ධ හදිසි යෝජනාවක් එදිනට නියමිත සියලු කටයුතු ද අභිබවා ප්‍රමුඛස්ථානය ගත යුතුය. පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට ඍජුවම සම්බන්ධ ප්‍රශ්නයක් පැන නැඟ තිබෙන විට, ඡන්දය ප්‍රකාශ කිරීමට බෙදීමක් පවතින විටක දී හැර වරප්‍රසාද පිළිබඳ වූ කාරණයක් මත වූ යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීමෙන් පාර්ලිමේන්තුවේ කටයුතු කවර හෝ වේලාවක දී තාවකාලිකව නතර කරනු ලැබිය හැකි ය.

එවැනි වරප්‍රසාද පිළිබඳ කාරණයක් ඉදිරිපත් කරනු ලැබීමට අදහස් කරන කිසියම් මන්ත්‍රීවරයකු විසින් පාර්ලිමේන්තුවේ කටයුතු තාවකාලිකව නතර කිරීම සඳහා පළමුව මූලාසනය වෙත දැනුම් දී ඒ සඳහා මූලාසනයේ අවසරය ලබා ගත යුතුය.

## මහජන පෙත්සම් (ස්ථාවර නියෝග 30)

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන සෑම පෙත්සමක් ම කථානායකවරයාගේ නමට ඉදිරිපත් කළ යුතු ය. මහජන පෙත්සම් ඉදිරිපත් කළ යුත්තේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු මාර්ගයෙනි. සෑම පෙත්සමක් ම ගෞරවාන්විත භාෂාවෙන් ඉදිරිපත් කළ යුතු ය. එහි අදාළ නොවන ප්‍රකාශ අන්තර්ගත නොවිය යුතුය.

එමෙන්ම සෑම පෙත්සමක් ම පැහැදිලිව කියවිය හැකි විය යුතු අතර, ඉල්ලා සිටිනු ලබන සහනය ප්‍රකාශ කරන ආයාචනයකින් එය අවසන් විය යුතු ය.

අසනීපයක් හේතුවෙන් නොහැකියාවට පත් වූ අවස්ථාවක හැර සෑම පෙත්සමක් ම පෙත්සම්කරු හෝ පෙත්සම්කරුවන් හෝ විසින් අත්සන් තැබීම අනිවාර්ය වේ. ලිවීමට නොහැකි කෙනෙකු විසින් සාක්ෂිකරුවකු ඉදිරියේ තම ඇඟිලි සලකුණ තැබිය යුතු ය.

පෙත්සමකට අත්සන් තබනු ලබන සෑම තැනැත්තකුගේම සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය එහි සඳහන් ව තිබිය යුතු ය. පෙත්සම්කරුට සිය දුරකථන අංකය ද ඇතුළුව සම්බන්ධ කරගත හැකි වෙනත් කවර හෝ තොරතුරු ද සඳහන් කළ හැකි ය.

එමෙන්ම මහජන පෙත්සමකට කවර හෝ ලිපි, දිවුරුම් ප්‍රකාශ හෝ වෙනත් ලේඛන අමුණා නොතිබිය යුතු ය.

යම් පෙත්සමක, පාර්ලිමේන්තුවේ කිසිම විවාදයක් පිළිබඳ සඳහන් කරනු නොලැබිය යුතු ය. තමාගේම පෙත්සමක් පිළිගැන්වීමේ බලය මන්ත්‍රීවරයකුට නැත. එහෙත් එය වෙනයම් මන්ත්‍රීවරයකු මඟින් පිළිගැන්විය හැකි ය.

සෑම පෙත්සමක් ම එය පිළිගැන්වීමට පෙර මුලින් එය භාර මන්ත්‍රීවරයා විසින් අත්සන් කරනු ලැබ, යටත් පිරිසෙයින් සම්පූර්ණ දින දෙකක්වත් මහ ලේකම්වරයා වෙත තිබෙන සේ එය භාර දෙනු ලැබිය යුත්තේ ය. මහ ලේකම්වරයා විසින් එය කථානායකවරයාගේ අනුමතිය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය. තව ද, කිසිම පෙත්සමක් එසේ අනුමත කරනු ලබන තුරු, පිළිගන්වනු නොලැබිය යුත්තේ ය.

පෙත්සමක් පිළිගන්වනු ලබන මන්ත්‍රීවරයකු විසින් තම ප්‍රකාශය මතු දැක්වෙන ආකෘතියට සීමා කළ යුතු අතර, එම ප්‍රකාශය සම්බන්ධයෙන් කිසිම විවාදයකට අවසර නොලැබේ.

“ගරු කථානායකතුමනි, (.....................................................................................................) / (ලිපිනය))පදිංචි ....................................................................(පෙත්සම්කරුගේ නම) ගෙන් සහ වෙනත් (.) (............. ................................................) / (පෙත්සම්කරුවන්ගේ සංඛ්‍යාව) දෙනෙකුගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.”

පෙත්සමක් පාර්ලිමේන්තුවට පිළිගන්වනු ලැබීමෙන් අනතුරුව එය මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කෙරේ.

## ප්‍රශ්න (ස්ථාවර නියෝග 31 සිට 37)

පොදු කටයුතු පිළිබඳ ප්‍රශ්න අග්‍රාමාත්‍යවරයාගෙන් හෝ ජනාධිපතිවරයා විසින් පවරා දෙන ලද යම් විෂයයන් හා කාර්ය භාරයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශයීය වගකීම ඇති අමාත්‍යවරයාගෙන් අසනු ලැබේ.

වාචික පිළිතුරක් ඉල්ලා ඇති යම් ප්‍රශ්නයක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි පළ වූ අවස්ථාවක, එම ප්‍රශ්නය පළ වී තිබෙන්නේ යම් මන්ත්‍රීවරයකුගේ නමින් ද, කථානායකවරයා විසින් එම මන්ත්‍රීවරයා අමතනු ලැබිය යුතු ය. එසේ අමතනු ලැබූ මන්ත්‍රීවරයා ස්වකීය ස්ථානයෙහි නැගී සිට ප්‍රශ්නයට පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි දී ඇති අංකය සඳහන් කරමින් එය අසනු ලැබිය යුතු ය. එවිට ප්‍රශ්නය යොමු කරනු ලැබූ අග්‍රාමාත්‍යවරයා හෝ අමාත්‍යවරයා විසින් ඊට පිළිතුරු දිය යුතු ය.

ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා නියමිත දින එම ප්‍රශ්නවලට වාචිකව පිළිතුරු සැපයීම සඳහා අදාළ අමාත්‍යවරයා පැමිණ නොසිටියි නම්, එම අමාත්‍යවරයා විසින් බලය පවරන ලද වෙනත් අමාත්‍යවරයෙකු පාර්ලිමේන්තුවට පැමිණ සිටිය යුතු ය.

යම් නිශ්චිත දිනයක දී මන්ත්‍රීවරයෙකු විසින් මතු කරන ලද යම් ප්‍රශ්නයකට වාචික පිළිතුරු සැපයීම සඳහා පාර්ලිමේන්තුවට පැමිණීමට නොහැකිවන අමාත්‍යවරයෙකු ඒ සඳහා කථානායකවරයාගේ පූර්ව අවසරය ගත යුතු ය. එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා එකී අමාත්‍යවරයා විසින් යොදා ඇති වැඩ පිළිවෙළ සම්බන්ධයෙන් කථානායකවරයාට දැනුම් දිය යුතු ය. පිළිතුරු අපේක්ෂාවෙන් ඉදිරිපත් කරන ප්‍රශ්නයක් සඳහා අවම වශයෙන් තුන්වන අවස්ථාවේදීවත් පිළිතුරු සැපයිය යුතු ය.

ප්‍රශ්නයකට ලිඛිත පිළිතුරක් ඉල්ලා ඇති විට, එම ප්‍රශ්නය යොමු කරන ලද අග්‍රාමාත්‍යවරයා හෝ අමාත්‍යවරයා විසින් ඒ සඳහා වන පිළිතුර හැන්සාඩ් වාර්තාවෙහි භාෂාත්‍රයෙන් මුද්‍රණය කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

සපයනු ලබන එවැනි යම් පිළිතුරක් සම්බන්ධයෙන් යම් මන්ත්‍රීවරයකු විසින් අතුරු ප්‍රශ්න දෙකකට වැඩි සංඛ්‍යාවක් නොඇසිය යුතු ය.

එම අතුරු ප්‍රශ්න මගින් මුල් ප්‍රශ්නයෙහි ඇතුළත් නොවන කාරණා මතු නොකළ යුතු ය. ඒවා වාචික පිළිතුරකින් පැන නගින යම් කාරණයක් වඩාත් පැහැදිලි කර ගැනීමේ කාර්යය සඳහා පමණක් විමසනු ලැබිය යුතු ය.

එසේම තවදුරටත්, කවර හෝ අතුරු ප්‍රශ්නයක් මගින් ප්‍රශ්න ඇසීමට ඇති ඉඩකඩ පිළිබඳ රීති උල්ලංඝනය වේ යැයි කථානායකවරයාගේ මතය වන්නේ නම්, එම අතුරු ප්‍රශ්න අසනු ලැබීමට කථානායකවරයා ඉඩ නොදිය යුතු ය. අතුරු ප්‍රශ්න ඇසීමට සහ ඒවාට පිළිතුරු දීම සඳහා ලබා දී ඇති කාලය කථානායකවරයා විසින් සීමා කරනු ලබයි. ප්‍රශ්නයක් විවාදයකට ව්‍යාජ හේතුවක් නොවිය යුතු ය.

යම් දිනයක දී ප්‍රශ්න සඳහා වෙන් කරන උපරිම කාලය  පැයකි. කිසිම මන්ත්‍රීවරයකු එක් දිනක දී වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න දෙකකට වඩා වැඩියෙන් නොඇසිය යුතුය.

එසේ වුව ද, විසර්ජන පනත් කෙටුම්පතේ කාරක සභා අවස්ථාව සඳහා නියම කර ගෙන ඇති දිනයක පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා මිනිත්තු තිහකට නොවැඩි කාලයක් වෙන් කරයි.

පාර්ලිමේන්තු ප්‍රශ්න ඇසීමේ අයිතිවාසිකම පහත දැක්වෙන රීතිවලට යටත් විය යුතුය.

(අ). එක් ප්‍රශ්නයක දී එක් විෂයයක් ගැන පමණක් සඳහන් විය යුතු අතර, ප්‍රශ්නය වචන එකසිය පනහකට සීමා විය යුතු ය.

(ආ). ප්‍රශ්නය පැහැදිලිව තේරුම් ගැනීම සඳහා අත්‍යවශ්‍ය නොවන යම් නමක් හෝ ප්‍රකාශයක් ප්‍රශ්නයක සඳහන් කරනු නොලැබිය යුතු ය.

(ඇ). ප්‍රශ්නයක ප්‍රකාශයක් ඇතුළත් වේ නම්, එම ප්‍රකාශයේ නිරවද්‍යතාව සම්බන්ධයෙන් ප්‍රශ්නය අසනු ලබන මන්ත්‍රීවරයා විසින් එහි වගකීම භාර ගත යුතු ය.

(ඈ). ප්‍රශ්නයක කිසිම තර්කයක්, අනුමාන කළ තීරණයක්, තහවුරු නොවූ චෝදනාවක්, අනවශ්‍ය විස්තර දක්වන පදයක්, හෝ අවඥා සහගත ප්‍රකාශයක් ඇතුළත් නොවිය යුතු ය.

(ඉ). කාරක සභාවක වාර්තාවක් මගින් පාර්ලිමේන්තුවට දැනුම් නොදෙන ලද එම කාරක සභාවේ වැඩකටයුතු පිළිබඳ ප්‍රශ්නයක් නොඇසිය යුතු ය.

(ඊ). අධිකරණයක විනිශ්චයට භාජන වෙමින් පවතින යම් කාරණයක් හෝ අධිකරණ තීරණයක් ලබා දීමට නියමිත යම් කාරණයක් සම්බන්ධයෙන් ප්‍රශ්නයක සඳහන් නොවිය යුතු ය.

(උ). මතයක් ප්‍රකාශ කරනු පිණිස හෝ කල්පිත නීති ප්‍රශ්නයකට (මෙසේ වියහැකි බවට සිතින් මවාගත් ප්‍රශ්නයකට) හෝ මනඃකල්පිත ප්‍රශ්නයකට විසඳුමක් වශයෙන් ප්‍රශ්නයක් නොඇසිය යුතු ය.

(ඌ).යම් තැනැත්තකුගේ නිල තත්ත්වය හෝ පොදු තත්ත්වයට අදාළව හැර එම තැනැත්තාගේ චරිතය හෝ හැසිරීම ගැන සඳහන් වන ප්‍රශ්නයක් නොඇසිය යුතු ය.

(එ). පූර්ණ යෝජනාවකින් පමණක් යම් තැනැත්තකුගේ චරිතය හෝ හැසිරීම අභියෝග කරනු ලැබිය හැකි අවස්ථාවක, එවැනි තැනැත්තකුගේ චරිතය හෝ හැසිරීම පිළිබඳව සඳහන් ප්‍රශ්නයක් නොඇසිය යුතු ය.

(ඒ). පෞද්ගලික ස්වභාවයෙන් චෝදනාවක් කරනු ලබන හෝ අඟවනු ලබන ප්‍රශ්නයක් නොඇසිය යුතු ය.

(ඔ). යම් සභා වාරයකදී සම්පූර්ණයෙන් පිළිතුරු සපයන ලද ප්‍රශ්නයක් නැවත එම සභා වාරය තුළදී ම නොඇසිය යුතු ය.

ස්ථාවර නියෝග යටතේ යම් ප්‍රශ්නයක් ඇසීමට ඉඩ දිය හැකි ද, නොහැකි ද, යන්න කථානායකවරයා විසින් තීරණය කරනු ලබයි. යම් ප්‍රශ්නයක්, ප්‍රශ්න ඇසීමේ අයිතිය අනිසි ලෙස ප්‍රයෝජනයට ගැනීමක් හෝ එය පාර්ලිමේන්තුවේ කාර්ය පටිපාටියට අගතිදායක ලෙස බලපෑමට සිතාමතා අසන බව හෝ එමගින් යම් ස්ථාවර නියෝගයක් උල්ලංඝනය වන බව, කථානායකවරයාගේ මතය වේ නම්, ප්‍රශ්නය ඇසීමට ඉඩ නොදීමේ බලය කථානායකවරයාට තිබේ. කථානායකවරයා විසින් යම් ප්‍රශ්නයක් ඇසීමට ඉඩ නොදීම, ඒ සඳහා හේතු ද සමඟ මහ ලේකම්වරයා විසින් අදාළ මන්ත්‍රීවරයාට ලිඛිතව සන්නිවේදනය කරනු ලබයි.

අනුචිත ප්‍රකාශ අඩංගු, නැතහොත් පාර්ලිමේන්තුවේ කිසියම් ස්ථාවර නියෝගයකට අනනුකූල යම් දැනුම්දීමක් එය පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකයේ පළ කරනු ලැබීමට පෙර ප්‍රශ්නය අසන මන්ත්‍රීවරයාගේ එකඟත්වය ඇතිව සංශෝධනය කිරීමේ බලය කථානායකවරයා සතු ය.

යම් ප්‍රශ්නයක් සඳහා දීර්ඝ පිළිතුරක් අවශ්‍ය බව කථානායකවරයාගේ මතය වේ නම්, කථානායකවරයා විසින් එම ප්‍රශ්නය වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්නයක් ලෙස සලකනු ලැබිය හැකි අතර, එම තීරණය මහ ලේකම්වරයා විසින් අදාළ මන්ත්‍රීවරයාට සන්නිවේදනය කරයි.

## අග්‍රාමාත්‍යවරයාගෙන් අසනු ලබන ප්‍රශ්න (ස්ථාවර නියෝග 38)

සෑම මාසයක ම පළමුවැනි රැස්වීම් සතියේ බදාදා වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා වෙන්කර ඇති කාලය තුළ මිනිත්තු තිහක කාලයක් අග්‍රාමාත්‍යවරයාගෙන් ප්‍රශ්න ඇසීම සඳහා වෙන් කරයි. එතුමාගෙන් ඇසිය හැකි උපරිම ප්‍රශ්න සංඛ්‍යාව 04කි. අග්‍රාමාත්‍යවරයා පළමු බදාදා පැමිණ නොසිටියි නම් පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් එම මාසය තුළ වෙනත් යෝග්‍ය දිනයක් ඒ සඳහා වෙන් කරයි.

අග්‍රාමාත්‍යවරයාගෙන් අසනු ලබන ප්‍රශ්න ජාතික වැදගත්කමකින් යුතු කාරණා ද ඇතුළුව ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට අදාළ කාරණාවලට සීමා විය යුතු ය. විස්තරාත්මක පිළිතුරක් හෝ යම් විෂයයකට සීමා වන පිළිතුරක් අපේක්ෂා කරන යම් ප්‍රශ්නයක් අග්‍රාමාත්‍යවරයාගේ අභිමතය පරිදි පිළිතුරු ලබාදීම සඳහා අදාළ විෂයය භාර අමාත්‍යවරයාට යොමු කළ හැකි ය. වෙන් කරනු ලබන යම් දිනයක දී ආණ්ඩු පාර්ශ්වයට ප්‍රශ්න දෙකක් ද විරුද්ධ පාර්ශ්වයට ප්‍රශ්න දෙකක් ද වශයෙන් ඇසීමට අවස්ථාව හිමිවීම විශේෂත්වයකි. එක් ප්‍රශ්නයක් වචන එකසිය පනහකට නොඅඩු විය යුතු ය. අග්‍රාමාත්‍යවරයාගෙන් අසනු ලබන ප්‍රශ්න, තර්ක සහ මත ප්‍රකාශ කිරීමකින් තොරව අසනු ලැබිය යුතු ය. සෑම ප්‍රශ්නයක්ම එක් පොදු ප්‍රතිපත්තියකට පමණක් සීමා වීම අනිවාර්ය වේ. අග්‍රාමාත්‍යවරයාගෙන් අතුරු ප්‍රශ්න දෙකක් ඇසීමටද මන්ත්‍රීවරයාට අවස්ථාව හිමි වේ. එම අතුරු ප්‍රශ්න ද, මුල් ප්‍රශ්නයට හෝ ඒ සඳහා දෙන ලද පිළිතුරට අදාළ විෂයයට පමණක් සීමා විය යුතු ය.

## විවාදයට භාජනය වන ප්‍රශ්න (ස්ථාවර නියෝග 39 සිට 41)

පොදු වැදගත්කමකින් යුතු යම් කාරණයක් පිළිබඳව ඕනෑම මන්ත්‍රීවරයකුට යෝජනාවක් ඉදිරිපත් කිරීමට අවස්ථාව පවතී. එවැනි යෝජනාවක් ස්ථාවර නියෝග අනුව විවාද කළ යුතු ය. නැතහොත් ඊට අනුකූලව වෙනයම් පිළිවෙළකට ක්‍රියා කර අවසන් කළ යුතු ය.

යම් පෞද්ගලික මන්ත්‍රීවරයකු තම නමින් තිබෙන යෝජනාවක් ඉදිරිපත් කිරීමට කැඳවනු ලබන විට, එම මන්ත්‍රීවරයා විසින් එකී යෝජනාව ඉදිරිපත් කරනු නොලබන්නේ නම්, එකී යෝජනාව ඉදිරිපත් කරනු ලැබීමට එම මන්ත්‍රීවරයා විසින් ලිඛිතව නිසි පරිදි බලය පවරනු ලැබූ යම් මන්ත්‍රීවරයකු විසින් එය ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. නොඑසේනම් එම යෝජනාව අහෝසි විය හැකි ය.

## සංශෝධන (ස්ථාවර නියෝග 43 සිට 45)

(1). මූලාසනයෙන් සභාවට ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්නයක්-

(අ). ඇතැම් වචන වෙනුවට වෙනත් වචන ඇතුළත් කරනු ලැබීම සඳහා එම වචන ඉවත් කරනු ලැබීමෙන්,

(ආ). ඇතැම් වචන ඉවත් කරනු ලැබීමෙන්; හෝ

(ඇ). වෙනත් ඇතැම් වචන ඇතුළත් කරනු ලැබීමෙන් හෝ එකතු කරනු ලැබීමෙන්; හෝ සංශෝධනය කරයි.

(2). එවැනි සෑම සංශෝධනයක්ම ලිඛිතව තිබිය යුතු අතර, යෝජනා කරනු ලබන මන්ත්‍රීවරයා විසින් එය මහ ලේකම්වරයාට බාර දිය යුතු ය.

(3). පනත් කෙටුම්පතකට යෝජනා කරනු ලබන සෑම සංශෝධනයක්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 77 වැනි ව්‍යවස්ථාවට අනුව නීතිපතිවරයා විසින් පරීක්ෂා කරනු ලැබිය යුතු ය.

(4). ප්‍රශ්නයකට ඉදිරිපත් කරනු ලබන සංශෝධනයක්, එම සංශෝධනය යෝජනා කරනු ලබන ප්‍රශ්නයට පමණක් අදාළ විය යුතුය.

(5). පාර්ලිමේන්තුවේ රීති අනුව දැනුම්දීමකින් අනතුරුව ඉදිරිපත් කරනු ලබන පූර්ණ යෝජනාවකින් පමණක් මතු කරනු ලැබිය හැකි යම් ප්‍රශ්නයක් සංශෝධනයකින් මතු කරනු නොලැබිය යුතු ය.

(6). ප්‍රශ්නයක කිසියම් කොටසකට ඉදිරිපත් කරන ලද සංශෝධනයක් සම්බන්ධයෙන් තීරණයක් ගනු ලැබීමෙන් අනතුරුව ඊට පූර්වයෙන් ඇති කොටසක් සංශෝධනය කළ නොහැක.

(7). එමෙන්ම, ප්‍රශ්නයක කිසියම් කොටසකට සංශෝධනයක් මූලාසනයෙන් සභාවට ඉදිරිපත් කර ඇති අවස්ථාවකදී, එසේ කරන ලද සංශෝධනයක් ඉල්ලා අස්කර ගනු ලැබුවහොත් මිස, ඊට පූර්වයෙන් ඇති කොටසක් සංශෝධනය නොකළ යුතු ය.

(8). යම්කිසි ප්‍රශ්නයක් පිළිබඳ වූ සංශෝධනයක් එම ප්‍රශ්නය පිළිබඳව ම කවර හෝ පනත් කෙටුම්පතකට හෝ කාරණයකට එම අවධියේදී ම දෙන ලද පූර්ව තීරණයකට අනුකූල විය යුතු ය.

(9). මූලාසනයෙන් සභාවට ඉදිරිපත් කරන ලද සංශෝධනයකට, සංශෝධනයක් ඉදිරිපත් කළ හැකි ය.

සංශෝධනයකින් අදහස් කරනු ලබන්නේ ඇතැම් වචන ඉවත්කරනු ලැබ ඒ වෙනුවට වෙනත් වචන ඇතුළත් කරනු ලැබීමට නම් කථානායකවරයා හෝ සභාපතිවරයා විසින් සංශෝධනය සඳහන් කරනු ලැබීමෙන් අනතුරුව, "ඉවත් කරනු ලැබීමට යෝජනා කරන ලද වචන ප්‍රශ්නයෙහි හෝ වගන්තියෙහි කොටසක් වශයෙන් තිබිය යුත්තේ ය" යන ප්‍රශ්නය පළමුව සභාවට ඉදිරිපත් කළ යුතුය. එම ප්‍රශ්නය විමසන ලදුව එය නිෂ්ප්‍රභ වෙත් නම්, "සංශෝධනයෙන් යෝජනා කරනු ලබන වචන ඒ වෙනුවට ආදේශ විය යුත්තේ ය" යන ප්‍රශ්නය එතුමා විසින් සභාභිමුඛ කරනු ලැබිය යුතු ය.

## ඡන්දය දීම (ස්ථාවර නියෝග 47 සිට 49)

යම් කාරණයකට අදාළව ඡන්දය විමසීමේදී "පක්ෂයි සහ විරුද්ධයි" යනුවෙන් කටහඬවල් අනුව ඡන්දය ලබාගෙන කථානායකවරයා ප්‍රතිඵලය ප්‍රකාශ කළ යුතු ය.

කථානායකවරයාගේ තීරණය සමග යම් මන්ත්‍රීවරයකු එකඟ නොවන්නේ නම්, කථානායකවරයා විසින් තීරණය කළ හැකි පහත සඳහන් කවර හෝ ක්‍රමයකට ඡන්දයක් සඳහා බෙදීමක් ඉල්ලා සිටිය හැකිය. එවැනි අවස්ථාවක දී, බෙදුම් සීනු මිනිත්තු පහක් නාද කළ යුතු ය. ඉන් අනතුරුව-

(අ). මන්ත්‍රීවරයන් එක් පේළියෙන් පේළිය බැගින් තම ස්ථානවලින් නැඟී සිට සභාව ඉදිරියේ තිබෙන යෝජනාවට පක්ෂව හෝ විරුද්ධව ඡන්දය භාවිතා කිරීම ගණන් කිරීමෙන් කිරීම.

(ආ). විද්‍යුත් ඡන්ද සටහන් කිරීමේ යන්ත්‍රය භාවිතයෙන් ඡන්දය ගණනය කිරීම. මෙහිදී මන්ත්‍රීවරයන් කථානායකවරයා විසින් ඉඩදෙනු ලබන කාල සීමාව ඇතුළත ඔවුන්ගේ තීරණය දැක්වීම සඳහා අදාළ බොත්තම එබීමට කටයුතු කිරීම.

(ඇ). මහ ලේකම්වරයා විසින් එක් එක් මන්ත්‍රීවරයාගෙන් එම මන්ත්‍රීවරයා ඡන්දය දීමට කැමති කවර ආකාරයෙන් ද යන්න විමසා ඒ අනුව ඡන්ද සටහන් කර ගනු ලැබිය යුතුය. මහ ලේකම්වරයා විසින් පළමුව අග්‍රාමාත්‍යවරයාගේ ද, ඉන්පසු අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ගේ, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරයන්ගේ ද, ඉන්පසු අනෙකුත් මන්ත්‍රීවරයන්ගේ ද ඡන්දය ඔවුන්ගේ නම්වල අකාරාදී අනුපිළිවෙළට විමසයි. යම් මන්ත්‍රීවරයකු ඡන්දය භාවිත කිරීමෙන් වැළකී සිටීමට අදහස් කරන්නේ නම්, ඒ බව මහ ලේකම්වරයාට ප්‍රකාශ කළ යුතුය. එවැනි අවස්ථාවක මහ ලේකම්වරයා විසින් එම මන්ත්‍රීවරයාගේ නම වාර්තා කරමින් ඔහු ඡන්දය භාවිත කිරීමෙන් වැළකී සිටි ලෙස සටහන් කරයි.

කථානායකවරයා විසින්, තීරණයට පක්ෂව හා විරුද්ධව ප්‍රකාශ කර ඇති ඡන්ද ගණන නිවේදනය කළ යුතුය. ඡන්ද සංඛ්‍යා සමාන නම්, කථානායකවරයාට තීරක ඡන්දය ලබා දිය හැකි ය. කථානායකවරයා විසින්, ඉන්පසු ඡන්ද විමසීමෙහි ප්‍රතිඵලය ප්‍රකාශ කළ යුතු ය.

ඡන්දය විමසීමක දී සටහන් කළ, සංඛ්‍යා හෝ නම් සම්බන්ධයෙන් නිවැරදි කළ නොහැකි පැටලිලි සහගත තත්ත්වයක් ඇති අවස්ථාවක දී කථානායකවරයා විසින් වහාම තවත් ඡන්ද විමසීමක් වෙත පාර්ලිමේන්තුව යොමු කළ යුතු ය.

යම් මන්ත්‍රීවරයකු විසින් සිය ඡන්දය වැරදි ලෙස භාවිතා කරන ලද බව හෝ යම් ඡන්දයක් වැරදි ලෙස ගණන් ගත් බව හෝ ප්‍රකාශ කරයි නම්, එම වරද නිවැරදි කරන ලෙස එම මන්ත්‍රීවරයා විසින් ඉල්ලා සිටිය හැකි ය.

එසේ වුව ද, කථානායකවරයා විසින් ඡන්දය දීම සඳහා ඉඩ ලබා දෙනු ලැබූ කාලය අවසාන වූ බවට ප්‍රකාශ කරනු ලැබීමට පෙර එම මන්ත්‍රීවරයා විසින් එම ඉල්ලීම යොමු කළ යුතු ය.

## පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීමේ කාර්ය පටිපාටිය (ස්ථාවර නියෝග 50)

අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙකුට ආණ්ඩුවේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කළ හැකිය. මහ ලේකම්වරයා විසින් පනත් කෙටුම්පතේ නාමය කියවනු ලැබිය යුතු අතර, එවිට, පනත් කෙටුම්පත පළමුවැනි වර කියවන ලදැයි සැලකේ. පළමුවර ඉදිරිපත් කරන ලද දිනයේ සිට සතියකින් පසු දෙවැනි වර කියවීම සඳහා දින නියම කළ යුතු ය.

එවැනි සෑම පනත් කෙටුම්පතක්ම පළමුවැනි වර කියවීමෙන් පසු, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කරයි. කාරක සභාව විසින් පනත් කෙටුම්පතට සංශෝධන යෝජනා කරනු ලැබිය හැකිය. කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ආපසු වාර්තා කරන තෙක් හෝ පාර්ලිමේන්තුව විසින් එසේ වාර්තා කිරීමට ලබා දී ඇති කාලය ඉකුත් වන තෙක් පාර්ලිමේන්තුව විසින් ඒ පිළිබඳව කිසිදු පියවරක් ගනු නොලැබේ.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ III වැනි ලැයිස්තුවේ දක්වා ඇති කාරණා සම්බන්ධ පනත් කෙටුම්පත් (ස්ථාවර නියෝග 51)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ III වැනි ලැයිස්තුවේ දක්වා ඇති කාරණයක් සම්බන්ධ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක දී, ඒ සම්බන්ධයෙන් පහත දක්වා ඇති කාර්ය පටිපාටිය අනුගමනය කරනු ලැබිය යුතු ය.

(2) (අ). එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එක් එක් පළාත් සභාවේ අදහස් ලබා ගැනීම සඳහා එම පනත් කෙටුම්පතේ පිටපත් අදාළ පළාත් සභාවට යොමු කළ යුතුය. එදින සිට මාස දෙකක් ඇතුළත දී හෝ පාර්ලිමේන්තුව විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් යම් කාලසීමාවක් තුළ දී සිය අදහස් යොමුකිරීම සඳහා ඒ එක් එක් පළාත් සභාවට යොමු කරන ලෙස කථානායකවරයා විසින් මහ ලේකම්වරයාට නියෝග කෙරේ.

(ආ). (අ) අනුඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාලය ඉකුත් වීම හෝ පළාත් සභාවේ අදහස් ලැබීම යන දෙකෙන් කලින් සිදුවන දෙයට අනතුරුව, පාර්ලිමේන්තුව විසින් එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරයි.

(3) (අ). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ III වැනි ලැයිස්තුවේ නිශ්චිතව දක්වා ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් සාදනු ලබන යම් යෝජිත ප්‍රඥප්තියක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ අදහස් විමසමින්, යම් පළාත් සභාවකින් දැනුම්දීමක් ලැබුණු කවර හෝ අවස්ථාවක දී, කථානායකවරයා විසින් ලැබෙන පළමු අවස්ථාවේ දීම, එවැනි දැනුම්දීමක් ලැබුණු බව පාර්ලිමේන්තුවට නිවේදනය කරයි. ඉන් අනතුරුව එම දැනුම්දීම ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට යොමු කෙරේ.

(ආ). ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ වාර්තාව සලකා බැලීමෙන් අනතුරුව, පාර්ලිමේන්තුව විසින් පළාත් සභාවෙන් එම දැනුම්දීම ලැබී මාස දෙකක් ඇතුළත, යෝජිත ප්‍රඥප්තිය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ අදහස් අදාළ පළාත් සභාවට ඉදිරිපත් කරන ලෙස මහ ලේකම්වරයාට නියෝග කරනු ලැබිය යුතු ය.

## පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පත් (ස්ථාවර නියෝග 52 සහ 53)

පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට අදහස් කරනු ලබන යම් පෞද්ගලික මන්ත්‍රීවරයකු විසින් එම පනත් කෙටුම්පතේ අරමුණ සහ එහි මුඛ්‍යාංගයන් සඳහන් කරමින් එය ඉදිරිපත් කිරීමට පාර්ලිමේන්තුවේ අවසරය ඉල්ලා සිටිය යුතු ය.

එවැනි සෑම ඉල්ලීමක් ම යෝජනාවක් ආකාරයෙන් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ. එම ඉල්ලීම කරනු ලබන මන්ත්‍රීවරයා විසින්, යෝජිත පනත් කෙටුම්පතේ සිංහල හා දෙමළ භාෂා පිටපත් ඉංග්‍රීසි අනුවාදයක් ද සිය යෝජනාවේ පිටපතක් ද සමඟ මහ ලේකම්වරයාට භාර දිය යුතු ය.

පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල ද යන්නත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වැනි සංශෝධනයට අදාළව යම් බාධාවක් තිබේ ද යන්නත්, පිළිබඳව නීතිපතිවරයාගේ මතය විමසා පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් එම පනත් කෙටුම්පත නීතිපතිවරයා වෙත යොමු කරයි. නීතිපතිවරයා විසින් සිය නිරීක්ෂණ සති හයක කාලසීමාවක් ඇතුළත දී පාර්ලිමේන්තුවට දැනුම් දිය යුතු ය.

නීතිපතිවරයාගේ මතය ලැබීමෙන් අනතුරුව මහ ලේකම්වරයා විසින් එම පනත් කෙටුම්පත එහි ඉංග්‍රීසි අනුවාදය ද සමඟ සිංහල සහ දෙමළ භාෂාවලින් ගැසට් පත්‍රයේ පළ කරයි.

පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින දහහතරක කාලයක් ඉකුත් වීමෙන් අනතුරුව කවර හෝ වේලාවක ඉහත දක්වා ඇති යෝජනාව පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි ඇතුළත් කෙරේ.

පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර, සභාව විසින් සම්මත කරනු ලැබීමෙන් පසු පනත් කෙටුම්පත පළමුවැනි වර කියවන ලදැයි සලකා, එය අදාළ වන විෂයය හා කාර්යය භාර අමාත්‍යවරයාට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයාට හෝ එවැනි අමාත්‍යවරයකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙකු හෝ නොමැති නම් කථානායකවරයා විසින් නම් කරනු ලබන අමාත්‍යවරයකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකු හෝ වෙත යොමු කළ යුතු ය. පනත් කෙටුම්පත යොමු කරනු ලැබූ අමාත්‍යවරයා හෝ නියෝජ්‍ය අමාත්‍යවරයා හෝ ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලබන තෙක් පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කිසිදු ඉදිරි පියවරක් ගනු නොලැබේ.

ඉහත වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව හෝ පනත් කෙටුම්පත අමාත්‍යවරයාට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයාට හෝ යොමු කරන ලද දින සිට එම අමාත්‍යවරයා හෝ නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් වාර්තාවක් ඉදිරිපත් නොකර මාස හයක් ඉකුත් වීමෙන් අනතුරුව එම පනත් කෙටුම්පත භාර මන්ත්‍රීවරයා කැමති දිනයක එය දෙවැනි වර කියවීම සඳහා පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි ඇතුළත් කරයි.

යම් විශේෂ පුද්ගලයකුට, සමිතියකට හෝ සංස්ථාගත මණ්ඩලයකට බලපෑමක් ඇති කිරීම සඳහා හෝ යහපතක් සැලසීම සඳහා අදහස් කරනු ලබන යම් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන අවස්ථාවකදී, එම පනත් කෙටුම්පතේ සාමාන්‍ය ස්වභාවය සහ අරමුණු පිළිබඳ දැන්වීමක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් ගැසට් පත්‍රයේ සහ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි ප්‍රවෘත්තිවල පත්‍රයක (එක් භාෂාවකින් එක් පුවත්පතක) පළ කරයි.

එම පනත් කෙටුම්පත ඉදිරිපත් කරනු ලැබීම සඳහා පාර්ලිමේන්තුවේ අවසරය ඉල්ලා සිටිනු ලැබීමට යටත් පිරිසෙයින් එක් මාසයකට පෙර එම දැන්වීම් පළ කිරීම අනිවාර්ය වේ.

එවැනි සෑම පනත් කෙටුම්පතක් ම දෙවැනි වර කියවීමෙන් අනතුරුව කථානායකවරයා විසින් ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට යොමු කරයි.

ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව විසින්, එම පනත් කෙටුම්පත සම්මත කිරීම සුදුසු යැයි පෙන්වීමට පනත් කෙටුම්පතේ ඉදිරිපත් කරනු ලබන සාධක සහ අනෙකුත් කරුණු සත්‍ය බව ඔප්පු කළ යුතු යැයි එවැනි පනත් කෙටුම්පතක් තමන් වෙත පවරනු ලබන කාරක සභාව විසින් ඉල්ලා සිටිනු ලැබිය යුතුය. තමන් අවශ්‍ය යැයි කල්පනා කරන වාචික හෝ වෙනයම් සාක්ෂි එම කාරක සභාව විසින් කරයි. ඊටපසු එම සාධක හා අනෙකුත් කරුණු ඔප්පු වී නොමැති යැයි එම ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව විසින් තීරණය කරනු ලබන්නේ නම් ඒ අනුව කාරක සභාව විසින් වාර්තා කල යුතු ය. එම සාධක හා අනෙකුත් කරුණු ඔප්පු වී ඇති බවට කාරක සභාව තීන්දු කරන්නේ නම් ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව විසින් පනත් කෙටුම්පතේ වගන්ති වෙන් වෙන් වශයෙන් සලකා බලනු ලබයි. වගන්ති ඉවත් කිරීමටත්, අලුත් වගන්ති එකතු කිරීමටත් අවශ්‍ය යැයි හැඟෙන කවර හෝ සංශෝධනයක් කිරීමටත් කාරක සභාවට හැකි ය. එවැනි අලුත් වගන්ති සහ අනිකුත් සංශෝධන සියල්ලක්ම පාර්ලිමේන්තුවට වාර්තාවකින් දැනුම් දිය යුතු ය.

එසේ වුව ද, ස්ථාවර නියෝග වලට අනුව අවශ්‍ය දැනුම්දීමෙහි අදහසට අනුකූල නොවන යම් වගන්තියක් එවැනි පනත් කෙටුම්පතකට ඇතුළත් කිරීමට ඉඩ දෙනු නොදිය යුතු ය. යම්කිසි පෞද්ගලික අයිතිවාසිකමක් හෝ බැඳියාවක් කෙරෙහි බලපාන වගන්තියක් එවැනි පනත් කෙටුම්පතකට ඇතුළත් කරනු ලැබීම යුක්ති සහගත සහ සුදුසු බවට කරුණු එම පනත් කෙටුම්පතින් දක්වා ඇත්නම් මිස, එවැනි වගන්තියක් පනත් කෙටුම්පතෙහි ඇතුළත් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

## දෙවැනි වර කියවීම (ස්ථාවර නියෝග 55)

පනත් කෙටුම්පතක්, එය ඉදිරිපත් කරන ලද දිනයේ සිට සතියක කාලය ගෙවීමෙන් පසු යම් දිනයක දෙවැනි වර කියවීම සඳහා නියම කළ හැකිය. (මෙය ආණ්ඩුවේ පනත් කෙටුම්පත් සඳහා අදාළ වේ)

යම් පනත් කෙටුම්පතක් හෝ එහි යම් විධිවිධානයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල ද යන්න නිශ්චය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 වැනි ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කර අධිකරණ බලය ක්‍රියාත්මක කර, එහි පිටපතක් කථානායකවරයාට භාර දී ඇති අවස්ථාවක දී-

(අ). එම යොමු කරනු ලැබීම හෝ පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබීම එසේ යොමු කරනු ලැබීම හෝ පෙත්සම ඉදිරිපත් කරනු ලැබීමෙන් අනතුරුව පැවැත්වෙන ප්‍රථම පාර්ලිමේන්තු රැස්වීම් දිනයේ දී කථානායකවරයා විසින් ඒ සම්බන්ධව පාර්ලිමේන්තුවට දැන්වීමක් කරයි.

(ආ). එම පනත් කෙටුම්පත පිළිබඳ තීරණය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කථානායකවරයාට දන්වනු ලබන තෙක් හෝ එම යොමු කරනු ලැබීම හෝ පෙත්සම ඉදිරිපත් කරනු ලැබීම කළ දිනයේ සිට සති තුනක කාලයක් ඉකුත් වන තෙක් හෝ යන මේ දෙකෙන් පළමුව එළඹෙන අවස්ථාව තෙක් එවැනි පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් කිසිදු පියවරක් නොගත යුතු ය.

(ඇ). ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය ලැබීමෙන් අනතුරුව, කථානායකවරයා එකී තීරණය පාර්ලිමේන්තුවට නිවේදනය කළ යුතු අතර, එම නිවේදනය සම්බන්ධයෙන් කිසිදු විවාදයකට අවසර දෙනු නොලැබේ.

## දෙවැනි වර කියවීම පිළිබඳ විවාදය (ස්ථාවර නියෝග 56)

පනත් කෙටුම්පතක් දෙවැනි වර කියවීමේ දී එම පනත් කෙටුම්පතේ සාමාන්‍ය යෝග්‍යතාව හා ප්‍රතිපත්ති ආවරණය කරමින් විවාදයක් පවත්වනු ලැබිය හැකි ය.

## පනත් කෙටුම්පත් පිළිබඳ කාරක සභා අවස්ථාව (ස්ථාවර නියෝග 57 සහ 58 )

පනත් කෙටුම්පතක් දෙවැනි වර කියවා ඇති අවස්ථාවක දී, එම පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට යොමු කරයි.

එසේ වුව ද, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකු විසින් යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීමේ දී පාර්ලිමේන්තුව විසින් එසේ තීරණය කරනු ලැබුවහොත් වාර්ෂික හෝ පරිපූරක විසර්ජන පනත් කෙටුම්පතක් හැර, වෙනත් යම් පනත් කෙටුම්පතක් කථානායකවරයා විසින් නම් කරනු ලබන විශේෂ කාරක සභාවකට හෝ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට හෝ යෝග්‍ය ආංශික අධීක්ෂණ කාරක සභාවකට හෝ යොමු කරයි.

පනත් කෙටුම්පතක් විශේෂ කාරක සභාවකට හෝ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට හෝ යෝග්‍ය ආංශික අධීක්ෂණ කාරක සභාවකට හෝ යොමු කරනු ලැබූ අවස්ථාවක දී, එම කාරක සභාව විසින් ඒ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වාර්තා කරන තෙක් ඒ පිළිබඳව කිසිම ඉදිරි පියවරක් නොගත යුතුය.

## පනත් කෙටුම්පත් පිළිබඳ කාරක සභා කාර්ය පටිපාටිය (ස්ථාවර නියෝග 59 සිට 66)

57) වැනි ස්ථාවර නියෝගය යටතේ යම් පනත් කෙටුම්පතක් කාරක සභාවකට යොමු කරන ලද අවස්ථාවක දී, එම කාරක සභාව විසින්, එහි නොයෙකුත් විධිවිධාන සහ යෝජිත සංශෝධන සාකච්ඡා කරයි. එහි රැස්වීම කල් තැබිය හැකි ය; නැතහොත් එය පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක් නම්, අවශ්‍යතාව අනුව විටින් විට, එහි ප්‍රගතිය වාර්තා කරයි.

කාරක සභාවේ සභාපතිවරයා හෝ මහ ලේකම්වරයා හෝ පනත් කෙටුම්පතේ එක් එක් වගන්තියේ අංකය අනුපිළිවෙළින් කියවයි.

වගන්තියකට හෝ වගන්තිවලට කරනු ලබන යම් සංශෝධනයක්, එම සංශෝධනය, පනත් කෙටුම්පතේ විෂයය කාරණයට අදාළ වන්නේ නම් සහ වෙනත් අයුරකින් ස්ථාවර නියෝග සමඟ අනුකූල වේ නම් යම් විධිවිධාන ඉවත් කරනු ලැබීම, ආදේශ කරනු ලැබීම, ඇතුළත් කරනු ලැබීම හෝ එකතු කරනු ලැබීම මගින් වගන්තියකට හෝ වගන්තිවලට යම් සංශෝධනයක් කළ හැකි ය.

කාරක සභාවක දී, පනත් කෙටුම්පතක මූලධර්ම සාකච්ඡා කරනු නොලැබේ, එහි විස්තර පමණක් සාකච්ඡා කරයි.

පනත් කෙටුම්පතේ පූර්වයෙන් වූ යම් කොටසක් පිළිබඳව ගන්නා ලද යම් තීරණයකට අනනුකූල සංශෝධනයක් යෝජනා කළ නොහැකි ය.

පනත් කෙටුම්පතක් කාරක සභාවක දී සලකා බලා අවසන් වීමෙන් අනතුරුව, පනත් කෙටුම්පත කාරක සභාවේ ම තිබිය දී යම් මන්ත්‍රීවරයකු විසින් සභාපතිවරයාගේ අවසරය ඇතිව, සම්මත වූ වගන්තියකට සංශෝධනයක් ඉදිරිපත් කළ හැකි ය.

පනත් කෙටුම්පතේ පවතින වගන්ති සලකා බලන තෙක් සහ අලුත් වගන්ති ඉදිරිපත් කිරීමට පෙර යම් කිසි වගන්තියක් සලකා බැලීම කල් තැබිය හැකි ය.

එමෙන්ම පනත් කෙටුම්පතේ උපලේඛන සලකා බැලීමට පෙර අලුත් වගන්ති ඉදිරිපත් කළ හැකි ය. ඒවා පළමුවැනි වර කියවන ලද සේ සලකනු ලබයි. ඉන් අනතුරුව, "වගන්තිය දෙවැනි වර කියවනු ලැබිය යුත්තේ ය" සහ "වගන්තිය (හෝ වගන්ති සංශෝධිත ආකාරයෙන්) පනත් කෙටුම්පතට එකතු කරනු ලැබිය යුත්තේ ය" යන ප්‍රශ්නවලට එළඹේ.

පනත් කෙටුම්පතේ උපලේඛන පිළිබඳ ව කටයුතු කර අවසන් වීමෙන් අනතුරුව අලුත් උපලේඛන ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. අලුත් වගන්ති සම්බන්ධයෙන් අනුගමනය කරන ලද පිළිවෙළ ම එම අලුත් උපලේඛන සම්බන්ධයෙන් ද අනුගමනය කරයි.

සෑම වගන්තියක් සහ උපලේඛනයක් ද, යෝජිත අලුත් වගන්තියක් හෝ උපලේඛනයක් ද සම්බන්ධයෙන් කටයුතු කර අවසන් වූ අවස්ථාවක දී, පූර්විකාවක් තිබේ නම් එය සලකා බලා, "මෙය පනත් කෙටුම්පතේ පූර්විකාව විය යුත්තේ ය" යන ප්‍රශ්නය විමසනු ලබයි.

පනත් කෙටුම්පතේ නාමයට යම් සංශෝධනයක් අවශ්‍ය වේ නම්, එය, ස්ථාවර නියෝගවල දක්වා ඇති වැඩකටයුතු අවසානයේ දී කරනු ලබයි.

## පනත් කෙටුම්පත් පිළිබඳ කාරක සභාවල වාර්තා (ස්ථාවර නියෝග 67 සිට 70)

පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක් විසින් පනත් කෙටුම්පතක් සලකා බැලීම අවසන් කරනු ලැබූ අවස්ථාවක දී, සභාපතිවරයා විසින් සංශෝධන සහිතව හෝ රහිතව පනත් කෙටුම්පත සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වාර්තා කරයි.

පනත් කෙටුම්පතක් යොමු කරනු ලැබ ඇති ආංශික අධීක්ෂණ කාරක සභාව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව හෝ විශේෂ කාරක සභාව හෝ විසින් සිය නිර්දේශ සඳහන් වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර, එම වාර්තාවේ පිටපතක් සෑම මන්ත්‍රීවරයකුටම බෙදා දෙනු ලබයි.

පනත් කෙටුම්පතක් පිළිබඳ විශේෂ කාරක සභාවක වාර්තාව සභාපතිවරයා විසින් පිළිගන්වනු ලබයි. එය සභා මේසය මත තැබිය යුතු යැයි නියෝග කරනු ලැබිය හැකි ය. නැතහොත් පාර්ලිමේන්තුව විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් ආකාරයකට ඒ සම්බන්ධයෙන් කටයුතු කළ හැකි ය. එමෙන්ම යම් මන්ත්‍රීවරයකු විසින් කරන ලද යෝජනාවක් අනුව පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට යොමු කරයි. නැතහොත් විශේෂ කාරක සභාවේ වාර්තාව සලකා බැලීම පනත් කෙටුම්පත භාර මන්ත්‍රීවරයා විසින් යෝජනා කරනු ලබන දිනයකට කල් දැමිය හැකි ය.

පනත් කෙටුම්පතක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවක හෝ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ හෝ වාර්තාව සභාපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබයි. පනත් කෙටුම්පත භාර මන්ත්‍රීවරයා

නියම කරනු ලබන දිනයක දී එය සලකා බැලීම සඳහා කටයුතු කරයි. ආංශික අධීක්ෂණ කාරක සභාවක, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ හෝ විශේෂ කාරක සභාවක හෝ වාර්තාව සලකා බැලීමෙන් අනතුරුව පාර්ලිමේන්තුව විසින් සලකා බැලිය යුත්තේ කාරක සභාව විසින් කරන ලද සංශෝධන ඇතොත් ඒ පමණ ය. එහෙත් එම සංශෝධන තවදුරටත් සංශෝධනය කරනු ලැබිය හැකි ය. එම වාර්තාව සලකා බලනු ලැබීමෙන් අනතුරුව පාර්ලිමේන්තුව විසින් පිළිගන්නා ලද කාරක සභා සංශෝධනවලට අදාළ වන්නා වූ සංශෝධන හැර කිසිම අලුත් සංශෝධනයක් පාර්ලිමේන්තුව මඟින් කරනු නොලැබේ. එහෙත් එම කාරක සභාවේ කරන ලද සංශෝධන සම්බන්ධයෙන් පනත් කෙටුම්පත නැවතත් එම කාරක සභාවටම යොමු කරයි.

## තුන්වැනි වර කියවීම (ස්ථාවර නියෝග 71 සිට 73)

පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ පූර්ණ කාරක සභා අවස්ථාව පසු කිරීමෙන් හෝ විශේෂ කාරක සභාවක් විසින්, සංශෝධන රහිතව පාර්ලිමේන්තුවට වාර්තා කිරීමෙන් අනතුරුව කරනු ලබන යෝජනාවක් මත වහාම තුන්වැනි වර කියවා එය සම්මත කරයි. කෙසේ වෙතත් පාර්ලිමේන්තුව විසින් එසේ විධාන කරනු ලබන්නේ නම් තුන්වැනි වර කියවීම කල් දැමිය හැකි ය.

පනත් කෙටුම්පතක් සංශෝධන රහිතව ආංශික අධීක්ෂණ කාරක සභාවක් හෝ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව හෝ විසින් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබ ඇති විට, එය සලකා බැලීමට නියම කරන ලද දිනයේ දී වහාම තුන්වැනි වර කියවා සම්මත කරනු ලැබිය හැකි ය. නැතහොත් පාර්ලිමේන්තුව විසින් එසේ විධාන කරන්නේ නම්, තුන්වැනි වර කියවීම කල් දමනු ලැබිය හැකි ය.

පනත් කෙටුම්පත ආංශික අධීක්ෂණ කාරක සභාවක් හෝ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව හෝ විශේෂ කාරක සභාවක් හෝ විසින් සංශෝධනය කර තිබේ නම්, කාරක සභාව මඟින් කරන ලද සංශෝධන පාර්ලිමේන්තුව විසින් සලකා බැලීම අවසාන කළ වහාම පනත් කෙටුම්පත තුන්වැනි වර කියවා සම්මත කරයි. පාර්ලිමේන්තුව විසින් එසේ විධාන කරනු ලබන්නේ නම්, තුන්වැනි වර කියවීම කල් දැමිය හැකි ය.

පනත් කෙටුම්පතක් තුන්වැනි වර කියවීමේ දී, දැනුම් දීමෙන් අනතුරුව යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීමෙන් අනතුරුව, වචනවලට හෝ කෙටුම්පත් කිරීමේ අවශ්‍යතාවලට පමණක් සීමා වූ සංශෝධන කරයි. පනත් කෙටුම්පතෙහි කථානායකතුමාගේ සහතිකය සටහන් කිරීමට පෙර ඕනෑම අවස්ථාවකදී පනත් කෙටුම්පතේ කිසියම් ව්‍යාකරණ දෝෂයක් හෝ මුද්‍රණ දෝෂයක් හෝ නිවැරදි කිරීමට කථානායකතුමාට බලය තිබේ.

## කථානායකවරයාගේ සහතිකය (ස්ථාවර නියෝග 74)

පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීමෙන් අනතුරුව, හැකිතාක් ඉක්මනින් කථානායකවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වැනි ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි සිංහල හා දෙමළ භාෂාවන්ගෙන් පනත් කෙටුම්පතේ සහතිකය සටහන් කරයි.

## විසර්ජන පනත් කෙටුම්පත සඳහා වෙන්කරන ලද දිනයන් (ස්ථාවර නියෝග 75)

දෙසැම්බර් මස 31 වැනි දිනට පෙර  දින විසිහයකට නොවැඩි දින ගණනක් විසර්ජන පනත් කෙටුම්පත සලකා බැලීම සඳහා වෙන් කරයි.

එසේ වුව ද, ඉහත කී දින විසිහය ගණනය කිරීමේ දී යම් පරිපූරක විසර්ජන පනත් කෙටුම්පතක් සලකා බැලීම සඳහා යොදා ගනු ලබන දින ගණන ඊට ඇතුළත් නොකරයි.

සිකුරාදා හැර අනෙක් දිනයක රැස්වීම් වේලාවන් පෙ. ව. 9.30 සිට ප. ව. 12.30 දක්වා ද, ප. ව 1.00 සිට ප. ව. 6.30 දක්වා ද, වේ. සිකුරාදා රැස්වීම් වේලාව පෙ. ව. 9.30 සිට ප. ව. 12.30 දක්වා ද, ප. ව 1.30 සිට ප. ව 6.30 දක්වා ද වේ.

## විනය රීති පිළිබඳ වගකීම (ස්ථාවර නියෝග 76)

විනය රීති පිළිපැදීම පිළිබඳ වගකීම පිළිවෙළින් පාර්ලිමේන්තුව තුළ දී නම් කථානායකවරයා විසින් ද, යම් කාරක සභාවක් තුළ දී නම් එහි සභාපතිවරයා විසින් ද දරනු ලබයි. රීති ප්‍රශ්නයක් පිළිබඳව කථානායකවරයා හෝ කාරක සභා සභාපතිවරයා හෝ විසින් දෙනු ලබන තීරණයකට විරුද්ධව අභියාචනයකට අවස්ථාව නැත.

විවාදයක් පවතින අතරතුර කථානායකවරයා හෝ සභාපතිවරයා හෝ යමක් පවසන කවර හෝ අවස්ථාවක දී, කථා කරමින් සිටින හෝ කථා කිරීමට අවස්ථාව ලබා දී ඇති හෝ යම් මන්ත්‍රීවරයකු විසින් අසුන් ගනු ලැබිය යුතු ය. කථානායකවරයා හෝ සභාපතිවරයා හෝ විසින් පවසන දෙය යම් බාධාවක් නොමැතිව ඇසෙන සේ පාර්ලිමේන්තුව හෝ කාරක සභාව නිශ්ශබ්ද විය යුතු ය.

රීති ප්‍රශ්නයක් නඟා ඇති අවස්ථාවක දී, එම ප්‍රශ්නය නගන මන්ත්‍රීවරයා විසින් සිය අසුනේ නැවත අසුන් ගනු ලැබිය යුතු ය. කථානායකවරයා හෝ සභාපතිවරයා හෝ ප්‍රශ්නය විසඳනු ලබන තෙක්, කථානායකවරයාගේ හෝ සභාපතිවරයාගේ හෝ අවසරය ඇතිව මිස වෙනත් යම් මන්ත්‍රීවරයකු නැඟී නොසිටිය යුතු ය. ප්‍රශ්නය නගන ලද වේලාවේ පාර්ලිමේන්තුව අමතමින් සිටි මන්ත්‍රීවරයාට මූලාසනයේ තීරණයට අනුකූලතාව දක්වමින්, ස්වකීය කථාව නැවතත් කරගෙන යාමට හිමිකම ඇත.

## පාර්ලිමේන්තුව තුළ විනය (ස්ථාවර නියෝග 77 සිට 83)

යම් මන්ත්‍රීවරයකු මූලාසනයේ අධිකාරිය නොතැකීම හෝ නිරන්තරයෙන් ම හිතාමතා ම හෝ අන්‍යාකාරයෙන් පාර්ලිමේන්තුවේ වැඩකටයුතුවලට බාධා කිරීම මගින් පාර්ලිමේන්තුවේ රීති අනිසි ලෙස භාවිත කිරීමේ වරද කරනු ලැබූ විගසම කථානායකවරයා විසින්, එම මන්ත්‍රීවරයා නම් කරනු ලැබූ කවර හෝ අවස්ථාවක දී " එම මන්ත්‍රීවරයාගේ පාර්ලිමේන්තු සේවය අත්හිටවනු ලැබිය යුත්තේ ය" යනුවෙන් කරන ලද යෝජනාවක් මත (කිසිම සංශෝධනයකට කල් තැබීමකට හෝ විවාදයකට ඉඩ ලබානොදී) කථානායකවරයා විසින් ප්‍රශ්නය වහාම විමසනු ලැබිය යුත්තේ ය.

එවැනි යම් යෝජනාවක් සම්මත වී මෙම ස්ථාවර නියෝගය යටතේ යම් මන්ත්‍රීවරයකුගේ පාර්ලිමේන්තු සේවය අත්හිටවනු ලැබ ඇත්නම්, එසේ එම මන්ත්‍රීවරයාගේ සේවය අත්හිටවීම පළමු අවස්ථාවේ දී සති දෙකකට ද, එම සභා වාරයේ ම දෙවැනි අවස්ථාවේ දී සති තුනකට ද, එම සභා වාරයේ ම තෙවැනි හෝ ඊට පසුව එළඹෙන කවර හෝ අවස්ථාවක දී සති හතරකට ද වශයෙන් විය යුතු ය.

එසේ වුව ද, පාර්ලිමේන්තු සේවය අත්හිටවනු ලැබ ඇත්තේ කවර මන්ත්‍රීවරයකුගේ ද, එම මන්ත්‍රීවරයාට එම අත්හිටවනු ලැබීම බලපැවැත්වෙන කාලසීමාව තුළ දී විසර්ජන පනත් කෙටුම්පතේ අවසන් ඡන්ද විමසීමේ දී පමණක් ඡන්දය භාවිත කරනු ලැබීමට කථානායකවරයා අවසර ලබා දෙයි.

සෙංකෝලය පාර්ලිමේන්තුවේ සභාගර්භය ඇතුළත තබා ඇති අවස්ථාවක දී, එය ස්පර්ශ කිරීම හෝ එසවීම හෝ මගින් බරපතළ විනය විරෝධී ක්‍රියාවක් සිදු කරනු ලබන යම් මන්ත්‍රීවරයකු විසින් එම වරද සිදු කරනු ලබනුයේ පළමුවරට යන කාරණය නොසලකා එම මන්ත්‍රීවරයාගේ පාර්ලිමේන්තු සේවය සති හතරකට අත්හිටුවයි.

එමෙන්ම පැමිණ සිටින මන්ත්‍රීවරයන් කිහිපදෙනෙකු එක්ව මූලාසනයේ අධිකාරිය නොතකා ඇත්නම් මිස, එකම අවස්ථාවේ දී එක් මන්ත්‍රීවරයකුට වඩා වැඩිදෙනෙකු නම් කිරීම කරනු නොලැබිය යුතු ය.

මෙම ස්ථාවර නියෝගය යටතේ පාර්ලිමේන්තු සේවය අත්හිටවනු ලැබ ඇති යම් මන්ත්‍රීවරයකු හෝ එක්ව ක්‍රියා කළ මන්ත්‍රීවරයන් හෝ එසේ සේවය අත්හිටවනු ලැබ ඇති කාල සීමාව තුළ පාර්ලිමේන්තු පරිශ්‍රයෙන් ඉවත් වීම සඳහා කථානායකවරයා විසින් කරනු ලබන විධානය පිළිපැදීම ප්‍රතික්ෂේප කරනු ලබයි නම්, කථානායකවරයා විසින් සිය විධානය බලාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීමට නියෝග කරනු ලබයි.

ඉහත පරිදි වරදක් පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක් තුළ දී කරනු ලැබුවහොත්, සභාපතිවරයා විසින් කාරක සභාවේ වැඩකටයුතු වහාම අත්හිටවනු ලැබ සිද්ධියට අදාළ කරුණු පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුතු ය. ඉන් අනතුරුව ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් මත, එම වරද පාර්ලිමේන්තුව තුළ දී කරන ලද්දක් මෙන් සලකා, සංශෝධනයක්, කල් තැබීමක් හෝ විවාදයක් නොමැතිව කථානායකවරයා විසින් ප්‍රශ්නය විමසනු ලබයි.

විවාදයක දී, තමා විසින් ම කරන ලද හෝ වෙනත් මන්ත්‍රීවරයන් විසින් හෝ කරන ලද තර්ක නිරන්තරයෙන් අදාළ නොවන හෝ වෙහෙසකර ලෙස නැවත නැවතත් ප්‍රකාශ කිරීමෙහි යෙදෙන මන්ත්‍රීවරයකුගේ හැසිරීම කෙරෙහි පාර්ලිමේන්තුවේ සැලකිල්ල යොමු කරවා, එම මන්ත්‍රීවරයාගේ කථාව අඛණ්ඩව කරගෙන යෑම නවත්වන ලෙස සහ සජීවී විකාශය නවත්වන ලෙස නියෝග කිරීමේ බලය කථානායකවරයාට සතු ය.

බරපතළ ලෙස විනය විරෝධීව හැසිරෙන මන්ත්‍රීවරයකුට එදින රැස්වීමේ ඉතිරි කොටස අවසන් වන තෙක් පාර්ලිමේන්තුවෙන් වහාම ඉවත් වන ලෙස කථානායකවරයා විසින් නියෝග කළ යුතු අතර, සිය නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට නියම කරයි. වේත්‍රධාරීවරයා විසින් එම නියෝගය ක්‍රියාවේ යෙදවීම සඳහා කටයුතු කළ යුතු ය.

යම් මන්ත්‍රීවරයෙකු පාර්ලිමේන්තු භූමි භාගයෙන් වහාම ඉවත් කර ඇති විටකදී, එසේ අත්හිටවන ලද කාල සීමාව තුළ, කාරක සභාවලට සහභාගී වීමට ද එම මන්ත්‍රීවරයාට තහනම්ය.

පාර්ලිමේන්තුව තුළ පැන නඟින බරපතළ විනය විරෝධී තත්ත්වයක දී කථානායකවරයා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන්නේ නම්, ප්‍රශ්නය නොවිමසා සභාව කල් තබනු ලැබීමට හෝ කථානායකවරයා විසින් නිශ්චය කරනු ලබන කාල සීමාවකට රැස්වීම අත්හිටවනු ලැබීමට එතුමාට බලය තිබේ.

විවාදයක දී නොසැබි වූ නොනිසි වචන පාවිච්චි කර, එවැනි අනුචිත වචන පාවිච්චි කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව සෑහීමකට පත් වන ලෙස තම කනගාටුව ප්‍රකාශ කර නොමැති යම් මන්ත්‍රීවරයකු හෝ ස්ථාවර නියෝගවල නිශ්චිතව දක්වා නොමැති යම් රීතියක් කඩ කරන ලද යම් මන්ත්‍රීවරයකුට එරෙහිව පාර්ලිමේන්තුව විසින් සුදුසු යැයි සලකනු ලබන කවර හෝ ආකාරයකින් කටයුතු කරනු ලැබිය හැකි ය.

යම් මන්ත්‍රීවරයකු විසින් දිගින් දිගටම අයෝග්‍ය ලෙස හැසිරෙන බව හෝ ස්ථාවර නියෝග උල්ලංඝනය කරමින් කටයුතු කරනු ලබන බව කථානායකවරයාගේ මතය වන්නේ නම්, පාර්ලිමේන්තුවේ කටයුතු පිළිබඳ සජීවී විකාශය වහාම අත්හිටවනු ලබන ලෙස නියෝග කිරීමට කථානායකවරයාට බලය තිබේ.

අනුචිත හෝ නුසුදුසු වචන විවාදයකදී භාවිත කර ඇති විටක දී, එම වචන හෝ ප්‍රකාශ හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙස හා එම වචන ප්‍රකාශ නොකරන ලද සේ සලකනු ලැබිය යුතු බවට නියෝග කිරීමට කථානායකවරයාට සිය අභිමතානුසාරී බලය ඇත.

එමෙන්ම ජනාධිපතිවරයාගේ හෝ වැඩබලන ජනාධිපතිවරයාගේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ, විනිශ්චයකාරවරයන්ගේ හෝ යුක්තිය පසිඳලීමෙහි නියුක්ත අන් තැනැත්තන්ගේ පෞද්ගලික පැවැත්ම පූර්ණ යෝජනාවකින් හැර මතු කරනු නොලැබිය යුතු ය. යම් වැඩකටයුතුවල දී, අමාත්‍යවරයකු වෙත යොමු කරනු ලබන ප්‍රශ්නයක් හෝ වෙනත් යම් විෂයයක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් මත සිදු කරනු ලබන විවාදයක දී එවැනි යම් තැනැත්තකුගේ පැවැත්ම සම්බන්ධයෙන් සඳහන් කිරීම රීත්‍යානුකූල නොවේ.

(ස්ථාවර නියෝගවල සඳහන් පරිදි "විනිශ්චයකාරවරයා" යනුවෙන් ජනාධිපතිවරයා විසින් ස්වකීය අත්සන යටතේ වූ අධිකාර පත්‍රයක් මගින් පත් කරනු ලබන අග්‍රවිනිශ්චයකාරවරයා ද අභියාචනාධිකරණයේ සභාපතිවරයා ද ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ වෙනත් සෑම විනිශ්චයකාරවරයෙකු ද අදහස් කෙරේ).

## පූර්ණ යෝජනාවක් මත ඇතැම් තැනැත්තන් ඉවත් කරනු ලැබීම (ස්ථාවර නියෝග 84 සහ 85)

වෙනත් යම් නීතියක පටහැණිව කුමක් සඳහන්ව තිබුණ ද, විෂම පැවැත්ම හෝ අබලතාව යන හේතු මත අග්‍රවිනිශ්චයකාරවරයා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකු, අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකු එම ධුරයෙන් ඉවත් කරනු ලැබීම සඳහා ජනාධිපතිවරයා අමතා යෝජනා සම්මතයක් ඉදිරිපත් කිරීම සඳහා දැනුම් දීමක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (107) වැනි ව්‍යවස්ථාවට අනුව, කථානායකවරයාට භාර දී ඇති අවස්ථාවක දී, කථානායකවරයා විසින් එම යෝජනා සම්මතය පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනු ලැබිය යුතු ය.

අනතුරුව කථානායකවරයා විසින් අග්‍රාමාත්‍යවරයා සහ පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයාගෙන් විමසා, එම යෝජනා සම්මතයේ දක්වා ඇති විනිශ්චයකාරවරයාගේ විෂම පැවැත්ම හෝ අබලතාව සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා විශ්‍රාම ලත් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් තිදෙනෙකුගෙන් සමන්විත විමර්ශන මණ්ඩලයක් පත් කළ යුතු ය.

කථානායකවරයා විසින්, එම විමර්ශන මණ්ඩලයේ එක් සාමාජිකයකු එහි සභාපතිවරයා වශයෙන් පත් කරනු ලබයි.

එසේ පත් කරන ලද විමර්ශන මණ්ඩලය විසින් මාස දෙකක කාල සීමාවක් ඇතුළත දී, විමර්ශනය අවසන් කළ යුතු ය. ඒ සඳහා අදාළ කාර්ය පටිපාටිය නීති ප්‍රතිපාදනවල සඳහන් වේ. කෙසේ වුවද, කථානායකවරයා විසින් විමර්ශන මණ්ඩලයේ ඉල්ලීම මත, එම කාල සීමාව, එක වරකට මාසයක් නොඉක්මවන්නා වූ වැඩිදුර කාල සීමාවකට දීර්ඝ කරනු ලැබිය හැකි ය.

විමර්ශනයේ වැඩකටයුතු අවසන් කරනු ලැබීමෙන් අනතුරුව, එසේ පත් කරන ලද විමර්ශන මණ්ඩලය විසින්, එකී මණ්ඩලය ඉදිරියේ සටහන් කර ගන්නා ලද සාක්ෂි සම්බන්ධ කාර්යසටහන් ද සමඟ එහි තීරණය කථානායකවරයාට වාර්තා කළ යුතු ය. එම විමර්ශන මණ්ඩලය විසින්, අදාළ චෝදනා ලත් විනිශ්චයකාරවරයා විෂම පැවැත්මට හෝ අබලතාවට වරදකරු බව තීරණය කරනු ලැබ තිබේ නම් පමණක් කථානායකවරයා විසින් විමර්ශන මණ්ඩලය විසින් වාර්තා කරන ලද කරුණු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අදාළ විනිශ්චයකාරවරයා වරදකරු නොවන බව විමර්ශන මණ්ඩලය විසින් සොයා ගනු ලැබ ඇත්නම්, කථානායකවරයා විසින් ඒ බව පාර්ලිමේන්තුවට දැනුම් දිය යුතු ය. එම යෝජනා සම්මතය සම්බන්ධ සියලු වැඩකටයුතු අවසන් කරනු ලැබිය යුතු ය.

විමර්ශන මණ්ඩලය විසින් අදාළ විනිශ්චයකාරවරයාට එරෙහිව ඇති විෂම පැවැත්මට හෝ අබලතාවට වරදකරු බවට තීරණය කර තිබේ නම්, කථානායකවරයා විසින් එය පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබයි. එම යෝජනාව පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරයන්ගේ බහුතරයකින් සම්මත වුවහොත්, කථානායකවරයා විසින්, එසේ ඔප්පු කරන ලද විෂම පැවැත්ම හෝ අබලතාව මත අදාළ විනිශ්චයකාරවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබීම සඳහා එය ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලබයි.

එමෙන්ම පාර්ලිමේන්තුව වාරාවසාන කිරීම හෝ විසුරුවා හැරීම නොසලකා විමර්ශන මණ්ඩලය විසින් සිය වැඩකටයුතු අඛණ්ඩව පවත්වාගෙන යනු ලබයි.

(අ). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 වැනි ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා; හෝ

(ආ). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ඉ ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා; හෝ

(ඇ). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (153) වැනි ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන විගණකාධිපතිවරයා; හෝ

(ඈ). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (156) වැනි ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්),

එම ධුරයෙන් ඉවත් කිරීම සඳහා ජනාධිපතිවරයා අමතා ඉදිරිපත් කරනු ලබන යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ ඇතුළත් කර ඇති අවස්ථාවක දී, ස්ථාවර නියෝග යටතේ පත් කරනු ලබන විශේෂ කාරක සභාව පත් කරන දිනයේ සිට එක් මාසයක කාල සීමාවක් ඉකුත් වන තෙක් එම යෝජනා සම්මතය, පිළිබඳ කටයුතු සිදු කරනු නොලැබේ.

මෙවැනි අවස්ථාවක දී, එම යෝජනා සම්මතයේ දක්වා තිබෙන කාරණා සම්බන්ධයෙන් විමර්ශනය කර පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබීම සඳහා කථානායකවරයා විසින් සාමාජිකයන් හත්දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත විශේෂ කාරක සභාවක් පත් කරනු ලබයි.

එලෙස පත්කරන විශේෂ කාරක සභාවක් විසින්, ධුරයෙන් ඉවත් කිරීම සඳහා සිය විමර්ශනයට විෂයය වී ඇති තැනැත්තා වෙත එම යෝජනා සම්මතයේ දක්වා ඇති කාරණාවල පිටපතක් එම තැනැත්තාට යැවිය යුතු අතර, විශේෂ කාරක සභාව විසින් නිශ්චිතව දක්වනු ලබන යම් කාල සීමාවක් ඇතුළත දී, සිය විත්තිවාචකය සම්බන්ධ ලිඛිත ප්‍රකාශයක් කිරීමට එම තැනැත්තාට නියම කරනු ලබයි.

විශේෂ කාරක සභාවේ විමර්ශනයට භාජනය වී ඇති විෂම පැවැත්ම හෝ අබලතාව පිළිබඳ චෝදනා ලබා ඇති තැනැත්තාට එරෙහිව කර ඇති චෝදනා සාවද්‍ය බව ඔප්පු කිරීම සඳහා විශේෂ කාරක සභාව ඉදිරියේ පෙනී සිටීමට ද පෞද්ගලිකව හෝ නීතිඥයකු මඟින් කරුණු කියා සිටීමට ද වාචික හෝ ලේඛනගත සාක්ෂි ගෙන හැර දැක්වීමට ද ඔහුට අයිතිවාසිකමක් තිබේ.

විශේෂ කාරක සභාවට යම් තැනැත්තකු කැඳවීම සඳහා සහ ලියකියවිලි සහ වාර්තා ගෙන්වා ගැනීමට බලය තිබිය යුතු අතර, එහි ගණපූරණය සාමාජික සංඛ්‍යාවෙන් අඩකට නොඅඩු ගණනකින් සකස් විය යුතු ය.

විශේෂ කාරක සභාව විසින් කරනු ලබන විමර්ශනය අවසානයේ දී, කාරක සභාව විසින්, එය ඉදිරියේ ගන්නා ලද සාක්ෂිවල සටහන් ද සමඟ එහි තීරණය පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුය. පාර්ලිමේන්තුවේ අවධානයට යොමු කිරීම සුදුසු යැයි කාරක සභාවට හැඟෙන කවර හෝ යම් කාරණා සම්බන්ධ විශේෂ වාර්තාවක් සැකසිය යුතුය.

ජනාධිපතිවරයා අමතා ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් සඳහා වූ යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබ ඇති අවස්ථාවක දී, කථානායකවරයා විසින් පාර්ලිමේන්තුව වෙනුවෙන් එම ඇමතීම ජනාධිපතිවරයාට ඉදිරිපත් කරයි.

## විවාද රීති ( ස්ථාවර නියෝග 86 සිට 90 )

කිසිම මන්ත්‍රීවරයකු විසින් සිය කථාවේ වරදවා තේරුම් ගෙන තිබෙන යම් වැදගත් කොටසක්, එම කොටසට වෙනත් අලුත් කාරණා ඇතුළත් නොකර එම කොටස පහදා දීමේ කාර්යය පිණිස; හෝ රීති ප්‍රශ්නයක් මත; හෝ විනා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති කිසිම කාරණයක් සම්බන්ධයෙන් එක් වරකට වඩා කථා කරනු නොලැබිය යුතු ය.

යම් යෝජනාවක් හෝ සංශෝධනයක් ඉදිරිපත් කරනු ලබන මන්ත්‍රීවරයකුට එය සනාථ කරමින් කථා කළ හැකිය.

එසේ වුව ද, එම යෝජනාව හෝ සංශෝධනය නිසි ලෙස ස්ථිර කරනු ලබන තෙක් ඒ පිළිබඳ වැඩිදුර විවාදයකට ඉඩ නැත. ඒ සම්බන්ධයෙන් කිසිම ප්‍රශ්නයක් පාර්ලිමේන්තුවෙන් විමසිය නොහැක.

කවර හෝ මන්ත්‍රීවරයකුට ස්වකීය ආසනයෙන් නැඟී සිට මූලාසනයට හිස නැමීමෙන් විවාදයේ යම් පසු අවස්ථාවක දී තමාට කථා කිරීමට ඇති අයිතිවාසිකමට හානියක් නොමැතිව, යෝජනාවක් හෝ සංශෝධනයක් ස්ථිර කළ හැකි ය.

යම් කාරණයක් සම්බන්ධයෙන්, "පක්ෂයි" සහ "විරුද්ධයි" යනුවෙන් හඬ නැගීමෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට අවස්ථාව හිමිවේ.

විවාද කළ යුතු ප්‍රශ්නයක් සභාවට ඉදිරිපත් කර, විවාද කොට, අවසන් කරනු ලැබූ පසු, කථානායකවරයාගේ අවසරය නොමැතිව කවර හෝ මන්ත්‍රීවරයකුට එම සභා වාරයේදී ම එම ප්‍රශ්නය නැවත වරක් ඉදිරිපත් කළ නොහැකි ය.

## පාර්ලිමේන්තුව තුළ කථා කිරීමේ දී මන්ත්‍රීවරයන් විසින් පිළිපැදිය යුතු රීති ( ස්ථාවර නියෝග 91 )

සෑම මන්ත්‍රීවරයකු ම, පාර්ලිමේන්තුව විසින් සලකා බැලීමට නියමිත යම් කාරණයක් සම්බන්ධයෙන් කථා කිරීමේ දී, පහත සඳහන් රීති දැඩිව පිළිපැදිය යුතුය.

(අ). සෑම මන්ත්‍රීවරයකු විසින්ම කථානායකවරයා අමතමින් සිය අදහස් ප්‍රකාශ කිරීම කළ යුතුය. කථානායකවරයාගේ අවසරය ඇතිව ඔවුන් තමාට වෙන්කර තිබෙන ආසනයෙන් නැඟී සිට කථා කළ යුතුය.

(ආ). මන්ත්‍රීවරයකුගේ කථාවකට බාධා කළ හැක්කේ රීති ප්‍රශ්නයක් මත හෝ කථා කරනු ලබන මන්ත්‍රීවරයා විසින් මැදිහත්වීමට අවසරය දෙනු ලැබුවහොත් පමණි.

(ඇ). මන්ත්‍රීවරයකු විසින් සිය අදහස් ප්‍රකාශ කිරීම අවසන් කළ විට, එම මන්ත්‍රීවරයා විසින් සිය ආසනයෙහි නැවත අසුන් ගත යුතුය.

(ඈ). මන්ත්‍රීවරයන් දෙදෙනකු එකවර නැගී සිටියහොත්, කථානායකවරයා විසින් තමාගේ ඇසට පළමුවෙන් හසුවන මන්ත්‍රීවරයාට පාර්ලිමේන්තුව ඇමතීමට අවස්ථාව ලබාදෙයි.

(ඉ). සෑම මන්ත්‍රීවරයකු විසින්ම සිය අදහස් ප්‍රකාශ කිරීම සාකච්ඡාවට භාජනය වෙමින් පවතින විෂයයට සීමා කළ යුතුය.

(ඊ). කිසිම මන්ත්‍රීවරයකුට විසින් යම් යෝජනාවක දී හෝ විවාදයක දී අධිකරණයේ විනිශ්චයට භාජනය වෙමින් පවතින හෝ අධිකරණයේ තීන්දුව දීමට නියමිතව තිබෙන යම් කාරණයක් පිළිබඳව සඳහන් කළ නොහැක. එවැන්නක් සිදු කරන කවර හෝ මන්ත්‍රීවරයකුට සිය ආසනයෙහි අසුන් ගන්නා ලෙස නියෝග කිරීමට කථානායකවරයාට හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයාට බලය තිබේ.

(උ). කථා කරමින් සිටින හෝ සභාවේ පැමිණ සිටින යම් මන්ත්‍රීවරයකු විසින්, අපහාසාත්මක හෝ අනිසි වචන පාවිච්චි කරනු ලැබුවහොත්, කථානායකවරයා විසින් ඒ මන්ත්‍රීවරයාට රීත්‍යනුකූල වන ලෙස නියෝග කරයි. එවිට එම  එම සඳහන් කිරීම පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙස නියෝග කිරීමට කථානායකවරයාට බලය ඇත.

(ඌ). කිසිම මන්ත්‍රීවරයකු වෙනත් මන්ත්‍රීවරයකුට අයුතු චෝදනාවක් කිරීම හෝ වෙනත් මන්ත්‍රීවරයකුගේ පෞද්ගලික කටයුතු සම්බන්ධයෙන් සඳහන් කිරීම හෝ නොකළ යුතුය.

(එ). මන්ත්‍රීවරයකු විසින්, පාර්ලිමේන්තුව ඉදිරියේ ඇති විෂයය කරුණට අදාළ වන ලෙස කථා කළ යුතුය.

(ඒ). පාර්ලිමේන්තුව ඉදිරියේ ප්‍රශ්නයක් ඉදිරිපත් කර නොතිබුණ ද, පාර්ලිමේන්තුවේ කැමැත්ත ඇතිව මන්ත්‍රීවරයකුට තමා සම්බන්ධව පෞද්ගලික ස්වභාවයේ කාරණා පැහැදිලි කළ හැකි ය; එහෙත් එවැනි කාරණා විවාදයකට භාජනය කළ නොහැකි ය. එමෙන්ම එම කථාව එම මන්ත්‍රීවරයාගේ පැවැත්ම නිදොස් කිරීමට පමණක් සීමා කරයි.

(ඔ). පනත් කෙටුම්පතක්, නියෝගයක්, යෝජනා සම්මතයක් හෝ යෝජනාවක් ඉදිරිපත් කරනු ලබන මන්ත්‍රීවරයකුට විවාදය අවසානයේ දී පිළිතුරු දීම සඳහා අයිතිවාසිකමක් තිබේ.

(ඕ). රීතිවලින් බැහැරවන කවර හෝ මන්ත්‍රීවරයකු වහාම සභාවේ රීතිවලට අනුකූල විය යුතු බවට කථානායකවරයා විසින් නියම කරයි.

(ක). ඡන්දය ප්‍රකාශ කරන අවස්ථාවේ දී හැර, මන්ත්‍රීවරයන් විසින් සභා ගර්භයට ඇතුළුවන සහ ඉන් පිටව යන අවස්ථාවේ දී, මූලාසනයට ගෞරව කළ යුතු ය.

(ග). රැස්වීම අවසානයේ දී, කථානායකවරයා හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා සභාගර්භයෙන් පිටව යාමට සූදානම් අවස්ථාවේ දී, මන්ත්‍රීවරයන් විසින් සිය ආසනවලින් නැගිට, කථානායකවරයා හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා සභා ගර්භයෙන් පිටත්ව යන තෙක් සිටිය යුතු ය.

(ච). මෙම ස්ථාවර නියෝගයේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කථානායකවරයා විසින් මන්ත්‍රීවරයන් අතර සාධාරණ සහ යුක්ති සහගත ආකාරයකට කාලය වෙන් කිරීම සඳහා වගකියනු ලැබිය යුතුය. කථා කිරීම සඳහා කැඳවනු ලැබිය යුත්තේ කවරෙකුද යන්න තීරණය කිරීමේදී, ආණ්ඩු පාර්ශ්වයේ සහ විරුද්ධ පාර්ශ්වයේ සංවිධායකවරයන් විසින් එසේ කථා කිරීම සඳහා කථානායකවරයා විසින් කැඳවනු ලැබිය යුතු මන්ත්‍රීවරයන්ගේ ලැයිස්තුවක් ලබා දීම මඟින් කථානායකවරයාට සහාය වෙයි.

## කථා නොකරන මන්ත්‍රීවරයන් විසින් පිළිපැදිය යුතු රීති ( ස්ථාවර නියෝග 92 )

පාර්ලිමේන්තුව ආමන්ත්‍රණය නොකරන මන්ත්‍රීවරයන් පහත සඳහන් රීතී අනුගමනය කළ යුතු ය.

(අ). ශිෂ්ට සම්පන්නව සහ සන්සුන් ලෙස පාර්ලිමේන්තුවට හෝ කාරක සභාවට හෝ පිවිසීම කළ යුතු ය.

(ආ). පාර්ලිමේන්තුවේ සභා ගර්භය හරහා ගමන් නොකළ යුතු ය.

(ඇ). පාර්ලිමේන්තුව ඉදිරියේ ඇති කටයුතු හා සම්බන්ධ වන්නේ නම් මිස පුවත්පත් කියවනු නොලැබිය යුතු ය.

(ඈ). දුම් පානය නොකළ යුතු ය.

(ඉ). වෙනත් මන්ත්‍රීවරයකු කථා කරන විට නිශ්ශබ්දතාවය පවත්වා ගත යුතු අතර, කථා කරමින් සිටින මන්ත්‍රීවරයා විසින් ඉඩ දෙනු ලබන්නේ නම් මිස ඊට බාධා නොකළ යුතු ය.

(ඊ). වාචික සන්නිවේදනය සඳහා භාවිත කරන සන්නිවේදන උපකරණ උපයෝගි කර ගනිමින් සංවාදයේ නොයෙදිය යුතු ය.

(උ). පාර්ලිමේන්තුවේ සභා ගර්භයේ මධ්‍යයට පිවිසීම නොකළ යුතු ය.

## රීති ප්‍රශ්න

ඡන්දයක් ප්‍රකාශ කිරීමට බෙදීමක් පවතින විටක දී හැර පාර්ලිමේන්තුවේ කවර හෝ කටයුත්තක දී නිවැරදි ක්‍රමවේද අනුගමනය කරනු ලැබ තිබේ ද හෝ කරනු ලබමින් තිබේ ද යන්න පිළිබඳව මන්ත්‍රීවරයකුට ප්‍රශ්න කළ හැකිය. එවැන්නක් රීති ප්‍රශ්නයක් වේ.

රීති ප්‍රශ්නයක් මතු කිරීමේ දී, මන්ත්‍රීවරයකුට මිනිත්තු එකකට වඩා කතා කළ නොහැක. සැලකිල්ලට භාජනය කරනු ලබමින් තිබෙන ප්‍රශ්නයක් අභිභවා රීති ප්‍රශ්නයක් මුඛ්‍යස්ථානය ගනු ලැබිය යුතු අතර, එවැනි අවස්ථාවක දී සලකා බැලීමට භාජනය කරනු ලබමින් තිබෙන සාකච්ඡාව තාවකාලිකව අත් හිටුවිය යුතු ය.

මෙම ස්ථාවර නියෝගවලට අනුකූලව යම් රීති ප්‍රශ්නයක් සම්බන්ධයෙන් කථානායකවරයා හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් තීරණයක් වහාම ගත යුතු ය. කෙසේ වෙතත් විශේෂයෙන් තීරණයක් ගැනීම කල් තැබිය යුතු ය. කථානායකවරයා හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ස්ථාවර නියෝග යටතේ එළඹී තීරණය නිවේදනය කළ යුතු ය. අනතුරුව එම තීරණය සම්බන්ධයෙන් තවදුරටත් සාකච්ඡා කිරීමට ඉඩ නොලැබේ.

## පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාව. ( ස්ථාවර නියෝග 93 සිට 99 )

පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක් පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මඟින් පත් කරයි. එවැනි යෝජනා සම්මතයකට එකඟ වීමෙන් අනතුරුව කථානායකවරයා මූලාසනයෙන් ඉවත් වෙයි.

කථානායකවරයා නොපැමිණ සිටින අවස්ථාවක දී, නියෝජ්‍ය කථානායකවරයා විසින් පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක සභාපතිවරයා වශයෙන් මූලාසනය දරයි. ඒ දෙදෙනාම නොපැමිණ සිටින අවස්ථාවක දී, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනය දරයි. කථානායකවරයා, නියෝජ්‍ය කථානායකවරයා සහ නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා යන තිදෙනාම නොපැමිණ සිටින අවස්ථාවක දී, සභාපති නාමාවලියේ කවර හෝ මන්ත්‍රීවරයකු මූලාසනය දරයි.

පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවේ ඡන්ද විමසීමේදී "කථානායකවරයා" යන වචනය වෙනුවට "සභාපතිවරයා" යන වචනය ආදේශකොට ඡන්දය විමසිය යුතු ය.

පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක සභාපතිවරයාට ඡන්දය භාවිත කළ හැක්කේ අනෙක් මන්ත්‍රීවරුන්ගේ ඡන්ද සමානව බෙදී ඇත්නම් පමණි. එවැනි අවස්ථාවක දී සභාපතිවරයාගේ ඡන්දය තීරක ඡන්දය බවට පත් වේ.

පහත සඳහන් කාරණා වල දී හැර කථානායකවරයා මූලාසනයේ සිටින අවස්ථාවක දී, කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් අදාළ වන රීති පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද අදාළ විය යුතුය.

(අ). යෝජනාවක් පිළිබඳව දැනුම් දීමක් අවශ්‍ය නොවේ.

(ආ). යෝජනාවක් ස්ථිර කරනු ලැබීම අවශ්‍ය නොවේ.

(ඇ). එකම ප්‍රශ්නය සම්බන්ධයෙන් මන්ත්‍රීවරයකුට එක් වරකට වඩා කථා කළ හැකි ය.

පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක් විසින් එම කාරක සභාවට පාර්ලිමේන්තුව විසින් යොමු කරන ලද කාරණා සම්බන්ධයෙන් පමණක් කටයුතු සිදු කරයි. එමෙන්ම පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක වැඩකටයුතු පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්වලද වාර්තා කරයි.

## විශේෂ කාරක සභා. ( ස්ථාවර නියෝග 100 සිට 110 )

## විශේෂ කාරක සභාවක් පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මඟින් පත් කරයි.

විශේෂ කාරක සභාවක්, පාර්ලිමේන්තුවේ අවසරය නොමැතිව මන්ත්‍රීවරු දොළොස් දෙනෙකුට වැඩි ගණනකින් යුක්ත නොවේ. එවැනි අවසරයක් ලබා ගැනීම සඳහා වන යෝජනාවක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට දැනුම් දීම අවශ්‍ය වේ.

විශේෂ කාරක සභාවකින් සිදු කරනු ලබන පරීක්ෂණයක විෂයය සීමාව, එම කාරක සභාව පත්කරන ලද නියෝගයේ නියම මඟින් තීරණය කරයි. නමුත් එම විෂයය පථය පුළුල් කිරීම හෝ සීමා කිරීම පාර්ලිමේන්තුවේ උපදෙස් අනුව සිදුකළ හැකිය. එම කාරක සභාව විසින් එහි අවසන් වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු කාල සීමාව ඉහත කී නියෝගයේ නිශ්චිතව දක්වා තිබිය යුතු ය.

සෑම විශේෂ කාරක සභාවකම සභාපතිවරයා සහ සභික මන්ත්‍රීවරයන් කථානායකවරයා විසින් පත් කරයි. සභාපතිවරයා නොපැමිණ සිටින අවස්ථාවක දී, පැමිණ සිටින සභික මන්ත්‍රීවරයන් විසින් තෝරා ගනු ලබන කාරක සභාවේ වෙනත් කවර හෝ මන්ත්‍රීවරයකු විසින් එම රැස්වීමේ මූලාසනය දරයි.

සභාපතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් වේලාවක සහ ස්ථානයක කාරක සභාව විසින් සිය රැස්වීම් පවත්වනු ලැබේ. පළමුවැනි රැස්වීමෙන් අනතුරුව පවත්වනු ලබන රැස්වීම් කාරක සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි වේලාවල සහ ස්ථානවල පැවැත්විය යුතු ය.

අන්‍යාකාරයෙන් නියෝග කරනු ලබන්නේ නම් මිස, විශේෂ කාරක සභාවක ගණපූරණය මන්ත්‍රීවරුන් හතර දෙනෙකුගෙන් සමන්විත වේ.

එවැනි යම් කාරක සභාවක පුරප්පාඩුවක් ඇති වන යම් අවස්ථාවක දී, කථානායකවරයා විසින්, කලින් කලට, එම සාමාජික මන්ත්‍රීවරයා වෙනුවට එම විශේෂ කාරක සභාවට වෙනත් මන්ත්‍රීවරයකු පත්කිරීම සිදුවේ. කාරක සභාවේ පූර්ව අවසරය නොලබා නොකඩවා රැස්වීම් තුනකට නොපැමිණ යම් සාමාජික මන්ත්‍රීවරයකු එම කාරක සභාවේ සාමාජිකත්වය අත්හැරගියා සේ සලකනු ලබයි. මෙම ස්ථාවර නියෝගය යටතේ කරනු ලබන සෑම පත් කිරීමක් ම පාර්ලිමේන්තුවේ ඊළඟ රැස්වීමේ දී පාර්ලිමේන්තුවට නිවේදනය කළ යුතු ය.

විශේෂ කාරක සභාවක සභාපතිවරයාට එක් මූලික ඡන්දයක් හිමිවේ. ඡන්ද විමසීමක දී ප්‍රකාශ කරන ලද ඡන්ද සමානව බෙදී ඇත්නම්, සභාපතිවරයාට තීරක ඡන්දයක් භාවිත කළ හැකි ය.

පනත් කෙටුම්පතක් හෝ යම් කාරණයක් යොමු කරනු ලැබූ විශේෂ කාරක සභාවක් විසින් එම පනත් කෙටුම්පත හෝ කාරණය පිළිබඳ සාක්ෂි විභාග කිරීම පිණිස පාර්ලිමේන්තුව විසින් එම කාරක සභාවට තැනැත්තන් කැඳවීමට සහ ලිපි ලේඛන සහ වාර්තා ගෙන්වා ගනු ලැබීමට යෝජනා සම්මතයක් මඟින් බලය ලබා දිය හැකි ය. එවැනි බලතල පවරනු ලැබ ඇති යම් කාරක සභාවකට එම කාරක සභාව ඉදිරියේ ලබා ගන්නා ලද සාක්ෂිවල කාර්යය සටහන් ද සමඟ කාරක සභාවේ මතයන් සහ නිරීක්ෂණ පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට ද අවසර තිබේ. පාර්ලිමේන්තුවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කිරීමට සුදුසු යැයි සැලකිය හැකි යම් කාරණයක් සම්බන්ධ විශේෂ වාර්තාවක් ඉදිරිපත් කිරීමට ද විශේෂ කාරක සභාවට අවසර හිමි වේ.

පාර්ලිමේන්තුව කල් තැබීම හෝ වාරාවසාන කර ඇති විටකදී වුවද, විශේෂ කාරක සභාවකට සිය විමර්ශන නොකඩවා සිදුකළ හැකිය. එහි වාර්තාව පාර්ලිමේන්තුවට පිළිගන්වනු ලබන තෙක් පාර්ලිමේන්තුවේ යෝජනාවකින් මිස එය විසුරුවා හැරිය නොහැකිය.

යම් විශේෂ කාරක සභාවක රැස්වීම සඳහා

එක් එක් දිනයේ පැමිණෙන සාමාජික මන්ත්‍රීවරයන්ගේ නම්,

විභාග කරන ලද සාක්ෂිකරුවන්ගේ නම්

යම් බෙදීමක් ඇති වූ අවස්ථාවක දී, ඉදිරිපත් කරනු ලැබූ ප්‍රශ්නය,

එය ඉදිරිපත් කරනු ලැබූ තැනැත්තාගේ නම

පැමිණ සිටින සාමාජික මන්ත්‍රීවරයන් එම ප්‍රශ්නය සඳහා ඡන්දය ලබාදුන් අනුපිළිවෙළ ද

කාරක සභාවේ වැඩකටයුතු පිළිබඳ කාර්ය සටහන්වල ඇතුළත් කරනු ලැබිය යුතු ය. සාක්ෂි පිළිබඳ කාර්ය සටහන් සමඟ වැඩකටයුතු පිළිබඳ කාර්ය සටහන් ද පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු ය. කාරක සභාවේ වාර්තාව සමඟ ඒවා මුද්‍රණය කළ යුතු ය.

### ආංශික අධීක්ෂණ කාරක සභා ( ස්ථාවර නියෝග 111 )

පාර්ලිමේන්තුව විසින්, මහ මැතිවරණයකින් පසුව එහි පළමුවැනි රැස්වීමෙන් අනතුරුව සති හයක් ඇතුළත දී, යෝජනා සම්මතයක් මඟින්, තේරීම් කාරක සභාව විසින් තීරණය කරන ආංශික අධීක්ෂණ කාරක සභා සංඛ්‍යාවක් පත් කරයි. කෙසේ වුව ද, ආංශික අධීක්ෂණ කාරක සභා සංඛ්‍යාව විස්ස නොඉක්මවිය යුතුය.ආංශික අධීක්ෂණ කාරක සභා පාර්ලිමේන්තුවේ කාලය තුළ දී ක්‍රියාත්මක වේ. පාර්ලිමේන්තුවේ යම් කල් තැබීමක් හෝ වාරාවසාන කිරීමක් නොසලකා එහි විමර්ශන කටයුතු පවත්වාගෙන යා යුතු ය.

එක් එක් ආංශික අධීක්ෂණ කාරක සභාවට වෙන්කරනු ලැබිය යුතු විෂයයන් සහ කාර්යයන් තේරීම් කාරක සභාව තීරණය කරයි.

ආංශික අධීක්ෂණ කාරක සභාවලට යම් පනත් කෙටුම්පතක්, නියෝගයක්, යෝජනා සම්මතයක් ඇතුළු යම් අනුනීතියක්, ගිවිසුමක්, වාර්තාවක්, හෝ එහි අධිකාර බල සීමාව ඇතුළත ඇති විෂයයන් සහ කාර්යයන්ට අදාළ වෙනත් යම් කාරණයක් විභාග කිරීමට බලය තිබේ.

ආංශික අධීක්ෂණ කාරක සභා පත්කිරීමෙන් සති හයකට පසු නොවන කාලයක දී එක් එක් ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවේ එම සැසිවාරය සඳහා අධීක්ෂණ සැලසුමක් සම්මත කරයි

පහත සඳහන් තැනැත්තන් හැර, පාර්ලිමේන්තුවේ සෑම මන්ත්‍රීවරයකු ම යම් ආංශික අධීක්ෂණ කාරක සභාවක සාමාජිකයන් ලෙස සේවය කිරීමට සුදුසුකම් ලබයි.

(අ). කථානායකවරයා;

(ආ). නියෝජ්‍ය කථානායකවරයා;

(ඇ). නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා;

(ඈ). අග්‍රාමාත්‍යවරයා;

(ඉ). පාර්ලිමේන්තුවේ සභානායකවරයා;

(ඊ). පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා;

(උ). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (2) ව්‍යවස්ථාව යටතේ පත්කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්.

එක් එක් ආංශික අධීක්ෂණ කාරක සභාව, සිය පළමු රැස්වීමේ දී සහ ඉන් අනතුරුව එහි සභාපතිධුරය පුරප්පාඩු වීමෙන් අනතුරුව පවත්වනු ලබන පළමු රැස්වීමේ දී ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභික මන්ත්‍රීවරයන් අතුරින් සභාපතිවරයකු තෝරා පත්කර ගනියි.

නීති පැනවීම හෝ ව්‍යවස්ථාමය නොවන වාර්තා ඉදිරිපත් කිරීම සඳහා ආංශික අධීක්ෂණ කාරක සභාවක් නිර්දේශ කරනු ලබන අවස්ථාවක දී, එම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමෙන් සති හයක් ඇතුළත දී, අමාත්‍ය මණ්ඩලය විසින් සිය මතය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා ( ස්ථාවර නියෝග 112 )

පහත සඳහන් සාමාජිකයින්ගෙන් සැදුම්ලත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යාංශ සංඛ්‍යාවට සමාන වන්නා වූ ද අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා සංඛ්‍යාවක් ස්ථාපනය කළ යුතුය.

(අ.) සභාපති ලෙස අමාත්‍ය මණ්ඩලයේ අදාළ විෂය භාර අමාත්‍යවරයා

(ආ.) රාජ්‍ය අමාත්‍යවරයා

(ඇ.) නියෝජ්‍ය අමාත්‍යවරයා, සහ

(ඈ). තේරීම් කාරක සභාව විසින් නම් කළ වෙනත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පස් දෙනෙක්

ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් කාරක සභාවට යොමු කරනු ලබන කාරණා සලකා බැලීම කාරක සභාවේ කර්තව්‍යය වේ. ඉහත සාමාජිකයන්ට අමතරව වෙනත් ඕනෑම මන්ත්‍රීවරයකුට ද කාරක සභාවේ සභාපතිගේ අවසරය ඇතිව රැස්වීම් සඳහා සහභාගී විය හැකිය. කාරක සභාව මසකට වරක් රැස්විය යුතු අතර, රැස්වී සති දෙකක් ඇතුළත ඊට අදාළ කරුණු පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු ය.

කාරක සභා රැස්වීම් කැඳවීම අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා සමඟ සාකච්ඡා කර සිදු කරයි.කාරක සභාව ඉදිරියට යම් තැනැත්තකු කැඳවා ප්‍රශ්න කිරීමට ද, යම් ලියකියවිලි, පොත්, වාර්තා හෝ වෙනත් ලේඛන ගෙන්වා පරීක්ෂා කරනු ලැබීමට ද කාරක සභාවට බලය තිබේ. කාරක සභා සඳහා වන සාමාන්‍ය රීති අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා සඳහා ද අදාළ වේ.

## ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව ( ස්ථාවර නියෝග 113)

නියෝජ්‍ය කථානායකවරයා සභාපති වූ , නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් මන්ත්‍රීවරයන් දස දෙනෙකුගෙන් සමන්විත, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවක් පාර්ලිමේන්තුව තුළ ක්‍රියාත්මක ය.

තේරීම් කාරක සභාව විසින් ආණ්ඩු පාර්ශ්වය සහ විරුද්ධ පාර්ශ්වය නියෝජනය කරමින් අතිරේක මන්ත්‍රීවරයන් ද නම් කරනු ලබයි. එවැනි මන්ත්‍රීවරයන් නම් කරනු ලැබීමට කථානායකවරයාට බලය තිබේ.

ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ ගණපූරණය මන්ත්‍රීවරයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය. ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ කර්තව්‍යය, පාර්ලිමේන්තුව විසින් ඊට සලකා බැලීම පිණිස යොමු කරනු ලබන පනත් කෙටුම්පත් / යෝජිත ප්‍රඥප්තිවලට පමණක් සීමා වේ.

ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ සභාපතිවරයාට එක් මූලික ඡන්දයක් හිමිවේ.ඡන්ද විමසීමකදී ප්‍රකාශ කරන ලද ඡන්ද සමානව බෙදී ඇත්නම් සභාපතිවරයාට තීරක ඡන්දයක් ද තිබිය යුත්තේ ය.

පාර්ලිමේන්තුව වාරාවසාන කිරීමක් සිදුවන අවස්ථාවක දී, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ සාකච්ඡා නිමකර නොමැතිව, එහි වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබ නොමැති අවස්ථාවක දී, එම කාරක සභාවේ වැඩකටයුතු ඊළඟ සභාවාරයේ දී එකී පනත් කෙටුම්පත / යෝජිත ප්‍රඥප්ති යොමු කරනු ලැබ තිබූ ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට යොමු කිරීම සිදු වේ.

## විශේෂ කාර්යයන් සඳහා කාරක සභා

## තේරීම් කාරක සභාව ( ස්ථාවර නියෝග 114)

ආංශික අධීක්ෂණ කාරක සභාවල සහ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවල සංයුතිය, සාමාජික සංඛ්‍යාව, ඒවායේ කර්තව්‍ය සහ ගණපූරණය  තීරණය කරනු ලැබීම සඳහා ද ඒ සම්බන්ධව සිය මතය හැකි පමණ ඉක්මනින් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබීම සඳහා ද, පහත සඳහන් කාරක සභාවල සේවය කිරීම සඳහා ද, මන්ත්‍රීවරයන් නම් කරනු පිණිස සෑම සභාවාරයක් ආරම්භයේ දී ම, "තේරීම් කාරක සභාව" යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් පිහිටුවයි.

(අ). පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව;
(ආ). ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව;
(ඇ). ගෘහ්‍ය කාරක සභාව;
(ඈ). ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව;
(ඉ). ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව;
(ඊ). අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා;
(උ). රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව;
(ඌ). පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව;
(එ). රජයේ මුදල් පිළිබඳ කාරක සභාව;
(ඒ). මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව;
(ඔ). උසස් නිලතල පිළිබඳ කාරක සභාව; සහ
(ඕ). පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව.

තේරීම් කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුගෙන් සමන්විත වේ. පාර්ලිමේන්තුව කල් තබා ඇති විට, සිය රැස්වීම් පවත්වනු ලැබීමට ද, වරින් වර වාර්තා කිරීමට ද ,කිසියම් කාරක සභාවකට යම් මන්ත්‍රීවරයකු නම් කරනු ලැබූ අවස්ථාවක දී, ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට දැනුම් දෙනු ලැබීමට ද තේරීම් කාරක සභාවට අවසර තිබේ.

## පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව ( ස්ථාවර නියෝග 115)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා කථානායකවරයායි. කථානායකවරයාට අමතරව නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා, පාර්ලිමේන්තුවේ සභානායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් අටදෙනෙකුගෙන් එය සමන්විත වේ.

පාර්ලිමේන්තුවේ සභානායකවරයා විමසා, කථානායකවරයා විසින් කාරක සභාවට යොමු කිරීම පිණිස නියම කරනු ලබන පාර්ලිමේන්තුවේ වැඩකටයුතු සඳහා වෙන් කළ යුතු කාල සීමාව සහ වෙනත් කරුණු සලකා බලා තීරණය කිරීම පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ කර්තව්‍යය වේ.මෙම කාරක සභාවේ රැස්වීම්වල කාර්ය සටහන් සියලුම සාමාජික මන්ත්‍රීවරයන් අතර බෙදා හැරිය යුතු ය.

## ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව ( ස්ථාවර නියෝග 116)

කථානායකවරයා සභාපතිවරයා වූ, නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් හය දෙනෙකුගෙන් මෙම කාරක සභාව සමන්විත වේ.

පාර්ලිමේන්තුවේ කාර්ය පටිපාටිය සහ එහි වැඩකටයුතු මෙහෙයවීම සම්බන්ධ කාරණා සලකා බැලීම සහ ස්ථාවර නියෝගවලට අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි සංශෝධන නිර්දේශ කිරීම සහ පාර්ලිමේන්තුව විසින් එම කාරක සභාවට යොමු කරනු ලැබිය හැකි ස්ථාවර නියෝගවලට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් වාර්තා කිරීම ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ කර්තව්‍යය වේ.

## ගෘහ්‍ය කාරක සභාව ( ස්ථාවර නියෝග 117)

කථානායකවරයා සභාපතිවරයා වූ, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් නව දෙනෙකුගෙන් මෙම කාරක සභාව සමන්විත ය.

මන්ත්‍රීවරයන්ගේ පහසුකම් හා සම්බන්ධ සියලු කාරණා සලකා බලා ඒ සම්බන්ධයෙන් උපදෙස් දෙනු ලැබීම ගෘහ්‍ය කාරක සභාවේ කර්තව්‍යය වේ. ගෘහ්‍ය කාරක සභාවේ රැස්වීම්වල කාර්ය සටහන් සියලුම මන්ත්‍රීවරයන් අතර බෙදා හැරිය යුතු ය.

## ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව ( ස්ථාවර නියෝග 118)

තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් දසදෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් මෙම කාරක සභාව සමන්විත වේ.

සෑම වරප්‍රසාද ප්‍රශ්නයක් ම සහ පාර්ලිමේන්තුව විසින් ඉදිරිපත් කරනු ලැබ සම්මත කරනු ලබන යෝජනාවක් මත එම කාරක සභාවට යොමු කරනු ලැබිය හැකි පැවැත්ම සහ ආචාර විධි සම්බන්ධ රීති

කඩ කිරීමට අදාළ කාරණා විභාග කිරීම; සහ ඒ එක් එක් කාරණය සම්බන්ධ කාරණා ඇසුරින් පැවැත්ම සහ ආචාර විධි සම්බන්ධ රීතිවලට වරප්‍රසාද කඩකිරීමක් සිදුකර තිබේ ද යන්න තීරණය කිරීම සහ එවැනි කඩකිරීමක් සිදුවී තිබේ නම්, එම වරප්‍රසාද කඩ කිරීමේ ස්වභාවය, ඊට තුඩු දෙන්නා වූ අවස්ථානුගත කාරණා සහ කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන කාරක සභාවේ නිර්දේශ ඉදිරිපත් කරනු ලැබීම. ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ කර්තව්‍ය වේ.

කලින් කලට, සිය කාර්ය පටිපාටිය විධිමත් කර ගැනීම සඳහා රීති සෑදීමේ බලය ද මෙම කාරක සභාව සතු ය.

## රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ( ස්ථාවර නියෝග 119)

තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් දහසය දෙනෙකුගෙන් මෙය සමන්විත වේ.

- මහජන වියදම් සඳහා පාර්ලිමේන්තුව විසින් ප්‍රදානය කරනු ලබන මුදල් විසර්ජනය කිරීම පෙන්නුම් කරන ගිණුම් ද,
- රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු ලැබිය හැකි පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන වෙනත් යම් ගිණුම් ද ,
- විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කරනු ලැබීම, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කර්තව්‍යය වේ.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජිකයන් හතර දෙනෙකුගෙන් සමන්විත වේ.

## පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ( ස්ථාවර නියෝග 120)

තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් දහසය දෙනෙකුගෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සමන්විත වේ.

- රාජ්‍ය සංස්ථා සහ මුළුමනින්ම හෝ කොටසක් ආණ්ඩුව විසින් අරමුදල් සපයනු ලබන ආයතනවල ගිණුම් සහ
- යම් ලිඛිත නීතියක් මගින් ආණ්ඩුවට පවරා ගන්නා ලද යම් ව්‍යාපාරයක් හෝ වෙනත් පැවරීමක් සම්බන්ධව පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන ගිණුම්, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කර්තව්‍යය වේ.

  පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ගණපූරණය සාමාජිකයන් හතර දෙනෙකුගෙන් සමන්විත ය.

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාව ( ස්ථාවර නියෝග 121)

මෙහි සභාපතිවරයා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයකු විය යුතුය. තේරීම් කාරක සභාව මඟින් නම් කළ සභාපතිවරයකු හා සාමාජික මන්ත්‍රීවරයන් එකොළොස් දෙනෙකුගෙන් මෙම කාරක සභාව සමන්විත වේ. පහත සඳහන් අංශ පරීක්ෂා කිරීම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ කර්තව්‍යය වේ.

(අ). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි ව්‍යවස්ථාව යටතේ ආදායම් එකතු කිරීම;

(ආ). ඒකාබද්ධ අරමුදලෙන් කරනු ලබන ගෙවීම්;

(ඇ). නීතිය මඟින් යම් විශේෂ කාර්යය සඳහා මහජන අරමුදල් භාවිත කිරීම;

(ඈ). රජයේ අරමුදල් යෙදවීම;

(ඉ). පවත්නා වර්ෂය සඳහා විසර්ජන පනතේ අඩංගු විසර්ජනවල ආර්ථික අවපාත, විසර්ජන මාරු කිරීම සහ අනපේක්ෂිත ශේෂය;

(ඊ). පවත්නා වර්ෂය සඳහා විසර්ජන පනත ක්‍රියාත්මක කිරීම;

(උ). රාජ්‍ය ණය සහ ණය සේවා; සහ

(ඌ). 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ වාර්තා සහ ප්‍රකාශන.

ඉහත දක්වා ඇති කාරණා වලින් පැන නගින ගැටලු, කලින් කලට, පාර්ලිමේන්තුවට වාර්තා කිරීමද මෙම කාරක සභාවේ කාර්යකි.

## මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව ( ස්ථාවර නියෝග 122 )

තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් පහළොස් දෙනෙකුගෙන් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව සමන්විත වේ.කාරක සභාවට යොමු කරන මහජන පෙත්සම් සලකා බැලීම මෙම කාරක සභාවේ කාර්ය වේ.

රජයේ නිලධරයකු හෝ රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන අධිකාරියක හෝ එවැනි වෙනත් යම් ආයතනයක නිලධරයකු විසින් සිදු කරන ලද මූලික අයිතිවාසිකමක් කඩ කිරීම හෝ වෙනත් යම් අසාධාරණයක් යම් පෙත්සමක් මඟින් අනාවරණය වන බව මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ මතය වන අවස්ථාවක, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින් එම පෙත්සම විභාග කරනු ලැබීම හෝ විභාගකොට වාර්තා කරනු ලැබීම සඳහා එය පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්වරයා) වෙත යොමු කරයි.

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලද පෙත්සම් සම්බන්ධයෙන් කාරක සභාව විසින් සුදුසු යැයි සලකනු ලබන වෙනත් නිරීක්ෂණ ද සමඟ ගත යුතු පියවර සම්බන්ධයෙන් සිය මතය, කලින් කලට, පාර්ලිමේන්තුවට වාර්තා කරයි.

කාරක සභාව විසින් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාට යොමු කරනු ලැබූ පෙත්සමක් සම්බන්ධයෙන් ඔහු විසින් කාරක සභාවට ඉදිරිපත් කරන ලද වාර්තාවක් කාරක සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව ඒ වාර්තාව පිළිබඳව ගත යුතු ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් හෝ කාරක සභාව විසින් සලකා බලනු ලැබූ පෙත්සමක් සම්බන්ධයෙන් ස්වකීය මතය පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ හැකි ය.

වාර්තාව පාර්ලිමේන්තුවේදී සභාගත කළ විට, කථානායකවරයා විසින් එම වාර්තාවේ අන්තර්ගත කරුණු අදාළ වන යම් අමාත්‍යවරයකුගේ නිරීක්ෂණ සඳහා එම අමාත්‍යවරයාට යවනු ලැබීමට පියවර ගනු ලැබිය යුතු අතර, එම අමාත්‍යවරයා විසින් එම නිරීක්ෂණ සති අටක කාල සීමාවක් ඇතුළත දී කථානායකවරයා වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවේ ගණපූරණය 03 කි.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාව ( ස්ථාවර නියෝග 123 )

කථානායකවරයා සභාපතිවරයා වූ, අග්‍රාමාත්‍යවරයා, පාර්ලිමේන්තුවේ සභානායකවරයා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා සහ කථානායකවරයා විසින් නම් කරනු ලබන වෙනත් මන්ත්‍රීවරයන් තිදෙනෙකුගෙන් මෙය සමන්විත වේ. ගණපූරණය සාමාජිකයන් තිදෙනෙකි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(ආ) ව්‍යවස්ථාවේ උපලේඛනය යටතේ පිහිටුවන ලද සියලුම ස්වාධීන කොමිෂන් සභා, සිය බලය ක්‍රියාත්මක කිරීම සහ කාර්ය හා කර්තව්‍යයන් පිළිබඳ කාර්ය සාධනය ඇතුළත්ව ස්වකීය ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් එක් එක් ලිත් වර්ෂයක් සඳහා වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරයි. මෙම කාරක සභාව විසින් වාර්ෂික වාර්තා සලකා බැලිය යුතු අතර කාරක සභාව විසින් එහි කර්තව්‍යය ඉටුකිරීමේ දී කොමිෂන් සභාවල සභාපතිවරයන්, සාමාජිකයන් හා නිලධාරීන් කාරක සභාව ඉදිරියට කැඳවනු ලබයි.

## උසස් නිලතල පිළිබඳ කාරක සභාව (ස්ථාවර නියෝග 124)

තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් මෙය සමන්විතය.

අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් තනතුරකට පත්කරනු ලැබ ඇති හෝ නම් කරනු ලැබ ඇති යම් තැනැත්තකුගේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සහ එම තැනැත්තන් සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ කර්තව්‍යය වේ.

අමාත්‍යාංශ ලේකම්වරුන්, විදේශීය දූත මණ්ඩල ප්‍රධානීන් සහ උසස් නිලතල පිළිබඳ කාරක සභාව විසින් තීරණය කරනු ලබන තෝරා ගත් සංස්ථාවල සභාපතිවරුන් යනාදී තනතුරු සඳහා පත්කළ හෝ නම්කළ, තැනත්තන්ගේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීම මෙහිදී සිදු කෙරේ.

උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ ගණපූරණය 04 කි.

## සම්බන්ධීකරණ කාරක සභාව ( ස්ථාවර නියෝග (125) )

සම්බන්ධීකරණ කාරක සභාව, කථානායකවරයා විසින් අභිනව පාර්ලිමේන්තුවක් ආරම්භයේ දී පත් කරනු ලබයි.

මෙම කාරක සභාව පහත දැක්වෙන සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත වේ.

(අ). කාරක සභාවේ සභාපතිවරයා විය යුතු කථානායකවරයා;

(ආ). නියෝජ්‍ය කථානායකවරයා;

(ඇ). නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා;

(ඈ). පාර්ලිමේන්තුවේ සභානායකවරයා;

(ඉ). පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා;

(ඊ). ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා;

(උ). විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා; සහ

(ඌ). ආචාර ධර්ම හා වරප්‍රසාද පිළිබඳ කාරක සභාව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව, ආංශික අධීක්ෂණ කාරක සභා, අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව, උසස් නිලතල පිළිබඳ කාරක සභාව සහ පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව යන කාරක සභාවල සභාපතිවරයන්.

සම්බන්ධීකරණ කාරක සභාව විසින්,-

(අ). කාරක සභාවල පහසුකම් සහ කාර්ය මණ්ඩලවලට අදාළ යම් කාරණා;

(ආ). කාරක සභාවල රැස්වීම් සඳහා කාරක සභා කාමරවල උපයෝජ්‍යතාවය;

(ඇ). කාරක සභා සඳහා විශේෂඥයන්ගේ සහ පර්යේෂකයන්ගේ උපයෝජ්‍යතාව;

(ඈ). කාරක සභාවල සාමාජික මන්ත්‍රීවරයන්ගේ රැස්වීම් සඳහා පැමිණීම; සහ

(ඉ). කාරක සභා වාර්තා විවාද කරනු ලැබීමේදී ඒ සඳහා කාලය වෙන් කිරීම පිළිබඳ සලකා බැලිය යුත්තේය.

සම්බන්ධීකරණ කාරක සභාව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස්විය යුතු අතර, කාරක සභාවේ රැස්වීම් කැඳවීම සඳහා එහි සභාපතිවරයා කටයුතු කරයි.

## පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව ( ස්ථාවර නියෝග 126)

තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව පහත සඳහන් සාමාජික මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත වේ.

(අ). ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා, ආණ්ඩු පාර්ශ්වයේ පසුපෙළ මන්ත්‍රීවරයන් තිදෙනෙකු සහ විරුද්ධ පාර්ශ්වයේ පසුපෙළ මන්ත්‍රීවරයන් තිදෙනෙකු:

(ආ). විරුද්ධ පාර්ශ්වයෙන් මන්ත්‍රීවරයන් තෝරා ගැනීමේ දී, විරුද්ධ පාර්ශ්වයේ වැඩිම මන්ත්‍රී සංඛ්‍යාවක් සිටින විශාලතම පක්ෂයට එක් මන්ත්‍රීවරයකු ද, විරුද්ධ පාර්ශ්වයේ ඊළඟට වැඩිම මන්ත්‍රී සංඛ්‍යාවක් සිටින දෙවැනි විශාලතම පක්ෂයට එක් මන්ත්‍රීවරයකු ද, වශයෙන් වෙන්කරනු ලැබිය යුතු ය.

(ඇ). ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා හැර, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන්, නියෝජ්‍ය අමාත්‍යවරයන්, පාර්ලිමේන්තුවේ සභානායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා සහ දේශපාලන පක්ෂවල නායකයන් මෙම කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරයකු වීමට හිමිකම් නොලැබිය යුතු ය.

ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාවේ සභාපතිවරයා වේ. ඔහු පැමිණ නොසිටින අවස්ථාවලදී විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා කාරක සභාවේ සභාපතිවරයා ලෙස ක්‍රියා කරයි.

පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කටයුතු සඳහා වෙන්කර තිබෙන දිනවල දී සැලකිල්ලට ගනු ලැබිය යුතු කටයුතු තීරණය කිරීම පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාවේ කර්තව්‍යය වේ.

## විශේෂ කාර්යයන් සඳහා කාරක සභාවල කාර්ය පටිපාටිය ( ස්ථාවර නියෝග 127)

විශේෂ කාර්යයන් සඳහා වූ සෑම කාරක සභාවක් විසින්ම එහි පළමුවැනි රැස්වීමේ කටයුතු ආරම්භ කිරීමට පෙර එහි සභාපතිවරයා වශයෙන් එක් සාමාජික මන්ත්‍රීවරයකු තෝරා පත්කර ගනී.

සභාපතිවරයාට මූලික ඡන්දයක් හිමිවේ. ඡන්දය විමසනු ලැබූ අවස්ථාවක දී, ලැබුණු ඡන්ද ගණන සමානව බෙදී තිබේ නම් සභාපතිවරයාට තීරක ඡන්දයක්ද හිමි වේ.

කාරක සභාවල පුරප්පාඩු, තේරීම් කාරක සභාව විසින් පුරවනු ලබයි. එවැනි සෑම පුරප්පාඩුවක් පිරවීම සම්බන්ධයෙන් ම, පාර්ලිමේන්තුවේ ඊළඟ රැස්වීමේ දී පාර්ලිමේන්තුවට නිවේදනය කළ යුතුය. කාරක සභාවේ ගණපූරණය 03 කි.

## රජයේ මුදල් ( ස්ථාවර නියෝග 133)

ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ වෙනයම් අරමුදල්වලින් හෝ ගෙවිය යුතු මුදල් වියදම් කිරීමට හෝ ගෙවිය යුතු යැයි වියදම් නියම කිරීමට,

නැතහොත් කිසියම් බද්දක් පැනවීමට හෝ පනවා එවකට වලංගුව තිබෙන බද්දක් අවලංගු කිරීමට හෝ වැඩි හෝ අඩු කිරීමට බලය පවරන යෝජනාවක්,

පනත් කෙටුම්පතක් හෝ පනත් කෙටුම්පතකට කරන සංශෝධනයක් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස පාර්ලිමේන්තුව විසින් සලකා බැලීම කරනු නොලැබිය යුතු ය.

එවැනි යෝජනාවක්, පනත් කෙටුම්පතක් හෝ පනත් කෙටුම්පතකට කරන සංශෝධනයක් ඉදිරිපත් කිරීමට පෙර, එම අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයා විසින් එම යෝජනාවට, පනත් කෙටුම්පතට හෝ සංශෝධනයට අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්විය යුතුය. "අමාත්‍ය මණ්ඩලයේ අනුමතය දන්වා තිබේ" යනුවෙන් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ සඳහන් කර තිබීම මෙම නියමය සමග අනුකූල බවට සලකනු ලබයි.

## ස්ථාවර නියෝග සංශෝධනය කිරීම ( ස්ථාවර නියෝග 134)

ස්ථාවර නියෝග සංශෝධනය කරනු පිණිස වන යෝජනාවක් පිළිබඳ දැනුම්දීමක් ඕනෑම මන්ත්‍රීවරයකුට සිදුකළ හැකි ය. යෝජනා කරනු ලබන සංශෝධනවල කෙටුම්පතක් එම දැනුම්දීම සමග ඉදිරිපත් කරයි. යෝජනාව ඉදිරිපත් කළවිට, එය ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවට යොමු කරයි. ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව එම යෝජනාව පිළිබඳව වාර්තා කරන තෙක් එවැනි යෝජනාවක් පිළිබඳ සෙසු වැඩකටයුතු කිසිවක් සිදු නොකරයි.

## ස්ථාවර නියෝග අත්හිටවීම ( ස්ථාවර නියෝග 135)

පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන් බහුතරයක් විසින් යම් රැස්වීමක දී දැනුම් දීමෙන් අනතුරුව ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් මගින්, යම් විශේෂ කටයුත්තක් තීරණය කිරීමට හෝ සුදුස්සක් කර අවසන් කිරීමට හැකිවනු පිණිස ස්ථාවර නියෝග එකක් හෝ ඊට වැඩි ගණනක් අත්හිටවනු ලැබිය හැකිය.

මෙම ස්ථාවර නියෝගය යටතේ යෝජනාවක් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් ඉදිරිපත් කරනු ලබන්නේ නම් මිස, බෙදීමකින් තීරණය කළ යුතුය. බහුතරයේ මන්ත්‍රීවරයන් විසි දෙනෙකුට අඩු සංඛ්‍යාවක් යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කොට ඇති බව පෙනී යන්නේ නම් එම යෝජනාව නිෂ්ඵල බවට තීරණය කෙරේ.

## කථානායකවරයාගේ සාමාන්‍ය අධිකාරය ( ස්ථාවර නියෝග 136 සිට 139 )

ස්ථාවර නියෝගවලින් විධිවිධාන සලසා නොමැති ඕනෑම කාරණයක දී පාර්ලිමේන්තුවේ වැඩකටයුතු පවත්වාගෙන යාම විධිමත් කිරීම සඳහා කථානායකවරයාට බලය තිබේ.

සභාවේ විනය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය යැයි අදහස් කරන්නේ නම්, රැස්වීමක් තාවකාලිකව අත්හිටවනු ලැබීමට හෝ පාර්ලිමේන්තුව කල් තබනු ලැබීමට කථානායකවරයාට බලය ඇත.

කථානායකවරයා විසින් රැස්වීමක් තාවකාලිකව අත්හිටවනු ලබන කවර හෝ අවස්ථාවක දී, රැස්වීම යළි ආරම්භ කරනු ලබන්නේ කවර වේලාවක ද යන්න කථානායකවරයා විසින් ම තීරණය කරයි. කථානායකවරයා විසින් සභාව කල් තබනු ලබන කවර හෝ අවස්ථාවක දී, එය ඊළඟ රැස්වීම් දිනය තෙක් කල් තබනු ලබයි.

පාර්ලිමේන්තුවේ ගොඩනැගිලි කළමනාකරණය, එහි ආරක්ෂක විධිවිධාන සහ සභා ගර්භයේ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් කථානායකවරයා වගකීම දරයි.

ස්ථාවර නියෝග යටතේ කථානායකවරයා විසින් කරනු ලැබිය හැකි ඕනෑම දෙයක්, කථානායකවරයා වෙනුවෙන් මූලාසනය දරන නියෝජ්‍ය කථානායකවරයා විසින් හෝ නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා විසින් හෝ මූලාසනය දැරීම සඳහා පාර්ලිමේන්තුව විසින් තෝරා පත්කර ගනු ලබන මන්ත්‍රීවරයකු විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (159) වැනි ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට යටත්ව සිදුකළ හැකි ය.

## සභාපති නාමාවලිය ( ස්ථාවර නියෝග 140 )

නියෝජ්‍ය කථානායකවරයාගේ හෝ නියෝජ්‍ය කථානායකවරයා පැමිණ නොසිටින අවස්ථාවක දී, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයාගේ ඉල්ලීම මත කාරක සභාවල තාවකාලික සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීමට මන්ත්‍රීවරයන් සිව් දෙනෙකුට නොඅඩු ගණනකින් සමන්විත සභාපති නාමාවලියක් සෑම සභා වාරයක් ආරම්භයේ දී ම කථානායකවරයා විසින් නම් කරයි.

කලින් කලට, එම නාමාවලියේ සංයුතිය වෙනස් විය හැකි ය. නියෝජ්‍ය කථානායකවරයා විසින් කරනු ලැබිය හැකි ඕනෑම දෙයක් නියෝජ්‍ය කථානායකවරයා වෙනුවෙන් මූලාසනය දරන තාවකාලික සභාපතිවරයකු විසින් ද කරනු ලැබිය හැකි ය.

## මන්ත්‍රීවරයන් විසින් නීතිමය නියෝජනයක් කරනු ලැබිය නොහැකි වීම ( ස්ථාවර නියෝග 141 )

කිසිම මන්ත්‍රීවරයකු විසින්, කිසියම් පාර්ශ්වයක් වෙනුවෙන් නීතිඥවරයකු ලෙස පෙනී නොසිටිය යුතුය. එමෙන්ම මන්ත්‍රීවරයාට යම් ගාස්තුවක් හෝ ත්‍යාගයක් හිමිවන ආකාරයෙන් හෝ පාර්ලිමේන්තුව ඉදිරියේ හෝ එහි යම් කාරක සභාවක් ඉදිරියේ හෝ පෙනී නොසිටිය යුතු ය.

## සාක්ෂිකරුවන්ගේ හා විශේෂඥයන්ගේ වියදම් ( ස්ථාවර නියෝග 142 )

පැමිණීම සඳහා කැඳවනු ලබන හෝ ලේඛන ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලබන යම් තැනැත්තකුගේ වියදම් සඳහා ගෙවනු ලැබිය යුතු හෝ ලබාදිය යුතු මුදල් ප්‍රමාණය, එම තැනැත්තා අධිකරණයේ සාක්ෂිකරුවකු වූයේ නම් දැනට බලාත්මකව තිබෙන නියෝගවලට අනුකූලව එම තැනැත්තාට ගෙවනු ලබන මුදල් ප්‍රමාණයම විය යුතු ය.

පාර්ලිමේන්තුවේ කාරක සභා සඳහා විශේෂ උපදේශන සේවා හා තාක්ෂණික සේවා ලබා ගන්නා අවස්ථාවක දී, එම කාර්යයන් ඉටුකිරීම සඳහා පැමිණෙන විශේෂඥයන් හා අනෙකුත් සේවා සපයන තැනැත්තන්ට, එම තැනැත්තන් විසින් ඉටුකරන ලද සේවා වෙනුවෙන් පාරිශ්‍රමික දීමනා, පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය උපදේශක කාරක සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ගෙවිය යුතු ය.

## අවශේෂ බලතල ( ස්ථාවර නියෝග 143 )

පාර්ලිමේන්තු  ස්ථාවර නියෝගවල නිශ්චිත වශයෙන් විධිවිධාන සලසා නොමැති සියලුම කරුණු ද, ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම පිළිබඳ වැඩි විස්තර සම්බන්ධයෙන් සියලුම ප්‍රශ්න ද, මෙහෙයවීම සිදුකරනු ලැබිය යුත්තේ කථානායකවරයා විසින් යෝග්‍ය යැයි සලකනු ලබන ආකාරයට වරින් වර කරනු ලබන නියෝග මත ය.